අන් අය කුමක්ද පවසන්නේ....

GO & TELL

# ගොස් පවසන්න ( යන්න සහ කියන්න )

මම මෙම පොතට ආදරෙයි! සාක්ෂි ඔබව ප්‍රබෝධමත් කරනු ඇත. ධර්මදූත සේවයට හා මිෂනාරි සේවයට අදාළ ඔබගේ කැඳවීම වෙනස් කරනු ඇත. ෂෝන් තුළ දැල්වෙන්නා වූ ශුද්ධාත්ම ගින්න ඔබට මතක් කරනුයේ ශුභාරංචියේ යෂ්ඨිය අල්ලාගෙන **යන්න සහ කියන්න** වෙලාව කාලය දැන් බවයි.

**STEPHEN EVANS** - PRESIDENT, LIGHT OF LIFE INTERNATIONAL

**යන්න සහ කියන්න** යනු, අතීතයේ බොහෝ දෙනෙක් විසින් ශුභාරංචියේ යෂ්ඨිය මාරු කිරීමේ මිලය සම්බන්ධ කම්පනාත්මක සිහිකැඳවීමයි. මෙම පොත තුළ ෂෝන් බ්‍රෑන් අපව අවධානයට පත් කරන්නේ ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් ලෙසට යේසුස් වහන්සේ අප තුළ කළාවූ අති විශිෂ්ඨ දෙය දෙස බලා මුළු ලෝකයටම හඬ නගන්නට තිබෙන මහත් වූ ශුභාරංචිය ගැන නිශ්ශබ්දව සිටීමට අප එඩිතර කරයි.

**DR. RON LUCE** - FUTURIST AND GLOBAL CHURCH STRATEGIST; FORMER PRESIDENT OF TEEN MANIA

ෂෝන් බ්‍රෑන් වසර 20ට ඉහතදී බ්‍රවුන්ස්වේල් පිබිදීමේ පාසලේ ශිෂ්‍යයෙක් විය. නමුත් දැන් ඔහු මාගේ මිතුරාය. මෙම පොත තුළ **යන්න සහ කියන්න** ඔහු ප්‍රධාන වශයෙන් අප ශුභාරංචිය ප්‍රකාශ නොකරන හේතුන් සඳහන් කර ඇත. අප කියන නිදහසට කරුණු ඒ සියල්ල මමද කළෙමි. ෂෝන් මේවා ගැන කතා කරනුයේ දණ්ඩකින් නොව නමුත් කතා ඉතිහාසය, හාස්‍ය, ආදරය හා ශුද්ධ ලියවිල්ලේ බලවත් ඇතුලාන්තයක් ඇතිවය. ඔබ සන්නද්ධව පැමිණෙනු ඇත. යේසුස් නමැති මනුෂ්‍යයා ගැන අන් අය සමඟ ඔබගේ සාක්ෂිය බෙදා ගැනීමට ඔබ උද්යෝගිමත් වනු ඇත.

**RON CANTOR –** PRESIDENT, SHELANU TV, ISRAEL; ISRAEL DIRECTOR, GOT TV

මම ෂෝන් බ්‍රෑන්ගේ **යන්න සහ කියන්න** පොත කියෙව්වෙමි. මෙය දිවීම උදෙසා ඔබගේ අවස්ථාවයි. ක්‍රිස්තු ශරීරයේ වහල් කළ යුතු අවශ්‍යතා සමහරක් මෙම පොත තුළ බලවත්, උද්යෝගිමත්, ඉලක්කගත ආකාරයට ආමන්ත්‍රණය කොට ඇත. ෂෝන් බ්‍රෑන් පැහැදිලිවම යේසුස් වහන්සේ තුළ සියලු වැදගත් ඇදහිලිවතුන්ට අපගේ කැඳවීම තුළ ඇති බරපතළ භාවය සහ දරුණු අවශ්‍යතාවයක් වන මහා නියෝගය සම්පූර්ණ කිරීමට යන්න සහ අපගේ ඇදහිල්ල බෙදාගන්න , ගෝලයන් බිහි කරන්න යැයි ඒත්තු ගන්වයි. කිතුණු ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම වීරයන් සහ වීරවරියන්ගේ එකතුවක් සමඟ බයිබලානුකූල කතා ක්‍රමයක් දුර්ලභ සංයෝජනයක් සහිත ප්‍රවීණ සහ අදාල නිදර්ශන තුළින් ප්‍රකාශ

කරයි. මුතුන් මිත්තන් තුළින් පොළඹවනු ලදුව සත්‍යතාවයේ ශුභාරංචිය බෙදා ගැනීමේදී මුහුණ දීමට සිදුවූ පීඩා හෝ ප්‍රාණ ත්‍යාග නොසලකා ෂෝන්ගේ උපකාරයෙන් අපට ධෛර්යය ලබාගෙන ඇදහිල්ලේ පියවර ගැනීමට කිසිදා නොකියවනු ලැබූ ශ්‍රේෂ්ඨතම කතාව අපගේම ප්‍රකාශනය තුළ පුද කිරීමට කැඳවිය හැක.

**DR. DAVID COLE –** PROVOST AND DEAN OF GRADUATE STUDIES, THE KING'S UNIVERSITY

මෙම පොත බිම තැබීමට අපහසුය . **යන්න සහ කියන්න** ක්‍රිස්තියානි ඉතිහාසයේ ඇදහිලිවන්තයන්ගේ උද්වේගකර සත්‍ය කතා සමඟින් මගේ අවධානය ක්ෂණිකව ආකර්ෂණය විය. සෑම පරිච්ඡේදයක්ම විවිධ සියවස් නියෝජනය කරයි. මෙම පොත ප්‍රබෝධමත් ශුද්ධ ලියවිලිමය අන්තර්ගතය සහ සමකාලීන නිදර්ශන වලින් පිරී ඇත. ඒවායින් බොහොමයක් කතුවරයාගේ දේව සේවයේ හමුවීම් වලින් උපුටා ගන්නා ලදී. අභිප්‍රේරණ පණිවිඩය මගින් යේසුස් වහන්සේ දැඩි ලෙස ප්‍රේම කරන නවීන ඇදහිලිවන්තයන්ගෙන් යුත් හමුදාවක් ඇති කර ගැනීමේ හැකියාව සහ ශුභාරංචිය බලයෙන් සහ සඵලත්වයෙන් බෙදා ගැනීමේ උපාය මාර්ගයෙන් සන්නද්ධ විය හැකිය. **යන්න සහ කියන්න** කණ්ඩායම් අධ්‍යයනය ගෝලත්ව පුහුණුව සඳහා වඩාත් සුදුසුය.

**DAVID W. DORRIES, PH.D.** – PRESIDENT AND FOUNDER, KAIROS MINISTRIES INTERNATIONAL; FORMER CHURCH HISTORY PROFESSOR AT ORAL ROBERTS UNIVERSITY

මෙය දිවීම උදෙසා ඔබගේ මොහොතයි

GO & TELL

# යන්න සහ කියන්න

ෂෝන් බ්‍රැන්

පෙරවදන ඩැනියල් කොලැන්ඩා විසින්



යන්න සහ කියන්න - මෙය දිවීම උදෙසා ඔබගේ මොහොතයි

වෙනත් අයුරකින් දක්වා නොමැති නම්, ශුද්ධ බයිබලය නව ජාත්‍යන්තර අනුවාදය, ප්‍රකාශන හිමිකම 1973,1984. ජාත්‍යන්තර බයිබල් සමාගම මඟින් ශුද්ධ ලියවිලි උපුටා ගැනීම් ලබාගෙන ඇත. සොන්ඩවන් ප්‍රකාශන ආයතනයේ අවසරය මත භාවිතා වේ.

ශුද්ධ ලියවිලි උපුටා දැක්වීම් (NASB) නව ඇමරිකානු සම්මත බයිබලයෙන්, ප්‍රකාශන හිමිකම 1960,1971, 1977, 1995, 2020 ද ලොක්මන් පදනම විසින් අවසරය මත භාවිතා කර ඇත. සියලුම හිමිකම් ඇවරිණි. www.lockman.org ශුද්ධ ලියවිලි උපුටා දැක්වීම් නව ඇමෙරිකානු සම්මත බයිබලයෙන් උපුටා ගන්නා ලදී. 1996,2004,2015 ටින්ඩේල් නිවාස පදනම විසින් භාවිතා කරන ලදී. කැරොල් ස්ට්‍රීම්, ඉලිනොයිස් 60188. සියලුම හිමිකම් ඇවරිණි. ප්‍රකාශකයින් භාවිතා කරන්නේ අවසරයෙනි.

ශුද්ධ ලියවිලි " ඕනෑම හැඩතල ගැන්වීමක් ( තද , ඇල අකුරු , යටි ඉරි ) අවධාරණය කිරීම සඳහා කතුවරයා විසින් එකතු කරනු ලැබේ.

සඳහන් කළ පුද්ගලයන්ගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීම සඳහා සමහර කතා සහ කතා විස්තර වෙනස් කර ඇත.

ට්‍රේඩ් පේපර්බැක් ISBN 978-0-9822879-0-6

ප්‍රකාශන හිමිකම, 2022 ෂෝන් බ්‍රැන් විසිනි.

ආවරණ නිර්මාණය සහ පිරිසැලැසුම මීකා කැන්ගර් විසින්. සංස්කරණය කළේ ඇලිසන් ග්‍රිෆින් විසිනි.

සියලු හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කතෘගේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව ප්‍රතිනිෂ්පාදනය කිරීම, ලබාගැනීමේ පද්ධතියක ගබඩා කිරීම හෝ ඕනෑම ආකාරයකින් සම්ප්‍රේෂණය කිරීම ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික ඡායා පිටපත් කිරීම, පටිගත කිරීම, ස්කෑන් කිරීම හෝ වෙනත් ආකාරයකින් කළ නොහැක.

සූරිච් හවුස් පබ්ලිෂින් විසින් ඩලාස්, ටෙක්සාස් හී ප්‍රකාශනයට පත් කරන ලදී.

සූරිච් හවුස් පබ්ලිෂින්

තැ.පෙ. 92366

සවුත් ලේක්, TX 76092 (USA)

www.zurichhousepublishing.com

මුද්‍රණය කරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ

2 3 4 5 6 7 8 9 10 11

# පිළිගැන්වීම

යේසුනී ඔබට ස්තුතියි, ඔබගේ ජීවිතය, මරණය සහ නැවත උත්ථානය නිසා. ඔබ වහන්සේ මාගේ ගැලවුම්කරුවාණන්, මාගේ රජතුමාණන් සහ මාගේ හොඳම මිතුරාය. ඔබ වහන්සේගේ ශුභාරංචිය උදෙසා මාගේ ජීවිතය. ටැන්ජා ඔබගේ ධෛර්යමත් කිරීම් සහ මෙම පොත ලියා අවසන් කරන තෙක් ඔබගේ ප්‍රේමය, මා මෙයින් අයින් වීමට උත්සාහ දරන විටත් එය මා උසුලාගෙන ගියේය. මා ඔබට ප්‍රේම කරමි. බේලී සහ සෝ මෙම සුභාරංචි ඔබටත්ය. යේසුස් වහන්සේ උදෙසා විකුණනු ලැබූ ජීවිතයකට තවත් නැති කරගන්නට, අහිතක් සිතන්නට කිසිවක් නැත. සියල්ල ලබා ගැනීම පිණිසය. තාත්තේ ඔයා ගැන මම ආඩම්බර වෙනවා. මීකා කොන්ගර් සහ ඇලිසන් ග්‍රිෆින් , ඔබ කාන්තාවන් දෙදෙනා අති විශිෂ්ටයි. මෙම පොත සකස් කිරීමට සහ මෙම පොත හොඳින් නිර්මාණය කිරීමට හා සංස්කරණය කිරීම සඳහා ඔබ හැර වෙන කිසිවෙක් මට නොවීය. **යන්න සහ කියන්න** මට වුවමනා විදිහටම ඔබ සකස් කොට ඇත. ඔබගේ ඉවසිලිවන්තකම සහ වෘත්තීය භාවය සඳහා ඔබට ස්තුතියි. ඩැනියල් කොලැන්ඩා ඔබටත් ස්තුතියි. ඔබගේ කාර්යබහුල න්‍යාය පත්‍රයෙන් කාලය වෙන්කරගෙන මෙම පොතට පෙරවදන ලිවීම ගැන. ඔබ ඉතාමත්ම සුවිශේෂී නායකයෙක් සහ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට ත්‍යාගයකි. **යන්න සහ කියන්න** අනුමත කිරීම් ලබාදුන් බොහෝ මිතුරන්ට ස්තුතියි. එම බොහෝ අනුමත කිරීම් මෙම පොතට ඇතුළත් නොවුන නමුත් ඒවා මට විශාල දිරි ගැන්වීමක් වූ අතර මෙම මුද්‍රිත පොතෙන් ඔබ්බට වෙනත් ස්ථානවල ප්‍රයෝජනවත් වී ඇත. අවසාන වශයෙන් ඔබගේ යාච්ඤාව, මූල්‍යමය උපකාර සහ දිරිගැන්වීම් තුළින් මෙම පොත ලිවීමට සහය දුන් ඔබ සැමට ස්තුතියි. ඔබ දන්නවා ඔබ කවුද කියා. මම ඔබ හැම කෙනෙකුටම ආදරෙයි. ස්තුතියි.

# පටුන

**පෙරවදන** 1

**පරිච්ඡේදය 1 : ක්‍රි.පූ. සිට ක්‍රි.ව. - සුභාරංචියේ යෂ්ඨිය** 3

*නමුත් ... සුභාරංචිය යනු කුමක්දැයි මා නොදනිමි*

**පරිච්ඡේදය 2 : පළමු සියවස - ශුද්ධාත්මයාණන් වහන්සේ** 19

*නමුත් ... සුභාරංචිය බෙදා ගැනීම ගැන මට පහසු හැඟීමක් නැත*

**පරිච්ඡේදය 3 : 100 ගණන් වල - යාච්ඥාව** 33

*නමුත් ... මට දේශනා කළ නොහැක*

**පරිච්ඡේදය 4 : 200 ගණන් වල - විශ්වය** 45

*නමුත් ... මා දේශකයෙක් නොවේ*

**පරිච්ඡේදය 5 : 300 ගණන් වල - ස්වභාව උත්තර** 53

*නමුත් ... මාගේ ඇදහිල්ල විශාල නොවේ*

**පරිච්ඡේදය 6 : 400 ගණන් වල - ජයග්‍රාහකයන් වින්දිතයන් නොවේ** 67

*නමුත් ... මා වැරදියි*

**පරිච්ඡේදය 7 : 500 ගණන් වල - මවනු ලැබුවේ මැවීම උදෙසාය** 77

*නමුත් ... මම නිර්මාණශීලී නොවෙමි*

**පරිච්ඡේදය 8 : 600 ගණන් වල - මාගේ සාක්ෂියේ බලය** 89

*නමුත් ... මගේ කතාව කතාව කම්මැලිය*

**පරිච්ඡේදය 9 : 700 ගණන් වල - ක්‍රියා කිරීමට අවස්ථාවයි** 97

*නමුත් ... මා යාච්ඥා කරමි*

**පරිච්ඡේදය 10 : 800 ගණන් වල - ප්‍රේමය** 103

නමුත් ... මාගේ පවුල සහ මිතුරන් මා නොදනිමි

**පරිච්ඡේදය 11 : 900 ගණන් වල - බීජ** 113

*නමුත් ... මම කිසිවෙක් නොවේ*

**පරිච්ඡේදය 12 - 1000 ගණන් වල - ස්ථානය** 125

*නමුත් ... මා ජීවත් වන ස්ථානය ඔබ නොදනී*

**පරිච්ඡේදය 13 : 1100 ගණන් වල - යහපත කරන්න** 137

*නමුත් ... කොතනින් ආරම්භ කරන්නට දැයි මම නොදනිමි*

**පරිච්ඡේදය 14 : 1200 ගණන් වල - සරල භාවය** 145

*නමුත් ... කියන්නේ කුමක්දැයි මා නොදනිමි*

**පරිච්ඡේදය 15 : 1300 ගණන් වල - දේශපාලනිකව නිවැරදි නොවෙමින්** 155

*නමුත් ... මා කිසිවෙකු කේන්ති කරවන්න අකමැත්තෙමි*

**පරිච්ඡේදය 16 : 14000 ගණන් වල - දේවධාර්මික වෙනස්කම්** 165

*නමුත් ... වාද කිරීමට මා නුසුදුසුය*

**පරිච්ඡේදය 17 : 1500 ගණන් වල - ධෛර්යය** 175

*නමුත් ... මාගේ ජීවිත රටාවේ එය සාමාන්‍ය දෙයක් නොවේ*

**පරිච්ඡේදය 18 : 1600 ගණන් වල - ශුද්ධකම** 185

*නමුත් ... මම බොහෝ වැරදි කර ඇත්තෙමි*

**පරිච්ඡේදය 19 : 1700 ගණන් වල - ආශාව** 197

*නමුත් ... මට නිවැරදි පුද්ගලිකත්වයක් නොමැත*

**පරිච්ඡේදය 20 : 1800 ගණන් වල - උපදේශකයන්** 207

නමුත් ... මම සමාජීය වශයෙන් අවාසි සහගත වෙමි

**පරිච්ඡේදය 21 : 1900 ගණන් වල - ගෝලීයකරණය වූ මනසක්** 217

*නමුත් ... කොහේ යන්න දැයි මා නොදනිමි*

**පරිච්ඡේදය 22 : 2000 ගණන් වල - ඉදිරිපත් වීම** 225

*නමුත් ... මට නොහැකිය*

**පරිච්ඡේදය 23 : අද - නිදහසට හේතු නැත** 235

*දැන් ඔබේ වාරයයි*

**පසු වදන** 241

**සටහන්** 245

# පෙරවදන

මෙම පොත තෝරාගැනීම පිළිබඳව මම උද්යෝගිමත් වෙමි. මම දන්නවා මෙම පොත ඔබව හොඳින් දිරිගන්වාවි කියා.

මෙම කතුවරයාගේ පොත මම තෝරා ගැනීමට එක් හේතුවක් නම් ෂෝන් බ්‍රැන් සහ මා අතර වන පොදු කාරණය වන අප දෙදෙනාගේ හදවත්වල දැවෙන්නා වූ දූතන සේවයයි.

එසේම එය අභිබවා ගිය කාරණාද අපට පොදුවේ ඇත. 90 වසරේ අග භාගයේ දී ෂෝන් සහ මා බ්‍රවුන්ස්විල් ඉපදීමේ සේවා පාසලට ගියෙමු. එහිදී දෙවියන් වහන්සේගේ සේවයට ඇති ප්‍රේමය අප තුළ දල්වා අප දෙදෙනාගේම ජීවිතය සූදානම් කළ සේක. යේසුස් වහන්සේ ගැන අසන කවුරුන් හෝ වේවා සියලු දෙනාටම උන්වහන්සේ ගැන කියන්න.

වසර ගණනාවක් පුරාවට ( දැන් යුගයන් ! ), ෂෝන් ගේ පුද්ගලික ජීවිතය හා සේවය දැක ඇත. ශිෂ්‍යයෙක්, ස්වාමිපුරුෂයෙක්, පියෙක් හා පූජකවරයෙක්, ඔහුගේම දූතන සේවය නිර්මාතෘවරයෙක් ලෙස ඔහුත් සමඟ වැඩ කරන හා සේවය ලබන අනෙක් අයට ආශිර්වාදයක් වී ඇත.

එසේම දැන්, **යන්න සහ කියන්න** පොත තුළින් ඔබද ආශිර්වාද ලබනවා ඇත.

ශ්‍රේෂ්ඨ ඉවැන්ජලිත සහ කතුවරයකු වන Leonard Ravenhill පැවසුවේ, " ජීවිත කාලයේ අවස්ථාවන් අල්ලා ගත යුතු වන්නේ, ජීවිත කාලය තුළ ලැබෙන්නාවූ අවස්ථාවන්ගෙනි." **යන්න සහ කියන්න** තුළින් ෂෝන් අපට මතක් කර දෙනුයේ ජීවිත කාලයේ අපට ලැබෙන අවස්ථාව මෙය බවය - ශුභාරංචිය සමඟ අප දුවන මොහොත ලෙසය !

වසර ගණනාවකට පෙර මාගේ උපදේශක රයෙන්හාඩ් බොංකේ සමඟ මා ජර්මනියේ සමුළුවක දේශනා කරමින් සිටියෙමි. දිනක් උදෑසන අප ආහාර ගන්නා ස්ථානය මුණගැසුණු නමුත් ඔහු වෙනදා මෙන්ම ඉතාම නිහඬව සිටියේය. මට එය කියාපෑවේ ඔහුගේ හදවත තුළ යමක් කැකෑරෙන බවයි. ඉන්පසු ඔහු කීවා; " ඊයේ රාත්‍රියේ මා සිහිනයක් දුටුවා. සැබවින්ම එය සිහිනයක්ද, දර්ශනයක් ද යැයි මට ස්ථිර නැත. එය පැහැදිලිව පෙනුනු ( විචිත්‍රවත් ) අතර මාව වසර ගණනාවක අනාගතයට ගෙන යනු ලැබුවා. පුද්ගලයන් දෙදෙනෙක් ඔවුන්ගේ කාලයේ ලෝකයේ සිදුවන දේවල් ගැන කතා කරමින් සිටියා. ඔවුන් ඇසූ සියල්ල විශේෂිතයි. ඔහුට බලපෑමක් ඇති කරනු ලැබුවේ අවසාන ප්‍රශ්නය සහ පිළිතුරයි. මට ඇසුණා එක් පුද්ගලයෙක් අනෙත් පුද්ගලයාගේ අසනවා " රයෙන්හාඩ් බොංකේට කුමක් සිදුවන්නේද? " ඔහු පිළිතුරු දුන්නා; " ඕහ්, රයෙන්හාඩ් බොංකේ ඔහු සම්පූර්ණ නව පරපුරක ශුද්ධාත්මයෙන් බලගැන්වූ ඉවැන්ජ්ලිස්ත වරයෙක් හා පෙර ගමන්කරුවකු බව"."

ඔහුගේ ජීවිතය අවසාන භාගය රයෙන්හාඩ් ජීවත් වුණේ නව පරපුරේ ඉවැන්ජ්ලිස්තවරුන්ගේ උපත සන්නද්ධ කිරීමට සහ දියත් කිරීම දැකීමටයි. ඔවුහු දුටුවේ ඔවුන් වේදිකාව උඩ දේශනා කරනවා පමණක් නොව වීදි, සන්ධිවල සහ සමාජයේ සෑම කොනකම පැතිරී යාමයි." එම දර්ශනය අපගේ කාලය සම්පූර්ණ වීම දැක ගැනීමට කිවේ යැයි විශ්වාස කරමි. අවසාන කාලය අස්වැන්න ලොවට ගෙන ඒමට මෙහෙකාර හමුදාවක් නිදහස් වීමයි. යේසුස් වහන්සේ ප්‍රකාශ කළ ලෙසට ගොයම නම් බොහෝයි, මෙහෙකරුවෝ ස්වල්ප දෙනෙක්ය. සෑම ඇදහිලිවන්තයෙකුම සන්නද්ධ කළ යුතු වන්නේ තමා වටා සිටින සෙනඟට ශුභාආරංචිය ප්‍රකාශ කිරීමට දුවන පිණිසය. පූජකවරයෙක් සහ ඉවැන්ජලිස්තවරයෙක් ලෙස මාගේම වැඩේදී මා දැක තිබෙන්නේ සමහර ඇදලිවන්තයන් නොදන්නේ කෙසේද, අරඹන්නේ කෙසේද හෝ ශුභාරංචිය බෙදා ගැනීමට මිලියන ගණනින් නිදහසට කරුණු පැවසීමය.

**යන්න සහ කියන්න** තුළ උදාසීනත්වය සහ විරෝධක දෙගිඩියාවේ බියෙන් ජයගැනීමට දිරිය ඔබගේ සන්දර්භය තුළ ඉවැන්ජලිස්තවරයෙක් වීමට අවශ්‍ය එලදායී ආම්පන්න ඇත. මෙම පොත පිරී ඇත්තේ ප්‍රායෝගික අදාළ කිරීම්, බලවත් කතා, ශුද්ධ ලියවිල්ල තුළ අඩංගු වටිනා අන්තර්ගතයන් පිටුවක් පාසා පිටුවක් පිරී හාස්‍ය, ආශාව, ගාම්භීරත්වය, මූලධර්ම, සියවස් ගණනාවක් පුරාවට ඇදහිලිවතුන්ගේ විචිත්‍රවත් කතා, දේව ධර්මයෙන් සහ ඉතිහාසයෙන් පොහොසත් කිරීම පමණක් නොව නමුත් කියවීමට ප්‍රීතිය සහ උද්වේගකර පොතකි.

ෂෝන් අපට අනුග්‍රහ පූර්වකව මතක් කරනුයේ, යුගයන් තුළ ශුභාරංචිය උසස් වීමට ගෙවන ලද මිලය කුමක්ද යන්නයි. සෑම සතවර්ෂයක් පාසා ඔබ ගමන් කරන විට ජීවිත පූජා කළා වූ උතුම්

ඇදහිල්ලේ වීරවරයන් තුළින් ඔබ උද්වේග කරවනු ඇත. (නිතරම ඔවුන්ගේ ජීවිත ඇතුළත්ය ) මහා නියෝගය සම්පූර්ණ කිරීම උදෙසා එය යථාර්ථවාදී වෙමින් නවක ඇදහිලිවතුන්ගේ හදවතට වදිනු ඇත. මන්ද සෑම ඇදහිලිවන්තයෙකු හා ඉවැන්ජලිස්තවරයෙකු යේසුස් වහන්සේගේ ශුභාරංචිය බෙදා ගැනීමට ලොවට එවා ඇත. ක්‍රීඩාගාරයක හෝ වීදි කොනක , සමූහ කාර්යාලයක හෝ දිවා සුරැකුම් මධ්‍යස්ථානයක ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරන සෑම කෙනෙක්ම ශුභාරංචිය බෙදාගත යුතුය.

මා මෙන්ම ඔබද **යන්න සහ කියන්න** පොත කියවීමට ආශාවෙන බව දනිමි. එය ශුභාරංචිය බෙදා ගැනීම සඳහා අවශ්‍ය සියලු ඇදහිලිවතුන් සහ සභාවන් සන්නද්ධ කරන්නාවූ ක්‍රීඩාවේ වෙනසකි. ඔබ සහ ( ඔබේ සභාවට ) මා ඉහළින්ම රෙකමදාරු  කරනුයේ මෙම පොත කියවීමට, ක්‍රියාකාරකම් පොත කිරීමට පමණක්ම නොව මෙම පොතේ වචන ඔබ තුළට ඇතුල්වන පිණිසයි. ලොව මුළුල්ලේ අස්වැන්නේ අද්දර අපි සිටිමු. එසේම ශුභාරංචිය යජ්ඨීය අප අතේය.

සහෝදරයා, සහෝදරිය ධෛර්යමත් වෙන්න. මෙය දිවීමට අපගේ මොහොතයි.

ඩැනියල් කොලැන්ඩා

සභාපති

ක්‍රයිස්ට් ෆෝ ඕල් නේෂන්

*"උන්වහන්සේ ඔවුන්ට කියනසේක්ඃ නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරන්න...... ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. ආමෙන්."*

*මාර්ක් 16ඃ15,20*

# පූර්විකාව

මැක්සිමා පිටිය මැද බිම වැතිරුණාය. ඇගේ සිරුර ස්පන්ධනය විය. ඇගේ දත් බියෙන් තද විය. ඇගේ හදවත ගැහෙන්නට පටන් ගත්තේය. මධ්‍යදරණී මුහුදේ සුළඟ ගල්ආරුක්කු මාර්ගය ඔස්සේ මෘදුව හුස්ම ගත්තේය. ඇය ඉදිරියේ අඩි 90ක කෙටි දුරකින් යකඩ කූඩුව ඉදිරියට හා පසුපසට පැද්දෙන්නට විය. සෑම පිම්මකම කුඩු කළ සිංහයන් ඉතා ඉක්මනින් ඇගේ මාංශය තුළට කිඳා බහින දත් මැක්සිමාට දැකීමට හැකි විය.

ඇගේ මනස තුළ පවුලේ ආදරණීය මතක සටහන් රූගත විය. එසේ වුවත් කිලිටිපිටියක භූමියේ ඇය තනිව ඇත. ඇයත් සමඟ තවත් කවුරු හෝ සිටිනවා ඇයට දැනුණි. නිර්වස්ත්‍රව, නින්දාවට පත්ව මැක්සිමා සැනසීම උදෙසා දෙවියන් වහන්සේට මිමිනුවාය. සෙනඟ ඝෝෂා කළහ. මෙම කැරලිකාරී යෞවනිය ඉක්මනින් ඇගේ දඬුවමට පත්වීම ගැන ප්‍රීති වූහ. මැක්සිමා යේසුස් නම් ලත් පුද්ගලයා ගැන අවුරුදු දෙසීයකට ඉහත ජීවත් වුන පුද්ගලයෙක් ගැන මෙතරම් ආදරේ ඇයි? ඇය ඔහු ගැන නිතරම කතා කළේ, ඇගේ පණිවිඩය නීති විරෝධී වුණත් ඔවුන්ට එය තේරුම් ගැනීමට නොහැකි විය. නිදහසට කරුණු ඇයව නතර කිරීමට නොහැකි විය. ඇගේ ප්‍රේමණීය කරුණාවට සෙනඟව ඇඳගනු ලැබීය. යේසුස් වහන්සේ ගැන අයෝග්‍ය වූ කැරලිකාර ආකාරයට නොනවත්වාම කතා කිරීම ගැන ඔවුන් සිතූහ. සියල්ලට ඉහළින් යෞවනියන් , කන්‍යා ගැහැණු දරුවන් කතා කරනුයේ ඔවුන්ව සදාකාලයටම ගෙන යන්නා වූ කුමාරයෙකු ගැන සහ අනාගත දරුවන් සම්බන්ධ සිහින ගැනය.

සැබවින්ම මැක්සිමා මේ දේ ගැන සිතුවා. නමුත් ඇගේ ගම්මානයේදී ඇය ඇසුවා වූ මෙම පණිවිඩයෙන් ඇය දවනු ලැබුවා. සියලුම ප්‍රේම වෘත්තාන්ත එයට යටපත් වුණා. රජ කෙනෙකුගේ පණිවිඩය ඔහුගේ රාජ්‍ය සෑම මනුෂ්‍යයෙකුටම බලාපොරොත්තුවක්, සදාකාලයටම එතුමාව දැන ගැනීම තුළින් ලැබිණි. යුතිකා වල සිට සැතපුම් සුළු ප්‍රමාණයක් දුරින් දින කිහිපයකට පෙර ශුභාරංචි ප්‍රකාශ කිරීම නිසා ඇදහිලිවතුන් 300ක් ඝාතනය කරන ලදී. ඔවුන් සියලු දෙනාම දැවෙන ගිනි වලක් වටේට තැබූහ. බ්‍රහස්පති දෙවියාට පූජාවන් යැයි කියූ අතර එසේ නොවුනොත් එම ගිනි වලට හෙළනු ලබන බව කීහ. සියල්ලෝම එය ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ගේ ජීවිතයට වඩා ශුභාරංචිය ඔවුන්ට අදහසක් ගෙන දුන්නේය. එම දින තුන්සිය දෙනාම සතුටින් ගින්නෙහි තමන්ගේ ජීවිත පූජා කළහ.

දැන්, බලධාරීන් මැක්සිමා සහ ඇගේ මිතුරන් දෙදෙනෙක් අල්ලාගෙන ඇත. දොනතිල්ලා සහ සෙකුන්දා මෙය මැක්සිමාගේ වාරයයි. ඇගේ පණිවිඩය ප්‍රතික්ෂේප කිරීම හෝ අකල් මරණයකට මුහුණ දීම. දොනතිල්ලා සහ සෙකුන්දා ඇයව අනුගමනය කරාවි සහ කවුද දන්නේ? වටා සිටින මිලියන දෙකක කිතුණු අනුගාමිකයන් කොයි මොහොතේ අධිරාජ්‍යයා විසින් මරණ දණ්ඩනයට ලක් කරාවිද කියා.

"මෙම ශුභාරංචිය බොරුව පැතිරවීම නවතාලනු, ක්‍රිස්තුස් වහන්සේව අත්හරිනු" සෙනඟගේ ඝෝෂාව මධ්‍යයේ නඩු පවරන්නා කෑගැසීය.

"මට කළ හැකි දෙයක් නැත. යේසුස් වහන්සේ ගැන කතා කරනවා විනා. සත්‍ය වඩා යහපත්ය. මාගේ ස්වාමිනී!" මැක්සිමා අයැදීමක් කළාය.

"ඔබත් සමඟ ඔය ඇති මැක්සිමා!"

නඩු පවරන්නා හමුදාවට නියෝග කළා. මැක්සිමා හඬන්නට පටන් ගත්තා. ඔවුන් ඇයට තිත්ත සහ විනාකිරි බීමට බල කළා. යේසුස් වහන්සේගේ කුරුසියේ භේවායෝ කළාක් මෙන් අනුකරණය කළා. ඔවුන් සිනහසුණා. ඇයට කසයෙන් තැළුවා. ඇගේ මාංශ පේෂීන් එක් කළා. සෑම පහරදීමකම ඇය දෙවියන් වහන්සේට උපකාර ඉල්ලා කතා කළා. ඇගේ කෑ ගැසීම ප්‍රමාණවත් වූ සොල්දාදුවා නිර්වස්ත්‍ර රුධිරය වහනය වන්නා වූ ශරීරය මතට දෙහි යුෂ වත්කළේය.

මැක්සිමා ඇගේ දෑස් අමාරුවෙන් ඇරගෙන සිටියා. ඇගේ ශක්තිය ඉක්මනින් හීන වී ගියා.

"සිංහයෝ! සිංහයෝ! සිංහයෝ!" සමූහයා කුඩු කළ බළලුන් පැත්තෙන් පැත්තට පනින කළ දරුණු ලෙස කෑ ගැසූහ.

මැක්සිමා වේදනාවෙන් ජනතාවගෙන් ඉල්ලා සිටියේ කරුණාකර නතර වී ඇගේ යේසුස් වහන්සේට සවන් දෙන ලෙසටයි. ඔවුන් ඇගේ දුර්වල ශරීරය එල්ලුම් ගසක එල්ලා දිගින් දිගටම පහර දෙන්නට විය.

ඇය මෙතරම් නිර්භීත යැයි විශ්වාස කළ නොහැකිමුත් අවසාන තත්පර ස්වල්පයේ ඇය තවදුරටත් සෙනඟට ප්‍රේම කරන අයුරු පිළිබඳ සිංහ කූඩු මත දණ නමා සිටින කඩුගත් මල්ලවයන්ට ප්‍රෙහෙලිකාවක් විය. ඔවුන් මෙම ව්‍යාකුල ඇදහිල්ල සහ නිර්භීතකම මෙවන් වාතාවරණයන් තුළදී වසර ගණනාවක් මුළුල්ලේ දුසින් ගණන් ඇදහිලිවන්තයන් තුළ දැක ඇත. මේ අවසන් වන්නේ කෙසේදැයි ඔවුන් දැන සිටියහ. මැක්සිමාගේ අවසන් වදන් සහ ආයාචනය ඔවුන්ගේ සිහින තුළ හොල්මන් කරන බව දැන සිටියේ අනෙක් දුසින් තුළ එය එසේම වූ බැවිනි. එනමුත් දැන් ඔවුන්ට කිරීමට කාර්යයක් ඇත.

සොල්දාදුවන් ආරක්ෂාව පිණිස මැක්සිමා වෙතින් ඉවත් වූ පසු නඩු පවරන්නා කඩුගත් මල්ලවයන් දෙස බලා හිස සැලීය. ඔවුන් කූඩ වල දොරටු ඉහළට එසවූහ.

සිංහයන් පිටතට පැමිණියහ. මැක්සිමා ඇගේ දෑස් තදින් පියා ගත්තාය. එල්ලුම් ගහට බැඳ තිබූ කඹය ඇය තදින් අල්ලා ගත්තාය. ඇය මහත් ශබ්දයක් නැගුවාය.

එය ක්‍රි.ව 258 දී සිදු විය.

# 1

# ක්‍රි.පූ. සිට ක්‍රි.ව. දක්වා ශුභාරංචියේ යෂ්ඨිය

නමුත්.. ශුභාරංචිය කුමක්දැයි මා නොදනිමි

"සහාය දිවීමේ ධාවන තරගයක යෂ්ඨිය සුභාරංචිය මෙනි" - රයින්හාර්ඩ් බොංකේ

රජතුමා වැඩි සේක. අන්ධකාරය වෙත යේසුස් වහන්සේ පැමිණි සේක. ලෝකයේ ආලෝකය. සාමාන්‍යයෙන් වසර තිහක් පුරාවට පොළොවේ පියාගේ වඩු කර්මාන්ත ශාලාවේ උතුම් වැඩ කළ සේක. කැඩුනාවූ මේස පුටු නැවත සකසන ලද අතර උන්වහන්සේගේ අවධානය වූයේ ඊටත් වඩා දෙයක් සකස් කිරීමය. අවු. 400 පෙර ආදම් සහ ඒව දෙවියන් වහන්සේට අකීකරු විය. දෙවියන් වහන්සේ සහ මනුෂ්‍යයා එකට ජීවත් වූ අතර මනෝරාජික පාරාදීසයක් නපුරා විසින් හඳුන්වා දී තිබුණි. එය සියල්ල විනාශ කළේය.

නමුත් ඒ අඳුර මධ්‍යයේ දෙවියන් වහන්සේගෙන් පොරොන්දුවක් විය. ගැළවුම්කරුවෙකු, ජයග්‍රහණයේ රජෙකු , ප්‍රේමවන්තයෙකු, පාපයේ රෝගය සුව කරන්න සහ එය ගෙන ආ බිඳුනු බව දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර සම්බන්ධතාවය නැවත ස්ථාපිත කරන පිණිස දිනක දෙවියන් වහන්සේම පැමිණෙන සේක.

ඒ කාලය පැමිණ තිබේ.

යේසුස් වහන්සේ ඊශ්‍රායලය වටා බලයෙන් හා ප්‍රේමෙන් පූර්ණ වුණා වූ සරල පණිවිඩයක් ප්‍රකාශ කරමින් ගමන් කළ සේක. දේව රාජ්‍ය මෙහිය, එම රාජ්‍යයේ ප්‍රතිඵල ප්‍රකාශිතය. ගම්මාන පිටින්ම සුවය ලබා ඇත. යක්ෂාවේශ වූවන් නිදහස් වී ඇත. මළාවූ අය නැවත ජීවනයට පැමිණ ඇත. මහත් සමූහයක් උන්වහන්සේව අනුගමනය කිරීමට පටන් ගත්හ.

උන්වහන්සේගේ ප්‍රසිද්ධ මෙහෙවර ආරම්භ වී වසර තුනක් ගත වූ පසු ක්‍රිස්තුස් වහන්සේ තම ගෝලයන් සමග පාස්කු මංගල්‍යය සැමරීමට හාන්සි වූ සේක. පෙර වසර වලට වඩා මෙම පාස්කු මංගල්‍යය සැමරීම බොහෝ වෙනස් වනු ඇත.

දෙවියන් වහන්සේ උන්වහන්සේගේ ජනතාව වහල් භාවයෙන් මුදා ගැනීමේ හාස්කම වෙත නැවත පෙන්වා දීම වෙනුවට මෙම ආහාරය මුළු ලෝකයම අවසාන වහල් භාවයෙන් ගැළවීමේ මහත් වූ පූජාවේ මරණය සහ නපුරා විසින් බිඳ තැබූ පාරාදීසය පෙන්වා දෙයි. මෙය සැබෑවූ නික්මයාමයි. නව ගිවිසුම ස්ථාපිත කිරීමයි. රොටි උන්වහන්සේගේ ශරීරය වන්නේය. මිදියුෂ උන්වහන්සේගේ රුධිරය වන්නේය. උන්වහන්සේගේ ජීවිතය, මරණයෙන් හා නැවත නැගිටීමෙන් උන්වහන්සේ ලෝකය ගළවන සේක.

උන්වහන්සේ නැවත ස්වර්ගාරෝහණය වූ පසු යේසුස් වහන්සේගේ සම්පූර්ණ ප්‍රසිද්ධ ජීවිතය දිගහැරෙන්නේ ගැඹුරු, අපූර්ව සහ මිදීමේ ප්‍රේමයේ අගනා අබිරහස බව පැහැදිලිය. උන්වහන්සේ පැමිණියේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට, ගැළවීමට සහ මිදීමේ මිලයක් කොට මනුෂ්‍යයා ගැළවීමටය. නපුරා පරාජය කිරීමට උන්වහන්සේ පැමිණි සේක.

නියත වශයෙන්ම උන්වහන්සේ ඒ දේ කළ සේක.

*යේසුස් වහන්සේගේ මුළු ප්‍රසිද්ධ ජීවිතයම ප්‍රේමය මුදවා ගැනීමේ ගැඹුරු, අපූරු සහ වටිනා අභිරහස හෙළිදරව් කිරීමකි.*

ඊළඟ වසර 2000 කාලය තුළදී යේසුස් වහන්සේගේ අනුගාමිකයන් සියලු නිදහසට කරුණු වලින් ජයගෙන, හැකි හැම අවස්ථාවකම පාවිච්චි කරමින් දෙවියන් වහන්සේ විසින් දෙන ලද්දා වූ සියලු ආධිපත්‍ය ඇතිව ප්‍රේමෙන් පූර්ණව මුළු ලෝකයා වෙතට යේසුස් වහන්සේගේ ශුභාරංචිය ප්‍රකාශ කළ සේක.

මෙය ඔවුන්ගේ කතාවයි.

මෙය ඔහුගේ කතාවයි.

මේ ඔබගේ කතාවද විය හැක.

මෙම පොතේ සෑම පරිච්ඡේදයක් ම පළමු පරිච්ඡේදයේ සිටම ශුභාරංචිය ප්‍රකාශ නොකර සිටීමට අපව ආපස්සට අදිනු ලබන කාරණා සම්බන්ධ නිදහසට කරුණු හා ඒවා ජය ගන්නේ කෙසේද යන්නත් සෑම යුගයන්හිදීම ඇදහිලිවන්තයන්ගේ කතා ඉවැන්ජලිස්ත සේවය සඳහා අවශ්‍ය මූලධර්ම සහ බයිබලානුකූල ඇතුළාන්තය මහත් සමූහයක් වූ ඇදහිලිවතුන් සමඟ දිවීමට උපකාරය පිණිස යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශුභාරංචිය මුළු විශ්වය තුළ අභිවෘද්ධිය තකා.

නමුත් පළමුව මුල් අවස්ථාව බලමු. මෙය ඔබට බොහෝ විට ප්‍රාථමික යැයි දැකිය හැකි වුවත් සමහර කොටස් විශ්මය උපදවයි. නව අවසාන වශයෙන් ශුභාරංචිය ඵලදායි ලෙස බෙදා ගැනීමට ඔබව බලගන්වයි.

# යේසුස් වහන්සේ

යුරෝපයේ ජාතික තරුණ සමුළුවක මා කතා කරමින් සිටි අතර රැස්වීමෙන් පසු යෞවනයෙක් වේදිකාව ඉදිරිපසට පැමිණ මට ළඟාවිය. ඔහු කාය වර්ධන ඇඳුමක් ඇඳ සිටි අතර ඔහු සාමාන්‍ය නව යොවුන් වියේ ටෙස්ටොස්ටෙරෝන් හෝමෝන අධික වූ යෞවනයෙකි. ඔහුට මාගෙන් ඇසීමට බරපතළ ප්‍රශ්නයක් විය.

"ඉතින් කියන්න කවුද ඔබේ වීරයා?" ඔහු එම ප්‍රශ්නය මගෙන් අසන විට ඔහුගේ ස්වරය බිඳී ගියේය.

ඔහු දේවධාර්මික ගැඹුරු ප්‍රශ්නයක් අසා වියැයි මා නොසිතුවෙමි.

නමුත් මා ඔබට කියනුයේ ඔහුට එය බරපතල විය. ඉදින් මා ඔහුට ප්‍රතිචාර දැක්වුවෙමි. "ඕ, එය සරලයි. යේසුස්."

" නැත. සැබවින්ම."

" සැබැවින්ම."

"හොඳයි බයිබලය අහකට ගන්න. දැන් කවුද ?" ඔහු ඇසුවේය.

"ඒත් යේසුස්වහන්සේමයි." මා ස්ථිර කළෙමි.

"කෙසේද උන්වහන්සේ ගැන බයිබලයේ කියන කාරණා වලට වඩා උන්වහන්සේව වඩා විශේෂ කරන්නේ කුමක්ද ?" ඔහු කැමති කරන ශ්‍රේෂ්ඨ වීරයෙකුගේ විකට පොතක් ගැනීමට ඔහු සමත් විය.

"ඕ, එය පහසුයි. යේසුස් වහන්සේ ගැන කරුණු තුනක් කිව හැකියි. ජීවත් උනා වූ කිසිවෙක් ගැන එම කාරණා කිව නොහැකි විය යුතුයි." මා පිළිතුරු දුනිමි.

ඔහුගේ ඇහිබැම රැළි ගැසී ඇස් විශාල වී කියන්නට යන කරුණු තුන කුමක්දැයි සිතීමට උත්සාහ කළේය.

මා දිගටම "ඉතිහාසයේ බොහෝ මනුෂ්‍යයන් විසින් සතවර්ශ ගණනාවක් මුළුල්ලේ ප්‍රොපේතමය ලෙස ප්‍රකාශ කොට තිබුණ සැබවින්ම ප්‍රොපේත වාක්‍ය සම්පූර්ණ කරමින් පැමිණියා වූ එකම පුද්ගලයාය. එය වෙන කිසිවෙකු ගැන කිව නොහැක. මොහොම්මද්, බුදුන්වහන්සේ, අයින්ස්ටයින්, නියුටන් වැන්නන් හෝ ඔබවත් මාවත් එම ගණයට අයත් නොවේ.

" දෙවනුව, යේසුස් වහන්සේ මහත් බලයකින් පැමිණ කාලය දෙකට බෙදූ සේක. එම මොහොතේ පටන් සියලු දෙනාම යේසුස් වහන්සේගේ නාමය පදනම් කොටගෙන කාලය ගණනය කළහ. එයට ඔබත් අයිතිය. ඔබගේ උපන්දිනය පදනම් වන්නේ මාගේ වීරයාගේ ජීවිතයෙනි."

" එය කදිමයි." ඔහුගේ මුහුණේ සිනහව වර්ධනය වෙමින් එසේ ඔහු මිමිනුවේය.

"සහ තුන්වෙනුව උන්වහන්සේ ඉපදුනෙණේ මැරෙන්නටය. ඒ නිසයි උන්වහන්සේ පැමිණියේ. අපි හැමෝම ඉපදුණේ ජීවත් වීමටය. නමුත් උන්වහන්සේ පැමිණියේ ජීවිතය දීමටය."

" වාව්. අලංකාරයි. නියමයි මා ඒ කිසි කලෙකත් නොසිතුවෙමි."

" දැන් අපි කතා කරමු බයිබලේ කුමක්ද කියන්නේ කියන්නේ කියා."

මා පිළිතුරු දෙමින් ඔහු සමග ශුභාරංචි බෙදා ගතිමි.

සාකච්ඡාව අවසන් වූ පසු ඔහුගේ ශ්‍රේෂ්ඨ වීරයා යේසුස් වහන්සේ මිස උන්වහන්සේට සම කළ වෙන කිසිවෙක් නොවීය. ඔහු ආපසු ගියේ නව වීරයෙක්ව අනුගමනය කිරීමටය. සැබෑ දෙවියන් වහන්සේ ලෝකයේ රජතුමාය.

*යේසුස් වහන්සේ පැමිණියේ කොතරම් බලයකින්ද යත්, උන්වහන්සේ කාලය දෙකට බෙදුවේය. ඒ මොහොතේ සිට සැම කෙනෙක්ම කාලය ගණනය කළේ ජේසුස් වහන්සේගේ ජීවිතය පදනම් කරගෙනය. ඔබත් ඇතුළුව!*

මට පැහැදිලි කළ හැකිද? යේසුස් වහන්සේ ගැන විස්තර වාර්තා තුනක් ඔහුට සැබැවින්ම ධර්මිෂ්ඨකම ගෙන නොදෙයි. එය සැබවින්ම අපේ දෙවියන් වහන්සේගේ උතුම්කම පිළිබඳව විස්තර කිරීමට උත්සාහ දැරීමකි.

චාල්ස්පර්ජියන් යේසුස් වහන්සේ ගැන ලියූ ආකාරයට "මම ප්‍රේම කරමි. ලෝක ඉතිහාසයේ උතුම් කේන්ද්‍ර සත්‍යතාවය ක්‍රිස්තුස් වහන්සේය. උන්වහන්සේට සියල්ල පෙනෙන්නේ ඉදිරියට සහ පසුපසටය. ඉතිහාසය සැම රේඛාවක්ම උන්වහන්සේව ආවරණය කරයි." සතවර්ශ විස්සක් පැමිණ ගොස් ඇත , අදත් යේසුස් වහන්සේ මනුෂ්‍ය සංහතියේ කේන්ද්‍රස්ථානයයි. ආණ්ඩු කරන ලද ස්ත්‍රීන්, පුරුෂයන් හෝ කවුරුන් වේවා ඔවුන් එක් මිටකට ගත් කල මෙම කේවල ජීවිතය තුළින් කළාවූ බලපෑම අප ජීවිතවලට කිසිවෙකුටවත් කළ නොහැකි විය.

යේසුස් වහන්සේව ඉතාම ළඟින් දැන සිටියා වූ යමෙක් වේද ඔවුන් සාමාන්‍ය වශයෙන් ආශාවෙන් දැවුණේ අන් මනුෂ්‍යයන්ද උන්වහන්සේව දැනගත යුතුය - මිලය කුමක් වුවත් කම් නැත. සාමාන්‍යයෙන් උන්වහන්සේගේ ප්‍රථම අනුගාමිකයන් වන ගෝලයන්ගෙන් ආරම්භ කරමු. උන්වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු ඔවුන් යන යන සැම තැනම ශුභාරංචිය ප්‍රකාශ කළහ. ක්‍රියා 12 වන පරිච්ඡේදයට අනුව අප දන්නා කරුණක් නම් හෙරොත් රජතුමා විසින් යාකොබ්ව මරනු ලැබූ බවය. නමුත් අන් අයට කුමක් සිදුවීද?

ඇන්ඩෲ අද කාලේ හඳුන්වන තුර්කියට සහ ග්‍රීසියට ගිය අතර නැගෙනහිර යුරෝපයේ නිශ්චිතව දක්වා නොමැති ප්‍රදේශයක් වන " මිනී කන දේශයට" ගොස් හැකිතාක් යේසුස් වහන්සේ ගැන ප්‍රකාශ කළේය. අවසානයේ ඔහුගේ ගැළවුම්කාරයාණන් වහන්සේව කුරුසපත් කළා සේම ඔහුව ද කුරුසපත් කරන ලදී.

තෝමස් සිරියාවේ නැගෙනහිර ප්‍රදේශයට බොහෝ දුරට ඉන්දියාවේ අවසානය දක්වාම පැමිණියේය. යේසුස් වහන්සේව සැක කිරීම සම්බන්ධයෙන් ඔහු නිරන්තරයෙන්ම මතක් කරනු ලබන පුද්ගලයෙකි. ඔහුගේ ඉතිරි ජීවිත කාලෙ යේසුස් වහන්සේ උදෙසා සම්පූර්ණ කැප කිරීමක් කළේය. යේසුස් වහන්සේව දේශනා කිරීම හේතුවෙන් ඔහුව පිහියෙන් ඇණ මරණ ලදී.

පිලිප් උතුරු අප්‍රිකාවට ගිය අතර බොහෝ ජනතාවක් ඔහුගේ දේශනා කරන කොට ගෙන යේසුස් වහන්සේ වෙතට පැමිණි බව දැකිය හැක. පසුව සුළු ආසියාවට ඔහු ගිය අතර රෝම ආණ්ඩුකාරවරයාගේ භාර්යාව ශුභාරංචිය අසා යේසුස් වහන්සේව අනුගමනය කළාය. ඇගේ ස්වාමිපුරුෂයා විසින් පිලිප්ව මරණයට පත් කරන ලදී.

මතෙව් පර්සියාවට සහ ඉතියෝපියාවට ගියේය. ඔහුව ද ඝාතනය කරනු ලැබූ බවට විශ්වාස කළ හැකිය.

වර්තන මෙව් ආමේනියාව, ඉතියෝපියාව, ඉන්දියාව සහ දකුණු අරාබියේ විශ්වාසවන්තව ශුභාරංචි ප්‍රකාශ කිරීමෙන් අනතුරුව ඝාතනය කරන ලදී.
අල්පේවුස්ගේ පුත්‍ර වූ යාකොබ් සිරියාවට ගියේය.

ජොසිපස් නමැති යුදෙව් ඉතිහාසඥයාගේ වාර්තාවලට අනුව ඔහුව ගල් ගස, කොටු කර මරා දමන ලදී.

*යේසුස් වහන්සේ පිළිබඳව මුලින්ම දැනුමක් තිබූ, උන්වහන්සේව මාංසයෙන් දුටු අය එතරම් උද්‍යෝගිමත් වූවා නම්, අපිත් එසේ විය යුතු නොවේද?*

ජුවලිතයා වූ සීමොන් පර්සියාවේදී මරණයට පත්කරන්නට ඇත. සම්ප්‍රදාය පවසන්නේ ඔහුව දෙකට ඉරණම ලද බවයි.

මත්තියස් පුළුස්සා මරණ ලදී.

රෝමයේ උතුරන ලද තෙල් භාජනයකට හෙලන ලද යොහාන් ගැලවුණේය. නමුත් ඔහුව පත්මෝස් දිවයිනට පිටුවහල් කරන ලදී. ඔහු ස්වභාවික හේතුන් මත මරණයට පත්විය.

ක්‍රි.ව. 66 දී පමණ පේතෘස් සහ පාවුල් රෝමේදී ඝාතනය කරනු ලැබීය. එය නීරෝගේ පීඩා කිරීමේ කාලවකවානුවයි. පාවුල්ව හිස ගසා මරණ ලදී. පේතෘස්ව ඇණ ගසා මරා දැමීමට නියම විය. යේසුස් වහන්සේ මෙන් මරණයට පත්වීමට නුසුදුසු බැවින් ඔහුගේ ඉල්ලීම වූයේ උඩු යටි අතට ඇණ ගසන්න කියාය.

අප දන්නා වූ මනුෂ්‍යයන් ඔවුන්ය. යේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණය හෝ පෙන්තකොස්ත දවසේදී ගැළවීම ලැබූ තුන්දහස ගැන , දූසින් ගණන් ඇදහිලිවන්තයන් ගැනද කතා වස්තුව දන්නේ සදාකාලය පමණි. යේසුස් වහන්සේ ගැන පෙර දැනගන්නවත් තිබුණා වූ අය මාංශයෙන් සාක්ෂි දරුවා නම්, එසේ දිව්වා නම් අප ද එසේ කළ යුතු නොවේද?

යේසුස් වහන්සේට ප්‍රේම කිරීමට සහ උන්වහන්සේ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පමණක් යොමුවී මෙයින් අපව බැහැර කරන්නා වූ යමක් අපගේ ජීවිතය වේ නම් ඒවා අප ඉවතලමුද? මෙම පොතේ ඉදිරි කොටස් ඔබව උද්වේග කරනු ලබන්නේ සතවර්ෂ ගණනාවක් පුරාවට ඇදහිලිවතුන් ඉතිහාසය වෙනස් කිරීමේ කාර්යය උදෙසා ශුභාරංචිය වෙත දැක්වූ නොසෙල්වෙන්නාවූ යොමුව සහ එය අද ඔබ කුමක් අර්ථවත් කරන්නේද යන්නයි.

ලියනාඩෝ ඩාවින්ච් විසින් පින්තාරු කරනු ලැබූ අවසාන රාත්‍රී භෝජනය ඔබ දැක ඇති බව මා විශ්වාස කරමි. සැබෑ ජීවිතයේදී එය තරමක් දර්ශනීයයි. අඩි 23-35 අතර ප්‍රමාණයේ සිතුවම ඉතාලියේ මිලාන් හි , සැන්ටා මාරියා දෙලේ ග්‍රේසි කන්‍යාරාමය තුළ සම්පූර්ණ බිත්තියක් ආවරණය කරයි. ලියනාඩෝ ඩාවින්චිට ඔහුගේ විශිෂ්ට කෘතිය නිම කිරීමට වසර තුනක් ගත විය. ඔහු ගෝලයන් තුන් දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් වශයෙන් ක්‍රිස්තුස් වහන්සේගේ දෙපස කණ්ඩායම් දෙකක් ලෙස පින්තූර කළේය. යේසුස් වහන්සේ මැද වාඩිවිය. උන්වහන්සේගේ දෑත් ඔවුන් ඉදිරියේ දිගු විය. එක් අතකින් ඔහු ඇදහිය නොහැකි යථාර්ථවාදී වූ පින්තාරු කරන ලද මිදියුෂ වීදුරුවක් තබා ගත්තේය. ඒ ටිකක් සත්‍ය වූ දෙයකි. අවසාන වූ පසු ඩාවින්චිගේ මිතුරා ප්‍රකාශ කළේ ඔහුට පුදුමාකාර ලෙස එම වීදුරුව දෙසට ඔහුගේ දෑස් තබාගත නොහැකි වූ බවයි.

කතාවට අනුව ඩාවින්ච් ඔහුගේ තෙත තීන්ත බුරුසුව අතට ගෙන විනිසි වීදුරු හරහා ඒ ගසා දැමූ අතර එහි රැඳී සිටීමට ඔහු අකමැති විය. යේසුස් වහන්සේගේ සිතුවම දුටු අයගේ අවධානය වෙනතකට යොමු නොකළ යුතුය. යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ ශුභාරංචිය වඩා වැදගත් නමුත් ඩාවින්චිගේ මිතුරා මෙන් අපද ජීවිතයේ අවධානය වෙනතකට යොමු කිරීමට ඉඩ දෙන්නෙමු.

අපගේ හදවත නැමැති සිංහාසනයේ යේසුස් වහන්සේව තබා ගැනීම අපගේ ආශාවේ අවධානය සහ අපගේ ජීවිතය කැපවීම කෙතරම් තීරණාත්මක දැයි අපට ටිකෙන් ටික අමතක වෙයි. ක්‍රිස්තුස් වහන්සේ ගැන තිබෙන්නා වූ අපගේ පුදුමය සහ බය නැති වෙන්න පුළුවන්. ඇයි මේ? යේසුස් වහන්සේ දෙවියන් වහන්සේ නම් උන්වහන්සේ එසේම උන්වහන්සේ කෙරෙහි අපගේ සම්පූර්ණ අවධානය වළක්වන්නේ කුමක්ද?

මා සිතන්නේ බොහෝ දෙනෙක් "දෙවියන්" යන වචනය අසන විට ඔවුන්ට නිරූපණය වන්නේ ඒකාධිපතියෙකු ලෙසයි. අකීකරුකම නිසා කෙනෙකුට පහරදීමට, මැරීමට සූදානම්ව සිටින ආකාශයේ අධිපතියෙක් ගැනයි. දෙවියන් වහන්සේ යේසුස් වහන්සේය. සැබවින්ම, පවතින්නේ නම් උන්වහන්සේ දුරස්ථ , අඳුරු සහ භයානක අයෙක් බව ඔවුන් උපකල්පනය කරයි. ඔවුන් සිතන්නේ අවට ඇති නපුර නිසාවෙන් මෙම දෙවියන්ට අපගේ ලොව ග්‍රහණය කොට කළමනාකරණය කිරීමට නොහැකි බවයි.

එහෙත් මා ඔබට මතක් කරනුයේ සියල්ල යේසුස් වහන්සේ භවය. නමුත් මෙය උන්වහන්සේ දයානුකම්පාවෙන් , සත්‍යයෙන් , සමාව දීමෙන්, සම්පත්වෙන් සහ ප්‍රේමයෙන් පූර්ණය. එම දෙවියන් වහන්සේගේ ප්‍රේමය අල්ලා ගැනීමට සම්භාවීය ගීතිකාවක් උත්සාහ දරයි.

*"තීන්ත වලින් සාගරය පිරවීමට අපට හැකිද,*

*ආකාශයේ ලේඛන චර්මයකින් නිර්මාණය කළත්,*

*පොළොවේ සෑම නටුවක්ම පිහාටු කූරක් වුවත්,*

*සෑම මිනිසෙක්ම රැකියාවෙන් ලේඛකයෙකු වුවත්,*

*ඉහළ සිටින දෙවිඳුන්ගේ ප්‍රේමය ගැන ලියන්න,*

*මුළු සාගරේ වියළී ගියත්,*

*දියවැලට අඩංගු කළ නොහැකි මුත්,*

*ආකාශයෙන් ආකාශයට එය දිගහැරී යයි,"*

## ගැළවුම්කරුවෙක් සහ රජෙක්

යේසුස් වහන්සේ සැබවින්ම කවුරුන්ද යන්න නිර්වචනය කිරීමට ප්‍රමාණවත් ධනාත්මක විස්තර නොමැත. අප සෑම කෙනෙක්වම උන්වහන්සේ ගලවා ගත් ආකාරය, සෑම පුද්ගලයෙකුටම උන්වහන්සේ කොතරම් වටිනවාද? තවදුරටත් උන්වහන්සේ දිගටම අපගේ ජීවිතයේ සෑම අංශයක් තුළම සම්බන්ධ වී සිටින සේක. උන්වහන්සේගේ හාස්කම් බොහෝය. උන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය අනන්තය. අප නොසැලකිලිමත් වුවහොත් අපට උන්වහන්සේව හඳුනාගැනීමට හැකි වන්නේ බයිබලීය කතා වස්තූන් තුළින් වන අතර ඒවා අමතක කර උන්වහන්සේ කළ දේ හා උන්වහන්සේට කළ හැකි දේ හඳුනා ගැනීමක් පමණක්ම වේ. යොහාන් තුමා විසින් ලියන ලද මෙම පුදුමාකාර පදය ඔබ කවදා හෝ කියෙව්වාද?

*""යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ දේවල්ද ඇත්තේය, ඒවා එකින් එක ලියනලද්දේ නම්, ලියනු ලබන පොත් දරන්ට ලෝකයත් මදියයි සිතමි." - (යොහන් 21:25)*

යේසුස් වහන්සේගේ සැබෑ විස්තරය වූ ක්‍රියාවන් අප ජීවිත තුළ සහ මනුෂ්‍ය සංහතිය වෙනුවෙන් කළා වූ දේ පොතකට දැමිය මට නම් නොහැක. ඒවා මැනිය නොහැකි තරම්ය. ක්‍රිස්තුස් වහන්සේ සඳහා වන විශේෂණ , අංකනය කළ නොහැක. දේව වචනය යේසුස් වහන්සේව විස්තර වන ආකාර සියයකට වඩා ඇත. උන්වහන්සේ මුල්ගල , එඬේරෙක්, මිත්‍රයෙක්, ගුරුවරයෙක්, බැටළුවා, මාර්ගය හා ලෝකයේ ආලෝකය මින් සමහරෙකි. මේ සියලුම විස්තර අපට ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳව විචිත්‍රවත් පින්තූර පිංතාරු කරන අතර උන්වහන්සේගේ යහපත්කම සහ ශුභ පණිවිඩය ගැන බිඳක් ලබා දෙයි.

*යේසුස් වහන්සේ ඇත්තටම කවුද, උන්වහන්සේ සෑම පුද්ගලයෙකුටම කොතරම් වටිනවාද සහ උන්වහන්සේ අප සෑම කෙනෙකුම ගලවා ගන්නා ආකාරය නිර්වචනය කිරීමට ප්‍රමාණවත් ධනාත්මක විස්තර නොමැත.*

කෙසේ වෙතත් ශුභාරංචිය තේරුම් ගැනීමට අවශ්‍ය කරන්නාවූ වැදගත් ගුණාංග දෙකක් වෙත අවධානය යොමු කරමු. එය මෙම පොතෙහි ඉතිරි කොටසට අත්තිවාරමක් වනු ඇත.

පළමුව යේසුස් වහන්සේ ලෝකයේ ගැලවුම්කරුය. ඒ නිසයි උන්වහන්සේ පැමිණියේ. - " නැතිවූවන් සොයන්නත් ගළවන්ටත් "

*"මක්නිසද ස්වාමීවූ ක්‍රිස්තුස් නම් ගැළවුම්කාරයෙක් නුඹලාට දාවිත්ගේ නුවර අද උපන්සේක."*
*ලූක් 2:11*

එසේ කී දේ ඔබ අසන්නට ඇති. එය මෙසේ කියයි; යේසුස් වහන්සේ ගළවන සේක. ක්‍රිස්තුස්වහන්සේ පැමිණියේ කුමකින් අපව ගැළවීමටද? අපගේ පාපයෙන්. දේව වචනය පවසන්නේ පාපය අපව දෙවියන් වහන්සේගෙන් දැනුත් සදාකාලයටත් වෙන්කර ඇත යන්නය. ආත්මිකව මැදියම් රැයේ

නැතිවුණා වූ පුරුෂයන් සහ ස්ත්‍රීන් මෙන් අප සිටින්නෙමු. විශාල සාගරයක අන්ධකාරයේ පදවමින් කිසිදු බලාපොරොත්තුවක් නැතුව ගිලෙමින් සියල්ල අපගේ පාපය සහ දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ නීතියට අකීකරු වීම, අප ජීවත් විය යුතු ආකාරය පිළිබඳව අපේක්ෂාවන් නිසාය. එහෙත් මෙම හිස්කම මැද යේසුස් වහන්සේ අපව ගලවා ගැනීමට පැමිණි සේක. උන්වහන්සේ අපේ ජීවනාලියයි. අපගේ ජීවන ඔරුවයි. අපගේ ගැලවුම්කරුවාණන් වහන්සේයි. උන්වහන්සේව යමෙක් පිළිගෙන එම ඇදහිල්ල ග්‍රහණය කරගෙන ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරන්නේද ඔහු විනාශ නොවී සදාකාල ජීවනය ලබාගන්නවා ඇත. මේ සම්බන්ධ බොහෝ ඇතත් කෙටියෙන්.

දෙවනුව යේසුස් වහන්සේ පොළවේ රජය. යොහාන් බෞතීස්ත උන්වහන්සේගේ මාර්ගය පිළියෙළ කරමින් දේවරාජ්‍යය ළඟ යැයි ප්‍රකාශ කළේය. රජුන්ගේ රජතුමා නම් වන යේසුස් වහන්සේ වැඩිය සේක.

යේසුස් වහන්සේ ගිය සෑම තැනකම උන්වහන්සේ දේශනා කළාද එතන දේව රාජ්‍යය විය. ඇයි? රජතුමා කොතනද ? එතන රාජ්‍යය වේ. යේසුස් වහන්සේගේ රාජ්‍යය මුළුමනින්ම අනෙක් ඒවාට වඩා ප්‍රතිවිරුද්ධය. කිසි කලෙකත් නොඇසූ හෝ නොදැක්කා මෙන් නොව එය අසාමාන්‍ය , අද්විතීය රැස් විහිදීමකි. යේසුස් වහන්සේ නිතරම අවධාරණය කළේ උන්වහන්සේගේ රාජ්‍ය හා ලෝකයේ රාජ්‍ය අතර තිබෙන අසමානතාවය නිසා යමෙකුට එහි කොටස්කාරයෙකු වීමට හැක්කේ කෙසේද යන්නයි.

ස්විට්සර්ලන්තයේදී මා ජර්මානු භාෂාව හදාරන අඥෙයවාදි පුද්ගලයෙක් විය. එක් පන්තියකට පසුව දිවා ආහාරය සඳහා මා සමඟ එකතු වන ලෙස ඔහුගෙන් ඉල්ලීමි. මට එක අරමුණක් විය. මගේ වීරයා කවුදැයි ඔහු හඳුනා ගැනීම මට අවශ්‍ය වූ අතර උන්වහන්සේගේ අනුගාමිකයෙකු බවට ඔහු පත් විය යුතුය යන්නයි. ඔහුත් සමඟ මා ශුභාරංචිය බෙදාගතිමි. සාකච්ඡාව ආරම්භයේදීම ඔහු මා නවත්වා කියනුයේ මා යේසුස් වහන්සේව රජ ලෙස ඇමතීම ගැන ඔහු අකමැති බවය. මෙම වචන අසන විට ඔහු සිතුවා වූ රූප ගැන ඔහු අකමැති විය.

එමෙන්ම එය මට තේරුම් ගියේය. බොහෝ මනුෂ්‍යයන් යේසුස් වහන්සේව "රජෙක්" ලෙස දැකීමට අකමැතිය. "දෙවියන්" යන වචනය ආකාරයටම එයද එසේම විය. කාගේ හෝ මනස තුළ ආඥාදායකයෙකු යන අදහස පින්තාරු විය හැක. සිංහාරූඪව සිටින්නා වූ පුද්ගලයා සාමාන්‍ය මනුෂ්‍යයන්ගෙන් බොහෝ ඈතව සිටි. එපා කිරීම, කේන්තිය, පළිගැනීම, - අහංකාර, කෲර, දුෂ්ට පාලකයෙක්. ඔහුට කිසි ප්‍රශ්නයක් නැත. ඔහුට විරුද්ධ වන්නා වූ යමෙක් ඇද්ද ඔහුට විරුද්ධව තම බලය පාවිච්චි කරමින් විනාශ කිරීමට තරම් ඔහු නම්‍යශීලී වෙයි. අර්ථ විරහිත නාමික පාලකයන්ගේ ප්‍රතිබිම්බය වියවුල් කරයි. ඉතිහාසයේ සිට පැවතුණා වූ තිලයක් දැන් තවදුරටත් එය බල රහිත.

යේසුස් රජ මේ ආකාර නොවේ. උන්වහන්සේ පරිපූර්ණ, ධර්මිෂ්ට සහ ජයග්‍රාහී වන පාලනයේ පරමාධිපත්‍ය දරන කිසිදු සැබෑ බලයට ආදරය කරන රජෙකු තවදුරටත් ක්‍රියාත්මක නොකරනු ඇත. උන්වහන්සේගේ රාජ්‍යය මෙලොවෙන් නොවේ.එය ප්‍රේමය සහ ජීවිතයට බලාපොරොත්තුව ගෙන එයි. මුල් සභාවේ සිට ශතවර්ෂ ගණනාවක් ම පුනරාවර්තන තේමාවක් , තවත් පැමිණෙන්නට තිබෙන්නා වූ යේසුස් වහන්සේ ලෝකයේ රජ ලෙස ප්‍රකාශ කිරීමයි.

යේසුස් වහන්සේ ලෝකයේ රජු බවට කරන නිවේදනය මුල් සභාව පුරා සහ ඉදිරි සියවස් ගණනාවක් පුරා ඔවුන්ට පුනරාවර්තනය වනු ඇත. අයිසැක් වොට්ස් 1719 නත්තල් ගීතයක් නිර්මාණය කලා. ' හිමි ක්‍රිස්තුස් වැඩියේය' විධානන් වහන්සේ පැමිණ ඇත; පොළොවට ඇගේ රජුව පිළිගන්න ඉඩ දෙන්න,' තෙසලෝනිකයේ කෝපාවිෂ්ට මැර පිරිසක් යාසොන් නම් පුද්ගලයාගේ නිවෙසට පැමිණියහ. ඔවුන් එහි සිටියේ නත්තල් භක්ති ගීත ගායනා කිරීමට නොව යාසොන්ගේ ආරාධිතයන් වන පාවුල් සහ සීලස් අත්අඩංගුවට ගැනීමටය. ඔවුන් පසුගිය දින තුනම ගත කළේ යේසුස් රජ ගැන මනුෂ්‍යයන්ට පැවසීමටය. ජර්මානු පන්තියේ මාගේ මිතුරා මෙන් ඔවුන් යේසුස් ගැලවුම්කරුවෙකු සහ රජෙක් කියන කතාවට කැමති වූයේ නැත. මැර පිරිස කෑගැසූ ආකාරය බලන්න:

*"නුමුත් ඔව්හු ඔවුන් සොයා නොදැක, යාසොන් සහ සමහර සහෝදරයන්ද නුවර මූලාදෑනීන් ළඟට ඇදගන ගොස්: ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති;යාසොන් ඔවුන් පිළිගත්තේය. මොවුන් සියල්ලෝද යේසුස් නම් අන් රජෙක් ඇතැයි කියා කායිසර්ගේ නියෝගවලට විරුද්ධව ක්‍රියාකරතියි මොරගසා කියමින්," ක්‍රියා 17:6-7*

මාගේ කතිකාව ජර්මානු මිතුරා සමග දිගටම කළෙමි. ඔහුගේ කාරණය මා සැලකූ බව ඔහුට කීවෙමි. යේසුස් වහන්සේ රජ ලෙස විස්තර කරනුයේ මන්දැයි ඔහුට පැහැදිලි කළෙමි. උන්වහන්සේට

ගරු සරු ලෙස මා හිටගත්තේ මන්දැයි සහ උන්වහන්සේ පොළොවට පැමිණි කාරණය කීවෙමි. අපගේ දිවා ආහාරය අවසන් වූ පසු ඔහු මාගේ ඇස් දෙක දෙස බලා කීවා, "මට බයිබලයක් අවශ්‍යයි. මට යේසුස් වහන්සේව දැනගන්න ඕනේ. යේසුස් වහන්සේ ගැන තවදුරටත් මට ඉගැන්විය හැකිද?" මා එසේ කළා. ශුභාරංචිය ප්‍රකාශ කරනු ලැබුවා. ගෝලයන්ගේ ගමන ආරම්භ වුණා.

## කායිසර්, යේසුස් සහ සුබ පණිවිඩය

බොහෝ යේසුස් වහන්සේගේ ගෝලයන්ට පිළිතුරු දීමට දුෂ්කර වූ මට ඔබෙන් ඇසීමට මූලික ප්‍රශ්නයක් ඇත. එම ප්‍රශ්නය ඔබව පුදුමයට පත් කරවනු ඇත. ඔබ සූදානම්ද? මෙන්න අපි යනවා .....

ශුභාරංචිය යනු කුමක්ද?

පෙර කොටසේදී මා ඔබට ඉඟියක් දුනිමි. නමුත් මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම තවමත් වියවුල් සහිත නම් මේ ඔබට උපකාර කරනු ඇත.

*ශුභාරංචිය නම් යේසුස් ජීවත් වී මිය ගිය බව නොව, ඔහු මිය ගොස් ජීවත් වූ බවයි!*

යේසුස් වහන්සේ උපත ලැබුවා වූ සංස්කෘතියට මාත් සමග ආපසු එන්න. ක්‍රි.පූ 31 වන අවුරුද්ද. වචනය " euangelion " ග්‍රීක් භාෂාවෙන් ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය වන්නේ " ශුභාරංචිය" හෝ " සුභ පණිවිඩය " අධිරාජ්‍යය පුරා ජනප්‍රිය වචනයයි. මේ දී ජුලියට් සීසර් ඝාතනය කර වසර 12 ගත වී ඇත. ජුලියට් සීසර් සුවිශේෂී වූයේ ඔහු රෝම අධිරාජ්‍යයේ පාලකයා ලෙස ස්ථානගත වීම නිසාය. නමුත් ඔහුගේ ජීවිතය කෙටි කරනු ලැබීය.

දැන් බටහිර ග්‍රීසියේ වෙරළට ඔබ්බෙන් මර්ක් ඇන්තනී සහ ක්ලියෝපැට්‍රාගේ හමුදා බලකායත්, ඇක්ටියුම් සටනේදී ඔක්ටේවියන් සහ ඔහුගේ මිනිසුන්ට විරුද්ධව සටන් වැද ඇත. ජයග්‍රාහකයා අධිරාජ්‍ය එකම පාලකයා බවට පත්වනු ඇත. පැය 24කට අඩු කාලයකදී ඔක්ටේවියන් නාවික හමුදාව මාර්ක් ඇන්තනී සහ ක්ලියෝපැට්‍රාගේ නාවික හමුදාව පරාජය කරයි. euangelion! ඔක්ටේවියන් සටනෙන් ජයගත්තේය.

ඔක්ටේවියන්ගේ පාර්ශවයේ සිටි අයට මේ සත්‍ය වශයෙන්ම යහපත් ආරංචියක් විය. මෙම නව පාලකයාට සේවය කිරීමේ ප්‍රතිලාභ ඔවුන් නෙළා ගනු ඇත. ඔහුගේ අධිරාජ්‍යයට ඔවුන් කළ දායකත්වය සඳහා ත්‍යාග ලබාගෙන ජීවත් වනු ඇත. කෙසේ වෙතත් ඔක්ටේවියන් සඳහා  නොවන අයට තීරණයක් ගැනීමට අවශ්‍ය විය. එසේ නොමැතිනම් මාර්ක් ඇන්තනීගේ සහ ක්ලියෝපැට්රාගේ පැත්තේ සිටීමේ ප්‍රතිඵල වලට මුහුණ දීමට සිදුවේ.

අවසානයේදී ඊළඟ දශක කිහිපය තුළ euangelion "ශුභාරංචිය" හෝ "සුභ පණිවිඩය" නව පාලකයකු සහ ඔහුගේ ජයග්‍රහණය ප්‍රකාශ කිරීමට පමණක් නොව පාලකයාගේ ජීවිතය සහ රෝම අධිරාජයේ ජීවත්වන අයට එයින් අදහස් කරන සියල්ල සැමරීමටද භාවිතා කරනු ඇත. පසුව ඔහුගේ නම සීසර් ඔගස්ටස් ලෙස වෙනස් කළ ඔක්ටේවියන් සඳහා ඔහුගේ ජයග්‍රහණය රෝම අධිරාජ්‍යයට ගැලවුම්කරුවකු සම්බන්ධ වූ සෑම කෙනෙකුටම නව ජීවිතයක් සංකේතවත් කරයි. ඔහු හරහා යුද්ධය අවසන් කිරීම සහ සාමය ස්ථාපිත කිරීම ඔහුගේ ජීවිතය සහ ඔහු මේ පොළොවට තියෙනා දේ සමරමින් අධිරාජ්‍ය පුරා ස්මාරක ඉදි කරන ලදී.

ඉතින්, මෙයට යේසුස් වහන්සේ සමඟ ඇති සම්බන්ධය කුමක්ද? ඔබ ඇසීම ගැන මට සතුටුයි.

ඊශ්‍රායල් හි ජීවත් වූ යුදෙව්වන් කායිසර් ඔගස්ටස් තුළින් යම් සහනයක් ලබා ගත්හ. ජයග්‍රහණය; මෙය සැබැවින්ම ඔවුන්ට විශේෂිත ශුභාරංචිය නොවීය. කායිසර් ඔගස්ටස්ගේ පාලනය යටතේ ඔවුන්ව තෙරපීමට ලක් කරනු ඇත. නමුත් ශුද්ධ ලියවිලි වල කියවා ඇති සැබෑ රජු පැමිණ ඔවුන්ව ගලවා ගන්නා ලෙස වඩාත් උද්යෝගයෙන් යාච්ඤා  කරති.

ඉන්පසු යේසුස් උත්පත්තිය ලැබූහ.

*"තවද ඒ දවස්වලදී මුළු ලෝකයාගේ ලේඛනයක් සෑදීමට කායිසර් අගොස්තුස් කෙරෙන් නියෝගයක් නිකුත්ව ගියේය." - ලූක් 2:1*

එවැනි කාලයක ඇයි යේසුස් වහන්සේ උපත ලැබුවේ කියා ඔබ කවදා හෝ කල්පනා කරනු ලැබුවේද? ඇයි අවුරුදු තුන්සීය අවුරුදු පන්සිය හෝ අවුරුදු දාහට පසු හෝ පෙර සිදු නොවුණේ? උන්වහන්සේගේ උත්පත්තියේ කාලවකවානුව අහම්බෙන් නොවේ. එය දෙවියන් වහන්සේගේ සැලැස්මේ කොටසකි. දෙවියන් වහන්සේ විසින් හිතාමතාම තෝරා ගනු ලැබූවකි. මෙම ආකර්ෂණීය පදය දෙස බලන්න.

*"නුමුත් කාලය සම්පූර්ණවූ කල, දෙවියන්වහන්සේ ස්ත්‍රියෙකුගෙන් උපන්නාවූද ව්‍යවස්ථාව යටතේ උපන්නාවූද තමන් පුත්‍රයාණන්වහන්සේ එවූසේක." - ගලාති 4:4*

යේසුස් වහන්සේ උපක්‍රමශීලීව ලෝක ඉතිහාස වේදිකාවට පිවිසියේ යම් හේතුවක් නිසාවෙනි. පැරණි ගිවිසුමේ අනාවැකි රෝම අධිරාජ්‍යය වටා යුදෙව්වන් විසිරියාම, රෝම මංමාවත් සහ තවත් බොහෝ සාධක නිසැකවම කාර්ය භාරයක් ඉටු කළේය. කෙසේ වෙතත් ක්‍රි.පූ. 31 දී සීසර් ඔගස්ටස්ගේ ජයග්‍රහණයටද එක් හේතුවක් ඍජුව සම්බන්ධ වන්නට ඇත. euangelion යන ජනප්‍රිය අදහස , මෙම ඝෝෂාකාරී වචනය තවමත් සෑම කෙනෙකුගේම තොල්පෙති මත විය. ඔවුන් එහි අර්ථය නිවැරදිව තේරුම් ගත්හ. නව රජෙකු සිටි අතර නව ජීවන රටාවක් ඇරඹිනි. අවසන් රජු ඔහුගේ ජයග්‍රහණය සඳහා වේදිකාව මනාව සකසා තිබුණි. ඔහුගේ කතාව ඉතිහාසය නිර්මාණය කළ යුතුය.

පාවුල් ඔහුගේ ලිපිවල ශුභාරංචිය ගැන දළ වශයෙන් හැට හය වතාවක් සඳහන් කරයි. නමුත් ඔහු කතා කරන්නේ කුමක්ද යන්න නිර්වචනය කිරීමට කිසිවිටකත් අවශ්‍ය නොවීය. ඔවුන් දැන සිටියහ. euangelion යේසුස් ජයගත්තා!

ශුභාරංචිය යන මෙම වචනය එදා සිට අද දක්වා යේසුස් වහන්සේගේ අනුගාමිකයන් උන්වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කිරීමට භාවිතා කරති.

එසේනම් නැවතත් මම ඔබගෙන් ප්‍රශ්නය අසන්නම්: ශුභාරංචිය යනු කුමක්ද?

තේරුම් ගැනීමට සහ සන්නිවේදනය කිරීමට පැහැදිලි කරන පිණිස ශුභාරංචිය දෙකට බෙදීමට මා කැමති වෙමි. මෙම කරුණු දෙක මතක තබාගන්න. ඒවා ඉතාමත්ම වැදගත්ය. 14 වන පරිච්ඡේදයේ පණිවිඩය බෙදාගන්නේ කෙසේදැයි ඔබ වඩා ඉගෙන ගනිවී.

පළමුව ශුභාරංචිය නම් යේසුස් වහන්සේය. සරල වශයෙන් කිවහොත් යේසුස් වහන්සේ ශුභාරංචියයි. උන්වහන්සේ ගැන සියලු කාරණා කතා කිරීම වටින්නේය. මම නැවත කියන්නම් ඔබ යේසුස් වහන්සේ ගැන කතා කරන විට ඔබ ශුභාරංචිය බෙදා ගන්නේය. මෙයට යේසුස් වහන්සේ සම්බන්ධ සියලු කාරණා අඩංගුය. උන්වහන්සේගේ උත්පත්තියේ සිට ජීවිතය, ඉගැන්වීම, මරණය, උත්ථානය, උන්වහන්සේගේ ස්වර්ගීය පාලනය සහ ඒ අතරතුර සියල්ල.

මනුෂ්‍යයන් ශුභාරංචිය බෙදා ගැනීම නොකිරීම සම්බන්ධව බොහෝවිට පවසන පොදු කාරණය නම් ආරම්භ කරන්නේ කොතනින්ද යන්න අස්ථිරත්වයයි. මෙන්න එයට රුකුලක්; යේසුස් වහන්සේ කවුද යන්න කතා කරන්න පටන් ගන්න. යේසුස් වහන්සේ කළ දෙයක් ගැන, කරන්ට යන්නා වූ හෝ කිව්වා වූ දෙයක්. උන්වහන්සේගේ කතා වස්තුවේ ඕනෑම කොටසකට කිඳා බසින්න. එය සම්බන්ධව කතා කරන්න. යේසුස් වහන්සේ ගැන බෙදා ගැනීම ශුභාරංචියයි. පාවුල් තුමා නිශ්චිත වශයෙන්ම මේ දේ කළේය.

1 කොරෙන්ති 15:1-5 දක්වා කොරින්තිය ඇදහිලිවතුන්ට ඔහු ලියූ දේ බලන්න.

*"තවද, සහෝදරයෙනි, මම නුඹලාට දේශනාකළාවූ, නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙවුවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි. මා නුඹලාට ප්‍රකාශකළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහු නම්, කුමන වචනවලින් එය නුඹලාට දේශනාකෙළෙම්දැයි දන්වමි. නැත්නම් නුඹලා නිෂ්ඵලලෙස ඇදහුවහුය. ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගුටුවනු ලැබූ බවත්, කේපස්ටද පසුව දොළොස්දෙනාටද පෙනුණු බවත්ය."*

යේසුස් වහන්සේ. උන්වහන්සේ ශුභාරංචියයි.

ශුභාරංචිය දෙවන කොටස ඉතාම සරලය. යේසුස් වහන්සේ නිවාඩුවක් ගත කිරීමට පොළොවට ආවා නොව උන්වහන්සේ පැමිණුනේ දූතන මෙහෙයක් උදෙසාය. රජුන්ගේ රජ වෙන යේසුස් සදා කාලයටම පාපයේ සිටින්නා අයවලුන් සොයා ගැලවීම පිණිසය. එයට සියලු දෙනාම අයිතිය. උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල තබන සියලු දෙනාම ගැලවීම ලබන්නෝය. යේසුස් වහන්සේ එය පැහැදිලිවම කළ සේක.

*"මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සෑමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එවුවේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණකොටගෙන ගළවනු ලබන පිණිසය." - යොහන් 3:16-17*

යේසුස් වහන්සේ ස්වර්ග රෝහණයෙන් වසර කිහිපයකට පසු පාවුල් තිමතිට මෙසේ ලියයි:

*"පව්කාරයන් ගළවන්ට ක්‍රිස්තුස් යේසුස්වහන්සේ ලෝකයට ආසේක යන කීම විශ්වාසවූ සර්ව ප්‍රකාරයෙන් පිළිගත යුතුවූ කීමක්ය; ඔවුන් අතුරෙන් මම ප්‍රධාන පව්කාරයාය. "*

*-1 තිමෝති 1:15*

ප්‍රථම අප සාකච්ඡා කළා සේ යේසුස් වහන්සේගේ දූතන මෙහෙවර වන්නේ අපව ගැලවීමයි. යේසුස් වහන්සේගේ සහ උන්වහන්සේගේ දූතන මෙහෙවර සම්පූර්ණ ශුභාරංචියයි. එය සරලයි.

යේසුස් වහන්සේගේ ජීවිතය සහ මරණය තුළින් ( රුධිරය ),සොහොනෙහි තැන්පත් කිරීම සහ උත්ථානය මනුෂ්‍ය සංහතියට සමාව ලබා ගැනීමට අවස්ථාවක් ඇත. එසේම උන්වහන්සේගේ සදාකාලිකත්වය පොළොවේ සහ සදාකාලික රාජ්‍යයට උන්වහන්සේ තුළ ඇදහිල්ල තැබීමෙන් කොටස්කරුවකු විය හැක.

මෙම සර්ව සම්පූර්ණ ප්‍රකාශයන් සදාකාලික බලය සහ අවස්ථාවන්ගෙන් පිරී ඇත.

තවත් අයුරකින් සුභ ආරංචිය පැවසීමට නම් යේසුස් වහන්සේ ජීවත්වී මැරුණා යනු ශුභාරංචිය නොවේ. නමුත් උන්වහන්සේ මැරී උත්ථාන වූ සේක. මනුෂ්‍ය සංහතියට ඇති ප්‍රේමයෙන් උන්වහන්සේ අපව ගලවා පාපයෙන් ජයගත් සේක. එහි ප්‍රතිඵලයක් ලෙස අපට සදාකාලික මරණයෙන් ගැලවී, සදාකාලික ජීවිතය ලබා ගැනීමටත් හැකි වේ. අප සුවපත් වී නිදහස් වනු ඇත.

"සුභාරංචි වූයේ සහ වන්නේ" දේව ධර්මාචාර්ය එන්.ටී.රයිට්ස් පවසන ආකාරයට , "සියල්ල සිදුවුණේ යේසුස් වහන්සේ හා උන්වහන්සේ තුළින්ය. එය යම් දිනකදී සම්පූර්ණයෙන්ම සහ මුළුමනින්ම සිදුවේ. මැවිල්ලේ සියල්ල සහ මනුෂ්‍යයන් වන අපි, අපි කවුරුවත් කම් නැත. එම පරිවර්තනයට මෙතන සහ දැන් හසු විය හැක."

උන්වහන්සේව මුණගැසුණාවූ අය විප්ලවීය ආකාරයට වෙනස් වන්නේ මෙම ප්‍රේමණීය රජතුමා සහ උද්වේගය ඒ අයුරින්ම අන් අය අත්දකින පිණිසය.

සදාකාලික තෝරාගැනීම් දෙකක් ඇත. ඔබත් මාත් ඇතුළුව සෑම පුද්ගලයෙකුම අනුගමනය කිරීමට තෝරාගත යුතුය. එක තෝරා ගැනීමක් නම් මෙම ලෝකයේ පරාජිත රාජධානියට කැපවීමෙන් සිටීම, නපුර සහ පාපයෙන් පිරි දෙවියන් වහන්සේගෙන් තොර වූ නිරයට නායකත්වය දීම. ඊළඟ කරුණ නම් ප්‍රේමයෙන්, නිදහසෙන් සහ බලාපොරොත්තුවෙන් පිරි යේසුස් වහන්සේ සහ උන්වහන්සේගේ රාජ්‍ය කෙරෙහි දැන් සහ සදාකාලයට ජීවිතය පූජා කිරීමය.

මෙම කරුණු දෙක අතරේ සෑම පුද්ගලයෙක්ම ඉතා බරපතළ තෝරා ගැනීමකට මුහුණ දී සිටිති.

# රජෙකුට ප්‍රතිචාර දැක්වීම

2002 වසරේ, වළාකුළු පිරි සෙනසුරාදා සවසක මම ටෙක්සාස් ක්‍රීඩාංගනයේ මගේ ආසනයේ සිට පිට්ටනිය දෙස බැලුවෙමි. මම බිලිග්‍රහම්ගේ ශුභාරංචි පණිවිඩයක ඉදිරිපත් කිරීමක් අසා සිටි අසූ දෙදාහක් සෙනඟ පැමිණ

*"ශුභාරංචිය සහය දිවීමේ තරඟයක යෂ්ඨියට සමානයි."*

සිටි අය අතර එක් අයෙකි. ඔහු තම පණිවිඩය අවසන් කරන විට ග්‍රැහැම් ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීමට පළමුවරට තීරණයක් ගැනීමට කැමති සියල්ලන් හට වේදිකාවට පැමිණෙන ලෙස ආරාධනා කළේය. දහස් ගණනක් ඉදිරිපත් විය.

සෙනගගේ චලනය නොකියූ මතක් කිරීමක් විය. ශුභාරංචියට ප්‍රතිචාරයක් අවශ්‍යය. පළමුව රජතුමාට පක්ෂපාතීත්වය සහ පසුව බලාපොරොත්තුවක්. එය මට පරණ ගිවිසුම් කතාවක් මතක් කරයි. ප්‍රොපේතයේ යෙසායා දුටු දර්ශනය වන යේසුස් වහන්සේ සිංහාසනා රූඪව සිටීම. යෙසායාගේ ප්‍රතිචාරය වූයේ අද අපගේ කැඳවීම කුමක්ද? ඒ දේමය. පරීක්ෂා කර බලන්නः

> *"උස්සියා රජු නැසුණු අවුරුද්දේදී ස්වාමීන්වහන්සේ උස්වූ උසස්වූ සිංහාසනයක වැඩ හිඳිනවා දුටිමි. උන්වහන්සේගේ වස්ත්‍ර කෙළවරින් මාළිගාව පිරී තිබුණේය. උන්වහන්සේ අවටින් සෙරාප්වරු සිටියෝය. එක් එක්කෙනාට පියාපත් හය බැගින් තිබුණේය; දෙකකින් මුහුණ වසාගත්තේය, දෙකකින් පාද වසාගත්තේය, දෙකකින් පියාසර කෙළේය.ඔව්හු එක්කෙනෙක් අනිකෙකුට මොරගසමින්:*
>
> *"සේනාවල ස්වාමීන්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය, මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේයයි කීවෝය."*
>
> *"එවිට මොරගැසූ තැනැත්තාගේ හඬට එළිපත්වල අත්තිවාරම් සෙලවුණේය, ගෘහයද දුමෙන් පිරුණේය."*
>
> *"එවිට මම කථාකොටः අහෝ! මට දුක්වේ! මක්නිසාද මට විනාශය විය; කුමක් හෙයින්ද අපවිත්‍ර තොල් ඇති මනුෂ්‍යයෙක්ව සිටින්නාවූ, අපවිත්‍ර තොල් ඇති සෙනගක් අතරේ වසන්නාවූ මම සේනාවල ස්වාමිවූ රජ්ජුරුවන්වහන්සේ මාගේ ඇස්වලින් දුටුවෙමියි කීමි." - යෙසායා 6:1-5*

යෙසායාගේ ක්ෂණික ප්‍රතිචාරය වූයේ දයාව බලාපොරොත්තුවෙන් සහ රජු කෙරෙහි ඇති ගරු බියෙන් දණින් වැටීමය. ඔහුගේ ජීවිතය සම්පූර්ණයෙන්ම රජුගේ දයාව හා පාලනය තුළ තබා ඇත. ඔහුගේ පාපය ඔහු දුටු අතර රජුට එරෙහිව කැරලි ගැසීම සම්බන්ධව සමාව ගැනීම අවශ්‍ය විය. රජුන්ගේ ශුද්ධ කමෙන් දේවදූතයන් ඔවුන්ගේ මුහුණ මුවා කොට වසාගත්හ.

එළිදරව් පොතේ ඊට සමානවම උත්තානවූ යේසුස් වහන්සේ ස්වර්ගයේදී දකින කල ඔහුගේ ප්‍රතිචාරය යෙසායාගේ ප්‍රතිචාරය පිළිබිඹු කරයි.

> *"මම උන්වහන්සේ දුටු විට මළ කෙනෙකු මෙන් උන්වහන්සේගේ පාමුල වැටුණෙමි. එවිට උන්වහන්සේ තමන් දකුණත මා පිට තබා කියනසේක්: භය නොවන්න; මම පළමුවෙනියා සහ අන්තිමයාය, ජීවමානවූ තැනැත්තාය; මම මැරුණෙමි, නුමුත් බලව, මම දැන් සදාකාලේටම ජීවත්ව සිටිමි, මරණයේද පාතාලයේද යතුරු මට ඇත්තේය." - එළිදරව් 1:17-18*

යෙසායා සහ යොහාන් මෙන් ශුභාරංචියට අපගේ ප්‍රතිචාරය විය යුත්තේ රජ වූ යේසුස් වහන්සේට අපගේ ජීවිත උසස් භක්තියෙන්, නමස්කාරයෙන් හා කීකරුකමෙන් සම්පූර්ණයෙන්ම දීමය. අපි තවදුරටත් මේ ලෝකේ දෙවිවරුන් උදෙසා ජීවත් නොවෙමු. නමුත් මුළු හදින්ම උන්වහන්සේට කැපවී සිටින බොහෝ ඇදහිලිවන්තයන් මේ මොහොතේ නතර වී සිටින මම දැක ඇත්තෙමි. නමුත් බලාපොරොත්තු වෙන දේ බොහෝය.

## යන්න සහ කියන්න

මාර්ක් ඇන්තනීගේ පාර්ශ්වකරුවෝ සීසර් ඔගස්ටස්ගේ ජයග්‍රහණයට සුබ පතා ඔහුගේ රජකමට කිසිවිටකත් යටත් නොවුනේ නම් ඔවුන් වැඩි කාලයක් ජීවත් වනු ඇත.

මූලික නමස්කාරය හා ප්‍රශංසාව ප්‍රමාණවත් නොවේ. තවත් අවශ්‍ය වේ. අපෙන් බලාපොරොත්තු වන්නේ යේසුස් වහන්සේගේ ගෝලයෙකු වීම, උන්වහන්සේ ඉගැන්වූ සෑම දේකටම අනුගාමිකයන් වීම පමණක් නොව උන්වහන්සේගේ ජයග්‍රහණය, උන්වහන්සේගේ ශුභාරංචිය ගැන අන් අයටද පැවසීමය.

බයිබලය පුරාවටම සිදුවූයේ මෙයයි. නැවත යොහාන්ව ආදර්ශයට ගන්න. ඔහු යේසුස් වහන්සේ සිංහාසනා රූඪව සිටීම දැක අපට පවසයි.එම පණිවිඩය ලබා ගැනීමට මුළු එළිදරව් පොතම ඔහුගේ ප්‍රතිචාරය කරගෙන ඇත. එසේ නම් යෙසායා ගැන කුමක් කිව හැකිද? ඔහු නමස්කාර කර ඔහුගේ පාපයට සමාව ලබාගත් කල කුමක් සිදුවන්නේද:

*"එවිට: මම කවරෙකු යවම්ද? අප උදෙසා යන්නේ කවුදැයි කියන්නා වූ ස්වාමීන්වහන්සේගේ හඬ මට ඇසුණේය.*

*"මමද: මෙන්න මම මෙහිය; මා යැවුව මැනවයි කීමි."*

*"උන්වහන්සේ: නුඹ ගොස් මේ සෙනඟට කථාකොට...." - යෙසායා 6:8-9*

යේසුස් වහන්සේගේ කුරුසියේ ජයග්‍රහණයෙන් පසු සහ උන්වහන්සේගේ උත්ථානයෙන් පසු ඔලිව් කඳු මුදුනේ උන්වහන්සේගේ ගෝලයන්ව එකතු කළ සේක. මෙය උන්වහන්සේගේ අවසාන වැකි විය හැක:

*"උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරන්න. අදහාගන්නාවූ බව්තීස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථාකරන්නෝය; සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක.*

*මෙසේ ස්වාමිවූ යේසුස්වහන්සේ ඔවුන්ට කථාකළ පසු, ස්වර්ගයට ඔසවාගනු ලැබ, දෙවියන්වහන්සේගේ දකුණු පැත්තෙහි වාඩිවූසේක. ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. ආමෙන්." මාර්ක් 16:15-20*

යේසුස් වහන්සේගේ සමහර අවසන් වැකි මොනවාද? යන්න සහ පවසන්න. සැබැවින්ම, ඔවුන් කලේ ඒ දෙයයි.

උන්වහන්සේ එසේ නම් නැවත එන්නේ කවදාද? සියලු ජාතීන්ට සාක්ෂිය ලෙස මෙම රාජ්‍යය ශුභාරංචිය මුළු ලෝකයටම දේශනා කිරීමෙන් පසුවය.

## ශුභාරංචියේ යෂ්ඨිය

ඔබ යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු පසු ඔබව සහය දිවීමේ ධාවන තරගයකට ඇතුළත් කර ඇති බව ඔබ දැනගෙන සිටියේද?

ඔලිම්පික් ක්‍රීඩා උළෙලේ මාගේ ප්‍රියතම වන්නේ සහය දිවීමයි. ධාවකයා හතරෙන් එකක් ධාවන පථයේ වේගයෙන් දුවයි. එතැනදී ඔහුට ඔහුගේ කණ්ඩායමේ ධාවකයෙක් හමු වෙයි. තරගයේ ඔහුගේ පාදය අවසන් වූ විට ඔහු අමාරු කලාපයට ඇතුළු වන අතර එහිදී ඔහු ඊළඟ ධාවකයාට යෂ්ඨිය ලබා දෙයි. අවසාන ධාවකයා යෂ්ඨිය අතැතිව අවසාන රේඛාව පසු කරන තෙක් සෑම ධාවකයෙකුම තරගයේ ඔහුගේ කොටස සම්පූර්ණ කිරීමත් සමඟම මෙම යෂ්ඨිය ගමන් කිරීම දිගටම සිදුවේ. එය ක්‍රීඩාවේ විශේෂිත කණ්ඩායම් ජයග්‍රහණ වලින් එකකි.

නැසී ගිය රයින් හාඩ් බොංකේ ධර්මදූත ප්‍රචාරක තෙම මෙසේ ලිව්වේය, " ශුභාරංචිය සහය දිවීමේ තරගයක යෂ්ඨියයි." ඇයි? මා ඔබට පැහැදිලි කරන්නම් .

මාර්ක් 16:15 ආපසු බලන්න. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට පවසන්නේ. "නුඹලා ලොව මුළුල්ලේ ගොස් "

යේසුස් වහන්සේ විසින් උන්වහන්සේගේ ගෝලයන්ට දෙන ලද බලවත් සැනසීමේ වදන් මේය. ඔබ බලන්න. යන්න යන වචනයට ග්‍රීක් භාෂාවෙන් පවසයි. මෙම වචනය අදහස යන්න පමණක් නොවේ. යමක් බෙදා ගැනීම යන අදහසද එය දරයි. ධාවකයෙක් යෂ්ඨිය හුවමාරු කිරීමේදී භාවිතා වන්නේ මෙම වචනයම වේ.

Poreuo රූපණය කරනුයේ යේසුස් වහන්සේ උන්වහන්සේගේ රාජ්‍යය දියුණුව සහ ශුභාරංචි පණිවිඩය නවක ඇදහිලිවතුන්ට සහ ඔවුන්ව අනුගමනය කරන්නා වූ අයට භාර දුන් බවයි.

ඔවුන් ලබා ලබාගන්නා වූ ශුභාරංචියේ යෂ්ඨියට එම ආධිපත්‍යය, එම බලය, එම ආලේපය, යේසුස් වහන්සේගේ ජීවිතයෙන් සහ තොල් වලින් ප්‍රකාශ වුණා සේම විය. යේසුස් වහන්සේ කළ කී දේ අනුකරණය කිරීමට කාලය එය විය. එය දිවීමට ඔවුන්ගේ මොහොත විය. මුළු ලෝකයටම ශුභාරංචිය ලබාගැනීම පිණිස ඔවුන් ඇතුළත් වී සිටියා වූ ධාවනයක් විය.

සෑම ඇදහිලිවන්තයෙක්ම මෙම ශුභාරංචිය ශතවර්ෂ ගණනාවක් වෙනස් කළ එබැවින් එය අල්ලාගෙන මුළු ලෝකයටම යේසුස් වහන්සේගේ පණිවිඩය බෙදා දීම කළ යුතුවේ. ජීවිතය පරිවර්තනය කරන්නා වූ රජ වූ යේසුස් වහන්සේව හමුවූ සෑම කෙනෙකුගේම ප්‍රධාන කාර්යය මෙය විය.

එම ඇදහිලිවන්තයන්ගේ මනස් වල බොහෝ නිදහසට කරුණු සැබවින්ම ගලා එන්නට ඇත, අද අප කරන්නා සේම. නමුත් ඇයි?... කොහොමද? .... මම කොහොමද?... මට බැහැ කියලා හැඟෙනවා... අන්න එම ස්ථානයේදී මෙම සැනසීමේ වචන අපට ලැබෙනු ඇත. ගෝලයින්ට මේ කාර්ය තනියම කිරීමට භාර නොවීය. ඔවුන්ට නිතරම විවිධ ක්‍රම කැඳවීම සහ ඔවුන්ගේ ධාවනයේ ස්ථාන වුවත්, ඔවුන් සෑම කෙනෙකුටම තිබුණේ එකම පණිවිඩය ප්‍රකාශ කිරීමය. ඔවුන් ඔවුන්ගේ රාජ්‍ය ගොඩ නොනැගුහ. ඒ වෙනුවට යේසුස් වහන්සේ ඔවුන් තුළින් උන්වහන්සේගේ රාජ්‍ය ගොඩනැගීමට යන සේක. අද ඔබ කරන්නා සේම යේසුස් වහන්සේම ඔවුන්ට උපකාර කරනු ඇත.

උන්වහන්සේ ස්වර්ගාභා රෝහණය වූ ආකාරයටම මෙම අවසන් වැකි උන්වහන්සේ ඔවුන්ට කී සේකඃ

*"මමද ලෝකාන්තිමය දක්වා සෑම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක." - මතෙව් 28:20*

ගෝලයන් මාරු කිරීමේ කලාපයට ඇතුළත් වී ඇත. ශුභාරංචියේ යෂ්ඨිය භාරදී ඇත. මුළු ලෝකයටම ඇහෙන පරිද්දෙන් යේසුස් වහන්සේ ධාවනය ආරම්භ කොට ඇත.

# 2

# පළමු සියවස - ශුද්ධාත්මයාණන් වහන්සේ

නමුත්.... ශුභාරංචිය බෙදා ගැනීම ගැන මට පහසු හැඟීමක් නැත.

*"ඔබට කන් නොමැතිව ඇසීමට හෝ පෙනහළු නොමැතිව හුස්ම ගැනීමට උත්සහ කරන්නාක් මෙන් දෙවියන් වහන්සේගේ ආත්මය ඔබගේ හදවතේ නොමැතිව කිතුණු ජීවිතයක් ගත කිරීමට උත්සාහ ගන්න." - ඩී. එල්. මූඩි*

පළමු 120 වන යේසුස් වහන්සේගේ අනුගාමිකයන් දුවන්න ආශාවිය. නමුත් ඔවුන් දැන සිටියා යෂ්ඨිය සම්පූර්ණයෙන්ම හුවමාරු කර අතට භාරන දෙන තෙක් ඔවුන්ට ඵලදායී ලෙස ශුභාරංචිය බෙදා ගැනීමට නොහැකි බව. දින දහයකට පෙර යේසුස් වහන්සේ ඔවුන්ට කීවා ශුද්ධාත්ම දීමනා උදෙසා බලා සිටින්න කියා. අවසාන යෂ්ඨි හුවමාරුව ඔවුන්ට යෙරුසලමේ, මුළු යුදයේ හා සමාරියේ, පොළොවේ සීමා දක්වා ද සාක්ෂිකරුවන් වීමට බලය දෙන බවටය. රජුගේ රජු ලෙස නැවත ස්වර්ගයට උසවා ගැනීමට පෙර පොළොවේදී උන්වහන්සේ මෙම අවසන් වදන් ප්‍රකාශ කළ සේක.

ක්ෂණිකව එය සිදුවිය. ඔවුන් සියලු දෙනාම යාච්ඤා කිරීම පිණිස කාමරය තුළ වාඩි වූහ. ප්‍රචණ්ඩ සුළඟක් හමා එන්නාක් මෙන් ගිනි දළු ඔවුන්ගේ හිස් මත පතිත විය. යේසුස් වහන්සේ පොරොන්දු වූණා සේම ශුද්ධාත්මයාණන් වහන්සේගේ මහා ප්‍රවේශයයි එය. දෙවියන් වහන්සේ නැවතත් පොළොවේ ජීවත්වීමට පැමිණි සේක. මෙවර මනුෂ්‍යයන් සමඟ සිටීමට නොව ඔවුන් තුළ ජීවත්වීමටය. ශුද්ධාත්ම දෙවියන් වහන්සේ සියලුම මනුෂ්‍යයන්ට ලබාගත හැකිය. සෑම සියවසකම එය අනුගමනය කරන ලදී. ශුභාරංචියේ යෂ්ඨිය දැන් ඔවුන්ගේ අතෙහි සහ ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ගේ හදවතේ වන සේක. එය ඔවුන් දුවන්නා වූ මොහොතයි.

ව්‍යාකූලත්වයෙන් රැස්ව සිටි දහස් ගණන් මනුෂ්‍යයන් අතරේ පේතෘ ස් කාමරයෙන් පිටතට පැමිණියේය. ඔහුට ඔවුන් හට යේසුස් වහන්සේගේ ශුභාරංචිය ගොස් පැවසීමට අවස්ථාවයි. පේතෘස්ගේ මනසේ ජීවිතයේ මතක සටහන් අවදිවන්නට ඇත. වසර තුනකට පෙර ඔහුත් ඔහුගේ සහෝදරයෙනුත් ගලීලයේ පැතිරුණු සාරවත් නගරයක ධීවර සංසදයේ කොටසක් වූහ. ඔහුගේ ජීවිතය සාමාන්‍යය ය. දවසක් පාසා දවසක් ඔහුගේ බෝට්ටුව සැතැක්ම අටක් පළල ගලීල මුහුද හරහා ගෙන ගියේ තිලාපියා සාඩින් සහ අනෙක් ඕනෑම ආකාරයක මසුන් පේතෘස්ගේ දැලට හසු වෙනවාද ඔවුන්ව අල්ලා ගැනීමටය.

*ඔහු තවදුරටත් ජීවමාන මාළු අල්ලා, මරා, වෙළඳපොළට යවන්නේ නැත - දැන් ඔහු වෙළඳපොළට ගොස්, මළවුන් අල්ලා, ඔවුන්ව පණ ගන්වනු ඇත.*

පසුව එක් ඉතිහාසය දිනක යේසුස් වහන්සේ ඔහුට ජීවිත කාලයටම අවස්ථාවක් දුන් සේක. තවදුරටත් ජීවමාන මසුන් අල්ලා, මරා වෙළඳ පොළට එවන්න නොවේ. දැන් ඔහු වෙළඳපළට ගොස් මැරුණාවූ මනුෂ්‍යයන් අල්ලා ඔවුන්ව ජීවත් කරන්නය. යේසුස් වහන්සේ ඔහුට කීවා; නුඹ මිනිසුන් අල්ලන්නෙක් කරන්නෙමි කියා. අන්න එවිට ස්වර්ග රාජ්‍යය පැමිණියේය. ඔහු සියල්ල අතහැර යේසුස් වහන්සේව අනුගමනය කළේය. එය මොන අවුරුදු තුනක්ද? හාස්කම්, සමූහයා, කථා, ඔහු ජල මත ඇවිද්දේය. යේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වීම, මෝසෙස් සහ එලියා මරණ ගිවිසුමේ වීරයන්ගේ බැහැ දැකීම ඔහු දුටුවේය. එසේම ඔහුගේ මිත්‍රයා යේසුස් වහන්සේ මළවුන්ගෙන් නැගිටවීම ඔහු දුටුවේය. ලෝකයේ රජතුමා සැබැවින්ම පැමිණ ඇත. මෙසියස් වහන්සේ මෙහි වූ සේක. පේතෘස්ගේ මිත්‍ර යොහාන් ලිපියක මෙසේ සඳහන් කරයි "යේසුස්වහන්සේ කළ වෙනත් බොහෝ දේවල්ද ඇත්තේය, ඒවා එකින් එක ලියන ලද්දේ නම්, ලියනු ලබන පොත් දරන්ට ලෝකයත් මදියයි සිතමි." ( යොහාන් 21: 25) ඔහුගේ සාක්ෂි දැරීමේදී තවත් කොටසක් අත පසුව ඇත. යේසුස් වහන්සේ ගැන අන් අයට නිර්භීත ලෙස කතා කිරීමට පේතෘස්ට නිර්භීතකමක් නොවීය.

යේසුස් වහන්සේගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථාවක පේතෘස් තෙවතාවක් හඳුනන්නේ නැතැයි කීවේය. යේසුස් වහන්සේව අත්අඩංගුවට ගන්නා ලද රාත්‍රියේදී ගින්නෙහි උණුසුම් වෙමින් එතන සිටි සේවක ගැහැණු දරුවකුට හා කුඩා කණ්ඩායමකට ඔහුට යේසුස් වහන්සේ තුළ තබා තිබෙන්නාවූ ඇදහිල්ල

ගැන කතා කිරීමට නොහැකි විය. එසේ කෙසේද ඔහු ලොව පුරා ගෙනයා යුතු ශුභාරංචියේ නියෝගය අනුගමනය කරන්නේ? එම කාමරය තුළ ඔහුගේ පිළිතුර පැමිණියේය.

දැන් යම් වෙනසක්. නිර්භීතකමෙන් බෙදා ගැන්මට පණිවිඩයක් ඇත. ඔහු සමූහයා ඇමතූ වේය. සමහරවිට එම මෙහෙකාරිය ඔහු දෙස අවිශ්වාසවන්ත අයුරින් බලන්න ඇති. ඒ බියගුළු පේතෘස් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ විය. ඔහු වෙනස් මනුෂ්‍යයෙක් බවට පත් විය. අනෙකුත් ගෝලයන් සමඟ ඔවුන් එක්ව නිර්භීතව ශුභාරංචිය ප්‍රකාශ කළහ. "සහෝදරවරුනි අපි දැන් කුමක් කරමුද" සමූහයා ප්‍රතිචාර දැක්වූහ.

පේතෘස් පිළිතුරු දෙමින් ; "නුඹලා සියල්ලෝම පසුතැවිලිව, පව්කමාව පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් බෞතීස්මය ලබන්න; එවිට ශුද්ධාත්ම දීමනාව නුඹලා ලබන්නහුය."

පේතෘස් සෙනඟ දෙස බලා මදක් නැවතියේය. ඉන්පසු ශුද්ධාත්මයාණන් වහන්සේ පේතෘස්ගේ හදවතට සහ මුඛයට ඉදිරි සියවස ගෙන ආයේ සේක. පේතෘස් "මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවන සේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා," පැවසීය. අනාගතයේදී ශුභාරංචියේ යෂ්ඨිය සියවස් ගණනාවකට හුවමාරු වනු ඇත.

පේතෘස්ගේ පණිවිඩය තුන් දාහකට අධික සමූහයා පිළිගත්හ. එදින ඔවුන් එම යෂ්ඨිය තදින් අල්ලා ගත්හ. විශ්වීය ශුභාරංචිය ප්‍රකාශයක් ආරම්භ විය.

# එය පහළට යවන්න

යෞවනයෙක් ලෙස පෙන්තකොස්ත සභාවකට සහභාගි වීමේදී මා යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකයෙක් වූයෙමි. තවද එය අෂ්ඨ දේවස්ථානයක් බව පැවසීම අවතක්සේරුම් කිරීමකි. තවද එය චිත්‍රපටිවලින් බැහැර වූ දෙයක් විය. මම කුමක් අදහස් කරන්නේදැයි ඔබ දන්නේද? නැටීම, කෑ ගැසීම , අන්‍ය භාෂාවෙන් කතා කිරීම පුරුද්දක් විය. සේවය දීර්ඝ විය. දේශනා කිරීම දැඩි ආශාවකින් පිරී තිබුණි. දම් පැහැති වස්ත්‍ර වලින් සැරසුනු ගායක කණ්ඩායමක් අපට සිටියහ. කිහිප වතාවක්ම මම ගීතිකා කණ්ඩායමට පවා සම්බන්ධ වුණේ මගේ ගායනය ඇසූ සියල්ලෝම විමතියට පත් කරමිනි.

අපි ආදරණීය අනුවර්ත නාමයකින් "පියාසර කරන ලේනා" ලෙස අපගේ මිතුරෙකු හැඳින්වීමුව. දෙවන ගීතයේ මධ්‍ය භාගයේ ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ස්පර්ශ කරනු ලැබීය. දුවන්නට පටන් ගත්තේය. ඔහු වේදිකාව මත ඇතින් පය තබමින් ඔහුගේ දෑත් සම්පූර්ණයෙන්ම පිටතට දිගු කර වේදිකාවෙන් ඉවතට පනිනු ඇත. ක්‍රිස් අඩි හතරේ වේදිකාවෙන් බිමට පියාසර කරන විට ඔහුගේ ගායන වස්ත්‍රයේ බලපෑම නිසා ඔහු පියාසර කරන ලේනෙකු මෙන් විය. දේවස්ථානය විනෝදජනක වූවක් මෙන් මට නොසන්සුන් වූ දේවල් කීපයක් විය. සමහර දේවල් මට තේරුණේ නැත. ඉන් එකක් වූයේ ශුද්ධාත්මයාණන් වහන්සේය.

අපි "පහළට යවන්න" සහ "ගින්න එවන්න" වැනි පද සහිත ගීත ගායනා කළෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ කාමරයට, පහළට සහ අප මතට වැටීමට ආසන්න බව දේශකයා බොහෝ විට පවසනු ඇත. මා සම්පූර්ණයෙන්ම අවුල් වූයෙමි. මෙම ආත්මය, අවතාරය කවුරුන්ද? ඔහු හෝ එය පෙනී යන්නේ කොයි ආකාරයටද? මම සිවිලිම දෙස බලා සිටින්නේ කුමක් සිදුවේදැයි අපේක්ෂාවෙනි. කිසිවක් සිදුවූයේ නැත.

මම සිතුවේ ශුද්ධාත්මයාණන් වහන්සේ ගැන සිතීමට කාලය ගත කිරීමට නොහැකි තරම් ව්‍යාකුල බවක් මෙම අද්භූත ඉගැන්වීම් මට දෙවියන් වහන්සේ සමඟ ඇති සම්බන්ධතාවය කෙරෙහි අවධානය වෙනතකට යොමු කිරීමට අවශ්‍ය නොවුණු බවත්ය. දෙවියන් වහන්සේ සහ ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය පිළිබඳ මෙම අත්‍යවශ්‍ය අවබෝධය ගැන මා නොදැන සිටියෙමි. නව ඇදහිලිවන්තයෙකු ලෙස පොළොවේ රාජ්‍යයේ ඉදිරියට ගෙන යාමට සහ ක්‍රිස්තියානි ජීවිතය ගත කිරීමට , ඵලදායී වීම සැමවිටම රඳා පැවතුණුයේ ශුද්ධාත්මයාණන්වහන්සේ මත බව මම නොදැන සිටියෙමි.

ඔබේ තත්ත්වය කුමක්ද? ශුද්ධාත්මයාණන් වහන්සේ / ශුද්ධාත්මයාණන් වහන්සේ අභිරහසක් හෝ අමුතු දෙයක් ද? තේරුම් ගැනීමට වඩා සුසර කර ගැනීමට. අධ්‍යාත්මික සඵලතාවයෙන් සහ

නිදහස් ජීවිතයකට අගුළු හරින තීරණාත්මක කරුණු කිහිපයක් අප ලෙහා ගනිමු. පළමුව එය යන සර්ව නාමය ඉවත දමන්න.

ශුද්ධාත්මයාණන් වහන්සේ යනු "එය" හෝ යම් ආකාරයක අද්භූත බලවේගයක් නොවෙයි.

ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේය. සම්පූර්ණ දෙවියන් වහන්සේය. දෙවියන් වහන්සේගේ ප්‍රකාශනයක් නොව. නමුත් දෙවියන් වහන්සේය. අපගේ මැවීමේ සිට උන්වහන්සේ මනුෂ්‍යයා සමග

*ශුද්ධාත්මයාණන් යනු "එය" හෝ යම් ආකාරයක අද්භූත බලවේගයක් නොවේ.*

පොළොවේ සිටි සේක. කිසි කලෙකත් අත් නොහැරිය සේක. උන්වහන්සේ පැමිණ නැවත නොයයි. සැම විටම සිටින සේක සහ පුද්ගලාකාර ලෙස අප උන්වහන්සේව දැන ගන්නවාට කැමති සේක. එසේම දිනපතා අප සමග සහභාගිත්වය

ආශාවන සේක.

ශුද්ධාත්මයාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම සහ දෙවියන් වහන්සේගේ සංයුතියේ මහා අභිරහසේ කොටසකි. එක්කෙනෙක් තුළ තුන්දෙනෙක් සහ තුන්දෙනෙක් තුළ එක්කෙනෙක්. ත්‍රිත්වය පියා, පුත්‍රයා හා ශුද්ධාත්මයාණන් වහන්සේ.

අපගේ සීමිත අවබෝධයෙන් ඔබ්බට ගිය අනන්ත දෙවි කෙනෙක්ය. ත්‍රිත්ව දෙවියන් වහන්සේගේ ස්වභාවය පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. සැම උත්සාහයක්ම නිෂ්ඵල නුමුත් උතුම් උත්සාහයකි. හතරවන සියවසේ දේව ධර්මාචාර්යවරයෙක් වන ඔගස්ටින් ත්‍රිත්වය පැහැදිලි කිරීමට උත්සාහ කළේ ප්‍රේමය සහ එහි කොටස් තුන රැගෙනය. ප්‍රේම කරන්නාවූ පුද්ගලයා, ප්‍රේම කරන දෙය සහ ප්‍රේමය. ඒ සියල්ල එකක් නොවේ. එසේම වෙන්කරද නැත. මීළඟ සියවසේ අයර්ලන්තයේ විසුවා වූ පැට්‍රික් නම් තරුණයා ( වැඩි විස්තර සඳහා පසුවට ) මෙම අභිරහස පැහැදිලි කිරීමට කොළ තුනේ කොළ භාවිතා කරයි. කොළ තුනක් නමුත් එක මලක්. නූතන විචාරකයින් ජලය රූපකයක් ලෙස භාවිතා කරයි. ජලය $H_2O$ නමුත් ආකාර තුනකි. අයිස්, ජලය සහ වාෂ්පය. පියාණන් වහන්සේ අයිස් හා සමානය. යේසුස් වහන්සේ වතුර හා සමානය. ශුද්ධාත්මයාණන් වහන්සේ වාෂ්ප හා සමානය . සියල්ල වෙනස් නමුත් සියල්ල $H_2O$ වේ.

කෙසේ වෙතත් වැදගත් වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේය.

එම පෙන්තකොස්ත සභාව තුළ අප ගායනා කරන ලද ගීත සහ භාවිතා කළ ප්‍රකාශයන් මෙන් නොව ශුද්ධාත්මයාණන් වහන්සේ යනු එය නොවෙයි. ගින්නක් නොවේ. වැසි දිනයක ජලය මෙන් අහසින් වැටෙන දෙයක් නොවෙයි. එය පහළට යැවීමට සහ අද්භූත අත්දැකීමක් අපේක්ෂා කිරීමට දෙවියන් වහන්සේට ගායනා නොකරන්න. මෙය දෙවියන් වහන්සේට අර්ථක හා නීච භාෂාවකි. ශුද්ධාත්මයාණන් වහන්සේ දෙවියන් වහන්සේ වන අතර අප උන්වහන්සේගේ ප්‍රේමණීය වැළඳ ගැනීමේ සම්පූර්ණයෙන් සිටීම අවශ්‍ය වේ.

නමුත් නවතින්න.... මනුෂ්‍යයන් මතට ශුද්ධාත්මයාණන් වහන්සේ පතිත වුණ බව දේව වචනය නොපවසන්නේද? ඔව්! යම් ආකාරයකට

> *"පේතෘස් මේ වචන කථාකරද්දීම වචනය ඇසූ සියල්ලන් කෙරෙහි ශුද්ධාත්මයාණන්වහන්සේ පහළවූසේක." - ක්‍රියා 10:44*

මෙම පාඨය තුළ පතිත විය යන වදනට උද්යෝගිමත් සුන්දර රූපයක් නිරූපණය කරයි. ග්‍රීක වචනය *epipito* . මෙම වදනින් ඇඟවෙන්නේ වැටීම පමණක් නොවේ. ඊටත් වඩා වැඩි දෙයක්ය. පතිත විය යන ඉතාමත්ම නිරවද්‍ය වූ පරිවර්තනය නම් ( අල්ලා ගත්තා ) අත් කරගත්තා. යමකුගේ වැළඳ ගැනීමේදී පතිත වන විට එය සම්පූර්ණයෙන්ම පරිග්‍රහණය කර ගත්තා යනුය.

මාගේ දියණියන් ළදරු පාසලෙන් නිවසට පැමිණෙන විට ඔවුන් වෙනුවෙන් මා ඉදිරිපස දොර අබියස රැඳී සිටිමි. නිරන්තරයෙන්ම ඔවුන් දොරෙන් ඇතුල්ව ගමන් කරන විට මා නැමී ඔවුන්ව සිප වැළඳ ගනිමි. එම වැළඳ ගැනීම තුළ මම මෘදුව නමුත් ප්‍රේමනීයව ඔවුන් මත පතිත වෙමි. අප දෙදෙනාම එක විට පොළොව මත පතිත වෙමු. පොළොව මත මම ඔවුන්ට ලොකු හාද්දක් දී වැළඳගෙන කිතිකවමින් මම ඔවුන්ට කෙතරම් ආදරය කරනවාදැයි පවසමි. මෙය *epipito* .

පාවුල් කතා කරනු අසාගෙන සිටි සෙනඟට ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් කරනු ලැබුවේ මෙයයි. ඔවුන් වචනය ඇසූ කල්හි ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ව වැළඳගත් සේක. දෙවියන් වහන්සේ ප්‍රේමණීය ලෙස ඔවුන්ට ප්‍රේම කළ සේක. ශුද්ධාත්ම දෙවියන් වහන්සේ අදත් අපට කරන්නේ මේ දෙයයි. උන්වහන්සේ අපට ප්‍රේම කරන සේක . උන්වහන්සේ සම්පූර්ණයෙන්ම අප වැළඳ ගන්න සේක . ක්‍රියා පොත තුළ මෙන් උන්වහන්සේගේ අභියසින් අපව පිරවීමට ආශා කරන සේක.

# දෙවියන් වහන්සේ අප තුළය

කෙසේ වෙතත් ටර්ටූලියන් පවසන ආකාරයට ක්‍රිස්තුස් වහන්සේගෙන් වසර දෙසීයකට පසු අප පොතක් තුළට යේසුස් වහන්සේව පළවා හැරියෙමු. ශුද්ධාත්මයාණන් වහන්සේ කිසි කලෙකත් පොතක් තුළ නොව අප තුළ වාසය කිරීමට සැලසුම් කළ සේක. සියවස් ගණනාවකට පසු එවන් රොබට්ස් ඉවැන්ජ්ලිස්ත වේල්ශ් ප්‍රකාශ කරනු ලැබුවේ " ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ නොවී ඔබට ස්වර්ග රාජ්‍යයට ඇතුල්විය හැක. නමුත් පූර්ණ නොවීම මඟදී ඔබට බොහෝ දේ නැති කරනු ඇත. " මේ මිනිසුන් කුමක් ගැන කතා කරනවද? දූතන සේවයට මෙයින් කුමක් කළ හැකිද ඔබගේ ආසන පටි තද කරගන්න. අපි ක්ලිප් සටහන් සෙමනේරි උපාධියක් තුළින් ධාවනය කරමු.

ප්‍රධාන දේව ධාර්මික නිබන්ධනයක් වන්නේ පරිපූර්ණ දෙවි කෙනෙක් පාපිෂ්ට මනුෂ්‍යයා සමඟ ජීවත් වන්නේ කෙසේද යන්නයි. ආලෝකය සහ අන්ධකාරය කෙසේ එකට පැවතිය හැකිද? සහ උන්වහන්සේ අප තුළ ජීවත් වන්නේ නම් ජීවත්වන්නේ කොහේද?

පළමු වසර හාරදාහක් තුළ දෙවියන් වහන්සේ නිතරම එක් මනුෂ්‍යයෙකුට ( උත්තම පූජකයාට) පෙනී සිටි සේක. වසරකට එක් වතාවක් විශේෂිත ස්ථානයක (දේව මාළිගාවේ) අති ශුද්ධස්ථානයේ. මේ කුඩා කාමරය තුළ ලෝක දෙකක් එකට ගැටුණි. ශුද්ධාත්ම දෙවියන් වහන්සේ සහ අශුද්ධ මනුෂ්‍යයා ඔවුන් දෙදෙනාම එකට ජීවත් වූහ.

අහඹු අවස්ථා කිහිපයකදී දෙවියන් වහන්සේ, ශුද්ධාත්මයාණන් වහන්සේ පුද්ගලයෙක් මතට පැමිණ සහ විශේෂිත කාර්යයක් උදෙසා ඔවුන්ව පාවිච්චි කරන ලදී. අත්වැස්මක් තුළ ඇති අතක් ගැන හිතන්න. විනිශ්චයකාරයා පොතේ ඔත්නියල් නැමැති පුද්ගලයාගේ අත, අත්වැස්ම වන්නේ ඔහු මත පැමිණෙන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේය. අනෙක් අවස්ථාවල අත්වැස්ම මනුෂ්‍යයා වන අතර ශුද්ධාත්මයාණන් වහන්සේ ඔහු වෙනුවෙන් ක්‍රියාකාරී වන්නේ යොෂුවා හා සමානවය. කෙසේ වෙතත් මේවා දුර්ලභ අවස්ථා විය.

*ශුද්ධාත්මයාණන්ගෙන් පිරී නොසිට ඔබට ස්වර්ගයට යා හැකිය, නමුත් පිරී නොගියහොත්, ඔබට මඟදී බොහෝ දේ අහිමි වනු ඇත.*

නමුත් මෙම ශුභාරංචිය පණිවිඩය ව්‍යාප්ත කිරීම සඳහා දෙවියන් වහන්සේගේ සැලැස්ම වූයේ විප්ලවීය වෙනසකි. උන්වහන්සේ ප්‍රොපේත යෝවෙල්ට කතා කරමින් ඉක්මනින් සිදුවීමට නියමිත මෙම මාර්ග ගැන කී සේක.

*"ඉන්පසු මාංසමයවූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි;" - යෝවෙල් 2:28*

" වගුරවමි" මෙහි අර්ථය කුමක්ද? එසේම මෙය දේව ධර්මයට නැකම් කියන්නේ කෙසේද? සහ විශේෂයෙන්ම මගේ ජීවිතයට ශුභාරංචිය ගෙනයන්නෙක් ලෙසට අපි මෙසේ ගමන් කරමු.

යේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ කළ දේව වචනයේ පවසන්නේ තවදුරටත් උන්වහන්සේ ගෝලයන් සමඟ දින හතළිහක් රාජ්‍යය පිළිබඳ කතා කරමින් සිටි බව. ක්‍රියා 1, මතෙව්, මාර්ක්, ලූක් සහ යොහාන් එම කාල වකවානුව තුළ සිදුවන කාරණා ගැන වඩා පැහැදිලි නොකරයි. කෙසේ වෙතත් අප දන්නා කාරණා කිහිපයක් ඇත. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ගේ කැඳවීම ගැන සහ එය සිදුවිය යුතු ආකාරය ගැන දැඩි මතක් කිරීමක් කළ සේක. උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ යෂ්ඨිය ඔවුන්ගේ අතට භාරදීමට ඔන්න මෙන්න. එය දිවීම සඳහා ඔවුන්ගේ මොහොතයි. ඔවුන් ශුභාරංචිය දේශනා කොට ගෝලයන් බිහි කළ යුතුය. මෙය ප්‍රසිද්ධ වීමට, කීර්තිමත් වීමට හෝ විනෝදකාමී වීමට ඔවුන්ගේ අවස්ථාව නොවීය. මෙවැනි නියෝගය රැගෙන දිවීමට කැඳවීම මනුෂ්‍යයාට කිසිදා නොදෙන

ලද මහඟු වරප්‍රසාදයකි. ඔවුන්ගේ ජීවිත වලට එය අධික මිලක් විය. අපට ඉතා ඉක්මනින් හමුවේවි. බොහෝ දෙනෙක් ඒ ඉටු කළහ.

එම දින 40 අවසානයේ ගලීලයේ කඳු මුදුනට අවසාන වතාවට යේසුස් වහන්සේ ගෝලයන් සමඟ හමුවූ සේක. මා විශ්වාස කරන්නේ යේසුස් වහන්සේගේ ....... ඔවුන් එකිනෙකා මත වෙමින් ඔවුන්ට උන්වහන්සේ කෙතරම් ප්‍රේම කරනවාදැයි කියන්න ඇති. උන්වහන්සේ ඔවුන්ව හැර යන නමුත් සම්පූර්ණයෙන්ම අත්හැර නොයනු ඇත. ශුද්ධාත්මයාණන් වහන්සේ, දෙවියන් වහන්සේ ඔවුන් සමඟ සිටීමට පමණක් නොව ඊටත් වඩා දෙයක් සඳහා වූ සේක. යේසුස් වහන්සේ ඒ සෑම ගෝලයෙක් දෙස බලා මෙම අවසාන ආඥාව දුන් සේක. මෙය තෝරා ගැනීමක් නොව. මෙයයි වෙනස. මනුෂ්‍යයා තුළ දෙවියන් වහන්සේ ජීවත් වන නව ආකාරයයි.

*"උන්වහන්සේ ඔවුන් සමඟ රැස්ව ඔවුන්ට ආඥාකරමින්ඃ යෙරුසලමෙන් අහක්ව නොගොස් නුඹලා මාගෙන් ඇසූ පියාණන්වහන්සේගේ පොරොන්දුව බලා සිටින්න. මක්නිසාද යොහන් වතුරෙන් බව්තීස්මකෙළේය; නුමුත් නුඹලා මෙයින් නොබෝ දවසක් ගිය පසු ශුද්ධාත්මයෙන් බව්තීස්මකරනු ලබන්නහුයයි කීසේක...... නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක." - ක්‍රියා 1:4-5 , 8*

එසේම යේසුස් වහන්සේ ගිය සේක.

ගෝලයන් කඳු පාමුලට දිවගෙන ගියා. ශුභාරංචිය එසැනින්ම ප්‍රකාශ කරමින්. හරිද ? වැරදිද ?

ස්තුතිවන්ත වෙනවා. එය අනුගමනය කළ පරම්පරාව මෙම පළමු ඇදහිලිවන්තයෝ යේසුස් වහන්සේට කීකරු වුණා. යේසුස් වහන්සේගෙන් මනුෂ්‍යයාට නියමිත ආකාරයට යෂ්ඨිය හුවමාරු වෙන තෙක් බලා සිටීමට. පැමිණෙන්නට තිබූ දෙය ඔවුන් ලබා නොතිබුණේ එය නම් ඔවුන්ගේ දිවීම ඔවුන්ගේ ශක්තියෙන්මය.

*නත්තල දෙවියන් වහන්සේ අප සමඟ නම්, පාස්කුව දෙවියන් වහන්සේ අප උදෙසා නම්, පෙන්තකොස්තේ දෙවියන් වහන්සේ අප තුළය.*

ඔවුන් ඉක්මනින්ම දැවී යන්නට ඇති. ඔවුන්ට ආධිපත්‍යයක් නොවන්නටද ඇත. යෙසුස වහනසෙ නයම අන්දමට ඉදිරිපත් කරන්න සහ රාජ්‍ය පැමිණීම දකින්නට අවාසනාවන්ත ලෙස බොහෝ ඇදහිලිවතුන් මෙයාකාර ජීවත් වෙති. නමුත් ඊළඟ දින දහය තෙක් ඔව්හු බලා සිටියහ. එවිට සිදුවිය. වෙනස පෙන්තකොස්ත යයි.

නත්තල දෙවියන් වහන්සේ අප සමඟ නම්, පාස්කුව දෙවියන් වහන්සේ අප උදෙසා නම්, පෙන්තකොස්තේ දෙවියන් වහන්සේ අප තුළය.

පෙන්තකොස්ත දිනයේ දී යේසුස් වහන්සේගේ ගොස් දින දහයකට පසු ගෝලයන් එකසිය විසි දෙනෙක් ශුභාරංචියේ යෂ්ඨිය හුවමාරු වීමේ යාච්ඤාවේ යෙදී සිටියහ. ක්ෂණයකින් ශුද්ධාත්මයාණන් වහන්සේගේ අභියස මහත් සුළඟකින් සහ ගින්නෙන් ප්‍රකාශ විය. එම මොහොතේ ශුද්ධාත්මයාණන් වහන්සේ මනුෂ්‍යයා තුළට ප්‍රවේශමෙන් උන්වහන්සේගේ අභියසින් පූර්ණ කළේ යෝවෙල් ප්‍රොපේත තුමාගේ අනාවැකිය සම්පූර්ණ කරමිනි. එදින ඒ කාමරයේ සිටි ඇදහිලිවතුන් පොරොන්දුවේ දීමනාව ලබාගත්හ. ආත්මයාණන් වහන්සේ යේසුස් වහන්සේ කියූ ප්‍රකාරයටම එය සිදුවිය. දෙවියන් වහන්සේ දැන් ඔවුන් තුළ වන සේක. ස්වර්ගය සියලුම ආධිපත්‍යය එයට අයිතිය. ලොව විප්ලවකාරීව වෙනස්වීමට ඔන්න මෙන්නය. ශුභාරංචියේ යෂ්ඨිය සාර්ථකව යේසුස් වහන්සේ තුළින් අපට හුවමාරු වී ඇත .

දේව ධර්මයේ අභිරහස දැන් විසඳා ඇත. නිබන්ධනය හමාරය. සෙමනේරිය අවසන් කිරීම නිසා සුභාෂින්ෂන පාවුල් තුමා එය මෙසේ ප්‍රකාශ කරයි.

*"අන්‍යජාතීන් අතරේ තිබෙන මේ රහසේ තේජස් සම්පත කිමෙක්ද කියා දෙවියන්වහන්සේ ශුද්ධවන්තයන්ට දන්වන්ට කැමතිවූසේක; ඒ වනාහි තේජසේ බලාපොරොත්තුව වන නුඹලා තුළ සිටින ක්‍රිස්තුස්වහන්සේය." - කොලොස්සි 1:27*

එදා සිට අද දක්වා ශුද්ධාත්ම දෙවියන් වහන්සේ කුමන ඇදහිලිවන්තයෙක් හෝ උන්වහන්සේගෙන් ඉල්ලන්නේ නම් ඔවුන් තුළ වාසය කිරීමට පැමිණෙන සේක. ඇදහිලිවන්තයෙක් ලෙස ඔබ තනිව ජීවත්වීම අවශ්‍ය නොවේ. ඔබට උත්සාහ කළ හැකිය. ඉවැන් රොබෙන්ට්ස්...... ප්‍රකාශ

කළ පරිදි මගදී ඔබට බොහෝ දේ මගහැරෙනු ඇත. ශුභාරංචිය ඔබ තනිව බෙදා ගැනීමටද අවශ්‍ය නොවේ. ඔබට යේසුස් වහන්සේගෙන් ලැබී තිබෙන අවස්ථාව හා නියෝගය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ සමග පන්ගුකාරකම ඇතිව එය බෙදාගන්නා ලෙසයි.

## මහා සහයෝගී දූත මෙහෙවර

1964 සැප්තැම්බර් 16 වෙනිදා බිලිග්‍රැහැම් පොදු රැස්වීමක දැන්වීමක් නිකුත් කළේ ඔමාහා සහ නෙබ්‍රාස්කා, ගුවන් විදුලි මාධ්‍යයේදී ඔහුගේ දැන්වීම ඉතා පැහැදිලිය. ඔහු ජාතික රූපවාහිනියේ දේශනා කරන බවය. නව ජනාධිපති පත්කිරීමේ ඡන්දයට සතු කිහිපයක් තිබේ. මිනිත්තු 16ක දැන්වීම අතරතුර කාලයේදී බිලිග්‍රැහැම් ප්‍රකාශ කළේ,

> *"මනුෂත්වය දෙවියන් වහන්සේ නොමැතිව, බලාපොරොත්තුවක් නොමැතිව සහ ශුභාරංචිය නොමැතිව ඉදිරියට යන ආකාරය කිතුණුවා උදාසීනව බලා සිටිය යුතු නැත. අපි බිඳුන ස්ථානයට පිසිය යුතුය. අපි කඩුල්ල තුළ සිට ගත යුතුය. තවද අපි ගොස් අපගේ ස්වාමින් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අණට කීකරු විය යුතුය. ලෝකයට දැඩි අවශ්‍යතාවයක් තිබේ. එයට දෙවියන් වහන්සේගේ ප්‍රේමය අවශ්‍යය.ලෝකය ව්‍යාකූල වී ඇත. එයට දෙවියන් වහන්සේගේ සාමය අවශ්‍යයි. යන්න උතුම් වූ අණ දෙන්නා සහ ප්‍රධානියා එසේ පැවසූ සේක. මෙම වචනය අතිමහත් හදිසි හැඟීමකින් යුතුව කතා කරන ලදී. එය උද්යෝගිමත්, වික්‍රමාන්විත වචනයකි. "*

එය මහා නියෝගය අපගේ පරම්පරාව උදෙසා ඉටු කිරීමේ වගකීම අප සතුය. සියවස් ගණනාවක් පුරාවට අප තේමාවක් දී ඇත්තෙමු. මහා නියෝගය ශුභාරංචිය දේශනා කොට ගෝලයන් බිහි කිරීම යේසුස් වහන්සේගේ ආඥාව ලෙසට. රජතුමා අපට කාර්යභාරයක් ආඥාවක් ලෙස පනවා ඇත.

මහා ආඥාව යනු විශිෂ්ට විකල්පයක මහා වරදකාරී ගමනක් නොවෙයි. එය මහා පූජාවක් ද නොවේ. එය මහගු වරප්‍රසාදයකි. සියල්ලටම පසු භූමික රජ කෙනෙකුගේ අණ ගෞරවාන්විත නම් ස්වර්ගීය රජ කෙනෙකුගේ ආඥාව පූජාවක් ලෙස සලකන්නේ කෙසේද? මෙම මහා නියෝගය භූමික දූතයෝ උදෙසා යේසුස් වහන්සේ විසින් සියල්ලන්ටම දී ඇත. නමුත් බලන්න යමක් අප ඒ තනිව කළ යුතු නැත. එයද උතුම් වූ හවුල් මෙහෙවරයි. එය අප දෙවියන් වහන්සේ සමග සමග අවුල්කාරීත්වයෙන් කළ යුතුය. අප තුළ ජීවත් වන සහ ක්‍රියා කරන්නා වූ ශුද්ධාත්මයාණන් වහන්සේ සමග.

මෙම පළමු ඇදහිලිවතුන් ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් පූර්ණ වීමේ වැදගත්කම දැන ඔවුන් මෙම උතුම් හවුල් දූතන මෙහෙවර ආරම්භ කිරීමට පූර්ණත්වය ලබන තෙක් බලා සිටියහ. ඔවුන් දින දහයක් යාච්ඤා කරමින් සහ ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් එක උදෑසන ශුභාරංචිය බෙදා ගත්තහ. තුන්දාහක් දෙනා අනුගාමිකයන් වූහ. එදින එය ඉවැන්ජ්ලිස්ත සේවයේ ක්‍රියාකාරීත්වයට ශුද්ධාත්මයාණන් වහන්සේගේ හවුල්කාරීත්වයේ ඉතා වැදගත් කම කෙතරම්දැයි ආදර්ශයක් ගෙන දුන්නේය.

ක්‍රියා පොත තුළ කතාවෙන් කතාව පෙන්තකොස්ත දිනයෙන් පසු පළමු වසර තිහ තුළ ශුභාරංචියේ මුල් අභිවෘද්ධිය සඳහන් කරයි. බොහෝ බයිබල් පරිවර්තන තුළදී මෙම පොත අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා ලෙසට තේමා ගත කර ඇත. කෙසේ වෙතත් හොඳම තේමාව විය යුත්තේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ ක්‍රියා යන්නය. පළමු පරිච්ඡේද 13 තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ 40 වතාවක් සඳහන් කොට ඇත. යේසුස් වහන්සේව ද 40 වතාවක් සඳහන් කොට ඇත. මෙය අහම්බයක් නොවේ. මුල් ඇදහිලිවතුන්ව බලගැන්වූයේ ශුද්ධාත්මයාණන් වහන්සේය. යේසුස් වහන්සේව නියෝජනය කිරීම උදෙසා සහ ඔබගේ ජීවිතය ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලගැන්වීම සහ ජීවත්වීම කරන කොටගෙන පමණක්ම ඔබ අවට සිටින්නන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ඔබට හැකියාව ඇත. ඔබ උන්වහන්සේ ඇතුව සිටිය යුතුමය.

## පූර්ණ වන්න

ඇදහිලිවන්තයෙකු ලෙස ඔබට ගත හැකි වැදගත් මෙන්ම තීරණය වන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ සමග පංගුකාරී වීමයි. ඔබ තුළ උන්වහන්සේ ජීවත් විය යුතුමය. එපීසවරුන්ට පාවුල් මෙසේ ලියයි,

> " *මුද්‍රිකපානයෙන් මත් නොවෙන්න, එයින් අනාචාරකම් හටගන්නේය; නුමුත් ආත්මයාණන්ගෙන් පූර්ණවී, " - එපීස 5:18-19*

ශුද්ධාත්මයෙන් පූර්ණ වීම විකල්පයක් නොවේ. ඒ ආඥාවකි. , පාවුල්ගේ හැරීමෙන් පසු ඔහු ශුද්ධාත්මෙන් පූර්ණ විය. සහ ඔහු දැන සිටියා ශුද්ධාත්මයාණන් වහන්සේගේ පූර්ණත්වයෙන් තොරව ඇදහිලිවන්තයෙක්ට ජීවත්වීම අසීරු බව. ඇදහිලිවන්තයෙක් තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ජීවත් වන සේක් නම් අනෙක් මනුෂ්‍ය වර්ගයාගෙන් ඔහුව වෙන් කර තබන සේක. උන්වහන්සේ සරල මිනිසුන් ගෙන ඔවුන්ව ස්වභාව උත්තර මනුෂ්‍යයන් බවට පත් කරන්නේ උන්වහන්සේගේ රාජ්‍යය උදෙසාය.

මා බොහෝ විට ඇදහිලිවතුන් තුළින් අසා තිබෙන නිදහසට කරුණක් වන්නේ ඔවුන්ගේ ඇදහිල්ල බෙදා ගැනීමට ඔවුන් නොදන්නා බවත් හෝ ඔවුන්ගේ ඇදහිල්ල බෙදා ගැනීමට පහසුවක් නොදැනෙන බවය. ඔබට මෙය දොස් නගනවාද ? එසේ නම් මට උද්යෝගිමත් පණිවිඩයක් තිබේ. මේ නිසා තමයි ඔබ තුළ දෙවියන් වහන්සේ ජීවත් විය යුත්තේ. යේසුස් වහන්සේ කිව්වා මාගෙන් අහක්ව යෑම නුඹලාට ප්‍රයෝජනවත්ය. මක්නිසාද මා අහක්ව නොගියොත්, සැනසිලිකාරයාණන් වහන්සේ නුඹලා ළඟට එන්නේ නැත; නුමුත් ගියොත්, උන්වහන්සේ නුඹලා වෙතට එවන්නෙමි, කියා.

ඔබ ශුද්ධාත්මයෙන් පූර්ණ වූ කල්හි උන්වහන්සේ ඔබ නොදන්නා වූ දේ උදෙසා ඔබ තුළින් කතා කරයි. ඔබට අපහසුව දැනෙන විට උන්වහන්සේ ඔබට පහසුව ගෙන දෙයි. නැවතත් ඔබ ශුභාරංචිය බෙදා ගැනීමේදී විශ්වාස කරන්න තනිව එය ඔබෙන් කිරීම අපේක්ෂා නොකෙරේ.

*ඇදහිලිවන්තයෙකු ලෙස ඔබට ගත හැකි වැදගත්ම තීරණය වන්නේ ශුද්ධාත්මයාණන් සමඟ හවුල් වීමයි.*

ඔබ ශුද්ධාත්මයෙන් පූර්ණ වී නැත්නම් මේ මොහොතේම ඔබට එය ලබාගත හැක්ය. එය සරලයි. ඔබ ඔබව හිස් කරන්න. පූර්ණ වී සිටිනවා නම් ඔබව දෙවියන් වහන්සේගෙන් පූර්ණ කිරීමට ඉඩ නැත. ඉන්පසු යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු වීමට ඔබ කළ යුතු දේ කරන්න.

*"මෙසේ නපුරුවූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දනිව් නම්, කොපමණ වැඩියෙන් නුඹලාගේ ස්වර්ගීය පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට ශුද්ධාත්මය නොදෙනසේක්දැයි කීසේක." - ලූක් 11:13*

ඔබ තුළ ජීවත්වන ශුද්ධාත්මයාණන් වහන්සේ මනුෂ්‍යයාට ලබාගත හැකි හොඳම රහසයි. ඔබේ ජීවිතයට අවශ්‍ය කරන සියල්ලෙන් භක්තිවන්තකමෙන් හා ඵලදායිත්වයෙන් උන්වහන්සේගේ රාජ්‍ය උදෙසා ඔබව සන්නද්ධ කරන සේක. උන්වහන්සේ ඔබ තුළට පැමිණි කල්හි ඔබගේ ජීවිතය වෙනස් වෙයි.

## එය සංකේතයකට එහා ගිය දෙයකි

නව ගිවිසුම පුරාවටම ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියා කරන්නේ කෙසේදැයි අපි කියවමු. සමහර අවස්ථාවලදී මේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ සංකේත ලෙස පවසා ඇත. මෙම සංකේත වරදවා තේරුම් ගත් බොහෝ ඇදහිලිවතුන් උන්වහන්සේ ක්‍රියා කරන ආකාරය හෝ ශුද්ධාත්මයාණන් වහන්සේ කවුද යන්න අවාසනාවන්ත ලෙස වරදවා තේරුම් ගෙන ඇත. උන්වහන්සේ ක්‍රියා කරන ආකාරය ගැන ඔවුන් වියවුල් වී ඇත. පරවියා උදාහරණයට ගන්න.

ශුද්ධාත්මයාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨතම සංකේතයක් වන්නේ පරවියාය. මා මුලදි සේවය කළාවූ දේවස්ථානයක ශ්‍රවනාගාරය තුළ ලීයෙන් නිමා කරන ලද විශාල පරවියෙක් විය. දේවස්ථානයේ සිටි එක කාන්තාවක් ඒත්තු ගෙන තිබුණේ ශුද්ධාත්මයාණන් වහන්සේ සැබවින්ම පරවියෙක් කියාය. සමහර අවස්ථාවල ඇයට අත දෙමින් මට කීමද සිතුනේ අපේ ජීවිතයේ උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වයට එය සංකේතයක් පමණක් කියාය.

ශුද්ධාත්මයාණන් වහන්සේ නැමති රූපකය යේසුස් වහන්සේගේ බෞතීස්මයේදී වාර්තාගත වී ඇත. ශුද්ධ ලියවිල්ල පවසන්නේ කුමක්ද? ශුද්ධාත්මයාණන් වහන්සේ ස්වර්ගයෙන් යේසුස් වහන්සේ වෙතට පැමිණ සේක. පරවියෙකු ආකාරයටය. ශුද්ධ ලියවිල්ල පවසන්නේ කුමක්ද? ශුද්ධාත්මයාණන් වහන්සේ ස්වර්ගයෙන් පරවියෙකු ආකාරයට යේසුස් වහන්සේ වෙතට පැමිණි සේක. යේසුස් වහන්සේගේ ජීවිතය තුළ උන්වහන්සේගේ ක්‍රියාව සහ අපගේ ජීවිත තුළ එය පරවියෙකු මෙන්ය.

ඇයි පරවියා? යහපත්, එක කාරණයක් නම්, පරවියා සාමයේ විශ්වීය සංකේතයයි. බයිබලීය කාලයේදී කායිසර්ගේ සංකේතය වූයේ රාජාලියාය. පක්ෂයෙක් රජුන්ව නියෝජනය කළා. පක්ෂයා නිරෝජනය කළේ යුද්ධයෙන් බලය සහ ශක්තිය රෝම නායකයාගේ චරිත ගුණාංගයක් ලෙසයි. යේසුස් වහන්සේ මතට ශුද්ධාත්මයාණන් වහන්සේ පැමිණි කළ මිනිසුන්ට ඒ එළිදරව් කරනු ලැබුවේ යේසුස් වහන්සේ රජ, උන්වහන්සේගේ රාජ්‍ය යුද්ධයෙන් නොව සාමයෙන් නිදහස පාන බවයි.

*ඔබ ශුද්ධාත්මයාණන්ගෙන් පිරී නොමැති නම්, ඔබට මේ මොහොතේම සිටිය හැකිය.*

අපගේ ජීවිත තුළ අප ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පූර්ණ වශයෙන් සිටිය යුතු වන්නේ උන්වහන්සේ සෑම කුණාටුවක් තුළම අපට සමාදානය ගෙන එන නිසයි. ශුභාරංචි ප්‍රකාශ කරන්න උත්සාහ ගන්න. ඔබගේ මනස ක්ෂණිකව ග්‍රහණය කරනු ලබන කුණාටුවක් නොවේද කියා ඔබ තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ජීවත් වෙන්න අවශ්‍යමයි , මහා නියෝගය නොකඩවා කිරීමට ඔබට ගෙනෙන පිණිස. එසේ නොවේ නම් නිදහසට කරුණු හා බිය ඔබව වෙලා ගනීවී. අපගේ ජීවිත තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ ක්‍රියාකාරී වන අනෙක් සංකේත නම් තෙල්, ඇඟිල්ලක් , වතුර, වැස්ස , සුළඟ , පොරොන්දු , මුද්‍රාව, ගඟ, මීදි යුෂ සහ වළාකුලය.

මාගේ කැමතිම ශුද්ධාත්ම සංකේතය වන්නේ ධර්මදූත සේවයේ යෙදෙන විට ගින්නය. එම පෙන්තකොස්ත සභාවේ මා ගායනා කළ ගීත මට සිහිපත් වේ. ගින්න එවන්න ගීතිකාව මම ගායනා කිරීමට අකමැතිව ගීතය විය. ඒ ගායනා කළොත් කුමක් සිදුවේද යන්න මට කිසිත් අදහසක් නොවීය. සැබවින්ම ශුද්ධාත්මයාණන් වහන්සේ ගින්නක් නම් එම ගින්න මා මත පතිත වූවොත් මම කෙසේ බේරෙන්නද?

යෝර්දාන් ගංගාවේ යොහාන් බෞතීස්ම කරමින් සිටින අවස්ථාවේදී සමූහයාට ඔහු පැවසූ දේ මතකද?

*"මම වනාහි පසුතැවිල්ල පිණිස නුඹලා වතුරෙන් බව්තීස්මකරමි. නුමුත් මට පසුව එන තැනැත්තේ මට වඩා බලවත්ය, මම උන්වහන්සේගේ වහන් ගෙනයන්ටවත් නොවටිමි. උන්වහන්සේ ශුද්ධාත්මයාණන්ගෙන්ද ගින්නෙන්ද නුඹලා බව්තීස්මකරනසේක." - මතෙව් 3:11*

පෙන්තකොස්ත දිනයේදී එම ඇදහිලිවතුන් 120දෙනා යාච්ඤා කරන කල්හිː

*"තද හුළඟක් හමන්නාක්මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ, එයින් ඔවුන් හිඳගෙන උන්නාවූ මුළු ගෙය පිරුණේය. ගිනි වැනිවූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය; එය ඔවුන් එක්එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කථාකරන්ට පුළුවන්කම දුන් ප්‍රකාරයට අන්‍ය භාෂාවලින් කථාකරන්ට පටන්ගත්තෝය." - ක්‍රියා 2:2-4*

යම් කාරණා කිහිපයකට අවධානය යොමු කරන්න. ශුද්ධාත්මයාණන් වහන්සේ ගින්නක් නොවෙයි. ගින්නක් මෙන් පැමිණියහ. ඇදහිලිවතුන්ව උන්වහන්සේ පූර්ණ කළ අතර ඔවුන්ට කළ නොහැකි දේ කිරීමට ඔවුන්ව බල ගන්වනු ලැබුවේය. එදින එම නිවසෙන් පිටත සිටි අයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට ශුද්ධාත්මයාණන් වහන්සේ ඔවුන්ට හැකියාව දුන්නු සේක.

ගින්නට බොහෝ කාරණා නියෝජනය කළ හැකිය. ආශාව, පවිත්‍රත්වය සහ බලය. යේසුස් වහන්සේගේ බොහෝ අනුගාමිකයෝ උන්වහන්සේව විශ්වාස කළේ ඔවුන්ගේ ගැළවුම්කරුවාණන් වහන්සේ ලෙස, නමුත් ඔවුන්ට තිබුණ බලය තුළ ඔවුන් ගමන් කළේ නැත. මෙය සිදු නොවිය යුතුය. සටනකදී ඔබ කාමරය පුරා කාලතුවක්කු බෝලයක් පෙරලනවාද? නැත්නම් තුවක්කුවකින් වෙඩි තබනවාද? මා දන්නවා මාගේ තෝරා ගැනීම. එය වචනවල විශාලත්වය නොවේ. එම කාර්යය පසුපස තිබෙන්නා වූ ගින්නයි.

*වැදගත් වන්නේ වචනවල විශ්වීයත්වය නොව, පිටුපස ඇති ගින්නයි*

ගින්න චලනය ප්‍රකාශ කරයි. බොහෝ පාරම්පරික මෝටර් වාහන චලනය වන්නේ ඇන්ජිමේ ඇතිවෙන ගිනි දහනය වීමෙනි. මෙම ගිනි දහනය නොමැතිව කාරයක් චලනය නොවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ උන්වහන්සේගේ රාජ්‍යය උදෙසා අප ඵලදායි වන පිණිස අපව චලනය කොට අප උදෙසා කතා කරයි.

*"උන්වහන්සේ සඳහන් නොකරන්නෙමියි කියාද උන්වහන්සේගේ නාමයෙන් තවත් කථා නොකරන්නෙමියි කියාද කියම් නම්, එය මාගේ ඇට තුළේ වැසී ඇවිළෙන ගින්නක් මෙන් මාගේ සිත තුළ තිබේ, දරන්ට මා වෙහෙසෙන නුමුත් මට බැරිය." - යෙරමියා 20:9*

ගින්නක් මෙන් උන්වහන්සේ සමඟ අප සියලු දෙනාම දැවීමට ශුද්ධාත්මයාණන් වහන්සේ කැමති වන සේක. මෙයින් අර්ථවත් වන්නේ අප උන්වහන්සේගෙන් පූර්ණ වීමයි. අපගේ ජීවිතයේ සම්පූර්ණ පාලනය උන්වහන්සේට අවශ්‍යය. එය මුල් ඇදහිලිවතුන්ට අන්‍ය භාෂාවෙන් කතා කිරීම අවශ්‍ය වූයේ නැති වූවත් හට සන්නිවේදනය කිරීමටයි. නමුත් ඒ එකිනෙකාටද සන්නිවේදනය වූයේ ශුද්ධාත්මයාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම ඔවුන්ව පාලනය යටතට ගැනීමෙනි. දේව වචනය සඳහන් කරන්නේ: "නුමුත් දිව දමනය කරන්ට කිසි මනුෂ්‍යයෙකුට නුපුළුවන. ඒක කැරළිකාරවූ, මරණීය විෂයෙන් පූර්ණවූ, නපුරු දෙයක්ය." - (යාකොබ් 3:8)

# මෝටර් බෝට්ටු සහ රුවල් බෝට්ටු

ඇදහිලිවන්තයෙකු ලෙස ඔබට ජීවත් විය හැකි ආකාර දෙකකි. රුවල් බෝට්ටුවක් හෝ මෝටර් බෝට්ටුවක් ලෙස. බොහෝ දෙනෙක් ජීවත් වන්නේ මෝටර් බෝට්ටු මෙනි. තමන්ගේ ජීවිතයේ වේගය තෝරාගෙන තමන්ට යන්නට ඕන කුමන ස්ථානයක් වේවා ඔවුන් යන්නෝය. සුළු ඇදහිලිවතුන් පිරිසක් රුවල් බෝට්ටු මෙන් ජීවත් වෙති. ශුද්ධාත්මයෙන් පූර්ණව උන්වහන්සේ පිඹින කල ඔවුන් චලනය වේ. ඔවුන් යන්නේ කොහාටද සහ උන්වහන්සේට ඕන ස්ථානයටය. ඔවුන්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම ශුද්ධාත්මයාණන් වහන්සේට යටත් ය.

මේ ආකාරයට අප සියලු දෙනා ජීවත් විය හැකිය.

එසේම අපේ ජීවිත ජීවත් විය යුතුය. ශුද්ධාත්මයාණන් වහන්සේ ඇතුළු වූ කළ ඔබගේ සැලසුම් වලට බාධා කරන්න ඔබ සූදානම් විය යුතුය. ඔබ කිසිදා බලාපොරොත්තු නොවුන ඔබගේ ස්ථාන ගැනීමට උන්වහන්සේ තුළ ඔබ සූදානම් විය යුතුය. සුළඟක් මෙන් රුවල් බෝට්ටුවක් ඇතුල්ව එය රුවල සහ බෝට්ටුව බලයෙන් පුරවයි. එසේම ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබව පුරවා උන්වහන්සේගේ පරමාර්ථය උදෙසා ඔබව බල ගන්වයි. ඔබට අධිපති හා බලය ඇතිව යන සෑම තැනකට සාක්ෂි දරන්න හැකියාව ලැබෙයි. ශුද්ධාත්ම බලයෙන් පූර්ණ ඇදහිලිවතුන් ශුභාරංචියේ යෂ්ඨිය රැගෙන යන විට ශුභාරංචිය ඉක්මනින් ප්‍රකාශ ව.

රයින්හාර්ඩ් බොංකේ, ලෝක ඉතිහාසයේ සිටි එළදායී වැන්ජලිස්තවරයා 1962 ජනවාරි 26 වනදා ලන්ඩනයේ දේශනා කිරීමට යෂ්ඨිය ලද මොහොතේ:

*"ශුභාරංචිය යනු සහය දිවීමේ තරගයේ යෂ්ඨිය හා සමානය. එදින මගේ අතට යෂ්ඨිය පත්විය. ගින්න මා තුලෙහි විය. ගින්න නිරන්තරයෙන්ම නැවුම්ය. ශුභාරංචියේ යෂ්ඨිය නිතරම පරණය. එය හුවමාරු වෙමින් පවතී. ලන්ඩනයේ එදින දැන් මා තේරුම් ගන්නේ යෂ්ඨිය හා ගින්න හමුවූ බවයි."*

යෂ්ඨිය හා ගින්න හමුවූ බවය.

එම දේම මුල් ශත වර්ෂයේ ඇදහිලිවතුන්ටද සිදුවිය. ශුද්ධාත්මයෙන් පූර්ණව ඔවුන් අධිරාජ්‍ය මුළුල්ලේ ශුභාරංචිය ගෙන ගියහ. යේසුස් වහන්සේගේ අනුගාමිකයන් ඊශ්‍රායලය, පලස්තීනය හා සුළු ආසියාව තුළ මතුවෙන්නට පටන් ගත්හ.

පාවුල් මකිදෝනිය, ස්පාඤ්ඤය සහ සයිප්‍රස් හරහා යේසුස් වහන්සේව ප්‍රකාශ කළේය. තීතස් ක්‍රීත දූපත ඉවැන්ජලිස්ත කරන කලෙය. තද්දියුස් ....... දේශනා කළේය. මාර්ක් අලෙක්සන්ද්‍රියාවේ, පේතෘස් බිතිනියේද, තෝමස් ඉන්දියාවේද , නොදන්නා වූ දහස් ගණන් ඇදහිලිවතුන් යේසුස් වහන්සේ රජු හැටියට සෑම කෙනෙක්ම අනුගාමිකයන් කළහ.

"ශුභාරංචියේ යෂ්ඨිය භාරදී හමාරය. පෙන්තකොස්ත නිවාඩු දිනයේ පාවුල් ප්‍රකාශ කළා: "මක්නිසාද ඒ පොරොන්දුව නුඹලාටත් නුඹලාගේ දරුවන්ටත් අපගේ ස්වාමිවූ දෙවියන්වහන්සේ යම් පමණ දෙනෙකු උන්වහන්සේ වෙතට කැඳවන සේක්ද දුර සිටින්නාවූ ඒ සියල්ලන්ටත්යයි කියා," - (ක්‍රියා 2:39)

*ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබේ සැලසුම් වලට බාධා කරන බවට ඔබ සූදානම් විය යුතුය.*

විශ්වීය ශුභාරංචි ප්‍රකාශය ඇරඹුණි. දෙවියන් වහන්සේ සමඟ පංගුකාරීත්වය තුළින් !

# 3

# 100 ගණන් වල - යාච්ඤාව

*නමුත්... මට දේශනා කළ නොහැක*

*දේශනාවක් සූදානම් කිරීමට ඔබගේ අධ්‍යයනයන් සඳහා නොයන්න. එය තේරුමක් නැත. දෙවියන් වහන්සේ වෙතට යන්න. එවිට ඔබගේ අධ්‍යයනය ගින්නක් මෙන් වී, ඔබගේ දිව ගිනි අඟුරක් කොට කතා කරන්න. - සී.ටී. ස්ටුඩ් දහනම වන සියවසේ බ්‍රිතාන්‍ය ජාතික මිෂනාරිවරයා වූයේ, චීනයටය*

යාච්ඤාවෙන් පූර්ණ දෙවන සියවසේ ඇදහිලිවතුන් වෙත ශුභාරංචියේ යෂ්ඨිය හුවමාරු වී ඇත. මෙම පරම්පරාව දැන සිටියා ඔවුන් දෙවියන් වහන්සේ වෙතට ළං වුණොත් මනුෂ්‍යයන් විසින් ඔවුන්ව බිය ගැන්වීමට නොහැකි බව. යෙරුසලම සහ යුදය මුළුල්ලේ සහ සමාරියේත් සාක්ෂිකරුවන් වීම කිසිම මනුෂ්‍යයෙකුට නොනැවැත්විය හැකි බව ඔවුන් දැන සිටියහ. නමුත් දැන් මුළු ලොව කරා දූත මෙහෙවරක.

ඔවුන් ශුභාරංචිය නැගෙනහිර අරාබිය, පර්සියාව දක්වා ගෙන ගියහ. බටහිර ඇලෙක්සැන්ද්‍රියාව තුළින් උතුරු අප්‍රිකාවටත්, උතුරු පළාතෙන් ආමේනියාවට, කොන්තස් සහ අවසානයේ අද හැඳින්වෙන ප්‍රංශය සහ බ්‍රිතාන්‍යයටය. ඔවුන් යාච්ඤා කොට දේශනා කළා.

යේසුස් වහන්සේ සහ දූත මෙහෙවර උදෙසා ඔවුන්ගේ ප්‍රේමය තුළින් ජීවිත පූජා කිරීමේ කිතුණුවන්ගේ වීරෝධාර කතා රැසක් ඇත. කිතුණුවන්ට ප්‍රාණ ත්‍යාගය පොදු අත්දැකීමක් විය. නමුත් ශුභාරංචියේ බලයද එසේම විය. මෙම ඇදහිලිවතුගේ නිලය කුමක් වුවත් ක්‍රිස්තුස් වහන්සේ සහ උන්වහන්සේගේ පණිවිඩය අල්ලාගෙන සිටියහ.

ක්‍රි.පූ 155 වන විට අවුරුදු 86ක් වයස පොලිකාප් නම් මනුෂ්‍යයා ශුභාරංචිය ස්මරණා නුවර වන අද නැගෙනහිර තුර්කිය යැයි හැඳින්වෙන වරාය නගරයේ ආශාවෙන් ප්‍රකාශ කළේය. පොලිකාප් අධ්‍යාපනය ලැබුවේ යොහාන් ගෙන්ය. යේසුස් වහන්සේගේ ගෝලයන් දොළොස් දෙනාගෙන් කෙනෙක් ය. ස්මරණාහී බිසොප් තනතුරේ යොහාන් විසින් ඔහුව ආලේප කරන ලදී. පොලිකාප් යාච්ඤාවේ මනුෂ්‍යයක් හා ශුභාරංචි දේශකයෙක් විය.

බලධරයෝ පොලිකාප්ව ඔහුගේ ඇදහිල්ල නිසා අත්අඩංගුවට ගෙන ජනගහනයෙන් පූර්ණ පිටියකට ගෙනෙන ලදී. ඔහුගේ නිර්දෝෂී චරිතය සහ ස්මර්ණා ජනතාව උදෙසා ඔහු දැක්වූ ප්‍රේමය සිංහයන්ට ඔහුව කන්නට දීමට අකමැති විය.

"සරලවම කායිසර්ගේ නාමයෙන් දිවුරන්න" ආණ්ඩුකාරයා අයදීය.

" මම කිතුණුවෙක්මි." පොලිකාප් ප්‍රතිචාර දැක්වීය. " එය කුමක්දැයි ඔබට දැනගන්නට අවශ්‍ය නම් දිනයක් වෙන් කරගෙන අසා සිටින්න."

ආණ්ඩුකාරයා පොලිකාප්ට ඔහුගේ ඇදහිල්ල සහ ඔහුගේ පණිවිඩය ප්‍රතික්ෂේප කිරීමට ඉල්ලා සිටි අතර එසේ නොකළහොත් මෘගයන්ට කෑමට විසි කරන බව පැවසීය.

" ඔබගේ මෘගයන් ගේන්න" පොලිකාප් පැවසීය.

"ඔබ මෘගයන්ට අවමන් කළහොත්, මම ඔබව පුළුස්සා දමමි." ආණ්ඩුකාරයා පිළිතුරු දුන්නේය.

"පැයකට දැල්වෙන ගින්න ගැන කියා මාව බය කරන්නද ඔබ හදන්නේ? ඔබට අමතකද සදාකාලිකව දැවෙන නිරයේ ගින්න නොනිවෙන බව" ආණ්ඩුකාරයාට හා ජන සමූහයාට පොලිකාප් නොනවත්වාම ශුභාරංචිය ප්‍රකාශ කළේය.

ආණ්ඩුකාරයාට ඇති විය. ගින්න දැල්විනි. පොලිකාප්ට අවසාන වතාවක් දෙන ලද්දේ නැවතත් දේශනා කිරීම නවත්වා ප්‍රතික්ෂේප කිරීමටය. නමුත් පොලිකාප්ට දේශනා කිරීමට ශුභාරංචියක් විය. ඔහුගේ අවසාන ප්‍රතිචාරය පැමිණෙන්නේ යාච්ඤා ජීවිතයේ ගැඹුරු මොර ගැසීමකිණි.

"අවුරුදු අසූ හයක් මා උන්වහන්සේට සේවය කළෙමි. උන්වහන්සේ මට නිසාක වරදක් කලේ නැත. එසේ නම් මා කෙසේ මාගේ රජු හා ගැලවුම්කරු ප්‍රතික්ෂේප කරම්ද?"

පොලිකාප්ව පුළුස්සා දැමුවා.

මෙම දෙවන සියවසේ ඇදහිලිවතුන් පළමුවෙන්ම දුටුවා යාච්ඤාව මුහු කරන ලද ශුභාරංචිය නොනැවත්විය හැකි බලවේගයක් බව.

කෙරුස්සෝ (KERUSSO)

යෞවන කිතුණුවකු ලෙස මම පළමුවෙන්ම ඇසුවේ "ලොව මුළුල්ලේ ගොස් ශුභාරංචිය දේශනා කරන්න" යන යේසුස් වහන්සේගේ ආඥාවය. මට ක්ෂණිකවම සිහිපත් වූයේ මගේ පූජකතුමන් හා මාධ්‍යයේ දේශනා කරන ප්‍රසිද්ධ දේශකයෙක් සහ මා බියෙන් තැති ගත්තෙමි. මට දේශනා කළ නොහැක. ප්‍රසිද්ධියේ කතා කිරීම මා එපා කෙලෙමි. මට දේශනා කිරීම අර්ථවත් වූයේ වේදිකාවක් මත සිටගෙන ඝෝෂ බහුව (microphone) අතැතිව දේව වචනයෙන් මිනිත්තු 30ක් පණිවිඩය දීමකි. දේශනා කිරීම යනු වචනය ඇසෙන විට ඔබගේ හිසට මෙම පින්තූරය නොපැමුනේද? එය තමයි තේරුම නිවැරදිද? වැරදියි.

දේශනා කිරීම යන වචනය ඉවැන්ජලිස්ත සේවය තුළ විවේචනාත්මක වචනයකි. ග්‍රීක් භාෂාවෙන් මාගේ ප්‍රියතම වචනය මෙය වේ. යේසුස් වහන්සේ එය භාවිතා කළේ පැහැදිලි කිරීමටයි. උන්වහන්සේ රාජ්‍ය සහ පණිවිඩය මුළු ලොව පුරා පැතිර ගියහොත් උන්වහන්සේ අදහස් කළ දේ උන්වහන්සේගේ ගෝලයන්ට වැටහෙනු ඇත.

ග්‍රීක භාෂාවෙන් දේශනා කිරීම යනු කෙරුසො (kerusso)යන වචනයයි. එහි තේරුම පණිවිඩයක් ප්‍රකාශ කිරීම හෝ නිවේදනය කිරීමයි. නමුත් තව බොහෝ දේ ඇත. ඔබට පෙනෙනවා නිශ්චිත පණිවිඩය (kerux) විසින් ලබා දෙන ලදී. මෙය හුදෙක් කිසිදු පණිවිඩයක් නොවන අතර ( kerux ) යනු යම් පුද්ගලයෙකුට නොවේ.

kerux යනු රාජධානියක තීරණාත්මක පුද්ගලයෙකි. ඔහු රජුගේ නිල ප්‍රකාශකයා විය. ඔහුට රාජධානියේ ඉහළම සහ උතුම්ම තනතුර හිමි වූයේ සතියේ දින හතේම දවසේ පැය 24 පුරාවටම රජු වෙත ප්‍රවේශයේ තිබූ එකම පුද්ගලයා ඔහු වූ බැවිනි.

රජුට නිවේදනයක් නිකුත් කිරීමට, නව නීතියක් ප්‍රකාශ කිරීමට නියෝගයක් දීමට හෝ ප්‍රවෘත්ති බෙදා ගැනීමට අවශ්‍ය වූ විට ඔහු ප්‍රකාශකයාට kerux ට ඔහුට පැවසීමට අවශ්‍ය දේ, එය පැවසීමට අවශ්‍ය ආකාරය, පණිවිඩය පිටුපස ඔහුගේ ආකල්පය කුමක්ද සහ පණිවිඩය වැදගත් වූයේ මන්දැයි කියයි. රජුගේ හැඟීම් හදවත සහ හැඟීම් ජනතාවට දැනුම් දීම kerux ගේ වගකීම විය.

කිව යුතු දේ සහ රජුට ඒ කෙසේ ලබාදිය යුතුද යන්න kerux හරියටම දැනගත් පසු ඔහු රජු වෙනුවෙන් කතා කිරීමට සූදානම් විය. kerux රජුගේ කුටියෙන් නික්ම ගොස් ජනතාව ඉදිරිපිටට පැමිණ සියල්ලන්ටම ඇසෙන පරිදි පණිවිඩය කෙරුසෝ (දේශනා ) කරනු ඇත.ඔහු ජනතාවට රජු නියෝජනය කළේය. රජුගේ ප්‍රකාශකයා ලෙස ඔහුට තමාගේම පෞද්ගලික අදහස් දැක්වීමට සහ අවධානය යොමු කර ගැනීමට අයිතියක් නොතිබුණි. ඒ සියල්ල රජු සහ ඔහුගේ පණිවිඩයයි. ඔහු ගොස් සහ පවසන්නේ රජුට ප්‍රකාශ කිරීමට අවශ්‍ය දේ පමණි.

ගෝලයන්ටත්, පළමු සියවස් වල ඇදහිලිවන්තයන්ටත් ඔබටත්, මටත් ආඥාවක් යේසුස් වහන්සේ දුන්නේ ලොව මුළුල්ලේ ගොස් කෙරුසෝ ( දේශනා ) ශුභාරංචිය දේවස්ථානයේදී, දේව මෙහෙය තුළ පණිවිඩය නිදහස් කළ යුත්තේ කෙසේද කියා ඔබ දැන සිටීම අවශ්‍ය නැත. දේශනා කරන්න කියා යේසුස් වහන්සේ කීවේ , මෙම අර්ථය ඇතිව නොවේය . අප වටා සිටින ජනතාව අතර දෛනික අන්තර් ක්‍රියාවලියේදී අප උන්වහන්සේගේ ප්‍රකාශකයා වීම අපෙන් උන්වහන්සේ බලාපොරොත්තු වන සේක . දේශනා කිරීමට අපට පණිවිඩයක් ඇත . නමුත් කෙසේ දේශනා කරන්නද ? දේශනා කළ යුත්තේ කවදාද? අප දේශනා කරන සෑම පුද්ගලයෙක්ම පැමිණෙන්නේ රජතුමා සමඟ අප ගතකරන පුද්ගලික කාලයට අනුවය .

දිනපතා අපේ යාච්ඤාවේ නොයෙදෙන්නේ නම් උන්වහන්සේගේ සෙනග වෙතට හෝ අප වෙතට උන්වහන්සේගේ හදවත කිසි කලෙකත් දිනාගත නොහැක . අප උන්වහන්සේව දැනගත යුතුය , ප්‍රශ්න ඇසිය යුතුය සහ උන්වහන්සේට සවන් දිය යුතුය . උන්වහන්සේ අපගේ කල්‍යාණ මිත්‍රයා ගැලවුම්කරු සහ දෙවියන් වහන්සේය. එවිට යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ සමඟ උන්වහන්සේගේ මෙහෙවරේ එකට වැඩ කළ හැක .

# හඬ ඇසීම

2013 අතරතුර කාලයේ දී ඩලාස්, ටෙක්සාස් හී පාපන්දු දේව ගැතිවරයා ලෙස හෝ සහාය දෙන්නා ලෙස වෘත්තිමය පාපන්දු කණ්ඩායම තුළ මා සිටියෙමි . මෙම කුඩා කාමර තුළට යෑමේ ගෞරවය අපට තිබුණි . ක්‍රීඩකයන්ට, පුහුණුකරුවන්ට සහ කාරිය මණ්ඩලයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමටද අපට හැකි විය. එය ඇදහිය නොහැකි අවස්ථාවකි.

ක්‍රීඩා දිනයන්හිදී ප්‍රධාන පූජකවරයා ලෙස මා කටයුතු කළ කණ්ඩායම් සඳහා මා ඔවුන් සමඟ පැතිකඩ රේඛාවේ ක්‍රීඩා අවස්ථාවේ සිටගෙන සිට සිටිමි. සමූහයා සෝෂා කරන විට ක්‍රීඩාගාරය ඇදහිය නොහැකි තරම් සෝෂාකාරී නිසා මා ක්‍රීඩකයෙකු ළඟ සිටගෙන සියලු ආකාරයේ අඥාන දේවල් පවසමින් විනෝද වෙමි. ක්‍රීඩකයාට කිසිවක් නොඇසෙන නිසා මම මෙසේ කියමි . ඔව් මා දෙස බලා සිනාසෙන්නේ ඔහු ගැන මා ප්‍රශංසා කරනවා යැයි සිතාය .

මම පැතිකඩ රේඛාවේ සිටගෙන සිටින එක් ක්‍රීඩාවක අපූර්ව දෙයක් සිදුවිය සමූහයා නැගිට සිට සෝෂා කරන අවස්ථාවේදී එය සිදුවිය . මහත් වූ ශබ්දය නිසා කුමක් කියන්නේ දැන් තේරුම් ගත නොහැකි විය . මම ප්‍රධාන පුහුණුකරු පසුපස සිටගෙන සිටියෙමි . එය ඔහුට කරදරයක් ලෙස මට දැනුණි . කණ්ඩායම අවසන් කලාපයට යාර කිහිපයක් නුදුරින් විය . පුහුණුකරුගෙන් ආර හතළිහක් නුදුරින් ඔවුන් අපට පසු පස හරවා සිටියහ . ක්ෂණයකින් පුහුණුකරු කෑ ගැසීය . ”හේයි, ක්ලින්ට්!”

*අපගේ රජුගේ හඬට සවන් දීමට සහ ශුභාරංචිය ඵලදායී ලෙස බෙදා ගැනීමට ඔබට හැකි එකම ක්‍රමය නම්, උන්වහන්සේ සමඟ දිනපතා යාච්ඤාවෙන් කාලය ගත කිරීමයි.*

ක්ෂණයකින් ක්ලින්ට් මඳක් හැරී, පුහුණුකරු සමඟ ඇසට ඇස ගැටුණි. මම පුහුණුකරු පසුපස සිටිතත් ඔහු කිවූ දේ මට හරියටම නොඇසුනි . පුහුණුකරු තව ක්‍රීඩාවකට කෑ ගැසීය . ක්ලින්ට් හිස සැලීය . පරණ ක්‍රීඩාව අලුත් ක්‍රීඩාවකට මාරු කළේය . කණ්ඩායමට ලකුණක් හිමි විය . මා කම්පනයට පත්ව සිට ගත්තෙමි.

වොව්. ක්ලින්ට කෙසේ හෝ පුහුණු කරුගේ හඬ ඇසුණි. ප්‍රතිඵලයක් ලෙස කණ්ඩායම ලකුණු ලබා ගත්තහ. අපි ජය ගතිමු. නමුත් එදා ඉතා වැදගත් ලෙස මම ජය ගතිමි. මම දූතන මෙහෙවර ගැන පාඩමක් ඉගෙන ගතිමි.

ක්ලින්ට පුහුණුකරුගේ හඬ ඇසුණේ දිනපතා පුහුණුව තුළ පුහුණුකරු සමග ඔහු කාලය ගත කළ නිසාය . දවස් පතා , සතිපතා , වසරක් පාසා වසරක් ඔවුන් එක්ව වැඩ කළහ. එවිට පුහුණුකරු ඔහුගේ නම කියා හඬ ගසන විට ක්ලින්ගේ සවන් පුහුණුකරුට සුසර විය . ඔහු දැන සිටියා ඒ ඔහුගේ පුහුණුකරුගේ හඬ බව . පුහුණුකරුගේ හඬ මිස වෙන කිසිවෙකුගේ හඬක් මිස ක්‍රීඩාංගනයේ වෙන කිසිවෙකුගේ හඬක් නොවන බව.

*ප්‍රසිද්ධියේ සිදු වූ දේ, යේසුස් වහන්සේ පෞද්ගලිකව කළ දේවල සෘජු ප්‍රතිඵලයකි. සරලව කිවහොත්, යේසුස් වහන්සේ යාච්ඤා කළ මිනිසෙකි.*

යේසුස් වහන්සේ කීවා ” මාගේ බැටළුවෝ මාගේ හඬ අසති, මමද ඔවුන් අඳුනමි, ඔව්හු මා පස්සේ එති.” අපගේ රජතුමාගේ හඬ ඇසීමට සහ ශුභාරංචිය ප්‍රකාශනයේ ඵලදායී වීම උදෙසා ඇති එකම මාර්ගය නම් දිනපතා යාච්ඤාවෙන් උන්වහන්සේ සමඟ කාලය ගත කිරීමය. ඔබගේ ජීවිත කැඳවීම ඔබට ජයග්‍රහණය කළ හැකි වන්නේ දෙවියන් වහන්සේගේ හඬ ඔබ දැන සිටියොත් පමණි . එසේ නොවුනොත් මාධ්‍යයේ හඬ , අපගේ පවුල් , අපගේ මිතුරන්, අසල්වාසීන් , හවුල් සේවකයන් සහ දහස් ගණන් අන් අය සියලු මාර්ගවලින් අප කරා පැමිණ උන්වහන්සේට සවන් දීම අපෙන් වළක්වනු ඇත.

# යේසුස් වහන්සේ කුමක් කළ සේක්ද?

යේසුස් වහන්සේ සමඟ දෛනික ජීවිතයේදී ගෝලයන්ට අත්දකින්න ලැබුණේ මොනවාදැයි ඔබට සිතා ගත හැකිද? යේසුස් වහන්සේගේ සෑම ස්ථානයකම උන්වහන්සේ බලාපොරොත්තුව ගෙනා සේක. උන්වහන්සේගේ වචන වලට ආධිපත්‍ය විය. උන්වහන්සේගේ පණිවිඩයට බලය තිබිණි. උන්වහන්සේගේ

ක්‍රියාව සියල්ලන්ව වෙනස් කළේය. අන්ධයන් පෙනීම ලැබූහ. ලාදුරු රෝගීන් සුව විය. යක්ෂයන් පලා ගියහ. මළවුන් නැවත නැගිටුවනු ලැබූහ. යේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය ඊශ්‍රායෙල්හී ගම් නියම්ගම් නිහඬ කළේය.

නමුත් , අවුරුදු තුනක් යේසුස් වහන්සේ ගෝලයන් සමග සිටි සමයේ සමූහයා නොදුටු යමක් ඔවුන් දුටුහ. ඔබ දුසිම් ගණන් වාර කියවූ යම් දෙයක් ශුද්ධ ලියවිල්ලේ ගැඹුර  තුළින් සිතන්නට නොනවතින්න ඇති.

ප්‍රසිද්ධියේ සිද්ධ වුණා වූ දේ යේසුස් වහන්සේ පුද්ගලිකව කළා වූ දේහි සෘජු ප්‍රතිඵලයකි. සරලව පැවසුවහොත් යේසුස් වහන්සේ යාච්ඤාවේ  මනුෂ්‍යයෙකි.

පහන් වෙන්ට ප්‍රථමයෙන්, රාත්‍රී මුළුල්ලේ, රහසින්, කඳු මුදුනක, වනාන්තරයේ, කෑමට පෙර, අමාරු අවස්ථාවලදී, සෙනග අතරේ, ලාසරුස්ගේ සොහොනේ, ගෙත්සෙමනේදී සහ කුරුසියේ උන්වහන්සේ මැරෙන මොහොතේදී පවා යේසුස් වහන්සේ යාච්ඤා කළ සේක.

යේසුස් වහන්සේ යාච්ඤාවේ  මනුෂ්‍යයෙකි. උන්වහන්සේ රජ වුවත් උන්වහන්සේගේ රාජකීය වස්ත්‍ර ගලවා, පසෙකලා මිනිසාගේ සම පැළඳ ශුභාරංචියේ යෂ්ටිය  දරන්නා වූ පළමු ලබන්නන් හට ආදර්ශයක් දුන්නේ එලදායී ප්‍රසිද්ධ ජීවිතයක රහස වන්නේ යාච්ඤාව  කියාය. පියාණන් වහන්සේ සමග යේසුස් වහන්සේ යාච්ඤාවෙන් කාලය ගත කළ සේක. උන්වහන්සේගේ හඬ අසමින්, උන්වහන්සේගේ ක්‍රියා බලමින් ඉන්පසු කෙරුසෝ ( දේශනා ) ශුභාරංචිය ප්‍රකාශ කළ සේක.

> *"එබැවින් යේසුස්වහන්සේ උත්තරදෙමින්ඃ සැබවක් සැබවක් නුඹලාට කියමි-පියාණන්වහන්සේ යමක් කරනවා පුත්‍රයා දක්නේද ඒ දේ මිස තනියම කිසිවක් කරන්ට ඔහුට බැරිය. මක්නිසාද උන්වහන්සේ යමක් කරන සේක්ද පුත්‍රයාත් ඒ දේ එසේම කරන්නේය. කුමක්හෙයින්ද පියාණන්වහන්සේ පුත්‍රයාට ප්‍රේමකරනසේක, තමන්වහන්සේ කරන්නාවූ සියල්ල ඔහුට පෙන්වනසේක. නුඹලා මවිතවන පිණිස මීට වඩා මහත් ක්‍රියාවලුත් ඔහුට පෙන්වනසේක." යොහන් 5ඃ19-20*

යේසුස් වහන්සේගෙන් ගෝලයන් කළ එකම ඉල්ලීම වූයේ, අප යාච්ඤා  කළ යුත්තේ කෙසේදැයි අපට උගන්වන්න කියාය. එය පුදුමයක් නොවේ. හොඳ ව්‍යාපාරිකයෙකු වීමට, උතුම් වූ විවාහ ජීවිතයක් ගත කරන්නේ කෙසේද, මුදල් උපයන්නේ කෙසේද හෝ නව නිපැයුමක් කරන්නේ කෙසේද කියා ඔවුන්ට අසන්න තිබුණා. නැත. ඔවුන්ගේ එකම ඉල්ලීම වූයේ යාච්ඤා කරන්නේ කෙසේදැයි දැන ගැනීමය.

## ඔබගේ රාජ්‍යය පැමිණේවා

කණ්ඩායමක් ක්‍රීඩාංගණයට දිවීමට මත්තෙන් කුඩා කාමර තුළ දණගසා ස්වාමීන්ගේ යාච්ඤාව කියති. යාච්ඤා  කරන්නේ කෙසේදැයි ගෝලයන් ඇසූ කල යේසුස් වහන්සේ දුන් සෘජු සැලැස්ම එයයි. මෙම යාච්ඤාව  මැද මෙම වැකි අමුණා ඇතඃ

> *"ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙන් මෙන් පොළොවෙහිද කරනු ලැබේවා " මතෙව් 6ඃ9-10*

ඔබ කවදා හෝ සිතුවාද යාච්ඤා කිරීම කොතරම් ගෞරවයක්ද කියා. යාච්ඤාව  යනු අපප රජතුමා සමඟ කාලය ගත කිරීමයි. ජීවිතයේ පීඩන අපව යාච්ඤාවට යොමු නොකළ යුතුයි; නමුත් දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ සතුට. අප යාච්ඤා  කරන කල්හි අප මතක තබා ගත යුත්තේ එය අප ප්‍රාර්ථනාවක් කිරීම හෝ දෙවියන් වහන්සේගේ කැමැත්ත වෙනස් කිරීමට බල කිරීම නොවන බවයි. අප දෙවියන් වහන්සේගේ කැමැත්තට අපගේ කැමැත්ත අනුකූල කිරීමයි. උන්වහන්සේගේ හදවත කඩන කාරණා සමඟ අපගේ හදවත කඩන්න කියායි. අපගේ ආත්මාර්ථකාමී ආශාවන් සියල්ලන් ගැලවීම ලැබීම උදෙසා උන්වහන්සේගේ ආශාවට ආදේශ කිරීමයි. උන්වහන්සේගේ රාජ්‍යය අප වෙතට එන්නයි ඉල්ලීමයි.

*යාච්ඤාව යනු දෙවියන් වහන්සේව පාලනය කිරීමට හෝ අපගේ කැමැත්තට ඇද ගැනීමට උත්සාහ කිරීම නොවේ, එය දෙවියන් වහන්සේ අපව පාලනය කිරීමට සෙවීමයි.*

චාල්ස් පර්ජියන් හොඳින් හඳුනන්නාවූ 1800 වසරේ ඉවැන්ජලිස්ටවරයෙකි. මෙම කරුණ හඳුන්වා දීමට ඔහු නැංගුරම්ලූ බෝට්ටුවක් නිතර භාවිතා කරයි. ඔහු මෙසේ පවසයි, " ඔබ බෝට්ටුවක නැංගුරමක් විසිකර වෙරළ අල්ලාගෙන

ගිලෙන විට  ඔබ වෙරළ ඔබ වෙතට ඇද ගන්නවාද? නැතහොත් ඔබ වෙරළට
ඇද ගන්නවාද? " ඇත්ත වශයෙන්ම අපි අපිවම වෙරළට ඇදගනිමු. ඒ හා සමාන යාච්ඤාව යනු දෙවියන් වහන්සේව පාලනය කිරීමට හෝ අපගේ කැමැත්තට ඇදගැනීමට උත්සාහ කිරීමක් නොවේ. එය අප දෙවියන් වහන්සේව සොයන්නේ අපව පාලනය කිරීමටයි.

යේසුස් වහන්සේ අපට කීවේ, එන්න උන්වහන්සේව අනුගමනය කරන්න. නමුත් අවාසනාවන්ත ලෙස බොහෝ මනුෂ්‍යයන් යේසුස් වහන්සේ ගෙන්ද එය බලාපොරොත්තුවේ. ඔවුන් කියන්නේ යේසුස් වහන්සේට එන්න අපව අනුගමනය කරන්න. රාජ්‍යය එසේ ක්‍රියාකාරී නොවේ. ඇදහිලිවන්තයෙකුගේ ජීවිතය යනු  අපගේ ලෝකයට පියවර තබන්න යැයි දෙවියන් වහන්සේගෙන් ඉල්ලීම නොවේ. නමුත් අප උන්වහන්සේ වෙතට පියවර තැබීමකි. එය ඔබගේ රාජ්‍යය පැමිණේවා, ඔබගේ කැමැත්ත සිදු වේවා යන්නය. මතක තබා ගන්න, අප ප්‍රකාශකයන් මිස රජතුමා නොවන බව.

# යාච්ඤා  කරන්න සහ දේශනා කරන්න

එකක් හැර එකක් ඔබට කළ නොහැකිය.එළදායි දූතන මෙහෙවර උදෙසා මෙම පාද දෙක අවශ්‍යය. ඔබ එකක් කලොත් එනම් යාච්ඤා  කර දේශනා නොකළොත් සහ දේශනා කර යාච්ඤා  නොකළොත් කේන්ද්‍රය වටා තනි පාදයෙන් නොකඩවාම පනිනු ඇත. ඔබ අසමබරව සිටි.

සයවන සියවස අවසානයේ මහා ග්‍රෙගරි එඬේර සැලකීම පිළිබඳ පොතක් ලිව්වේය. ඒ තුළ ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙක් අන් අයට උපකාර කිරීමෙහිලා බොහෝ අවශෝෂණය වී යාච්ඤාව අමතක කිරීම හෝ බොහෝ වේලා යාච්ඤාවෙන්  ගත කිරීම තුළින්  අප ඇදහිලිවන්තයන් ලෙස අපගේ වගකීම් අතපසු නොකළ යුතුය. අපගේ ස්වාමීන් වහන්සේ කන්දට ගොස්  නොකඩවා යාච්ඤා  කළ සේක. නගර තුළ සිදුවුනාවූ මහත් හාස්කම් අපට පෙන්නන්නේ ඉහළම දේ අපේක්ෂා කරන බවත් දුර්වල බෙලහීනයන්ගේ අවශ්‍යතා සම්බන්ධයෙන් අනුකම්පාවෙන් අප මිදිය යුතු බවත්ය. ග්‍රෙගරි  විසින් ලියන ලදී.

දේව වචනය දේශනා කරමින් නගරයේ හාස්කම් කරමින් කන්දට ගොස් යාච්ඤා  කිරීම අතපසු නොකොට ඔහු වෙහෙසට පත්ව ක්‍රි.ව 604දී ග්‍රෙගරි මරණයට පත්විය. ඔවුන්ගේ ඔහුගේ එපීටො සරලව සඳහන් කළහොත් "දෙවියන් වහන්සේගේ තානාපති ".  ඔහු සමබර ඇදහිලිවන්තයෙකි. ඔහු බොහෝ ජනතාවක් යේසුස් වහන්සේගේ සුභාරංචිය වෙතට ගෙනාවේය.

කවදා හෝ දවසක ඔබ සුවිස් ඇල්ප්  හරහා ධාවනය කර තිබේද? සෑම කොනකම පාසා විශ්මයජනක දසුන්, ප්‍රත්‍යතාවක් කඳු,පැරණිකුටි දක්නට ලැබෙයි. සුවිස් ඇල්ප් මාගේ එක් කැමතිම ධාවනයක  කඳු මුදුනක තිබෙන කුඩා නිවසක් විය. එම නිවස අයිතිව තිබුණේ නික්ලස් වොන්ඩ් ෆ්ලුටය. බොහෝ දෙනෙක් දැන සිටියේ සහෝදර ක්ලෝස් ලෙසය. 1400 ගණන්වල මධ්‍ය භාගයේදී සහෝදර ක්ලෝස් තාපසයෙක් ලෙස හුදකලාව එහි වාසය කළේය.

ඔහුගේ නිවසේ සැලසුම අපගේ ජීවිත ජීවත් හේතු ආකාරයට කදිම අදර්ශයකි. ඔහුගේ නිවසට ජනෙල් දෙකක් විය ( කවුළු ). එක් ජනේලයක් විවෘත වනුයේ සම්බන්ධිත දේවස්ථානයටය. මන්ද ඒ ඔහුගේ සංකේතාත්මක  මතක සටහන ලෙසට නියත වශයෙන් දේව අභියස කෙරෙහි අවධානයෙන් සිටීමටය. අනෙක් ජනේලය පිටතට විවෘත වන අතර එය මනුෂ්‍යයන් දෙසටය. ගම්මුන් සහෝදර ක්ලෝස්ගේ ජනේලය වෙතට පැමිණ අසනුයේ, දෙවියන් වහන්සේ ඔවුන්ට කියන්න කීවේ කුමක්ද යන්නයි. සහෝදර ක්ලෝස් ජනේල්  අතරට  ගොස් ගම්මුන්ට උපදෙස් දෙයි. ඔහු දැන සිටියා දේව අභියස නොමැතිව ගම්මුන් උපදේශනය උදෙසා ජනේලය වෙතට පැමිණි කල්හි එහි භාවිතය අල්ප බව. සහෝදර ක්ලෝස්ගේ නිවස මෙන් අපගේ ජීවිත නියත වශයෙන්ම අප ජීවත් විය යුත්තේ එක් ජනේලයකින් තවත් ජනේලයකට ගමන් කිරීමෙනිඃ දේව අබියස සහ උන්වහන්සේගේ සෙනඟ.

හබක්කුක් පොතේ පැමිණෙන්නට තිබෙන්නා වූ කාරණා ගැන ප්‍රොපේතවරයා සමග දෙවියන් වහන්සේ සාකච්ඡාවක යෙදී සිටින සේක. ඉන්පසු හබක්කුක් යෙරුසල මේ මුරපොල මුදුනට ගොස් සහ පවුර පිට ඉඳගත්තේය. දෙවියන් වහන්සේ කුමක් කරන සේක් දැයි ඉඳගෙන බලා සිටීමට ඔහු තීරණය කළේය. නමුත් උන්වහන්සේ අපට කතා කරන කල්හි එය උන්වහන්සේගේ ආශාව නොවේ. වාඩිවෙලා බලා සිටීම නොව අප ගොස් කියන්න අවශ්‍යය.

දෙවියන් වහන්සේ හබක්කුක්ට පවසනුයේ මුරපොළ උඩ සිටගෙන සිටීමෙන් ඔහු කිසිවක් ලබා නොගන්නා බවය. ඔහු වීදි වලට ගොස් පවුර මත දෙවියන් වහන්සේ පැවසූ දේ ලිවිය යුතු වන අතර මේ මගින් යන්නා වූ අයට එය කියවීමටද, ප්‍රකාශකයෙක් එය රැගෙන දිවිය යුතු වන්නේය. හබක්කුක් සෙනඟට අවවාද කළ යුතු වන්නේ දෙවියන් වහන්සේ කරනේ කුමක්දැයි වාඩිවී දුර සිට බලා නොසිටිය යුතු බවය. දෙවියන් වහන්සේ අපට කතා කරන විට බොහෝ විට අපට කියනුයේ අන් අයට පවසන්නටය. එසේ නොවුනහොත් එය සිදුවේදැයි බැලීමට අපට ඒ අසල සිටිය හැක.

## යාච්ඤාව සොලවයි ( චලනය කරයි )

යාච්ඤාව කඳුසොළවයි. එලෙසම දෙවියන් වහන්සේව ද සොලවයි. උන්වහන්සේ අපට කතා කරන සේක. අපි උන්වහන්සේ උදෙසා කතා කරමු. උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ හදවත් සොලවන සේක. ඔබව මවා තිබෙන්නේ දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කිරීමටය. යාච්ඤාව නොමැතිනම් ඔබට කිසි කලෙකත් ඵලදායි විය නොහැක.

මම ඔබට තව නිදසුනක් දෙන්නම්.

යාච්ඤාව හරියට දුම්රිය පීලි මෙන්නය. දුම්රිය බලවත්, නමුත් පීලි නොමැතිව එය නොසෙල්වෙයි. සැතපුම් දහස් ගණනක් එක් පීල්ලකින් එයට ගමන් කළ හැකිය. එය නැතුව එක අඟලක්වත් සෙලවෙන්නේ නැත. ඒ හා සමානව උන්වහන්සේ සමග අප කාලය ගත කරන තෙක් උන්වහන්සේ නොසෙල්වී බලා සිටි. ඉතිං අපේ යාච්ඤා කාලය තුළ දෙවියන් වහන්සේ ස්වර්ගයේ සිට පොළොවට අපගේ පීලි සකස් කරමින් ඵලදායි ලෙස වචනයෙන් හා ක්‍රියාවෙන් ශුභාරංචිය බෙදා ගැනීමට අපට උපකාර කරන සේක.

ඔබට මතකද යෝවෙල්ගේ අනාගත වාක්‍යය?

*"ඉන්පසු මාංසමයවූ සියල්ලන් කෙරෙහි මාගේ ආත්මය වගුරුවන්නෙමි; නුඹලාගේ පුත්‍රයෝද දූවරුද අනාගතවාක්‍ය කියන්නෝය, නුඹලාගේ මහල්ලෝ ස්වප්න දකින්නෝය, නුඹලාගේ යෞවනයන්ට දර්ශන පෙනෙනවා ඇත.ඒ දවස්වලදී දාසයන් සහ දාසීන් කෙරෙහි පවා මාගේ ආත්මය වගුරුවන්නෙමි." - (යෝවෙල් 2:28-28)*

ප්‍රොපේතමය වාක්‍යය නිහඬව වසර පන්සීයකට අධික කාලයක් පැත්තක තිබුණි. ඉන්පසු කාමරයක් තුළ 120 දෙනෙකු දින දහයක් යාච්ඤා කළහ. ඔවුන් දෙවියන් වහන්සේට ඇහුම්කන් දුන්හ. සෙනග අතරට ගියහ. සෙනගට කෙරුසෝ (Kerusso) කළහ. දෙවියන් වහන්සේ ක්‍රියා කළ සේක.

"නුමුත් පේතෘස් එකොළොස්දෙනා සමඟ නැගිට ශබ්දනගා ඔවුන්ට කියනුයේ: යුදයේ මනුෂ්‍යයෙනි, යෙරුසලමේ වසන සියල්ලෙනි, මේක දැනගන්න. මාගේ වචනවලට කන්දෙන්න. මක්නිසාද දැනට දවල් තුන්වෙනි පැය පමණක් බැවින් නුඹලා සිතන්නා සේ මොවුන් මත්වෙලා නොවේ. නුමුත් මේ වනාහි අනාගතවක්තෘවූ යෝවෙල් කරණකොටගෙන කියනලද කාරණයය. කෙසේදයත්:" ක්‍රියා 2:14-16

බොහෝ ඵලදායි ආත්මික පිබිදීම් සිදුවීම් සිදුවූයේ යාච්ඤාවේ ප්‍රතිඵලයක් ලෙසටය.

මුල් සභාව නොකඩවා යාච්ඤා කළ අතර අධිරාජය පුරා වේගයෙන් ශුභාරංචිය ප්‍රකාශ විය. දෙවන සියවසේ ඇදහිලිවතුන් ඔවුන්ගේ පෞද්ගලික යාච්ඤා කාලයෙන් උපත ලැබූ ශුභාරංචිය කෙරෙහි ඔවුන්ගේ නොසැලෙන කැපවීම තුළින් ඒ කැපී පෙනුණි. ඇමෙරිකා එක්සත් ජනපදයේ මහා පිබිදීම ජොනතන් එඩ්වඩ්ස්ගේ ප්‍රසිද්ධ යාච්ඤා කැඳවීම තුළ ආරම්භ විය. චාල්ස් ෆිනි සහ ඩී. එල්. මූඩි යාච්ඤා බොහෝ දෙනෙකුගේ ගැලවීම උදෙසා ආරෝපණය කර ඇත.

1904 තරුණ වෙල්ස් ජාතික එවන් රොබට්ස් දෙවියන් වහන්සේට යාච්ඤා කළේ "දේවස්ථානය නැඹුරුවී ලොව ගලවන්න කියාය". සභා සෙනඟ යාච්ඤා කළහ. ඔවුන් දේශනා කළහ. මාස දෙකක් ඇතුළත වෙල්ස්සයේ හැත්තෑ දහසක් පමණ ජනතාව යේසුස් වහන්සේ ඔවුන්ගේ ගැලවුම්කරු ලෙස ප්‍රකාශ කළහ.

පෙන්සකෝලා, ෆ්ලොරිඩාහි 1995 වසරේ මහත් වූ පිබිදීමක් සභාව තුළ හටගත්තේය. එය මිලියන ගණනක් ලෝකයේ සෙනඟ කරා ළඟා වී බ්‍රවුන්ස්වෙල් පිබිදීම සභාවේ යාච්ඤාවේ සෘජු ප්‍රතිඵලයකි. එම පිබිදීමේ කාල කාලවකවානුව තුළ සභාවේ යාච්ඤා කණ්ඩායම සමඟ වැඩ කිරීමේ වරප්‍රසාදය මමද ලැබුවෙමි. පිබිදීම පෙළඹවීමක් නොවේ. එය යාච්ඤාවයි. දෙවියන් වහන්සේ කතා කරන සේක.

උන්වහන්සේගේ සෙනග පවසන විට ස්වර්ගික ජනගහනය වැඩිවේ. මෙම ශුද්ධාත්මයාණන් වහන්සේගේ මහත් ක්‍රියාවලියට හේතුව වන්නේ යාච්ඤාවයි.

දූතන මෙහෙවරේදී කෙටි මාර්ග නැත. ඔබ ගොස් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට නම් ඔබගේ ජීවිතයේ දෛනික ක්‍රියාවලිය විය යුත්තේ යාච්ඤාවයි.

## නමුත් , මට යාච්ඤා කිරීමට කාලය නොමැත

සැබවින්ම යාච්ඤා නොකිරීමට අපට කාලය නැතිද ? දානියල් මෙය දැන සිටි නිසා දිනක් යාච්ඤා නොකර සිටීමට වඩා එක් රාත්‍රියක් සිංහ ගුහාවේ විසීම ඥානවන්තයයි කල්පනා කළා. එක් තත්පරයකින් අපට බොහෝ දේ කිරීමට සහ බොහෝ දේ කතා කිරීමට දෙවියන් වහන්සේට පුළුවන.මුළු ජීවිත කාලයක් පුරාවටම මහත් පරිශ්‍රමයක් දැරූ කාරණා ඉටු කිරීමට යාච්ඤාව නාස්තිකාර කාලයක් යැයි සිතීමේ මනස අප වෙනස් කර ගත යුතුය. යාච්ඤාව නොමැතිව අපි කරන වැඩ නාස්තිකාර කාලයක් වන්නේය.

උන්වහන්සේගේ ශුභාරංචිය ගොස් පැවසීමට, දෙවියන් වහන්සේගේ ප්‍රකාශකයා වීමට අප රජතුමා සමඟ විසීමට කාලය ගත යුතුය. ස්වර්ග රාජ්‍යය දෙවියන් වහන්සේ සමඟ සදාකාලය ගතකිරීමට ඇදහිලිවතුන් කී දෙනෙකුට අවශ්‍ය දැයි මට ප්‍රහේලිකාවක් ඇත. මන්ද එක් මිනිත්තුවක් පොළොවෙහිදී උන්වහන්සේ සමඟ ගතකිරීමට ඔවුන් කැමති නැත. මෙය එසේ සිදු නොවිය යුතුය. ඒ වෙනුවට අප මාටින් ලූතර කියූ අයුරින්; "අද දවසේ මට බොහෝ දේ කිරීමට ඇත. මම වෙනදාට වඩා යාච්ඤා කිරීම උදෙසා කාලය වෙන්කර ගත යුතුය."

කලකට ඉහතදී බිලිග්‍රැම් සමඟ ජාතික රූපවාහිනියක් ෆොක්ස් සම්මුඛ පරීක්ෂණයක් සජීවීව පවත්වනු මා බලා සිටියෙමි.

වයස අවුරුදු අනූ දෙකක් වයස ඇති බිලිග්‍රැම්ගෙන් සම්මුඛ පරීක්ෂණය පවත්වන පුද්ගලයා එක් කාරණයක් ගැන ප්‍රශ්න කරමින්," මෙම කාර්ය භාරය ඔබට නැවත කිරීමට සිදුවුණහොත් මෙයට වඩා වෙනස් දෙයක් ඔබ කරන්නේද? "

*ස්වර්ග රාජ්‍යය දෙවියන් වහන්සේ සමඟ සදාකාලය ගතකිරීමට ඇදහිලිවතුන් කී දෙනෙකුට අවශ්‍ය දැයි මට ප්‍රහේලිකාවක් ඇත. මන්ද එක් මිනිත්තුවක් පොළොවෙහිදී උන්වහන්සේ සමඟ ගතකිරීමට ඔවුන් කැමති නැත.*

බිලී ක්ෂණයකින් සරල ප්‍රතිචාරයක් දැක්වූයේ, " ඔව්." යනුවෙනි එවැනි බලපෑමක් ඇති මනුෂ්‍යයෙක් කුමන ආකාර වෙනසක්ද? " අඛණ්ඩව මම තවදුරටත් ඉගෙන ගනිමි. මම තවත් යාඥා කරමි. උඩුවෙන් ගමන් කරමි. අඩු සාකච්ඡා වාර ලබා ගනිමි. ලොව වටා බොහෝ ස්ථානවලට මම ඒවා බොහෝ ගෙන ගියෙමි. නැවත මට එය කිරීමට සිදුවෙනවා නම්, මම මෙනෙහි කිරීමේ හා යාච්ඤාවේ බොහෝ කාලය ගත කරන අතර ස්වාමින් වහන්සේට මා පවසන්නේ, මා උන්වහන්සේට කෙතරම් ප්‍රේම කරනවද, උන්වහන්සේව අගය කරනවාද, සදාකාලිකවම අප එකට ගත කරන කාලය එනතෙක් බලා සිටිමි යන්නය."

බිලිග් ග්‍රැහැම්. ඔහු එක් වෙනසක් කරයි. බොහෝ යාච්ඤා කරයි.

දෙවියන් වහන්සේ අපට කතා කරන සේක. දෙවියන් වහන්සේ අපව සන්නද්ධ කරන සේක. උන්වහන්සේ අපව පිටතට එවනු ලබන්නේ අප උන්වහන්සේ සමඟ යාච්ඤාවෙන් ගත කරන කාලයට අනුව උන්වහන්සේගේ වචනයෙන් හා ආත්මයෙන් පූර්ණවය. දුර්වල ඇදහිලිවන්තයා හෝ ඇදහිලිවන්තිය දනින් සිටින විට යක්ෂයා මෙය දැක වෙව්ලන්නේය. යාච්ඤා නොමැති කිතුනුවා බල රහිත කිතුනුවෙකි. ඔබගේ ජීවිතයේ යාච්ඤාව අත්‍යාවශ්‍ය කරගන්න. උන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කිරීමට ඔබව පාවිච්චි කරන ආකාරය පිළිබඳව ඔබම පුදුමයට පත්වේවි.

## ශුභාරංචිය විස්තීරණයවේ

යාච්ඤාව බලවත්ය. ශුභාරංචිය දේශනා කරන්නේ කෙසේදැයි අප දන්නේ එය නිසාය. බිලිග් ග්‍රැහැම් එය දැන සිටියා. මුල් සභාවත් එසේමය. දෙවන ශත වර්ෂය ඇදහිය නොහැකි වේගයකින් අධිරාජ්‍ය වටා ගමන් කළේය.

දෙවන ශතවර්ෂය අවසානයේ රෝම අධිරාජයේ සියලුම පළාත්වල මෙන්ම මෙසපොතේමියාවේද කිතුණුවන් සොයා ගත හැකි විය. දෙවන සියවසේ දේව ධර්මාචාර්යවරයෙකු සහ මුල් සභාවේ පියෙකු වූ ටර්ටූලියන් මිථ්‍යා දෘෂ්ටිකයන්ට කළ මෙම ප්‍රකාශය අනුව මෙය නිවැරදි තක්සේරුවක් බව පෙනේ. "අපි ඔබට අයත් සෑම ස්ථානයක්ම පුරවා ඇත්තෙමු. නගර, දූපත් , මාලිගා, නගර රැස්වීම්, ඔබේ කඳවුර, ඔබේ ගෝත්‍ර, සමාගම් , සේනා සංසදය! අපි ඔබට ඔබේ ආගමික ස්ථාන පමණක් ඉතුරු කළෙමු."

ටර්ටූලියන් තරමක් අතිශෝක්තියට නංවා ඇති නමුත් රෝම සමාජයේ සෑම කොටසක්ම ක්‍රි.ව 200 දී සභාව විසින් ඇතුළු බව ( පසාරු කරගෙන ගිය බව ) පැහැදිලිය.

පළමු සියවසේ ඇදහිලිවතුන්ගේ ඇසූ දුටු සාක්ෂි තුලින් දෙවන සියවස ලොව වටා ශුභාරංචිය ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව යාච්ඤාව තීරණාත්මක ලෙස සැලකුහ .

එය එසේ විය.

# 4

# 200 ගණන් වල - කොස්මොස්

නමුත්... මම දේශකයෙක් නොවේ

*" මුළු ලොව වෙත යන්න යන ආඥාව භූගෝලාත්මකව නොවේ . එයට සියලු අංශ ,  වෘත්තීන්, හික්මවීම, ක්‍රීඩා යන ආදී .... " - රික් ජොයිනර්*

තුන්වන සියවසේ ඇදහිලිවතුන්ට ශුභාරංචියේ යෂ්ඨිය හුවමාරු කරන ලද අතර එය සම්පූර්ණ වේග ශක්තිය සහා බලය ඇතුව පැමිණිනි. කිතුණු ආගම තවදුරටත් යුදෙව්වරුන්ට පමණක් හිමි සුළු නිකායක් නොවීය. රෝම අධිරාජ්‍යයේ පැරණි ක්‍රමවලට ප්‍රතිවාදීව ප්‍රබල ලෙස එය ඉතා ඉක්මනින් නැගී එන්නක් විය. ගොස් සුභාරංචිය ප්‍රකාශ කරන්න යන යේසුස් වහන්සේගේ වචන මිනිසුන් බැරෑරුම් ලෙස සැලකුහ. මෙම ඇදහිලිවතුන්ගේ යේසුස්වහන්සේට බෙහෙවින් ප්‍රේමකල අතර දෙවියන්වහන්සේ මනුෂ්‍යය වර්ගයා මුදවා ගැනීම සදහා කාලය ආක්‍රමණය කර ඇති බවට දැවෙන විශ්වාසයක් තුළ ඔවුන් පෙළඹුණි. මෙම විශ්මයජනක පුවත අසන්නට ලෝකයට අවශ්‍ය විය.

කිතුණුවන් ශුභාරංචිය සමඟ සමාජයේ සෑම ක්ෂේත්‍රයකටම කාන්දු වී සිටියහ. නීතිඥ ටර්ටූලියන්, ගුරු ඔරිගන්,  ශිෂ්‍යයාව මාටිනා සිටියහ. මෙම තිදෙනා කිතුණුවන් ලෙස හැදිනගෙන තිබුණද මිලය කුමක් වුවත් ශුභාරංචිය බෙදාගැනීම උදෙසා ගණන්කල නොහැකි තරම් කිතුණුවන් ද විය. යේසුස්වහන්සේගේ නියෝගය වන්නේ යන්න කියන්න . බොහෝ දෙනෙකුට මරණ දණ්ඩනයේ ප්‍රතිඵලය විය. නමුත් ඔවුන් දැනසිටියා ඔවුන්ගේ ගැලවුම්කරුවාණන් මෙම පණිවිඩය උදෙසා මරණු ලැබුවානම් එම කාර්යය උදෙසා ඔවුන්ගේ ජීවිත ද දීමට ඔවුන් කැමතිවූහ. ඔහුගේ ලියවිල්ල තුළ ටර්ටූලියන් ඇදහිලිවතුන්ට මතක් කරනුයේ මීළඟ වසර 2000 කාල සීමාවට කිතුණුවන් කළේ කුමක්ද යන්න සිහිතබා ගන්න ලෙසටය. එනම් "වේද සාක්ෂිකාරයන්ගේ රුධිරය සභාවේ බීජයයි"

වේද සාක්ෂිකරුවන් ලෙස මරණයට පත් කිරීම අඛණ්ඩව සිදුවුණත් ශුභාරංචිය පැතිරයාමේ වේගය අඩු නොවීය. රෝම අධිරාජ්‍යයන් වන සෙවරස්, ඩෙසියස්, වැලරියන්, ඕරේලියන් සහ ඩයොක්ලෙටියන්ගේ කාලවකවානුවේ කිතුණුවන්ට මහත් ලෙස පීඩා කිරීම සිදුවිය. ඩෙසියස් නියෝගයක් නිකුත් කරමින් රෝම අධිරාජ්‍යයේ සියලුම පුරවැසියන් රෝම දෙවිවරුන්ට පූජාවිය යුතු බවත් එසේ නොකළහොත් මරා දමන බවත් පැවසීය. නමුත් කිතුණුවන් දැනසිටියේ ඔවුන්ට අනුගමනය කිරීමට උතුම් රජ කෙනෙක් සිටින බවත් සහ මරණයේ බියට ඔවුන් පාවා නොදෙන බවත්ය. ශුභාරංචිය දේශනා කල යුතුවම තිබේ.

පැමාචියස් සහ ඔහුගේ පවුලේ අය ඔවුන්ගේ ඇදහීම නිසා හිසගසා දමන ලදී. ට්‍රිෆෝ සහ රෙස්පිසියස් වීදිය දිගේ ඇදගෙන ගොස් ඔවුන්ගේ පාදවලට ඇණ දමා යකඩ කොකු වලින් ඉරා පසුව හිසගසා දමන ලදී.

ක්වින්ටින් ක්‍රි.ව. 287දී පිකාර්ඩි ප්‍රදේශයේ ගොස් ගම්මානවල ශුභාරංචිය ප්‍රකාශ කලේය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුව අත්අඩංගුවට ගෙන දඩුවම් නියමකොට මරා දමන ලදී. බලධාරීන් ඔහුගේ අත් පා වලට ලණු දමා බැද කප්පිවලින් දිග ඇද ඔහුගේ සන්ධි විසන්ධි කලහ. ඉන්පසු වයරකින් ඔහුට පහරදුන්හ. ඔහුගේ නිර්වස්ත්‍ර වූ ශරීරයට තාපාංක තෙල් හා තාර වත්කරන ලදී. ඔහුගේ කිහිල්ලට සහ පැත්තෙන් ගිනී තැබූහ. ඉන්පසු සිරගත කරන ලද අතර ඔහු මරණයට පත්විය.

මේ සියල්ලම සිදුවූයේ මුළු ලොවටම ශුභාරංචිය යෑමේ අවශ්‍යතාවය ඔහුට තිබුණ බැවිනි.

වයෝවෘද්ධ කිතුණුවෙකු වූ මෙක්ට්‍රස් පොලුවලින් පහරදී ඉදිකටු  වලින් විද සහ ගල් ගසා මරණ ලැබුවේ , ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය ප්‍රකාශ කල නිසාය.

වයස අවුරුදු 70ක් වූ අපලෝනියා අන් අයට ශුභාරංචිය නොනවත්වා ප්‍රකාශ කිරීමෙන් කණුවක බැද ගිනිතැබූහ. ඇයව නිදහස් කරන මෙන් ඇය ඇයද සිටියාහ. ඇය ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි තිබුණ ඇදහිල්ල අත් හරී යැයි සිතූ මැර පිරිස මෙසේ කළහ. ඔවුන්ව පුදුම කරමින් කෙසේ වෙතත් ඇය  එම ගිනි දැල්වලට විසී වෙමින් මැරුණාය.

සැටර්නිනස්, සෙකන්ඩුලස් සහ සැටූර් පේළි දෙකක් ලෙස සැදී  සිටි මිනිසුන් අතරින් දුවන්නට සලස්වන ලද අතර ඔවුන් විසින් මැරෙන තෙක් කසපහර ගසන ලදී.

මෙම සත වර්ෂවල කිතුණුවන්ගේ කතා අසීමිතය. සභාවක චේතනයක් ගෙවනලද කාර්යය මණ්ඩලයට ඔවුන් අයිති නොවූහ. නමුත් ඔවුන්ගේ මිතුරන්ට, අසල්වාසීන්ට සහ හවුල් වැඩකරුවන්ට ඔවුන් පූර්ණකාලීන ඉවැන්ජලීස්තවරු වූහ. කීමට ඔවුන්ට පණිවිඩයක් විය සහ ඔවුන් වටා සිටි සැම කෙනෙක්ම එය දැනගැනීම ඔවුන්ගේ අභිප්‍රාය විය.

පර්පේටුවා වයස අවුරුදු 20 කුඩා දරුවෙකුගේ මවකි. ඇය යේසුස්වහන්සේ ගැන සෙනඟට නොනවත්වා කතා කළාය. ක්‍රි.ව. 203දී පමණ ඇයගේ ගර්භණී යෙහෙළිය වන ෆෙලිසිටි සමඟ ඇයව අත්ඩංගුවට ගන්නා ලදී. ක්‍රිස්තුස්වහන්සේට තිබෙන ඔවුන්ගේ කැපවීම අත්නාරින බව ෆෙලිසිටි සහ පර්පේටුවා නිලධාරීන්ට ප්‍රකාශකල අතර ඔවුන් සමඟ තවත් ඇදහිලිවතුන් ද ක්‍රීඩාංගණයක ජනාකීර්ණ ප්‍රේක්ෂකයන් මධ්‍යයට ගෙනයන ලදී. පුරුෂයින් දිවියන් විසින් කා දමන පිණිසත් කාන්තාවන් ගොනුන් විසින් ඉරා දැමිය යුතුවිය. සියල්ල සෙනඟගේ ප්‍රීතිය උදෙසාය.

ෆෙලිසිටිටාස් ගොනුන් විසින් ඉරා දමන ලද අය අතර ප්‍රථමයා විය. පර්පේටුවා ඇය වෙතට දිවගොස් ඇය ව අල්ලා ගත්තාය. ගොනුන් නැවත ඔවුන් ව ඉරා දැමීමට උත්සාහ නොදැරූහ. එවිට කඩුගත් මල්ලවයන් අවසන් කිරීමට එතැනට ඇතුල්වූහ. ෆෙලිසිටිටාස්ව ඉක්මනින්ම මරා දමන ලදී. නමුත් පර්පේටුවා මරා දැමීමට පත් කරන ලද තරුණ අත්දැකීම් අඩු කඩුගත් මල්ලවයා දරුණු ලෙස වෙව්ලමින් ඇයට දුර්වල ලෙස පිහියෙන් ඇනීමට පමණක් හැකිවිය. ඔහු කොතරම් බියෙන් සිටිනවාදැයි දුටු පර්පේටුවා ඔහුගේ කඩුතලය අල්ලාගෙන එය ඇගේ ශරීරයේ වැදගත් ප්‍රදේශයකට ගෙන ගියාය. ශු ශුභාරංචිය වෙනුවෙන් තම ජීවිත පූජා කරන අසංක්‍රාත පිරිසකගේ අඩිපාරේ ඇය ගමන් කළාය. මෙම කිතුණුවන් තමන් බෙදාගත් පණිවිඩය සැබැවින් ම ඒත්තු ගැන්වූ බව සමූහයා දුටුහ. අධිරාජ්‍යයේ සියලුදෙනා විසින් ශුභාරංචිය ගැන කතා කරනලදී.

මෙම නිර්භීත, අධිෂ්ඨානශීලී ඇදහිලිවන්තයන්ගේ සියවසේ ආදර්ශය එයයි. රජය අධ්‍යාපනය, කලාව, විනෝදාස්වාදය තුළ නියැලී සිටි සියළුදෙනා යේසුස්වහන්සේගේ ජීවිතය ගැන ඇසීමෙන් බේරී සිටීමට නොහැකිවිය. මෙම ඇදහිලිවතුන් දැනසිටියා එය ඔවුන්ගේ අවස්ථාව බව ශුභාරංචියේ යෂ්ටිය රැගෙන දිවීමට . පවුල්වලට ආදරණීයන් අහිමි විය . ව්‍යාපාරිකයන්ට නායකයන් අහිමි විය සහ සභාවට ගුරුවරුන් අහිමි විය. නමුත් ශුභාරංචිය ඊටත් වඩා ශක්තියක් ලබා ගත්තේය.

ක්‍රි.ව. 250 වන විට රෝමයේ පමණක් කිතුණුවන් 30,000 විය. රෝමයේ පළාත් වලින් සියළුම කිතුණුවන් බැහැර වූවානම් අධිරාජ්‍යය හිස්වන බව ටර්ටුර්ලියන් ලියයි. මෙම ඇදහිලිවතුන් දැනසිටියා ඔවුන්ගේ පණිවිඩය ප්‍රකාශ කලයුතු බව දෙවියන්වහන්සේ ලෝකයාට ප්‍රේම කොට පැමිණියා සේ ඔවුන්ගේ ලෝකයට යෑමට ද ඔවුන් තීරණය කළා.

## එත්නොස් ...

මතෙව් පොතේ සඳහන්ව තිබෙන්නාවූ මහා නියෝගය මාර්ක් පොතේ සඳහන් දේට වඩා පොඩි වෙනසක් ඇතිබව ඔබ කවදා හෝ දුටුවාද ? සොයා බලන්න. නැවත යේසුස්වහන්සේ ස්වර්ගාරෝහණය වීමට පෙර ගෝලයන් දේශනා කලයුතු පොදු පළාත් ඔවුන්ට පවරන ලදී. මතෙව් සහ මාර්ක් පොත්වල යේසුස්වහන්සේගේ අවසන් වචන මේවාය.

*"එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරන්න, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්මකරන්න.මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක." - මතෙව් 28:19-20*

*"උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශකරන්න." - මාර්ක් 16:15*

මෙම ශුද්ධලියවිලි කොටස් දෙක අප විසින් දැනගතයුතු වැදගත් තීරණාත්මක ඒවාය. රෝම අධිරාජ්‍යයේ විසූ මුල් ඇදහිලිවතුන් ග්‍රීක් කතා කල අතර යේසුස්වහන්සේ කීවේ කුමක්දැයි ඔවුන් පැහැදිලිව තේරුම් ගත් හ. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහු වෙතට මුළු අධිරාජ්‍යයම දිනා ගන්නාලදී. ඇදහිලිවතුන් මෙම පරිච්ඡේද දෙක තේරුම්ගෙන ක්‍රියා කලානම් අපගේ ලෝකය අත්දැක්කා වූ උතුම් පිබිදීම එය වන්නේය.

අප නැවත එය බලමු .

මතෙව් 28.19 යේසුස්වහන්සේගේ ගෝලයන්ට කියනුයේ සියලු ජාතීන් ගෝලයන් කරන්න . ජාතීන් යන වචනයට ග්‍රීක් වචනය වන්නේ එත්නොස් (ethanos) . එත්නොස් යන වචනය ඉංග්‍රීසියට බිදී එනවිට එහි අදහස වන්නේ වාර්ගිකත්වය හෝ වාර්ගික කණ්ඩායම් . එත්නොස් යනු අත්‍යාවශ්‍යයෙන්ම ගෝත්‍රයත්, ජාතියත් සහ / හෝ වාර්ගික කණ්ඩායමකි .

මෙම ස්ථානයෙන් අප අදහස් ලබා ගන්නේ විදේශයකට ගොස් හෝ මහද්වීප හරහා ගොස් දූතන සේවයේ යෙදිය යුතු බවයි. අපගේ දූතන මෙහෙවර වන්නේ අන් අයට යේසුස්වහන්සේ ගැන පැවසීම සහ අලුතින් ගැල්වීම ලැබූ අය අප ගෝලයන් බවට පත් කිරීමය. ඇදහිලිවන්තයකු වූ පසු වැදගත් වන ඊළඟ පියවර එය වන්නේය.

අදටත් සුභාරංචිය කිසිදාක නොඇසුවාවූ මනුෂ්‍යයන්, ග්‍රෝතිකයන් සහ ලොව වටා ගනන් කල නොහැකි තරම් ජාතීන් සිටිති. අපට ආඥාව ලැබී ඇත්තේ ගොස් සහ පවසන්න ඔවුන්ට යේසුස්වහන්සේ ගැන ! වසර ගණනාවක් පුරා මම අප්‍රිකාවේ ග්‍රෝතික ප්‍රදේශවලට, මෙක්සිකෝවේ මත්ද්‍රව්‍ය ජාවාරම් ප්‍රදේශවලට, රුසියාවේ පැරණි කොමියුනිස් ගම්මානවලට සහ මාෂල් දූපත්වලට, දුරස්ථ දූපත්වලට සුභාරංචිය ගෙනගොස් ඇත්තෙමි.

අවාසනාවකට මෙන් බොහෝ ඇදහිලිවතුන් සිතනුයේ ධර්මදූත සේවයට ඇත්තේ මෙපමණක් බවය. ක්‍රිස්තුස්වහන්සේගේන් ලැබුණු නියෝගය විදෙස්ගත වී කුරුසිය ගැන සෙනඟට කතා කිරීම පමණක් නොව කුරුසිය දෙස බැලීම සහ ඔබගේ අසල්වාසීන්, මිත්‍රයන් සහ හවුල්කරුවන් වෙතට ගමන් කිරීම බව ඔවුන් බොහෝ විට නොදැන සිටිති

## ... සහ කොස්මොස්

නැවත මාර්ක් 16.15 බලන්න . යා යුත්තේ කොතනට දැයි තවත් බොහෝ පුද්ගලික මගපෙන්වීම් මෙම ශුද්ධලියවිලි පාඨය තුළ ඇත. මෙහිදී යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයන්ට කියනුයේ <u>ලොව</u> මුළුල්ලේ ගොස් සියලු ජාතීන්ට සුභාරංචිය ප්‍රකාශ කරන්න.

ග්‍රීක් භාශාව දැනගැන්මට පෙර මම මෙම පාඨය දෙස බලා ලෝක ගෝලය මවා ගතිමි. අපගේ පෘථිවිය දෙස ගූගල් සිතියම තුළින් බලමි. මම මෙම පදය සහ සම්බන්ධ පදයක් ලෙස මතෙව් සදහන් කරන්නාවූ එත්නොස් වෙත ගමන් කරමි. නමුත් එය මීට වඩා පුද්ගලිකය. ඔබ මෙය බැලිය යුතුමය.

ලෝකය යන්නට මෙම ශුද්ධලියවිලලේ අඩංගු පදය ග්‍රීක් භාෂාවෙන් එත්නොස් නොවන්නේය. නමුත් කොස්මොස් වේ. ඉංග්‍රීසි භාෂාවෙන් සරල ලෙස ග්‍රීක භාෂාවේ අක්ෂර kosmos වෙතින් cosmos වෙතට වෙනස් කර ඇත. cosmos යනු පිළිවෙළ ට ඇති ඕනෑම දෙයකි. අපගේ විශ්වය අප හඳුන්වන්නේ එහි ඇති පිළිවෙළ අනුවය.

පිළිවෙළක් ඇත්තේ විශ්වයට පමණක් ම නොවේ. දේශපාලනික ක්‍රම සම්බන්ධ ක්‍රම, සම්බන්ධතාවයේ ක්‍රම, විලාසිතා ක්‍රම,විනොදාස්වාද ක්‍රම, ව්‍යාපාරික ක්‍රම, මිතුරන්ගේ පිළිවෙළ , ක්‍රීඩාවේ පිළිවෙළ, බැංකු ක්ෂේත්‍රය, රාජ්‍ය පාලනය මෙසේ ලැයිස්තුව ඉදිරියට ගමන් කරයි. ඔවුන්ගේ කොස්මොස් තුළ මෙම විවිධ ක්‍රම අඩංගුව ඇත.

මෙම මොහොත වනවිට දෙවියන්වහන්සේ ඔබව උපක්‍රමශීලීව එක් කොස්මොස් එකකට වඩා ස්ථානගත කොට ඇත. ඔබ දෙවියන්වහන්සේ විසින් තෝරා ගන්නා ලද නියෝජිතයෙක් වන්නේ එම කොස්මොස් තුළ සුභාරංචිය ප්‍රකාශ කිරීමට ය. ඔබගේ පවුල, ඔබගේ රැකියාව, ඔබගේ අසල්වාසීන්, ඔබගේ විනෝදාංශ සහ ඔබේ සිල්ලර කඩේ ඔබ යා යුතු ලෝකය වේ.

*මෙම මොහොත වනවිට දෙවියන්වහන්සේ ඔබව උපක්‍රමශීලීව එක් කොස්මොස් එකකට වඩා ස්ථානගත කොට ඇත.*

එම නිසා සියලු කොස්මොස් වෙතට ගොස් සහ සුභාරංචිය සියලු ජාතීන්ට දේශනා කරන්න.

## ඔබගේ දූතන මෙහෙවරේ කෙත

එසේනම් ඔබේ දූතන මෙහෙවරේ කෙත කොහෙද ? ඔබගේ ජනවාර්ගික කණ්ඩායමෙන් පිට ජාතියක් හෝ ශ්‍රෝතයක් විය හැකි ය. දෙවියන්වහන්සේ එය මට කරනු ලැබුවේ ඇමෙරිකාවේ සිට යුරෝපය වෙතට පවුලක් ලෙස අපව ගෙන යාමෙනි. නමුත් එවැනිම දෙයක් ඔබ ඉදිරියෙහි තිබේ.

මා බැහැ දුටුවාවූ දේවස්ථානයක පිටතට පැමිණිමේ දොරටුවේ මෙසේ ලියා ඇත. " ඔබ දැන් ඇතුල් වනුයේ ඔබගේ දූතන මෙහෙවරේ කෙතටය." එම දොරටුවෙන් එදින මං පිටතට පැමිණියේ මාගේ කැදවීම සිහි ගන්වමිනී.

එම අවස්ථාවේ ඩලාස් කව්බෝයිස් පූජකතුමන්ට මා සහය දුන් අතර ඩලාස්හී ක්‍රීඩාංගණ කිහිපයකම ප්‍රධාම පූජකතුමා ලෙස කටයුතු කලෙමි. මෙම කණ්ඩායම් සමග දෙවියන්වහන්සේ මාව තිරය පසුපස තැබුවේ සමරුපොතේ අත්සන් තබා ගැනීමට ජායාරූප ගැනීමට හෝ මුදල් ඉල්ලීමට නොව මා එහි සිටියේ ගැනීමට නොව ක්‍රීඩකයන්ට, පුහුණුකරුවන්ට, කාර්යය මණ්ඩලයට සහ කණ්ඩායමේ වැඩකරුවන්ට ජීවය ගෙන ඒමටය. එය තමයි මා කළයුතු දෙය කියා අධිෂ්ඨාන කළෙමි.

මා ක්‍රීඩාංගණයට හෝ පුහුණුවීම් පහසුකම් සඳහා පැමිණෙන සැමවිටම මා ශාලාව තුළ ඇවිදිනුයේ මාගේ වෘත්තීමය පාපන්දු ලෝකය මාගේ කොස්මොස් ලෙස දැනගෙනය. සැම කෙනෙක් සමගම මා සුභාරංචිය බෙදාගනිමි. ඔබ ක්‍රීඩා තරුවක් වේවා, පවිත්‍ර කරන්නෙක් වේවා, එය මට කිසිදු ප්‍රශ්නයක් නොවීය. මා එම කොස්මොස් හී සිටින තාක්කල් යේසුස්වහන්සේව ප්‍රකාශ කිරීමට තීරණය කළෙමි.

නැවත මා ඔබට මතක් කරන්නම් අපි සියළුදෙනාම පූර්ණකාලීන ඉවැන්ජලීස්තවරුය. ඔබ දේවස්ථානයක පත් කළ දෙවියන්වහන්සේට දැකිය යුතු වූ සේවකයෙක් වීම අත්‍යවශ්‍ය නොවේ. උන්වහන්සේ ඔබව පෙර සිටම කුලීයට ගෙන ඇත. ඔබ උන්වහන්සේගේ මෙහෙවරුය උන්වහන්සේ ඔබ ගැන බලාපොරොත්තු තබා ඇත.

ඵලදායී ලෙස ශුභාරංචි නිදහස් කරන බොහෝ දෙනෙක් දූතන මෙහෙවරේ කෙතේ සිටින පූර්ණ කාලීන ඉවැන්ජ්ලිස්තවරු නොවන බව මා දන්නා කරුණෙකි. මා දන්නා වූ ව්‍යාපාරික යුවළක් ඔවුන්ගේ කොම්පැනියේ වැඩ කරන සැම පුද්ගලයෙකු සමගම ශුභාරංචිය බෙදා බෙදාගන්නා අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ක්‍රිස්තුස් වහන්සේට තමන්ගේ ජීවිතය දී ඇති බව මා දැක තිබේ. මා දන්නා වූ සමහර ක්‍රීඩකයන් තමන් සිටියාවූ සැම කණ්ඩායමකම ශුභාරංචිය බෙදාගෙන ඇත. මාගේ මිත්‍රයන් ඔවුන්ගේ සම්පූර්ණ පුළුල් කොස්මොස් පවුල වෙත ශුභාරංචියෙන් ළඟා වීමට තීරණය කර ඇත. ඔබගේ කොස්මොස් වන්නේ ඔබේ දූතන මෙහෙවරේ කෙතයි.

*වසර වෙනස් වන විට, ඔබේ කොස්මොස් ද විය හැකිය. නමුත් ජනවරම එලෙසම පවතී.*

18 වන සියවසේ සිටියා වූ ඉංග්‍රීසි ජාතිකයෙකු ඔහුගේ කොස්මොස් වෙතට බලපෑම ඇති කළ කතා වස්තුවට මා ආදරය කරමි. 1780 දී රොබට් රේක්ස් ප්‍රකාශන සමාගමක අයිතිකරු වූ අතර ඔහුගේ පුරවරය වන ග්ලවුසෙස්ට, එංගලන්තයට ශුභාරංචියයේ යෂ්ඨිය රැගෙන යාමට අවශ්‍ය විය. ඔහු දැන සිටියා ඔහුගේ කොස්මොස් වන්නේ ව්‍යාපාරික ලෝකය සහ අසල්වාසීන් බව. රේක්ස් තීරණය කළා ඔහුගේ මුද්‍රණාලය දේව රාජ්‍යයේ ප්‍රවර්ධනයට භාවිතා කිරීමට. අසල්වාසීන්ගේ නිවසක පිරිමි දරුවන් උදෙසා වන වැඩසටහන වැඩසටහනක් සම්බන්ධයෙන් ඔහු අත්පත්‍රිකා මුද්‍රණය කළා.

ඉරුදින උදෑසන ඔහු වැඩසටහන ඇරඹුවා. අනෙක් දින හයේම පිරිමි දරුවන් වැඩ කළා. රෙක්ස් ඔහුගේ මුද්‍රණ යන්ත්‍ර, වැඩකරුවන් සහ අමු ද්‍රව්‍ය භාවිතා කරමින් පැමිණ සැම කෙනෙක් උදෙසාම පාඨමාලාවක් සකස් කළේය. ඔවුන් පැමිණියා ! අවසානයේ ඔවුන් මෙම වැඩසටහන ආමන්ත්‍රණය කළේ සබත් පාසල යනුවෙනි. 1788 වන විට ඔහුගේ මෙම සකස් පාසලට ගැහැණු පිරිමි දරුවන් ලක්ෂ තුනක් පමණ සහභාගී විය. වසර 40 ක කාලය තුල මහා බ්‍රිතානයේ 25% ළමයින් ශුභාරංචිය ඇසීමට පැමිණිය 1910 වන විට මිලියන පහමාරක් ළමයින් සැම සතියකම සබත් පාසලට සහභාගී විය. ඇයි? මන්දයත්, එක් ව්‍යාපාරිකයෙක් දැන සිටියා සුභාරංචිය ප්‍රකාශ කිරීමට ඔහුගේ කොස් මස් වෙත දිව යාමේ මොහොත එය බව.

ඉතිං , ඔබ ඉන්නා කොස්මොස් හෝ කොස්මෝසස් කුමක්ද? ආරම්භ කරන්නේ කොතනින්ද යි ඔබ නොදන්නේ නම් බලපෑම් ඇති කරන කඳු මුදුන් හත ගැන සිතන්න.

1975 දී බිල්ඩ් බ්‍රයිට් Campus Crusade නිර්මාතෘ සහ ලොරින් කනිංහැම් Youth With a Mission ( YWAM ) නිර්මාතෘ කොසමොස් පෙරදැරි කරගත් නියෝගයක් සකස් කළහ. ජාතියක් යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචිය සමඟ සැබවින්ම පරිවර්තනය කිරීමට නම් සමාජයේ මෙම කඳු හතට ළඟා විය යුතු බව ඔවුහු නිගමනය කළහ.

මෙම කඳු හත නම් ආගම, පවුල , අධ්‍යාපනය, රාජ්‍ය, මාධ්‍ය, කලාව සහ විනෝදාස්වාදය සහ ව්‍යාපාරික ලෝකයයි.

ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ ඒක මොහොතක් රැගෙන අසන්න ඔබව තබා තිබෙන මේ කන්ද කුමක්ද කියා, ඔබට එළිදරව් කරන මෙන්.

අවුරුදු වෙනස් වෙන්නාක් මෙන් ඔබගේ කොස්මොස් ද එසේමය. නමුත් නියෝගය එසේම පවතී. දෙවියන් වහන්සේ ඔබව තබා තිබෙන සෑම ලෝකයකටම ඔබ දෙවියන් වහන්සේගේ නියෝජිතයා වන්නේය. ඔබට උපක්‍රමශීලී ඉව එම රැකියාව , ඔබේ පවුලට ලබා දී ඇත. ඔබේ අසල්වැසි ප්‍රදේශයේ තබා ඇති අතර එම විනෝදාංශය ලබාදී ඇත්තේ, දෙවියන් වහන්සේ ඔවුන්ට ශුභාරංචිය දේශනා කිරීමට ඔබ කෙරෙහි විශ්වාස කරන බැවිනි. උන්වහන්සේ ඔබ කෙරෙහි විශ්වාසය තබයි.

දෙවියන් වහන්සේ ලෝකය තනිවම බේරාගත හැකි නමුත් උන්වහන්සේ එය තනිවම කිරීමට කැමති නැත. උන්වහන්සේට අවශ්‍ය එය ඔබ සමග කිරීමටය.

# ජයග්‍රහණ උදෙසා ක්‍රීඩා කරන්න

ඔබේ ලෝකයේ සිටින සෑම කෙනෙකුටම ශුභාරංචිය ගෙන ඒමට ඔබ අධිෂ්ඨාන කර ගන්නේ නම් ඔබේ ජීවිතයේ කතාව කුමක් විය හැකිද?

මම එක ක්‍රීඩා කණ්ඩායමක වැඩ කරන විට පුහුණුකරුවෙක් අර්ධ ගෝලයේදී ගැඹුරු ප්‍රකාශයක් කළා. ඔහු කිව්වා " කණ්ඩායම, අපි ක්‍රීඩා කරන්නේ පරාජය වෙන්න නොවේ. ජයග්‍රහණය කරන්න ක්‍රීඩා කරමු." කියා.

බොහෝ ඇදහිලිවතුන් තම ජීවිත ගත කරනුයේ පරාජය නොවීමට සෙල්ලම් කිරීමෙනි. ඔවුන් ප්‍රවේශම් සහගත රහසිගත ක්‍රිස්තියානි ජීවිත ගත කරති. ඔවුන් තමා කොස්මොස් හි කිසිවෙකු තමන් කිතුණුවපු බව දැනගැනීමට කැමති නැත. මන්ද ඔවුන් යමෙකු අමනාප කර ගැනීමට, නිශේධනාත්මකව වටහා ගැනීමට හෝ යේසුස් වහන්සේව වැරදි ලෙස නිරූපණය කිරීමට ඉඩ ඇත. ඔවුන් ක්‍රීඩා කරන්නේ පරාජය නොවීමටය.

නමුත් දෙවියන් වහන්සේ ඔබට දී ඇති ජීවිතය එය නොවේ. අපගේ කනට කොඳුරන දේ අප වහල වල සිට කෑ ගැසිය යුතුයි. අපි යේසුස් වහන්සේ උදෙසා අප ජීවිතය ශබ්ද නගා ගත කළ යුතුය. අප ජයග්‍රහණය කිරීමට දිවිය යුතුය !

ඒ මුල් ඇදහිලිවතුන් මතකද? ඔවුන් කිසිවෙකු අමනාප වීමට නොව, මරණයට මුහුණ දීමට සිදුවිය. කෙසේ වෙතත් ඔවුන්ට ශුභාරංචිය දේශනා කිරීමට ඇති බව ඔවුන් දැන සිටියහ. ටර්ටූලියන් අධිරාජයන්ට ලිවීය, "අපි ඔබ සමග නිතර නිතර එකතු වන තරමට අපි සංඛ්‍යාවෙන් වැඩි වෙමු."

ඔවුන් සහය දිවීමේ තරගයේ යෙදී සිටියහ. ඔවුන් ළඟ යෂ්ඨිය තිබුණි. ඔවුන් දුවගෙන ගියේ ජයගැන්මටය.

අපද එලෙසම කළ යුතුය.

අපට හැම දෙනාවම ගැලවුම්කරුවාණන් වෙතට ගෙනා නොහැකිය. ඔබගේ ජීවිතයට දෙවියන් වහන්සේගේ ආත්මික අරමුණ වනුයේ ඔබගේ කොස්මොස් තුළ සිටින්නා වූ අයව දිනා ගැනීමට ඔබගේ ආශාවයි. සහ Robert Murray M'Cheyne ලේඛකයෙක්, කිවිවරයෙකු සහ පූජකයෙකු වන අතර ඔහු ස්කොට්ලන්තයේ 1800 වර්ෂයේ මුල් භාගයේ ජීවත්ව මෙසේ ලියයි.

*ඔබේ ලෝකයේ සිටින සෑම කෙනෙකුටම ශුභාරංචිය ගෙන ඒමට ඔබ අධිෂ්ඨාන කර ගන්නේ නම්, ඔබේ ජීවිතයේ කතාව කුමක් විය හැකිද?*

" ඕ, දෙවියන් වහන්සේ උදෙසා පූර්ණ දවසක් වැඩ කිරීම සහ ඉන්පසු උන්වහන්සේගේ සිනහව යටතේ රාත්‍රියේ සැතපීම කෙතරම් මිහිරිද."

උන්වහන්සේ ඔබව නිර්මාණය කර ඇත්තේ ජීවිතය ජය ගැනීමටයි. ඔබට ක්‍රීඩා පොත ලබා දී ඇත්තේ සෑම කොස්මස් වෙතට ගොස් සෑම ජාතියකටම ශුභාරංචිය ගෙන යන්නටයි.

තුන්වන සියවසේ ඇදහිලිවතුන් යේසුස් වහන්සේගේ වචන බැරෑරුම් ලෙස සැලකූහ. කොන්ස්තන්තිනෝපලයේ බිෂොප්වරයෙක් මෙසේ පැවසීය, " මේ නගරයේ ඔබ යමෙකුගෙන් වෙනසක් ඉල්ලා සිටියහොත් ඔහු ඔබ සමඟ සාකච්ඡා කරනු ඇත. දෙවියන් වහන්සේගේ පුත්‍රයා ඉපදී ඇත්ද නැද්ද? ඔබ පාන් වල ගුණාත්මකභාවය විමසා සිටියහොත් ඔබට ලැබෙන පිළිතුර වන්නේ, පියවූ දෙවියන් වහන්සේ උතුම්ය. දෙවියන් වහන්සේගේ පුත්‍රයා අඩුය. ඔබ යෝජනා කළහොත් ස්නානය කිරීම සුදුසුය කියා ඔබට ඔවුන් පවසනුයේ, දේවපුත්‍රයා මැවීමට පෙර කිසිවක් නොතිබුණේය යන්නය. " කොන්ස්තන්තිනෝපල් ගේ සෑම සංවාදයක්ම යේසුස් වහන්සේ සහ බයිබලානුකූල ප්‍රශ්න වටා කේන්ද්‍රගත විය. සියවස අවසන් වන විට කොන්ස්තන්තිනෝපල් සියල්ලම පාහේ බේරා ගත්තේය.

ඇයි? මන්ද ජීවිතයෙන් හෝ මරණයෙන් වේවා, ඇදහිලිවතුන් ඔවුන් දන්නා සෑම කොස්මොස් වෙතටම සහ ජනවාර්ගික කණ්ඩායමකටම ශුභාරංචිය ගෙන ගියහ. ඔවුන් ශුභාරංචියේ යෂ්ඨිය සහ සමග දුව ගොස් එය ඊළඟ සියවසට භාර දුන්නේ ඔවුන්ට ලැබුණ ප්‍රමාණයට වඩා වැඩි ගම්‍යතාවයක් සහ බලාපොරොත්තුවක් ඇතිවය.

# 5

# 300 ගණන් වල - ස්භාඋත්තර

නමුත්.. මාගේ අදහිල්ල විශාල නොවේ.

ආශ්චර්යයන් ස්වභාවධර්මයට පටහැනි නොවේ. නමුත් ස්වභාව ධර්මය ගැන අප දන්නාදේට පමණක් පටහැනී. - ශාන්ත ඔගස්ටින්

4 වන සියවස වන විට සියලුම ප්‍රේරිතයන් සහ මුල් ඇදහිලිවන්තයන් බොහෝ කලකට පෙර අතුරුදහන් වී ගිය නමුත් සුභාරංචියේ බලය දිගටම පැවතුණි. මුල් සභාව මෙන් සුභාරංචිය ඉදිරියට ගෙන යාමේදී ප්‍රාතිහාරයන් වැදගත් කාර්යය භාරයක් ඉටු කළේය. සුභාරංචිය මැද පෙරදිග පුරා ඉක්මනින් ව්‍යාප්ත වූ අතර ක්‍රි.ව 301 දී යෙරුසලමේ සිට සැතපුම් දහස් ගණනක් ඈතින් පිහිටි මුළු ජාතියකටම තමන් පළමු ක්‍රිස්තියානි රට ලෙස ප්‍රකාශ කිරීමට හාස්කම් මග පෑදීය.

මුල් ගෝලයන් දොළොස් දෙනාගෙන් දෙදෙනකු වන බර්තලමෙව්ස් සහ තද්දියුස් ක්‍රි.ව 40 සහ 60 අතර කාලය තුල ආමේනියාවට සුභාරංචිය ගෙන ගියහ. යුසීබියස්ට අනුව දේවස්ථානයේ ඉතිහාසඥයෙකුවන (ක්‍රි.ව 265 - 340) 5 වන අභිගා රජු ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ ආමේනනියානු අධිරාජ්‍ය පාලනය කළ අතර ලාදුරු රෝගයෙන් සුවය ලබා දෙන ලෙස යේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. යේසුස් වහන්සේ හමුවීම සිදු නොවූවත් යේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් ටික කලකට පසු බර්තලමෙවුස් සහ තද්දියුස් උතුරට ගමන් කළහ. ඔවුන් අභිගා රජු වෙත සුභාරංචිය ගෙනා අතර ඔහු ආශ්චර්යමත් ලෙස සුව විය. ඊළඟ වසර 250 තුල කලාපය සොරොස්ත්‍රියානු වාදයට කැපවී තිබිණි. නමුත් සුභාරංචිය සහ එහි ආශ්චර්යමත් බලය රට තුළ මුල් බැස තිබුණි.

ක්‍රි. ව 301 දී ආමේනියාවේ නපුරු රජෙක් ලෙස හැඳින්වෙන තුන්වන ක්‍රීඩේඩ්ස් අසනීප විය.ඔහුගේ අසනීප කාලය තුළ ඔහු සිහිනෙන් දුටුවේ ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ල නිසා ඔහු වද හිංසා කළ වසර දහතුනක් සිරගත කළ ග්‍රෙගරින් නම් කිතුණුවා ඔහුට උදව් කළ හැකි එකම තැනැත්තා බවයි.ඔහුගේ සිහිනයෙන් 3 වන ක්‍රිඩේට්ස් ශුභාරංචිය බදා ගත් සහ රජුට ශුභාරංචිය ප්‍රකාශ කළ ග්‍රෙගරි කැඳවීය.වහාම 3 වන ක්‍රිඩේට්ස් රජු සුව වී ක්‍රිස්තියානි ආගමට හැරුනි.

ආමේනියාවේ නිල ආගම ලෙස ක්‍රිස්තියානි ආගම ප්‍රකාශයට පත් කිරීමේ මෙම අත්දැකීමෙන්, රජු වයස අවුරුදු 50දී වෙනස් විය. මේ සමඟ ආමේනියාව පළමු නිල ක්‍රිස්තියානි ජාතිය බවට පත්විය. ශුභාරංචිය අසා ප්‍රාතිහාරයන් අත් විඳින විට අර්මේනියානුවන් ඉක්මනින්ම සොරොස්ත්‍රියානු වාදයෙන් ක්‍රිස්තියානි ආගමට හැරුණි. 3වන ක්‍රිඩේස් රජු ක්‍රි.ව. 330දී මිය යන තෙක්, ක්‍රිස්තියානි ආගම ආමේනියාවේ පැතිරවීමට උත්සාහය දැක්වීය. 4වන සියවසේ ඉතිරි කාලය පුරා, ආමේනියාව ක්‍රිස්තුස් වහන්සේට වඩාත් කැපවී සිටියේය.

අර්මේනියාව ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇති නව ඇදහිල්ල මත නැගී සිටිනු ඇත.වසර 150කට පසුව, පර්සියානු රජ වූ 2වන යස්ඩෙගඩ් (ක්‍රි.ව. 437-457) ආමේනියාවේ ක්‍රිස්තියානි ධර්මය අහෝසි කිරීමට තීරණය කළේය. ඔහු අල්ලස්, කප්පම් සහ විවිධ වද හිංසාවන් මඟින් ආමේනියානු ජනතාවගේ ඇදහිල්ල විනාශ කිරීමට උත්සහ කළහ. එහෙත්, ආමේනියානුවන් දැඩි විශ්වාසයකින් යේසුස් වහන්සේට විශ්වාසවන්තව සිටියහ. ඔවුන්ගේ එම කැපවීම, 2වන යස්ඩෙගඩ් රජුට ලියූ ආමේනියානු වංශාධිපතිවරුන්ගේ ලිපියකින් දැක්වෙයිː

*"මේ ඇදහිල්ලක් කිසිවෙකුට අපව සොලවිය නොහැක. දේවදූතයන්ට හෝ මිනිසුන්ට, කඩුවට, ගින්නට, ජලයට හෝ වෙනත් ඕනෑම භයානක වද හිංසාවලට අපගේ සියලු භාණ්ඩ හා දේපළ ඔබගේ අතේය. අපගේ ශරීරද ඔබ ඉදිරියෙහි ඇත. ඔබ කැමති පරිදි ඒවා බැහැර කරන්න. ඔබ අපව අපගේ විශ්වාසයට භාර දුන්නොත්,අපි මේ පොළොවේ ඔබේ ස්ථානයේ වෙනත් ස්වාමියෙකු තෝරා නොගනිමු. ස්වර්ගයේ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ වෙනුවට වෙනත් දෙවි කෙනෙකු තෝරා නොගනිමු. මන්ද, වෙනත් දෙවි කෙනෙකු නැත. නුමුත් මේ ශ්‍රේෂ්ඨ සාක්ෂියෙන් පසු තවදුරටත් අපෙන් ඔබ්බට යමක් ඔබ ඉල්ලා සිටියහොත්, මෙන්න අපගේ ශරීර ඔබේ අතේය. ඔබ කැමති පරිදි ඒවා සමඟ කටයුතු කරන්න. වද හිංසා ඔබේය. යටත් වීම අපේය. කඩුව ඔබේය. බෙල්ල අපගේය. මෙම ඇදහිල්ල වෙනුවෙන් ඔවුන්ගේ භාණ්ඩ ,දේපළ සහ ශරීරය පවා කැප කළ*

*අපගේ මුතුන්මිත්තන්ට වඩා, අප හොඳ නැහැ. එහෙත්, අප අමරණීය වුවත්, ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය වෙනුවෙන් මිය යාම අපට සිදුවනු ඇත. මක්නිසාද උන්වහන්සේම අමරණීය වූ අතර එතරම් ප්‍රේම කළ සේක. උන්වහන්සේ මරණය තමන් මතට ගත් සේක. උන්වහන්සේගේ මරණයෙන් අප සදාකාලික මරණයෙන් නිදහස් වී සිටිමු. උන්වහන්සේ තම අමරණීය භාවය ඉතිරි නොකල බැවින් අපි අපේම නිදහස් මරණීය භාවයට පත්විය. උන්වහන්සේගේ ප්‍රේමය වෙනුවෙන් කැමැත්තෙන්ම මිය යනු ඇත. එවිට උන්වහන්සේ අපව උන්වහන්සේගේ අමරණීයභාවයට සහභාගී කරවනු ඇත. අපගේ මරණය උන්වහන්සේ අමරණීයන්ගේ මරණයක් ලෙස පිළිගන්නා පිණිස අපි මනුෂ්‍යයන් ලෙස මිය යන්නෙමුව.*

*එබැවින් මේ සියල්ල ගැන අපෙන් තවදුරටත් ප්‍රශ්න නොකරන්න. මක්නිසාද අපගේ ඇදහිල්ලට ඇති බැඳීම දරුවන් මෙන් රැවටීමට මිනිසුන් සමග නොව, අප වෙන් කළ නොහැකි ලෙස බැඳී සිටින සහ කිසිවකට අපව වෙන් කිරීමට හෝ වෙන්කිරීමට නොහැකි දෙවියන් වහන්සේ සමඟය. දැන්, පසුව, සදහටම, සදහටම නොවේ,"*

මුළු ජාතියක්ම ක්‍රිස්තියානි ආගමට හැරුණේ, එක් මිනිසෙක් තම ශුභාරංචිය , ලකුණු හා අරුම පුදුම දේ සමග බෙදාගත් නිසාය. අද දක්වාම ආර්මේනියාව ක්‍රිස්තියානි රටකි.

## රුසියානු සිහිවටන සාප්පුවක හාස්කමක්

මිනිසුන්ගේ අවධානය ලබා ගැනීමට සහ සුභාරංචිය සඳහා දොර විවෘත කිරීමට සංකේත, පුදුම දේ සහ හාස්කම් ස්ථිර මාර්ගයකි. එය යේසුස් වහන්සේ, ප්‍රේරිතයන් සහ මුල් සභාව ආමේනියාවේ ක්‍රියාත්මක කළ පරිදි, ඔබත් ඔබේ සුව පහසු කලාපයෙන් පිටතට ගොස් මිනිසුන් වෙනුවෙන් යාච්ඤා කළහොත්, ඔබටත් එයම සිදු වේ.

ඔබ කවදා හරි රුසියාවට ගොස් තිබේද? එය මගේ ප්‍රියතම සුභාරංචිය දේශනා කරන ස්ථානවලින් එකකි. 2018 දී, රුසියාවේ විවිධ නගර තුනක සහා සම්මන්ත්‍රණවල දේශනා කිරීමට මට ආරාධනාවක් ලැබුණි. අන්තිම දින, මම මගේ මිතුරා ජේසන් සමඟ ශාන්ත පීටර්බර්ග්හි සිටියෙමි. අපේ භාර්යාවන් සඳහා මැට්‍රියෝෂකා බෝනික්කන් සොයමින්, අපි සිහිවටන සාප්පුවක සිටියදී, ජේසන් කැෂියර්ගෙන් ඇසුවේ "දිමිත්‍රි, අපිට ඔබගේ පිට වෙනුවෙන් යාච්ඤා කළ හැකිද?" යැයි ඇසීය.

දිමිත්‍රිගේ මුහුණේ පුදුමයක් පැවති අතර, "මගේ පිටේ යම් දෙයක් වැරදි ඇති බව ඔබ දන්නේ කෙසේද?"

අපි පැහැදිලි කළේ අපි යේසුස් වහන්සේගේ අනුගාමිකයන් බවත්, උන්වහන්සේ අපට කතා කරන බවත්ය. අපි ඔහු වෙනුවෙන් යාච්ඤා කිරීමට කැමැත්ත පල කර, පුටුවක වාඩිවීමට ආරාධනා කළෙමු. සැක සහිත දිමිත්‍රි එයට එකඟ විය.ඔහු පැවසුවේ, වසර ගණනාවක් තිස්සේ ඔහුගේ පිටුපස වේදනාව ඉතා දරුණු බවත්, ඒ නිසා ඔහුට නැමී ඇඟිලි ස්පර්ශ කිරීමට නොහැකි වී ඇති බවත්ය. මේ නිසා ඔහුගේ බොහෝ ක්‍රියාකාරකම් සීමා වී තිබුණි.

අපි දිමිත්‍රිගේ පිට මත අත් තැබූ අතර, ඔහුගේ සුවය ප්‍රකාශ කිරීමට ආරම්භ කළෙමු. අපි යාච්ඤා කරමින් සිටියදී, දිමිත්‍රි හදිසියේම අප දෙස බලා,"මේ මොන රස්නේද? මගේ පිට මෙච්චර රත් වෙලා තියෙන්නේ ඇයි?" කියා ඇසීය.

*මිනිසුන්ට ශුභාරංචිය ඇසීමට අවශ්‍ය තරමටම දැකීමටද අවශ්‍ය වේ.*

ඒ දෙවියන් වහන්සේ ඔබව සුව කරනවා යැයි කියා ජේසන් පැහැදිලි කළේය. අප යාච්ඤා කළ අවසන් වූ විට, දිමිත්‍රි නැමී හිටගෙන ඔහුගේ ඇඟිලි ස්පර්ශ කළේය. ඔහු ඕනෑවට වඩා කෑ ගැසුවා. මුද්‍රණය කිරීමට බැරි තරම් පුදුම සහගත වචන වලින් ඔහු කෑ ගැසුවා.

"මට මේක විශ්වාස කරන්න බැහැ! මට අවුරුදු ගණනකින් මගේ පාදවල ඇඟිලි අල්ලන්න පුළුවන් වෙලා තිබුණේවා. මේක ආශ්චර්යයක්! මේක ඇත්තටම වෙන්න බැහැ!" යැයි ඔහු කෑ ගැසුවේය. "ඔබ ඩේවිඩ් බ්ලේන් මැජික් සංදර්ශනයක කොටසක්ද?

අපි පැහැදිලි කලා නැහැ, මේක මැජික් එකක් නෙවෙයි කියලා. ඒ යේසුස් වහන්සේය!" යැයි දිමිත්‍රි ඔහුගේ සගයන්ට සහ ගබඩා කළමනාකරුට අපව හමුවීමට කතා කළේය. අපි මුණගැසෙන අතරතුර, ගබඩා කළමනාකරු දොරේ තිබූ "වසා ඇත" යන ලකුණ පවා වෙනස් කළේය. මේ අවස්ථාවේ සඳහන් කිරීම වටින්නේ, රුසියාවේ මෙම සාප්පු යුද්ධයේදී අප කරමින් සිටින්නේ නීති විරෝධී දෙයක් බවයි. එහිදී ඉවැන්ජලිස්ත සේවය හෝ ඕනෑම ආගමික අන්තවාදයක් තහනම් කර තිබුණි. අපගේ අභිප්‍රාය වූයේ පුද්ගලයන්ගේ ආගමට හැරවීමයි. එය එසේ විය. අපව අල්ලා ගත්තානම්, රුසියානු බන්ධනාගාරයකට දමනු ඇත. ඒ අවස්ථාවේදී රුසියානු රජයෙන් ආගමික ආරාධනාවක් නොමැතිව ඔබට දේව සේවය සඳහා රටට පැමිණීම පවා නොහැකි විය. එසේ වුවද, ඔබ කරන ඕනෑම දේශනාවක් සභාව තුළ තිබිය යුතුය. අපි ශාන්ත පීටර්ස්බර්ග් සිටියදී, සහ මේ පොත ලියන අවස්ථාවේදී, මේවා නීති සහ ප්‍රතිවිපාක වූවාය. නමුත් ශාන්ත පීටර්ස්බර්ග්හි එම සීතල දිනයේදී, යේසුස් වහන්සේ ගැන එම සේවකයන්ට අසන්නට දෙවියන් වහන්සේට සැලැස්මක් තිබෙන බව අපි දැන සිටියෙමු.

සිහිවටන සාප්පුවේ සේවකයින් හය දෙනෙකු අප වටා රැඳුණු විට, අපි සුභාරංචිය බෙදා ගත්තෙමු. ගබඩා කළමනාකරු ඔහුගේ උරහිසේ වේදනාව ගැන අපට පවසා, "අපිත් ඔහු වෙනුවෙන් යාච්ඤා කළොත්?" යැයි ඇසීය. අපිත් එය කළා. ඔහු සුව විය. යේසුස් වහන්සේ තම ගැලවුම්කරුවා ලෙස පිළිගැනීමට කළ ආරාධනයට ගබඩා කළමනාකරු පවා ප්‍රතිචාර දැක්වීය. දිමිත්‍රි සහ අනෙකුත් සේවකයින් ඒ අවස්ථාවේ යේසුස් වහන්සේව සම්පූර්ණයෙන්ම අනුගමනය කිරීමට සූදානම් නොවූ නමුත්, බීජයක් රෝපණය කරන ලදී. (11 පරිච්ඡේදයේ බීජ පිළිබඳව වැඩි විස්තර)

මෙම හමුවීමෙන් පසු මාස කිහිපයක් පුරා, ගෝලයෙකු වීම සැමවිටම ඉවැන්ජලිස්ත සේවය අනුගමනය කළ යුතු බව දැන, මම සමාජ මාධ්‍ය හරහා නිරන්තරයෙන් ගබඩා කළමනාකරු සමග සම්බන්ධව සිටියෙමි. වසර කිහිපයකට පෙර, පෝලන්තයේ ගෝසෝහි අපගේ One Hope උත්සවයේදී, මට හමුවූ කළමනාකරුගේ උපන් ගමේ පදිංචිකරුවකු වන පූජකවරයෙකු මා දන්නා බව මම සොයාගත්තා. මම හැඳින්වීමත් සංවිධානය කර, එම පූජකවරයාට ගෝලයෙකු ලබා දුන්නා.

අපි කඩෙන් එළියට බසින විට, ජේසන් සහ මම ටිකක් කනස්සල්ලෙන් සිටියා. "අපි කළ දේ නීතියට පටහැනියි" කියා හිතා, රුසියානු බන්ධනාගාරයට යන අදහසට අප දෙන්නම කැමති නොවුණි. නමුත් දෙවියන් වහන්සේ ඒ දවසේ ආශ්චර්යයක් කළා. සුභාරංචිය ප්‍රකාශ විය. බීජයක් රෝපණය විය. එක මිනිසෙකුගේ සදාකාලිකත්වය වෙනස් විය.

ඕහ්, අපගේ භාර්යාවන්ද මෙට්‍රොෂ්කා බෝනික්කන් ලබා ගැනීමෙන් සතුටටපත්වූහ.

# වචනයෙන්, ක්‍රියාවෙන් සහ ලකුණෙන්

යේසුස් වහන්සේ තම ගෝලයන්ට දේව සේවය අනුකරණය කරන ආකාරය පුහුණු කරන විට, උන්වහන්සේ ඔවුන්ට සැලැස්මක් ලබා දුන් සේක.

> *"එකල උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත් ඔවුන් යැවූසේක." - ලූක් 9:1 -2*

තම ගෝලයන් ශුභාරංචිය දේශනා කළයුතු හා ආශ්චර්යයන් කළයුතු බව යේසුස් වහන්සේ පැහැදිලි කළ සේක. ශුභාරංචිය ප්‍රකාශ කිරීම වචනයෙන්, ක්‍රියාවෙන් සහ ලකුණෙන් විය යුතු බවට උන්වහන්සේ පූර්වාදර්ශයක් සකසා සිටියේය. මිනිසුන්ට ශුභාරංචිය ඇසීමට අවශ්‍ය වන පරිදි, දැකීමටත් අවශ්‍ය වෙයි. ගෝලයන්, යේසුස් වහන්සේ නොමැතිව තනිවම ගම් වලට ගියේ උන්වහන්සේ අණ කළ දේ නිවැරදිව කරමින්ය. ඔවුන් ශුභාරංචිය ප්‍රකාශ කළ අතර, ආශ්චර්යයන් අනුගමනය කරන ලදී.

මෙය නව ගිවිසුම පුරාම පවතින්නේය.ආබාධිතව සිටි සිඟන්නෙක්, පේතෘස් සහ යොහාන් නවතා මුදල් ඉල්ලා සිටි අවස්ථාවේදී, පේතෘස් ඔහු දෙස බලා මෙසේ කියයි:"අපට රිදී හෝ රත්තරන් නැත. නමුත් අප සතුව ඇති දේ ඔබට දෙන්නෙමු. නාසරත් යේසුස් ක්‍රිස්තුස්ගේ නාමයෙන්, නැගිට ඇවිදින්න."ක්ෂණයකින්ම මිනිසාගේ පාද සහ වළලුකර ශක්තිමත් වූ අතර, සිදුවූ දේ ගැන ජනතාව පුදුමයෙන් පිරී ගියහ.මෙම අවස්ථාවේ, පේතෘස් සමූහයාගේ අවධානය ගෙන, යේසුස් වහන්සේගේ ජයග්‍රහණය පිළිබඳ සුභාරංචිය නිර්භීතව ප්‍රකාශ කළේය. එදින මිනිසුන් පන්දහසක් පමණ ගැලවීම ලබා

ගත්තහ.තවද, පේතෘස් ඔහු වෙනුවෙන් යාච්ඤා කළ විට, වසර අටක් ඇඳේ සිටි අනනියස් සුවය ලැබීය. තැබීතා මළවුන්ගෙන් නැගිට්ටාය.

ස්තේපන් මහා ආශ්චර්යයන් සහ ලකුණු සමග ශුභාරංචිය දේශනා කළේය. ඉතියෝපියානු ජාතිකයෙකුට දේශනා කිරීමෙන් පසු, පිලිප් ආශ්චර්යමත් ලෙස අසූටාස් වෙත ගෙන යන ලදී. ඇත්ත වශයෙන්ම, සියලුම ප්‍රේරිතයන් ජනතාව අතර බොහෝ ලකුණු සහ ආශ්චර්යමත් දේ සිදු කළහ.

යේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු, පරිවර්තනය වූ පවුල්, උන්වහන්සේගේ ගෝලයන්ට දුන් රටාව දිගටම කරගෙන ගියේය. ඔහු කොරින්තිවරුන්ට මතක් කර දුන්නේ:"මගේ පණිවිඩය සහ මගේ දේශනා කිරීම ප්‍රඥාවන්ත හා ඒත්තු ගැන්වෙන වචන වලින් නොව, ආත්මයාණන් වහන්සේගේ බලයෙන්ය."තවද, රෝමවරුන්ට ඔහු පැවසුවේ: "ක්‍රිස්තුස් වහන්සේ මා තුළින් ඉටු කළ දේ හැර, අන්‍යජාතීන් දෙවියන් වහන්සේට කීකරුවීමට මග පෙන්වීමෙන් මිස, වෙන කිසිවක් ගැන කතා කිරීමට එඩිතර නොවමි" යනුවෙනි. ලකුණු සහ ආශ්චර්යයන්ගේ බලයෙන්, ආත්මයේ බලයෙන්, මම කිව්ව එය කළා. දිස්ත්‍රාවේදී පාවුල් උපතින්ම කොර වූ මිනිසකු වෙනුවෙන් යාච්ඤා කළේය. ඔහු ආශ්චර්යමය ලෙස සුවය ලැබීය. පිලිප්පියෙහිදී, පේන කීමෙන් තම ස්වාමිවරුන්ට මුදල් උපයා ගත් වහල් තරුණියකගෙන් ඔහු යක්ෂයෙකු දුරු කළේය. පාවුල් දේශනා කරමින් සිටියදී, තරුණයෙක් ජනේලයකින් වැටී මිය ගියේය. පාවුල් ඔහු වෙනුවෙන් යාච්ඤා කළේය, ඔහු නැවත ජීවනයට පැමිණිය.

මුල් සභාව තුළ ශුභාරංචිය දේශනා කිරීමේදී හාස්කම්, ලකුණු සහ පුදුම සිදුවීම් සම්පූර්ණයෙන්ම සාමාන්‍ය දෙයක් විය. ශුභාරංචිය බෙදා ගැනීම අත්‍යවශ්‍ය වුවද, එය අප ජීවත්වන ආකාරය සහ දෙවියන් වහන්සේගෙන් ලැබෙන ලකුණු සහ ආශ්චර්යයන් මගින් අනුබල දිය යුතුය. අපි ශුභාරංචිය වචනයෙන්, ක්‍රියාවෙන් සහ ලකුණු මගින් බෙදා ගනිම දෙකක් ඇස් සඳහා වන අතර, එකක් කන් සඳහා වේ. අලුත් ගිවිසුමේ කාලය පුරා ඵලදායී සන්නිවේදනය සඳහා එවැනි සමතුලිතතාවයක් තිබුනේ නම්, එය නිසැකවම අපගේ සමාජ මාධ්‍ය යුගයේද කළ යුතුය.

බයිබලයේ සඳහන් වූ අය උපකල්පනය කළේ නැත මිනිසුන් ශුභාරංචිය අසන්නට බලා සිටින බව; නමුත් ඔවුන් එය දැකීමට බලා සිටින බවය. ඔවුන් ප්‍රකාශ කළ පණිවිඩය සත්‍ය බවට ඔප්පු වූයේ මිනිස් ක්‍රියාවන් සාක්ෂි බවට පත්වීමෙනි.

## ඔබට ඩොලර් 3 බිලක් තිබේද?

ක්‍රිස්තුස්වහන්සේගෙන් වසර පහළ සියයකට පසු, ජෝන් කැල්වින්, විරාමවාදය නමින් අදහසක් ඉගැන්වීමට පටන් ගත්තේය. මෙය සිතුවිල්ලකට සමාන යෙදුමක් වූ අතර එහි අර්ථය වූයේ මුල් සභාවේ ලකුණු, පුදුම සහ හස්කම් ප්‍රේරිතයන්ගේ මරණයෙන් පසු නතර වූ බව හෝ සභාවේ පළමු සියවස් තුන තුළ ඒවා මැකී ගිය බවයි. නමුත් මුල් සියවස් කිහිපයේ කිතුනුවන් ලිව්වේ එය නොවෙයි.

ජස්ටින් මාටර් ( ක්‍රි.ව 100-165) මෙසේ ලිවිය, " මක්නිසාද අනාවැකිමය දීමනා වර්තමානය දක්වාම අප සමඟ පවතී. ඔරිගන් ( ක්‍රි.ව 184 - 253 ) බොහෝ යක්ෂයන් පලවා හැරීම්, සුව කිරීම් සහ අනාවැකි ඇසින් දුටු සාක්ෂිකරුවෙකු බව කියා සිටියේය. ඔගස්ටීන් ( ක්‍රි.ව 354- 430) සඳහන් කළේ ඔහු දුටු හාස්කම් එතරම් දර්ශනීය නොවූ නමුත් ඔහු තවමත් ඔහුගේ කාලයේ ආශ්චර්යයන් දුටු බවයි.

කිරේනියස් ( ක්‍රි.ව 130- 202) මෙසේ පැවසීය, සැබවින්ම උන්වහන්සේගේ ගෝලයන්වන අය උන්වහන්සේගේ කරුණාව ලබමින් උන්වහන්සේගෙන් එකිනෙකාට ලැබුණු දීමනාවනට අනුව අනෙක් මිනිසුන්ගේ සුබ සාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා උන්වහන්සේගේ නාමයෙන් ( හාස්කම ) කරති. මක්නිසාද සමහරු නිසැකවම සහ සැබවින්ම යක්ෂයන් දුරු කරති. එවිට ආත්මයන්ගෙන් පවිත්‍ර වූ අය බොහෝ විට (ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි) විශ්වාස කර සභාවට එක්වෙති. තවත් සමහරු ඉදිරියේදී සිදුවීමට ඇති දේවල් පිළිබඳව පූර්ණ දැනුමක් ඇත. ඔවුන් දර්ශන දකින අතර අනාවැකිමය ප්‍රකාශන ප්‍රකාශ කරති. තවත් සමහරු තවමත් අත් තබා සුව කරති. ඔවුන් සම්පූර්ණයෙන්ම සුවපත් වෙති.ඔව්, එපමණක් නොව, මා පැවසූ පරිදි මළවුන් පවා නැගිටුවනු ලැබ, වසර ගණනාවක් අප අතර රැඳී සිටි අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ නාමය, දැන් පවා මිනිසුන්ට ප්‍රතිලාභ ලබා දෙයි. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන සියල්ලන්ටම සම්පූර්ණයෙන්ම සහ ඵලදායි ලෙස සුවය සිදුවේ.

අවාසනාවකට මෙන්, අද බොහෝ අය අද්විතීය දේ විශ්වාස නොකරන්නේ ඔවුන් ව්‍යාජ හාස්කම් දැක ඇති හෝ ව්‍යාජ අනාවැකිමය වචන අසා ඇති බැවිනි. හාස්කම් ශුභාරංචියට දොර විවර කරනවා

සේම, මෙම බොරු අනාගතවක්තෘවරුන් සහ ව්‍යාජ සුවකරුවන් මිනිසුන්ගේ හදවත් ශුභාරංචියට වසා දමති. මෙයද සභාවේ ආරම්භයේ සිටම සිදුවෙමින් පැමිණියේය.

ක්‍රි.ව. 156 දී මොන්ටානස් සහ ඔහුගේ අනාගතවක්තෘවරියන් දෙදෙනා වූ ප්‍රිස්කා සහ මැක්සිමිලා, යේසුස් වහන්සේගේ දෙවන පැමිණීම ගැන අනාවැකි කියමින් කුඩා ආසියාව පුරා සංචාරය කළහ. බයිබලීය අනාගතවක්තෘවරුන්ගෙන් වෙනස්ව, මෙම තිදෙනා ශුද්ධාත්මයාණන් ඔවුන් හරහා කථා කරන අතරතුර ඔවුන්ගේ පෞරුෂයන් අත්හිටුවා තිබූ බව පෙනී ගියේය. ඔවුන් විශ්වාස කළේ, ශුද්ධාත්මයාණන් නව ගීතයක් වාදනය කිරීමට භාවිතා කරන වීණාව තමන් බවයි. නමුත්, අනාවැකි කීමේ ඔවුන්ගේ ආශාව තුළින් දෙවියන් වහන්සේ පැවසූ දේ ඉක්මවා ගොස් බොරු අනාවැකි නිර්මාණය කළහ. ඔවුන්ගේ අධි-අධ්‍යාත්මිකත්වය ඔවුන්ව ඕනෑවට වඩා දුර ගෙන ගොස්, බොහෝ දෙනෙකු ශුභාරංචියට නොවැටීමට හේතු විය.

සභා ඉතිහාසය පුරාම එය සිදුවී ඇති අතර, අදටත් එය සිදුවෙමින් පවතී. ඔබ දැනටමත් දැක ඇති පරිදි, දෙවියන් වහන්සේගේ සුව කිරීමේ බලය ඔප්පු කිරීමට දැඩි ආශාවක් දක්වන පුද්ගලයින් නොදැනුවත්වම හාස්කම් ව්‍යාජ ලෙස නිර්මාණය කරති. නැතහොත්, අන්‍ය භාෂාවලින් කථා කිරීමේ හැකියාව ඔප්පු කිරීමට වචන නිර්මාණය කරති. තවද, මොන්ටානස් මෙන්, දෙවියන් වහන්සේ ඔවුන්ට පැවසූ බව කියන අනාවැකිමය වචන ප්‍රකාශ කරන පුද්ගලයින් සොයාගැනීම අසාමාන්‍ය දෙයක් නොවේ. නුමුත්, එම අනාවැකි සිදු නොවීම පමණි.

මම ඉගෙන ගත් දෙයක් ඔබ සමග බෙදාගැනීමට මට අවසර දෙන්නඃ මෙම ව්‍යාජ හාස්කම් සුපිරි දීමනා නතර වී ඇති බව ඔබව අධෛර්යමත් නොකළ යුතුය. ඒ වෙනුවට එය ප්‍රතිවිරුද්ධ දෙයකින් ඔබව දිරිමත් කළ හැකිය.

යුරෝපයේ, ඇමරිකාවේ හෝ චීනයේ මුදල් ගෙවන විට ඔබට කිසිදා යූරෝ තුනයි පනස් තුනක් හෝ එවැනි මුදල් නෝට්ටුවක් නොලැබේ. ඇයි? මන්ද, එවැනි මුදල් නෝට්ටුවක් නොමැති බැවිනි. ව්‍යාජ දෙයක් පවතින්නේ සැබෑ එකක් පවතින විට පමණි. ව්‍යාජ ආශ්චර්යයන් පවතින බව යනු, සැබෑ ආශ්චර්යයන් පවතින බවට තහවුරු කරන ලකුණකි. පැරණි කියමනකට අනුව, "දුම ඇති තැන ගින්නක් ඇත."

ශුභාරංචිය සමග ලකුණු, පුදුම සහ හාස්කම් ඇති අතර, එය තවමත් විශ්වාස කරන සියල්ලන්ටම ලබාගත හැකිය.

## හාස්කම් අපෝස්තුළුවරුන්ට පමණක් නොවේ.

ක්‍රිස්තුස් වහන්සේ ගෝලයන් දොළොස් දෙනා ලූක් 9 පරිච්ඡේදයේ පිටත් කළ පසු, ලූක් 10 වන පරිච්ඡේදයේ තවත් හැත්තෑ දෙදෙනකු පිටත් කළ බව අපි කියවමු. ගෝලයන්ට කිවුවාක්මෙන්ම, යේසුස් වහන්සේ ඔවුන්ටද එම දේම පැවසූ සේක "නුඹලාගේ වචන අසන්නා මාගේ වචන අසයි; නුඹලා එපාකරන්නා මා එපාකරයි; මා එපාකරන්නා මා එවූ තැනන්වහන්සේ එපාකරන්නේයයි කීසේක." - (ලූක් 10:16 )

ලූක් පොතේ එක් පරිච්ජේදයක් හැරුනු කොට ගෙන මෙම හැත්තෑ දෙදෙනා නැවත එවූ බවට වෙන තැනක අපි කියවන්නේ නැත. ඔවුහු ඔබ හා මා වගේ සාමාන්‍ය ක්‍රිස්තියානි ඇදහිලිවතුන් වූහ. මෙම හැත්තෑ දෙදෙනා ඉතා ප්‍රීතිවන්තව උත්තර යේසුස් වහන්සේ වෙතට හැරී ආහ. ඔවුන්, යේසුස් වහන්සේ ඔවුන්ට කරන්නට කිවූ දෙයට කීකරු වූහ. එසේම, ශුභාරංචිය ප්‍රකාශ කිරීමෙන් පසු හාස්කම් සහ ලකුණු සිදුවූ බව ඔවුහු දුටුහ. "ඉන්පසු සැත්තෑදෙනා ප්‍රීතියෙන් හැරී ඇවිත්ඃ ස්වාමිනි, ඔබගේ නාමය නිසා යක්ෂයෝ පවා අපට යටත්වෙතියි කීවෝය." - (ලූක් 10:17)

උන්වහන්සේ ඔවුන්ට කියනසේක්ඃ සාතන් විදුලිය මෙන් අහසෙන් වැටුණා දුටිමි. බලව, සර්පයන්ද ගෝනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩපවත්වන්ටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දෙයකින්වත් නුඹලාට අන්තරායක් නොවන්නේය." - (ලූක් 10:18-19) මෙම සාමාන්‍ය ඇදහිලිවතුන් සුභාරංචිය බෙදාගැනීමේ දී සහ හාස්කම් සිදු කිරීමේදී උන්වහන්සේගේ ආඥාව අනුගමනය කළහ. එය දැක, යේසුස් වහන්සේ සතුටු විය. උන්වහන්සේගේ දරුවන් වන අපි, වචනයෙන් සහ ක්‍රියාවෙන් සුභාරංචිය බෙදාගන්නා විට, යේසුස් වහන්සේ තවමත් අතිශයින් ප්‍රීතිවන සේක. මේයයි ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන්ගෙන් අපේක්ෂා කෙරෙන්නේ.

# විශ්වාස කිරීම නොනවත්වන්න

මම මුලින්ම ඇදහිලිවන්තයෙකු වූ විට මම දෙවියන් වහන්සේගේ වචනේ ගිල දැමුවෙමි. මට එය ප්‍රමාණවත් නොවීය. අවදිව සිටින සෑම මොහොතකම බයිබලය කියවීම මට අවශ්‍ය විය. එක් අවස්ථාවක මම මාර්ක් 16:17 කියෙව්වෙමි. එහිදී යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක, "අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථාකරන්නෝය;"

දින කිහිපයකට පසු මම ෆ්ලොරිඩාවේ රාජ්‍ය ප්‍රදර්ශනයට ගිය අතර එහිදී රෝද පුටුවක සිටින කාන්තාවක් දුටුවෙමි. ඇය වෙනුවෙන් මගේ හදවත බිඳී ගියේය. මම ඇදහිලිවන්තයෙකු බව දැන සිටියෙමි. එසේම යේසුස් වහන්සේ කුමක්ද කීවේයයි මා දැන සිටියෙමි. මා දන්නවා උන්වහන්සේ එය අර්තවත් කළ බව. ඉන්පසු උන්වහන්සේ කිව්ව දේ උන්වහන්සේ අර්ථවත් නොකළේ නම් ඇයි උන්වහන්සේ නොකිව්වේ එහි අර්ථය.

මා ඉක්මනින් ඒ කාන්තාව වෙතට ගියෙමි.

"මහත්මිය මගේ යේසුස් වහන්සේට ඔබව සුව කළ හැකියි.මා ඔබට යාච්ඤා කරන්නද?"

ඇය එයට එකඟ විය. මිනිත්තු දහයක් එම කාන්තාව උදෙසා මම නැවත නැවත යාච්ඤා කළෙමි. මම ඇගෙන් නිරතුරුවම ඇයට කෙසේද සහ ඇයට රෝද පුටුවෙන් නැගිටිය හැකිදැයි ඇසුවෙමි. කිසිවක් සිදු නොවීය. එසේම ඇයගේ කැමැත්ත ගැන මා ඇයට ස්තුති කළ අතර දෙවියන් වහන්සේ ඇයව සුව නොකළ එක ගැන මා සමාව අයද සිටියෙමි. මම සම්පූර්ණයෙන්ම කලකිරීමෙන් යුක්තව හැරී ගියෙමි .

*යේසුස් වහන්සේ ඔබට අද්භූත දේවල ගමන් කිරීමට කැඳවන විට, ඔබ කළ යුත්තේ කීකරුකමෙන් ඉදිරියට ගොස් ප්‍රතිඵල දෙවියන් වහන්සේට භාර දීමයි.*

කෙසේ වෙතත් මම අත්හැරියේ නැත. ශුද්ධ ලියවිල්ල මගේ අත්දැකීම් වලට අනුකූල නොවන විට ශුද්ධ ලියවිල්ල නිවැරදි බවත් , හාස්කම් විශ්වාස කරන අය අනුගමනය කරන බවත් ඉගෙන ගන්නා තැනැත්තා මම බවත් යන මූලධර්මයේ සමග මම සෑම විටම ජීවත් වී සිටිමි. නැවතත් යේසුස් වහන්සේ පැවසූ දේ අදහස් කළේ නැත්නම් උන්වහන්සේ අදහස් කළ දේ උන්වහන්සේ නොකියන්නේ ඇයි? නමුත් උන්වහන්සේ එය අදහස් කළ සේක. ඒ නිසා මම රෝගීන් වෙනුවෙන් යාච්ඤා කරමින් සිටියෙමි.

දැන් වසර ගණනාවකට පසු අපගේ සේවයේදී සුවපත් වූ අසංඛ්‍යාත පිරිසක් අපි දැක ඇත්තෙමු. මේ සතියේ (මම මෙය ලියන විට ) මට ලැට්වියා කාන්තාවකගෙන් ලිපියක් ලැබුණි.ලිපිය සමඟ ඇගේ දරුවාගේ පින්තූරයක් එව්වාය. ඇය මට පැවසුවේ, "මගේ වඳ භාවය පිළිබඳ ගැටළුව සඳහා යාච්ඤා කිරීම ගැන ස්තුතියි. ඊළඟ මාසයේ ඔබ මා වෙනුවෙන් යාච්ඤා කරපු නිසා මාගේ සැමියා සහ මම දරුවෙකු පිළිසිඳ පැත්තෙමි. එය ආශ්චර්යයක්. ස්තුතියි!"

මාර්ක් ශුභාරංචියේ මෙම පාඨය ගැන මම යමක් දුටුවෙමි. මාගේ ශුභාරංචියේ "විශ්වාස කරන්න" යන වචනය සඳහා ග්‍රීක වචනය සමඟ භාවිතා කර ඇති කාලය නිසා සහ මෙම ලකුණු නිරන්තරයෙන් විශ්වාස කරන අය අනුගමනය කරනු ඇත. ලෙස පරිවර්තනය කිරීම වඩා හොඳය. වෙනත් වචන වලින් කිවහොත් මෙම ලකුණු විශේෂයෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි ඇදහිලිවන්තයෙකු වූ වහාම කෙනෙකු අනුගමනය නොකරයි. වඩාත් මෙම ලකුණු පුදුම සහ හාස්කම් සඳහා විශ්වාස කරන අය අනුගමනය කරයි. ඔබට ලකුණු සහ පුදුම දේ අනුගමනය කිරීමට අවශ්‍ය නම් ඒවා සිදුවීමට ඔබ නිරන්තරයෙන් විශ්වාස කළ යුතුය.

ජීවිතයේ කොටසකඔබ ශුභාරංචිය ප්‍රකාශ කරන කල්හි අද්විතීය දේ කෙරෙහි විශ්වාසය තබන්න , එය ඔබගේ ජීවිතයේ කොටසක් වන පිණිස.

# නමුත් මට ඇත්තේ ස්වල්ප ඇදහිල්ලකි

වැදගත් වන්නේ ඔබට ඇති ඇදහිල්ලේ ප්‍රමාණය නොව ඔබේ ඇදහිල්ල කා කෙරෙහිද යන්නයි. සියල්ලට පසුව මෙම ශුභාරංචි පණිවිඩය ඔබ ගැන නොවේ.

එය යේසුස් වහන්සේ ගැනය. 1900 ගණන්වල දේශිකාවක වූ කැතරින් කොල්මන්ගෙන් වරක් විමසුවේ ඇගේ රැස්වීම් වලට පැමිණෙන සියලුම පුද්ගලයන් සුවය ලැබීම උදෙසා මෙවන් උතුම් ඇදහිල්ලක් ඇයට ලැබුණේ කෙසේද යන්නයි. ඇගේ ප්‍රතිචාරය පරිපූර්ණය." මම ඇදහිල්ලේ උතුම් කාන්තාවක් නෙවෙමි. මම උතුම් වූ දෙවියන් වහන්සේ තුළ ස්වල්ප ඇදහිල්ලක් ඇති කාන්තාවක්මි " යන්නයි .

ඔබේ ජීවිතය ආශ්චර්යමත් දේ දැකීමට ඇදහිය නොහැකි ඇදහිල්ලක් අවශ්‍ය නොවේ. ආරම්භ කිරීමට ඔබට දැනටමත් ප්‍රමාණවත් ඇදහිල්ලක් තිබේ. පේතෘස් බෝට්ටුවෙන් බැසව ජලය මත ඇවිදීමට පටන්ගත් අවස්ථාව ඔබට මතකද? පේතෘස් යේසුස් වහන්සේ දෙසට ඇවිද යන විට ඔහු රළ පහරින් බියට පත්වී ගිලෙන්ට පටන් ගත්තේය. පේතෘස් උත්සහ කරන විට ඔහුගේ කුඩා ඇදහිල්ල ගැන තරවටු කිරීමෙන් යේසුස් වහන්සේ පේතෘස් හට මෙතරම් කළු වන්නේ ඇයි? යේසුස් වහන්සේගේ චරිතය තුළ එතරම් රළු බවක් නොපෙනේ. නමුත් අපි සමහරවිට කතාව වැරදි ලෙස කියවා ඇත්තෙමු.

මම විශ්වාස කරන්නේ යේසුස් වහන්සේට තරවටු කළේ පේතෘස්ව විවේචන කිරීම ගැන නොව ඔහුට ප්‍රශංසා කිරීම ගැනයි. ඔහු මූලික වශයෙන් පැවසුවේ, ඇදහිලා අඩුවෙන් තිබියදී ඔහුට ජලය මත ඇවිදින්න පුළුවන්, ඔබ මා කෙරෙහි ඊටත් වඩා විශ්වාස කළහොත් කුමක් සිදුවේදැයි සිතා බලන්න. පේතෘස්ගේ ජීවිතයේ වැදගත් කරුණක් වනු ඇත. මන්දේ ආශ්චර්යමත් ලකුණු සහ පුදුම දේ ඔහුගේ ජීවිතය පුරාණ ඔහු පසුපස එනු ඇත. නමුත් ඒ සියල්ල ආරම්භ වූයේ බෝට්ටුවෙන් එක පියවරක් ඔහු වතුරට තැබීමෙනි.

පේතෘස් මෙන් යේසුස් වහන්සේ ඔබට අද්විතීය තලයේ ගමන් කිරීමට කැඳවන සේක. ඔබට කරන්නට ඇති දේ කීකරුකමෙන්, ප්‍රතිඵලය දෙවියන් වහන්සේට භාර කිරීමෙනි. ඔබගේ කාර්‍යය කීකරු වීමය. උන්වහන්සේගේ උන්වහන්සේගේ කාර්යය ක්‍රියා කිරීමය. දෙවියන් වහන්සේ අපට අණ කරනුයේ ප්‍රතිඵලය පාලනය කල නොහැකි දේ කරන්නටය.

ආදම්ට දුන් පළමු නියෝගය වන්නේ ඵල දරන්න සහ ප්‍රගුණ වන්නයි. ඔබට ප්‍රගුණ වීමට නොහැකි බව ඔබ දන්නේද? අප සිතන්නේ නම් අපට හැකිය කියාය. නමුත් යථාර්ථය නම් අපට නොහැකිය. පුරුෂයෙක් සහ ස්ත්‍රියක් ක්‍රියාදාමයෙහි කරන්නාවූ සරල ක්‍රියාවක් ඇත. නුමුත් ඉන් පසු දෙවියන් වහන්සේගේ ක්‍රියාව වන්නේ ගර්භය තුළ දරුවෙකු වර්ධනය කිරීමයි. ඇදහිල්ලේ ක්‍රියාවක් තිබෙන අතර හාස්කම අවසානයේදී සිදුවේ.

එය අනෙකුත් හාස්කම් සමග එසේය. ඔබ ඇදහිල්ලෙන් ක්‍රියාකරන්නේය සහ දෙවියන් වහන්සේ ප්‍රතිඵල ගෙනෙන සේක. දෙවියන් වහන්සේගෙන් තොරව ඔබට කිසිවක් කළ නොහැකිය.

# කිසිවක් සිදු නොවුනහොත් කුමක් සිදු වේද?

ගැබ් ගැනීමට උත්සාහ කරන විට කිසිවක් සිදු නොවුනහොත් කුමක් කළ යුතුද? නැවතත් ගැබ් ගැනීමකදී අපට භෞතික වගකීමක් ඇති අතර ඕනෑම හාස්කමක් දෙවියන් වහන්සේගෙන් අවශ්‍ය වන අද්විතීය ප්‍රතිචාරයක් ඇත. අපි අපේ කොටස කරන අතර එය සිදු කිරීමට හෝ නොකිරීමට දෙවියන් වහන්සේ තම පැත්තෙන් කරන දේ දන්නා බව විශ්වාස කරමු.

දෙවියන් වහන්සේ හාස්කමක් අවශ්‍ය අය කෙරෙහි පරමාධිපති බව විශ්වාස කිරීම ඔවුන් වෙනුවෙන් යාච්ඤා කරනවට වඩා දුෂ්කර බව මට බොහෝවිට පෙනේ. ෆ්ලෝරිඩා ප්‍රාන්ත ප්‍රදර්ශනයේදී මම එම කාන්තාව රෝද පුටුවේ තබා ගියවිට මම අධෛර්යයට පත්වුණෙමි. මම එම රාත්‍රියේ ගෙදර ගොස් දෙවියන් වහන්සේම එම කාන්තාව සුව නොකළේ මන්දැයි විමසමින් සියල්ලට පසු ඇය රෝද පුටුවෙන් පැනලා තිබුණා නම් කීදෙනෙක් ප්‍රීති වී ශුභාරංචි විවෘතව පිළිගැනී දැයි මට කිව නොහැකි බව මට හැඟුණි.සුවකිරීම මගේ නොව දෙවියන් වහන්සේගේ කාර්යයක් බව එදින මට මතක් විය.

කැතරින් කුල්මන් සම්මුඛ පරීක්ෂණයකදී පැවසුවේ," එක් පුද්ගලයෙකුවත් මට සුව කළ නොහැකිය. දෙවියන් වහන්සේ සුව කරන සේක. තෝරා ගැනීම උන්වහන්සේගේ ක්‍රියාවේ. "

මට පැහැදිලිවම අවධාරණය කළ හැකිද දෙවියන් වහන්සේ මට වඩා බොහෝ විශාල බව මම වසර ගණනාවක් තිස්සේ ඉගෙනගෙන ඇත්තෙමි. තවද මිනිසා සමග වැඩ කිරීමේ සහ ඔහුගේ රාජ්‍ය ගොඩනැගීමේ ක්‍රම සමහරවිට මා සිතන හොඳම දේට පටහැනිය. දෙවියන් වහන්සේ අප යාච්ඤා කරන සියල්ලෝම සුව නොකරන්නේ මන්දැයි අප සියල්ලෝම කල්පනා කර ඇත්තෙමු. නමුත් අපි අවංක වෙමු.

අපගේ කුඩා සීමිත මනසට සැමවිටම අපගේ අසීමිත දෙවියන් වහන්සේව තේරුම් ගත නොහැක. අපට කළ හැක්කේ රෝගීන් සුව වන ලෙසත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය ස්වර්ගය මෙන් පොළොවට පැමිණෙන ලෙසත් එහි ප්‍රතිඵලය දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාස කරන ලෙසත් යාච්ඤා කිරීම පමණි.

කුල්මන් ඇගේ සම්මුඛ පරීක්ෂණය මෙසේ සාරාංශ ගත කරයි." දිව්‍ය සුවය ලබාගන්නේ කෙසේද සහ ඇයි යන්න පිළිබඳව මම කිසිදා පොතක් ලියා නැත. එසේ කිරීමට ඉල්ලීම් මා වටලා ඇතත් කෙසේද සහ ඇයි යන්න මා නොදන්නා නිසාය. ඔබට පෙනෙනවා ඇති පොත ප්‍රකාශයට පත් කිරීමට ආසන්න වන විට ශුද්ධාත්මයාණන් වහන්සේ මා පැවසූ දෙයට සම්පූර්ණයෙන්ම පටහැනි දෙයක් කරනු ඇත. දෙවියන් වහන්සේ ක්‍රියා කරන්නා වූ අභිරහස් ආකාරය ගැන මම තවත් ඉගෙන ගනිමින් සිටිමි. මා එක දෙයක් කියන්නම්. දෙවියන් වහන්සේට හාස්‍යජනක හැඟීමක් තියෙනවා කියා මට විශ්වාසයි!"

ඉතින් විවේක ගන්න.

අපට මුණ ගැසෙන සෑම පුද්ගලයෙක් තුළම හාස්කමේ ලකුණක් අපට දැකීමට අවශ්‍ය නම් මොනයම් හෝ හේතුවක් නිසා ආශාවන ආකාරයට එය සිදු නොවනු ඇත. එහෙත් දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන්න . එක් පුද්ගලයකුට යාච්ඤා කිරීමේදී සුවය හට නොගන්නේ නම් එයින් ඔබ පසු නොබැස ඊළඟ පුද්ගලයාට යාච්ඤා කරන්න. මතක තබා ගන්න දෙවියන් වහන්සේ ඔබ සියලු දෙනාම සුව කරනු ඇතැයි බලාපොරොත්තු නොවන බව. උන්වහන්සේට අවශ්‍ය වන්නේ උන්වහන්සේගේ වචනය විශ්වාස කොට, රෝගීන්ට යාච්ඤා කරමින් සුව කිරීම දෙවියන් වහන්සේට භාර දෙන ලෙසයි. ඔබගේ කොටස ඔබ කරන්න. උන්වහන්සේගේ කොටස උන්වහන්සේ කරනු ඇත.

## එසේ නම් මා කුමක් කළ යුතුද?

ආශ්චර්යමත් දේ තුල පාවිච්චි වීම ඔබ හිතනවාට වඩා පහසු විය හැක. ඔබගේ කොටස ඉතාමත්ම සරලය. සමන්‍ය ඇදහිලිවතුන් හැත්තෑ දෙදෙනෙකු ශුභාරංචිය දේශනා කොට , රෝගීන් සුවපත් කොට , මළවුන් නැගිටුවා, යක්ෂයන් දුරුකොට, ලාදුරු රෝගීන් සුව කර නැවත හැරී උන්වහන්සේ වෙතට පැමිණීම තුළ ඔවුන්ගේ සරල භාවය අපට දැක යක්ෂයන් පවා අපට යටත් වෙති.

නැවතත් ඔබගේ ඇදහිල්ලේ විශාලත්වය නොව, කොයිතරම් ඔබ බලවත් ලෙස ඇයදුවත් , යාච්ඤා කරන විට මිරිකා ගත්තත් හෝ ඔබගේ යාච්ඤාව කොයිතරම් අලංකාර ද යන්න නොව. ආශ්චර්යමත් දේ තුළ ක්‍රියා කිරීම උදෙසා ආත්මික චාරිත්‍ර වාරිත්‍ර හෝ දෙවියන් වහන්සේගෙන් සිගමන් ඉල්ලීම අවශ්‍ය නැත. ඔබ කළ යුතුය වන්නේ වාතාවරණය වෙනස් කිරීම උදෙසා යේසුස් වහන්සේගේ නාමයෙන් කතා කිරීමයි. යේසුස් වහන්සේට ප්‍රතිචාර දක්වන්න ඉඩ හරින්න. ඇදහිල්ලෙන් දැනගන්න ඔබගේ උතුම් දෙවියන් වහන්සේ එය එම ස්ථානයෙන් ඉවත් කරන බව.

2020 වසරේදී ස්වීසලන්තයේ, විශාල සම්මේලනයක මා කතා කරමින් සිටියෙමි. එම රැස්වීම අවසානයේ කාන්තාවක් තන්ජා සහ මා වෙතට ළංවී සුවය උදෙසා යාච්ඤා කරන මෙන් ඉල්ලා සිටියාය. ඇය පැවසුවේ ළඟකදී ඇය යන්ත්‍ර මන්ත්‍ර කරන්නාවූ සාප්පුවකට ඇතුල් වූ බවත් ඉන්පසු ඇගේ පසුපස වේදනාවක් ඇති වූ බවත්ය.

ඇයට ඇයගේ තුවාල වලින් සුවය ලැබීමට අවශ්‍යතාවයක් නොමැති බව පැහැදිලිව පෙනෙන්නට නොතිබුණේ නම් ඊළඟට සිදුවූ දෙයින් එය පැහැදිලි විය.

අපි යේසුස් වහන්සේගේ නම කියූ සැණින් ඇගේ ඇස් ඔලුව ඇතුලට හැරුනා. ඇය වෙව්ලන්න පටන් ගත්තා.

"ඔබට සුවය අවශ්‍ය නැහැ. ඔබ යක්ෂා වේශ වී සිටිනවා!" මා කෑ ගැසුවෙමි.

මගේ භාර්යාව ටන්ජා, ඇය මා දෙස බලමින්, " අපි යමු." බලන්න අප ඇය තුළින් යක්ෂයාවේ එලෙව්වෙමු.

ඇගේ ඇස් කරකවමින් සහ ශරීරය සොලවමින් මා කීවේ, " යක්ෂයා, යේසුස් වහන්සේගේ නාමයෙන් දැන් මේ කාන්තාවගේ ශරීරයෙන් ඉවත් වෙන්න."

ඇය එම වේදිකාව මත ඇද වැටුණේ යක්ෂයා ඇගෙන් ඉවත් වූ පසුවය. විනාඩි කිහිපයකට පසු ඇය මා දෙස බලා. මගේ ඇස් දෙස බලන්න නැවත වෙව්ලන්නට පටන් ගත්තාය.

නැවතත් මම කීවේ," යක්ෂයා, මම නියෝග කරනවා රජ වූ යේසුස් වහන්සේගේ නාමෙන් ඈ තුළින් ඉවත් වන ලෙස." ය නැවතත් ඇය වේදිකාව මත ඇද වැටුණා. බොහෝ යක්ෂයන් ඇය කෙරෙන් බැහැරව ගියා. මෙය පස්වතාවක් ඒ ආකාරයට සිදු විය.

පස්වන වතාවට පසු ඇය හිමීට ඇගේ ඇස් විවෘත කොට සිනාසුනාය. ඇගේ බැල්ම මිල කළ නොහැකිය. ඇය ටන්ජාට සහ මට ස්තුතිවන්ත වෙමින් අප සිප වැළඳ ගත්තාය. ඇය නිදහස් වී හමාරය. හාස්කමක් සිදුවිය සහ අර ඇත්තෑ දෙදෙනා මෙන් අප නිවසට ප්‍රීතියෙන් ගියේ නැවතත් දෙවියන් වහන්සේ කළාවූ දේ නිසාය.

මට මතක් වුනේ අප කළ යුතු දේ ඉතාමත් සරල භවය.

යේසුස් වහන්සේගේ නාමයෙන් රෝගී ශරීරවලට අපි සුවය කතා කළ යුතුයි.

යේසුස් වහන්සේගේ නාමෙන් යක්ෂාවේෂ වූවන්ගෙන් යන පිණිස කතා කළ යුතුය.

යේසුස් වහන්සේගේ නාමයෙන් මත්ද්‍රව්‍යයට ඇබ්බැහි වූවන්, සිය දිවි නසා ගන්නා වූ අය, කාමුක දර්ශන වලට ඇබ්බැහි වූවන් අප නිදහස් කොට පවිත්‍ර කළ යුතුය.

යේසුස් වහන්සේගේ නාමෙන් මළවුන්ට ජීවනය කතා කළ යුතුය.

යේසුස් වහන්සේගේ නාමෙන් අපි කතා කරන විට දෙවියන් වහන්සේ හාස්කම් කරන සේක. එසේම නැතිවූවන්ට නොමිලයේ ශුභාරංචිය ප්‍රකාශ කළ හැක. ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ සභාව මෙම සත්‍යය දැන සිටියහ. ශුභාරංචිය ඉතා වේගවත්ව යෙරුසල මෙන් අර්මේනියාවට සහ ලොව මුළුල්ලේ ප්‍රකාශ විය.

# 6

# 400 ගණන් වල - ජයග්‍රාහිකයන්, විදිතයන් නොවේ.

නමුත්.... මා වැරදිය

"නුඹලා වනාහි මට නපුර කරන්ට අදහස්කළහුය; එහෙත් බොහෝ සෙනඟ දිවි සහිතව රක්ෂාකරන පිණිස අද තිබෙන ප්‍රකාර ඉෂ්ටකිරීමට දෙවියන්වහන්සේ ඒක යහපතට අදහස්කළසේක." - (උත්පත්ති 50:20).

පස්සන සියවස ආරම්භයේදී නූතන ස්කොට්ලන්තයේ සිට පැමිණි දාසය හැවිරි පැට්‍රික් විශාල අසාධාරණයකට ලක් විය. මුහුද අසල සෙල්ලම් කරමින් සිටියදී පැට්‍රික්ව අයර්ලන්ත මුහුදු කොල්ලකරුවන් විසින් අල්ලා ගෙන වහල් භාවයට විකුණන ලදී. වහල් භාවයේ සිටියදී පැට්‍රික් තම දෙමව්පියන්ගේ කිතුනු ඇදහිල්ල දෙසට හැරී දෙවියන් වහන්සේව ඉතා ඕනෑකමින් සෙවීමට පටන් ගත්තේය.

අවුරුදු හයකට පසු පැට්‍රික් ඔහුගේ වහල් හිමියන්ගෙන් බේරුණේය.

සැතපුම් දෙසීයකට වැඩි ප්‍රමාණයක් පයින් ගමන් කරමින් ඔහු වෙරළට පැමිණ බල්ලන් රැගෙන යන නැවකට නැග වහාම බල්ලන් බලාගන්නෙකු ලෙස සේවය කළේය. අවසානයේදී පැට්‍රික් බ්‍රිතාන්‍යයේ පිහිටි ඔහුගේ නිවසට ආපසු ගියේය. පැට්‍රික් තමා මහා අසාධාරණයකට ලක් වූ කෙනෙක් ලෙස පහසුවෙන් දැක ගත හැකි විය. ඔහුට අයර්ලන්ත ජනතාවට අකමැති වීමට හැකි වුවද උපන් ගම තුළ අපැහැදිලි ජීවිතයක් ගත කිරීමට හැකි වුවද, ඔහු එසේ නොකළේය. ඔහු ක්‍රිස්තුස් වහන්සේ තුළ තමා කවුදැයි දැන සිටියේ සිටියේය.

සුභාරංචියේ යෂ්ටිය අතේ තබාගෙන තිත්තකමට පත්වීම වෙනුවට පැට්‍රික් යේසුස් වහන්සේගේ සුභාරංචිය බෙදා ගැනීමට නැවත අයර්ලන්තයට යාමට තීරණය කළේය. ජීවිතය වෙනස් වන සිහිනයක් ඔහු දුටුවේය. එහිදී අයර්ලන්ත දරුවන් නැවත වරක් අප අතරට ඇවිදින්න එන්න යැයි අපි ඔබෙන් අයද සිටිමු යනුවෙන් පවසමින් සුභාරංචිය ගෙන එන ලෙස ඔහුගෙන් අයැද සිටිනු දුටු ඔහු එසේ කළේය.

ක්‍රිස්තු වර්ෂ 432 පැට්‍රික් නැවත අයර්ලන්තයට පැමිණියේ වහලෙකු ලෙස නොවේ. ගැලවීමේ නිදහස් පණිවිඩය සමඟිනි. පැට්‍රික් අයර්ලන්තයේ වහලෙකු ලෙස ගත කළ කාලය තුළ ඔහු ගොඩනැගුනේ යාච්ඤාවේ මනුෂ්‍යයෙක් හා ධෛර්යයක් ඇති මනුෂ්‍යයෙක් ලෙස ඔහුට සංස්කෘතිය හා ජනතාව පිළිබඳ අවබෝධයක්ද ලබා ගනිමිනි.

ඔහුට වසර තිහක් පුරා අයර්ලන්තය පුරා දේශනා කිරීමට උපකාරී වූ අතර ක්‍රිස්තු වර්ෂ 460 දී ඔහුගේ මරණය සිදුවිය. අයර්ලන්තය කිසිදා එලෙසම නොවනු ඇත. මේ කාලය තුළ අයර්ලන්තයේ සෑම කෙනෙක්ම පාහේ කිතුණු ආගමට හැරුණි. ඔවුහු පසුව සාන්තුවරයෙකු වූ ඔහුගේ ජීවිතයේ අවසාන වන විට සාන්ත පැට්‍රික් සහා 200 ගණනාවකට වඩා පිහිටුවා ලක්ෂයකට අධික ජනතාවක් බෞතිස්ම කර තිබුණි.

දෙවියන් වහන්සේ පැට්‍රික් ගේ ඛේදවාචකය ජයග්‍රහණයක් බවට පත් කළ අතර මුළු ජාතියකටම සුභාරංචිය ළඟා විය.

## දෙවියන් වහන්සේට එය යහපතට හැරවිය හැකියි

ජීවිතය සාධාරණ නැත. මට ආමෙන් එකක් ලබාගත හැකිද? හොඳ මිනිස්සුන්ට නරක දේවල් සිදුවේ. ඔබට අසාධාරණයක් සිදුවෙනවාද නැද්ද යන්න වැදගත් නොවේ. ඔබ එයට කරන දේ වැදගත්වේ. "සතුරා නපුරට අදහස් කළ දේ දෙවියන් වහන්සේ යහපත හරවන සේක" යන ප්‍රසිද්ධ පද ඔබ අසා තිබේද එය පැමිණෙන්නේ කොහෙන්දැයි දන්නවාද?

> *"එවිට යෝසෙප්ගේ සහෝදරයෝ තමන්ගේ පියා නැසීගිය බව දැක: සමහරවිට යෝසෙප් අපට වෛරකොට අප විසින් ඔහුට කළ සියලු නපුරුකම් ගැන සම්පූර්ණ ලෙස අපෙන් පළිගන්නේයයි කීවෝය. ඔව්හු යෝසෙප් වෙතට පණිවිඩයක් යවමින්: ඔබගේ පියා තමාගේ මරණයට පළමුවෙන් අපට අණකරමින්- නුඹලා යෝසෙප්ට මෙලෙස කියන්න; ඔබගේ සහෝදරයන්ගේ අපරාධයත් ඔබට නපුරුකම්කළ ඔවුන්ගේ පාපයත් කමාකළ මැනවි. දැනුදු*

*ඔබගේ පියාගේ දෙවියන්වහන්සේගේ මෙහෙකරුවන්ගේ වරද ක්ෂමාකරන ලෙස ඉල්ලමුයයි කීවෝය. ඔවුන් යෝසෙප්ට කථාකළ විට ඔහු හැඬුවේය." - (උත්පත්ති 50:17 සැඤී-ර්ධස-1995%)*

*"ඔහුගේ සහෝදරයෝ ගොස් ඔහු ඉදිරියෙහි වැටී: මෙන්න, අපි ඔබගේ මෙහෙකරුවෝයයි කීවෝය."*

*"යෝසෙප්: භයනොවෙන්න. මම දෙවියන්වහන්සේ වෙනුවට සිටිම්ද?නුඹලා වනාහි මට නපුර කරන්ට අදහස්කළහුය; එහෙත් බොහෝ සෙනග දිවි සහිතව රක්ෂාකරන පිණිස අද තිබෙන ප්‍රකාර ඉෂ්ටකිරීමට දෙවියන්වහන්සේ ඒක යහපතට අදහස්කළසේක. එබැවින් භය නොවන්න. මම නුඹලා සහ නුඹලාගේ දරුවන්ද පෝෂ්‍යකරන්නෙමියි කීවේය. මෙසේ ඔහු ඔවුන් සනසා කරුණාවෙන් ඔවුන්ට කථාකෙළේය." - (උත්පත්ති 50:15-21*

මෙය යෝසෙප්ගේ ජීවිතයෙන් වූ වදනකි. ඔබට යෝසෙප්ගේ කතා වස්තුව මතකද ? ලෝකය ඉදිරියෙහි ඔහුගේ පවුල කීකරුකමේ ආදර්ශය ලෙස දෙවියන් වහන්සේ තැබූ සේක. දෙවියන් වහන්සේ විසින් දෙන ලද සිහිනය ඔහුගේ පවුලේ සාමාජිකයන්ගේ ඉදිරියේ ඔහු බෙදා ගත්තේය. සිහිනය සම්බන්ධව යෝසෙප් සමග ප්‍රීතිවීමට වඩා ඔහුගේ ඊර්ෂ්‍යායා සහගත සහෝදරියෝ ඔහුව මරන්නට මාන බැලූහ. ඔහුව ඔවුන් විසින් වලකට හෙළනු ලැබු වේ ඔහු මැරේ යැයි සිතාය.

කෙසේ වෙතත් එම අවස්ථාවේ වහල් වෙළඳුන් එම ස්ථානය පසු කරන විට අවුරුදු දාහතක් වයසැති තමන්ගේ සහෝදරයාව ඔවුන්ට විකුණන ලදී. ශාන්ත පැට්‍රික්සේ යෝසෙප් විදෙස් රටක නව යොවුන් වියේ වහලෙක් වූයේය . ශාන්ත පැට්‍රික් මෙන් යෝසෙප්ගේ හඳුනා ගැනීම , යෝසෙප්ගේ අනන්‍යතාවයෙන් ඔහුගේ සිහිනය සහ ඔහුගේ දෙවියන් වහන්සේ ඔහුට සිහිවිය. මීළඟ වසර විස්ස තුල ඔවුන්ට සිදුවන අසාධාරණකම් තමා කවුදයි නිර්වචනය කිරීමට ඔහු ඉඩ දුන්නේ නැත . දෙවියන් වහන්සේ තුළ ඔහුගේ අනන්‍යතාවය තුළින් යෝසෙප් තම ජීවිතය ගත කිරීම බොහෝ ජීවිත බේරා ගැනීමට හේතු විය.

ඔබටත් ඔබ කුමන වැරදි විඳ තිබුණත් බොහෝ දෙනකු ක්‍රිස්තුස් වහන්සේ වෙත ගෙන යන ජීවිතයක් ගත කළ හැක . ජීවිතය යන වෙනත් කෙනෙකු ඔබට කළ දෙයක් නොවේ . එය දෙවියන් වහන්සේ ඔබ වෙනුවෙන් කළ ද යයි. එය එතරම් සරලයි.

## ඔබ කවුද?

ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙකු වූ විට ඔබේ මුළු අනන්‍යතාවයම වෙනස් විය. ඔබ වැදගත් කෙනෙක්. ඔබ කළ දෙයක් නිසා නොව යේසුස් වහන්සේ කවුද සහ උන්වහන්සේ ඔබ වෙනුවෙන් කළ දේ නිසා. බයිබලය ප්‍රකාශ කරන්නේ ඔබව මිලදීගෙන ඇත්තේ රිදී හෝ රත්තරන් වැනි දිරා යන දේවල් වලින් නොව යේසුස් වහන්සේගේ වටිනා රුධිරයෙන් බවයි. 2 කොරින්ති 5:17 හි පාවුල් තුමා ලියූ පරිදි ඔබ අලුත් මැවිල්ලකි . පැරණි දේ පහව ගියේය . අලුත් දේ පැමිණ තිබේ.

ගැලවීම යනු වෙනත් බොහෝ ආගම් තම අනුගාමිකයන් මත බලෙන් පටවන යහපත් ක්‍රියා නොවේ. එය රජුගේ පුතෙකු හෝ දියණියක ලෙස හදා වඩා ගැනීම ගැනය. මේ මොහොතේ උන්වහන්සේ ඔබට ආදරය කරනවාට වඩා උන්වහන්සේ ඔබට ආදරයේ කිරීමට ඔබට කළ හැකි කිසිවක් නැත.

යේසුස් වහන්සේ බෞතිස්ම වි , උන්වහන්සේ වතුරෙන් එළියට ආ කල්හි උන්වහන්සේගේ ස්වර්ගීක පියාණන් වහන්සේ මෙසේ කී සේක. " මේ මාගේ පුත්‍රයාය මම ඔහුට ප්‍රේම කරමි. මම ඔහු කෙරෙහි ඉතා සතුටු වෙමි. " මෙය සිදුවූයේ යේසුස් වහන්සේ කිසියම් ප්‍රාතිහාර්යයක් කිරීමට , කිසිදු දේශනාවක් දේශනා කිරීමට හෝ කිසිදු මානසීය ක්‍රියාවක් කිරීමට පෙරය.

*මේ මොහොතේ ඔහු ඔබට ආදරය කරනවාට වඩා ඔහු ඔබට ආදරය කිරීමට ඔබට කළ හැකි කිසිවක් නැත.*

උන්වහන්සේට ප්‍රේම කරනු ලැබුවේ , උන්වහන්සේට අයත් වූ නිසාය. ඔබත් එසේමය . ඔබ ඔබේ පැරණි ආත්මාර්ථකාමී මාර්ග වලට මියගොස් යේසුස් වහන්සේ කෙරෙහි ගැලවීමේ ඇදහිල්ලට හැරුණ අවස්ථාවේදී ඔබගේ ස්වර්ගීක පියාණන් වහන්සේ ඔබට නව අනන්‍යතාවයක් ලබාදෙන සේක. උන්වහන්සේ පවසන්නේ ඒ මගේ දරුවා. මම ඔබ ගැන ආඩම්බර වෙමි කියාය.

ඒ වගේම තවත් තිබෙනවා.  ඔබ රජතුමාගේ  දරුවෙක් විතරක් නොවෙයි. දේව වචනය කියන්නේ ඔබ....

තෝරාගත් කෙනෙක්. (එපීස 1:4)

සමාව දෙන සමාව ලැබූ කෙනෙක් (1 යොහාන් 2:12)

ඔබ අලංකාර අයෙක්. (ගීතාවලිය  45:11)

ඔබ සම්පූර්ණ අයෙක්. (කොලොස්සි 2:10)

ඔබ විශිෂ්ට කෘතියක්. (එපීස 2:10)

ඔබ ජයග්‍රාහිකයෙක්. ( 1 කොරින්ති 15:57)

ඔබ දෙවියන් වහන්සේගේ මාලිගාව. (1 කොරින්ති 3:16,17)

ඔබ ප්‍රේමණීය අයෙක්.  (යොහාන් 3:16)

ඔබ උන්වහන්සේගේය.  (යෙසායා 43:1)

අපට මෙම නව අනන්‍යතාවය ලබා දී ඇත්තේ යම් අරමුණක් සඳහාය. පේතෘස්ගේ අනන්‍යතාවය වෙනස් විය. යේසුස් වහන්සේ ඔහුට නව නමක් දුන් සේක. ඔහුගේ නම චමත්කාර ජනක ලෙස වෙනස් කරන ලදී. එය නිර්භීතව ප්‍රකාශ කළේය.

*නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධවූ ජාතියක්ද දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය." - 1 පේත්‍රුස් 2:9*

අපට අලුත් අනන්‍යතාවයක් තිබෙන බැවින් යේසුස් වහන්සේ ගැන ගොස් පැවසීමට හැකියාව ඇත.

## ඔබ ගොදුරක් නොවේ. ඔබ ජයග්‍රාහීකයෙක්.

සුභාරංචිය යෂ්ටිය රැගෙන යන අපට ඇති ලොකුම බාධකය වන්නේ දෙවියන් වහන්සේ කවුද යන්න තේරුම් ගැනීම නොව අප කවුද යන්නයි.

බොහෝ දෙනෙකු ක්‍රිස්තුස් වහන්සේ වෙතට ගෙන ඒමට දෙවියන් වහන්සේ භාවිතා කරන වේදිකාව පීඩා සහ අයුක්තිය විය හැකිය.

වසර ගණනාවක් පුරා අතීත ඛේදවාචකයන් නිසා දෙවියන් වහන්සේ දුන් ඉරණම ඉටුකර නොගත් කිතුණුවන් ගණනාවක් මම දැක ඇත්තෙමේ. මෙය ඔවුන් සභාවට යන  අතරතුර පවුලේ සාමාජිකයෙකු විසින් දරුවෙකු ලෙස සිදුවූ දෙයක් ඔවුන් හැදී වැඩුණු පරිසරය හෝ ඔවුන් ඉපදීමට සියවස් ගණනාවකට පෙර ඔවුන්ගේ පරම්පරාව තුළ සිදුවූ දෙයක් විය හැකිය. මෙම අතීත අසාධාරණය නිසා ඔවුන්ට ගොදුරු වූ මානසිකත්වයක් ඇත. සිදුවූ දේ නරක නොවන බව මම නොකියමි. නමුත් එය ඔබේ ජීවිතය සහ ඉරණම නිර්වචනය නොකිරීම වැදගත් බව මම කියමි.පැට්‍රික් සහ යෝසෙප් වැනි අය පීඩා සහ අසාධාරණකම් ක්‍රිස්තුස් වහන්සේ වෙතට බොහෝ මනුෂ්‍යයන් ගෙන එන පිණිස දෙවියන් වහන්සේ ඒවා වේදිකාවන් බවට පත් කරයි.

සාතන් සහ ඔහුගේ දූතයන් අතිකාල ආකාරයට වැඩ කිරීමක නිරත වෙමින්  කිතුණුවන්ගේ අනන්‍යතාවය සොරකම් කිරීමේ නපුරු වෙළෙඳාමක  යෙදී සිටි. දේව වචනය පවසන්නේ සාතන් සහෝදරයාගේ දොස් තබන්නා බවය. ඔබෙන් ඔබගේ අනන්‍යතාවය සොරකම් කිරීමට ඔහු උත්සාහ කිරීමට ප්‍රථමයෙන් දෙවියන් වහන්සේ වෙතින් ඔබගේ අනන්‍යතාවය සොරකම් කිරීමට ඔහු උත්සාහ කළේය. එළිදරව් පොත මෙම අනන්‍යතාවය සොරකම් කිරීමට උත්සාහ දැරීම සම්බන්ධයෙන් ඉතා සුළු වශයෙන් කතා කරයි.

*"එවිට: අපගේ දෙවියන්වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩුබලයද දැන් පැමුණුණේය. මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දාවල් අපේ සහෝදරයන්ට වරදතබන්නාවූ, ඔවුන්ගේ වරදතබන්නා පහත හෙළනු ලැබුවේය." - එළිදරව් 12:10*

දිවා රාත්‍රී දෙකෙහි සාතන් ඝනාත්මක දොස්තැබීම් ඇදහිලිවන්තයන් සම්බන්ධයෙන් දෙවියන් වහන්සේට කරයි . අවසානයේ දෙවියන් වහන්සේ ස්වර්ගයෙන් යක්ෂයා නෙරපා දැමූ සේක. දැන් යක්ෂයා අප වෙතට එයි. නොනවත්වා අපට දොස් නගමින් සහ අපේ අනන්‍යතාවය සොරකම් කිරීමට ඔහු උත්සාහ දරයි. ඔහු දන්නා කාරණයක් නම් අවසානයේදී ඔහු පරාජය වන බව හා ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇදහිලිවන්තයන් සදාකාලයටම ජයගන්නා බවය.

1 පේතෘස් 5:8 පේතෘස් සාතන් ගෙන මෙසේ කියයි. සාතන් ගොරවන සිංහයෙකු මෙන් කාව ගිල ගනිම්දෝ කියමින් ඔබ මොබ ඇවිදියි. හොඳට බලන්න ඔහු ගොරවන සිංහයෙකුය. ඒ ඔහුගේ මහා ගෙරවීමේ ශබ්දය ඔබ බිය ගැන්වීමට උත්සාහ කරයි. ඔහු ගොරවනවා විය හැක. ඔහුට දත් නැත. ඔහුට ඔබ ගැන කිසිවක් කළ නොහැකි අතර ඔහු උත්සහ කරන්නේ ඔබව මරණයට පත් කිරීමටයි. සාතන්ට ඇති එකම ආයුධය වන්නේ ඔහුගේ ශබ්දය පමණි. එය ඔහුගේ බොරුවයි. යේසුස් වහන්සේ කුරුසියේදී මරණයට පත්වුණු අවස්ථාවේ ඔහුට තිබුණු සියලු බලය ඔහුට නැති විය.

*"නුඹලාගේ වරදවලද මාංසයේ අචර්මඡේදයයෙහිද මැරී සිටියාවූ නුඹලා, උන්වහන්සේ සමඟ ජීවත්කරවූසේක. එසේය, උන්වහන්සේ අපේ සියලු වරද අපට කමාකළසේක; අපට විරුද්ධව, අපට එදිරිව තිබුණාවූ නියෝගවල ලියවිල්ල මකාදමා, ඒක කුරුසියෙහි ඇණගසා අහක්කළසේක. උන්වහන්සේ තමන් කෙරෙන් අධිපතීන්ද බලයලත්තන්ද පහකොට, ප්‍රසිද්ධයෙන් ඔවුන් දක්වා, කුරුසිය කරණකොටගෙන ඔවුන්ගෙන් ජයගත් බව ප්‍රකාශකළසේක." - කොලොස්සි 2:13 - 15*

යුරෝපයේ ජීවත් වන්නා වූ විදේශිකයෙක් පාපන්දු ක්‍රීඩා රාශියක් දැක තිබුණි. ක්‍රීඩකයෙක් ගෝලයක් වාර්තා කරන විට ඔහුගේ දැත් ඉදිරියට විහිදා දණහිස් වලින් ඔහු ඉදිරියට ලිස්සා යමින් ශබ්ද කරයි. පාපන්දු ක්‍රීඩාව මෙන් මෙම සරල උදාහරණය කුරුසේ සිදුවුණාවූ බොහෝ දේවල එක් කොටසකි. යේසුස් වහන්සේ දැත් දිගු කර විශාල ශබ්දයක් කළ සේක.

එම මොහොතේ උන්වහන්සේ මුළු ලෝකයම පාපය ගත්තා පමණක් නොව මුළු මිනිස් සංහතියටම නව අනන්‍යතාවයක් දුන් සේක. එමෙන්ම සතුරාගේ සියලු ආයුධ උන්වහන්සේ ගත් සේක. මේ යේසුස් වහන්සේගේ ජයග්‍රහණයේ තීරණාත්මක කොටස විය. සාතන් බල හීනයෙක් විය. දැන් ඔහුට කල හැකි එකම දේ නම් නිරන්තරයෙන් ඔබට චෝදනා කිරීමයි. එයින් ඔහු බලාපොරොත්තු වන්නේ ඔහුගේ බොරුවට ඔබ අසුවී ක්‍රිස්තුස් වහන්සේ තුළ තිබෙන අනන්‍යතාවය අත් හරි විය යැයි කියාය. ඔබේ අනන්‍යතාවය සොරකම් කිරීමට ඔහු ඔබ ළඟට පැමිණෙන විට ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔබ කවුද යන්න ශුද්ධවූ ලියවිල්ලේ ලියා ඇති පාඨ තුළින් ඒවා පෙරළා සටන් වදින්න. සතුරා ඔබගේ අතීතය මතක් කර දෙන විට ඔහුගේ අනාගතය ඔහුට මතක් කර දෙන්න. ඔහු නොව ඔබ සදාකාලික ජයග්‍රහණය පැත්තේ සිටින්නෙකි. රජ වූ යේසුස් වහන්සේ නැවත වඩින සේක.

අවදියෙන් සිටින්න . කඩිසර වන්න. ඔබගේ ජීවිතය හා අනන්‍යතාවය ගැන සතුරාගේ කූට උපායන් සම්බන්ධව පරීක්ෂාකාරී වන්න. පාවුල් කොරින්තිවරුන්ට මෙසේ කියයි. ඔබට විරුද්ධව කරන ඕනෑම වරදකට සමාව දෙන්න. සාතන් අපව අභිබවා නොයන පිණිස. මන්ද අපි ඔහුගේ උපක්‍රම ගැන නොදනිමු.

# බොහෝ දේ සුරකීම හෝ බොහෝ දේ අපවිත්‍ර කිරීම, එය ඔබගේ තෝරා ගැනීමයි

1860 ගණන්වල ඇමරිකා එක්සත් ජනපදයේ සිවිල් යුද්ධයෙන් ටික කලකට පසු ජමන්ෆෙඩෙරටෙ කන්ෆඩරේට් ජනපද හමුදාවේ අණ දෙන නිලධාරී රොබට් ඊ. ලී. හෙන්ටකීහී කාන්තාවක් බැලීමට ගියේය. කලකිරීමෙන් එම කාන්තාව තම නිවස අසල කැඩුණු ගසක් ගැන විලාප තැබුවාය. යුද්ධයට පෙර එය

ලස්සන මැක්ඩෝලියාවක් විය. නමුත් යූනියන් හමුදාව එයට වෙඩි තබා එහි අලංකාරය නැති කළේය. නිසරු ගස දෙස බලා ඇය ලී ගෙන් " ඒ ගැන ඔබ සිතන්නේ කුමක්ද " කියා ඇසුවාය.

රොබට් ඊ ලී ඇය දෙස බලා සරලව පැවසුවේ " කපා දමා අමතක කර දමන්න. " යනුවෙනි .

ඔබට අතීතයේ සිදුවූ දෙයක් සමග ඔබ අරගල කරනවාද ? එසේ නම් ධෛර්යය එකතුකර එය ඔබේ හදවතින් කපා දැමීමට මම නිර්දේශ කරමි. එය අත්හරින්න. අතීත අසාධාරණයකින් මිදීමට මට සිතිය හැකි හොඳම උපදෙස මෙයයි. එවිට එය ඔබව නිර්වචනය නොකරනු ඇත. හෝ ඔබගේ හදවතේ තිත්තකම රඳවා නොගනියි. ඒ ඉක්මවා නොබලන්න. එය ඔබගේ හදවතින් සම්පූර්ණයෙන්ම කපා දමන්න.

*"කිසිවෙක් දෙවියන්වහන්සේගේ කරුණාවෙන් පසුබට නොවන පිණිසද, තිත්තකමේ මුලක් හටගෙන එයින් නුඹලා කලඹා බොහෝ දෙනෙක් කිලුටු නොවන පිණිසද," - හෙබ්‍රෙව් 12:15*

ඕනෑම පසුකාලීන දේවල් මුලින් උපුටා දැමීමට සහ අපගේ අනන්‍යතාවය හොඳ නවකයෙකු වීමට අපට අණ කර ඇත. " එය බලන්න" යන වාක්‍ය කණ්ඩය පැමිණෙන්නේ, episkopos යන ග්‍රීක වචනයෙනි. මෙය epi සහ skopos යන ග්‍රීක වචන දෙකේ එකතුවකි. Epi යන්නෙහි තේරුම ඉහළට වන අතර skopos හි තේරුම බැලීම යන්නයි. episkopos 1 තිමති 3:1 හී බිසොප් යන වචනය සඳහා භාවිතා කරන වචනයයි.

හේබ්‍රිව් භාෂාව අපට පවසන්නේ අපගේ හදවත් වල බිෂෝබ්වරුන්, අපේක්ෂකයන් සහ අප කවුද යන්න නිර්වචනය කිරීමට අතීතයේ සිට ඇති වූ සෘණාත්මක තත්ත්වයන්ට ඉඩ නොදෙන ලෙසයි. මෙය අත්‍යවශ්‍ය වන්නේ නොමඟ ගිය අනන්‍යතාවයට අපෙන් ඔබ්බට පවා බොහෝ මිනිසුන් අපවිත්‍ර කිරීමට හැකියාව ඇති බැවිනි. නමුත් දෙවියන් වහන්සේ අපව දකින ආකාරයට අපි අපව දකින විට, උන්වහන්සේ යෝසෙප් සහ ශාන්ත පැට්‍රික් කලාක් මෙන් අප හරහා අන් අයව ගලවා ගනිමින් උන්වහන්සේ ක්‍රියා කරන ආකාරය අපට දැකගත හැකිය.

# දෙවියන් වහන්සේ දකිනවා වගේ කතා කරන්න

රජුගේ දියණියකගේ, පුතෙකුගේ අනන්‍යතාවය හඳුනා ගැනීමට ඔබට අපහසු නම් ඔබ ඇදහිලිවන්තයෙකු ලෙස කවුදැයි ප්‍රකාශ කිරීම ආරම්භ කරන ලෙස මම ඔබව දිරිමත් කරමි. ඔබට ඉහත පද භාවිතා කළ හැකිය. නැතහොත් අන්තර්ජාලයේ සරල බයිබල් පද සෙවීමක් සමග තවත් දුසිම් ගණනනක් සොයා ගත හැකිය.

මගේම ජීවිතේ මම ක්‍රිස්තුස් වහන්සේ තුළ කවුද යන්න හැර වෙනත් දේවල් වලින් මගේ අනන්‍යතාවය සොයා ගැනීමට පටන් ගත් අවස්ථා තිබේ. නැවත අවධානය යොමු කිරීමට මගේ උපාය මාර්ගයක් වන්නේ ශුද්ධ ලියවිලි පද, ඇලෙන සුළු සටහන් (sticky notes) ලියා මගේ නිවස, මෝටර් රථය සහ කාර්යාලය පුරා දෘශ්‍යමාන ස්ථානවල තැබීමයි. මම මෙම පද නාන කාමරයේ, මගේ කණ්නාඩිය මත, ශීතකරණයේ දොරේ, මෝටර් රථයේ සුබානම් රෝදය සහ මගේ කාර්යාල මේසේ තැබූවෙමි. ඔබ ඔබේ ජීවිතය පුරා දිනපතා මෙම පද ප්‍රකාශ කරන විට ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔබේ අනන්‍යතාවය ශක්තිමත් වන අතර අන් අයට සුභාරංචිය ඇසීමට ඇති ඔබේ ආශාව වර්ධනය වනු ඇත. ඇදහිලිවන්තයන් සියවස් ගණනාවක් පුරා මෙය කරමින් සිටි.

පැට්‍රික් තමාට වඩා ජීවිතය කතා කළේය. ඔහු දෙවියන් වහන්සේගේ මාලිගාව බව ඔහු දැන සිටියේය. සෑම දිනකම ඔහු තමා කෙරෙහි දෙවියන් වහන්සේගේ වචනය ප්‍රකාශ කරමින් නැගිටිනු ඇත.

ශාන්ත පැට්‍රික් ගේ යාච්ඤාව:

*"... අද නැගිටින්න*

*දෙවියන් වහන්සේගේ ශක්තියෙන් මාව මෙහෙයවන්න*

*මාව ආරක්ෂා කිරීමට දෙවියන් වහන්සේගේ බලය*

මාව මග පෙන්වීමට දෙවියන් වහන්සේගේ ප්‍රඥාව

මාගේ ඉදිරියෙහි බැලීමට දෙවියන් වහන්සේගේ ඇස

මට සවන්දීමට දෙවියන් වහන්සේගේ කන

මා වෙනුවෙන් කතා කිරීමට දෙවියන් වහන්සේගේ වචනය

මා ආරක්ෂා කිරීමට දෙවියන් වහන්සේගේ හස්තය

දෙවියන් වහන්සේ මා ඉදිරියේ පෙන්වන මාවත

මා ආරක්ෂා කිරීමට දෙවියන් වහන්සේගේ පලිහ

මාව බේරා ගැනීමට දෙවියන් වහන්සේගේ සේනාවන්

යක්ෂයාගේ උගුල්වලින්

දුෂ්චරිතවල පෙළඹවීමෙන්

මට නරකක් ප්‍රාර්ථනා කරන සියල්ලන්ගෙන්,

දුර සහ ආසන්න,

තනිව හෝ සමූහයක් තුල

මා සහ නපුරා අතර මේ සියලු බලයන් අද මම කැඳවමි

මගේ ශරීරයට විරුද්ධ වන සෑම කුරිරු අනුකම්පා විරහිත බලයකටම එරෙහිව සහ බොරු අනාගත වක්තෘවරුන්ගේ මන්ත්‍රණ වලට එරෙහිව

මිථ්‍යා දෘෂ්ටික කළු නීතිවලට එරෙහිව

මිථ්‍යා දෘෂ්ටිකයන්ගේ ව්‍යාජ නීතිවලට එරෙහිව

රූප වන්දනාවේ ශිල්පයට එරෙහිව

කාන්තාවන්ගෙන් සහ මායාකරුවන්ගේ මන්ත්‍රවලට එරෙහිව

මිනිසාගේ ශරීරය හා ආත්මය දූෂණය කරන සෑම දැනුමකටම එරෙහිව

අද ක්‍රිස්තුස් වහන්සේ මාව ආරක්ෂා කරයි

වස විසට එරෙහිව

පිළිසීමට එරෙහිව

දියේ ගිලීමට එරෙහිව

තුවාල වීමට එරෙහිව ඒ විපාකය මට බහුල ලෙස ලැබෙනු ඇත.

මා සමග ක්‍රිස්තුස් වහන්සේ,

මා ඉදිරියෙහි ක්‍රිස්තුස් වහන්සේ,

මා පිටුපස ක්‍රිස්තුස් වහන්සේ,

මා තුළ ක්‍රිස්තුස් වහන්සේ,

මට පහළින් ක්‍රිස්තුස් වහන්සේ,

මට ඉහළින් ක්‍රිස්තුස් වහන්සේ,

මගේ දකුණු පසින් ක්‍රිස්තුස් වහන්සේ,

මාගේ වම් පසින් ක්‍රිස්තුස් වහන්සේ

*මම නිදා සිටින විට ක්‍රිස්තුස් වහන්සේ,*

*මම වාඩිවන විට ක්‍රිස්තුස් වහන්සේ,*

*මා ගැන සිතන සෑම මිනිසෙකුගේම හදවතේ ක්‍රිස්තුස් වහන්සේ,*

*මා ගැන කතා කරන සෑම මිනිසෙකුගේම මුවින් ක්‍රිස්තුස් වහන්සේ,*

*මාව දකින ඇසේ ක්‍රිස්තුස් වහන්සේ, මාව සවන් දෙන කනට ක්‍රිස්තුස් වහන්සේ,*

*මම අද නැගිටිනවා....*

එවැනි ප්‍රකාශයක් සමඟ ඔහුට දිනපතා දෙවියන් වහන්සේගේ වචනයේ ජීවය ඔබ කෙරෙහි ශුභාරංචිය බෙදාගන්නේ කෙසේදැයි ඔබ පුදුමයට පත්වනු ඇත. ඔබ යන සෑම තැනකම නිර්භීතකමක් තිබීම පුදුමයක් නොවේ. ඔහුව වහල් භාවයට පත් කළ මිනිසුන් සමගම යේසුස් වහන්සේගේ ශුභාරංචිය නිර්භීතව බෙදා ගැනීමට එය ඔබව පරිවර්තනය කරන බව ප්‍රකාශ කරන්න.

# ජය ගොස!

බොහෝ විට ඔබට ඇසෙන්නේ මිනිසුන් ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස ඔවුන්ගේ ජීවිත කොතරම් විශිෂ්ටද යන්න ගැන කතා කිරීමයි. ඔබ ඇදහිලිවන්තයෙකු වූ පසු ඔබට නරකත් කිසිම අවස්ථාවක සිදුවිය නොහැකි බව ඔවුන් ඇඟවුම් කරන බව පෙනේ. අවාසනාවකට මෙන් එය සත්‍ය නොවේ. නමුත් ඔබට සහතික විය හැකි දෙයක් නම් දෙවියන් වහන්සේ සියල්ල යහපත සඳහා එකට ක්‍රියා කරන බවයි.

මගේ අදහස හරියටම සනාථ කිරීමට මෙන් කිසිම වරදක් නොකළ නිසා යේසුස් වහන්සේ අත්අඩංගුවට ගෙන කුරුසියේ ඇණ ගසනු ලැබීමට ටික කලකට පෙර උන්වහන්සේ තම ගෝලයන්ට මෙසේ පැවසූ සේක. "මා තුළ නුඹලාට සමාදානය තිබෙන පිණිස මේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නුමුත් ධෛර්යවත්වෙන්න; මම ලෝකයෙන් ජයගතිමියි කීසේක." - (යොහන් 16:33)

දෙවන ලෝක යුද්ධ සමයේදී රුමේනියානු යුදෙව් ඇදහිලිවන්තයෙකු වූ රිචඩ් වර්ම්බ්‍රැන්ඩ් ජර්මානු ආක්‍රමිකයන් සමඟ සුභාරංචිය බෙදා ගැනීමට අවස්ථාවක් දුටුවේය. මෙය කිරීමෙන් ඔහු තම ජීවිතය හා නිදහස අවදානමට ලක් කරන බව වර්ම්බ්‍රැන්ඩ් දැන සිටියේ. නමුත් එය ඔහුව නතර කළේ නැත. ඔහුගේ සැබෑ අනන්‍යතාවය අනන්‍යතාවය ඔහුගේ ජාතිය හෝ ඔහු ජීවත් වූ කාලය තුළ කාලය තුළ නොව ඔහු කාගේද යන්න බව ඔහු දැන සිටියේය. තවද ඔවුහුව බේරා ගත් රජු ගැන හැකි තරම් පිරිසකට පැවසීම ඔහුගේ ආශාව විය. වර්ම්බ්‍රැන්ඩ් බෝම්බ කුඩාරම් වලදී සහ යුදෙව් දරුවන් ගෙතෝ වලින් බේරා ගැනීමේදී ශුභාරංචිය බෙදා ගත්තේය. ඔහුව නැවත නැවතත් අත් අඩංගුවට ගෙන පහර දෙන ලදී. වරක් මරණයට පත් කිරීමට ආසන්න විය.

යුද්ධය අවසන් වූ විට රුමේනියාව කොමියුනිස්ට් වාදයට පක්ෂපාතී වන බවට ප්‍රතිඥා දුන්නේය. එය 1945 සිට 1947 අතර කාලයේදී ඔහු ශුභාරංචිය ප්‍රකාශ කිරීම නතර කළේ නැත. රිචඩ් රුසියානු හමුදාවන්ට ශුභාරංචිය පොත් මිලියන එකට වඩා ලබා දුන්නේය. ඔහු රුසියාවට බයිබලය හොර රහසේ ගෙනදියේය. ඔහුව අත්අඩංගුවට ගෙන පහරදී සිතාගත නොහැකි දුෂ්කරතාවන්ට ඔහු මුහුණ දුන්නේය. නමුත් රිචඩ්ට ශුභාරංචිය දේශනා කිරීමට සිදුවිය. ඔහු කිසිවිටකත් තම දුෂ්කරතා තමාව නිර්වචනය කිරීමට ඉඩ දුන්නේ නැත.

ඒ වෙනුවට යේසුස් වහන්සේ අණ කළ පරිදි ඔහු තම ප්‍රීතිය ලෙසට එය තබා ගත්තේය . ජීවිතයේ පසුකාලීනව රිචඩ් තත්ත්වය ගැන සිනාසෙමින් අනෙක් සිරකරුවන්ට දේශනා කිරීම සපුරා තහනම් විය. ඔහු පැවසීය, "න්මෙම කාර්යය නිරත වී සිටින අවස්ථාවේදී ඔවුන්ව අල්ලා ගනු ලැබුවාද ඔවුන් දරුණු පහරදීමකට ලක්වූවා. අපෙන් බොහෝ දෙනෙකුට දේශනා කිරීමේ වරප්‍රසාදය සඳහා මිල ගෙවීමට තීරණය කළ නිසා අපි ඔවුන්ගේ (කොමියුනිස්ට්වාදීන්ගේ) කොන්දේසි පිළිගත්තා". එය ගනුදෙනුවක් අපි දේශනා කළෙමු ඔවුන් අපට පහර දුන්නා .අපි සතුටින් දේශනා කළා . එයාලා අපිට පහර දීලා සතුටු උනා. ඒ නිසා හැමෝම සතුටු වුණා.

තම ඇදහිල්ල නිසා මරා දැමූ අසංඛ්‍යාත මිලියන සංඛ්‍යාත ඇදහිලිවන්තයන් හෝ ඔවුන්ට කරන ලද බොහෝ වැරදිම නොතකා ශුභාරංචිය බෙදා ගන්නා අය දැනුවත් කිරීම සඳහා කැපවූ සංවිධානයක් වන වොර්ම් බ්‍රන්ඩ් Voice of Martyrs නිර්මාණය කිරීමට ඉදිරියට ගියේය.

*අපට කුමක් සිදු වුවද, අපට ප්‍රීති වීමට හේතුවක් තිබේ.*

ඇත්ත වශයෙන්ම පසුගිය වසර දෙදහස තුළ නොදන්නා මිලියන සංඛ්‍යාත ඇදහිලිවන්තයන් යේසුස් වහන්සේගේ ශුභාරංචිය දැඩි ලෙස බෙදා ගත් නිසා සිරගත කර වද හිංසා පමණවා ඇති අතර ප්‍රාණ පරිත්‍යාග කර ඇත. එළිදරව් පොත පවසන පරිදි ඔවුන් මරණය දක්වා පවා තම ජීවිතවලට ප්‍රේම කළේ නැත. අපි ඔවුන්ගේ නම් නොදන්නවා විය හැකි නමුත් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඔවුන් කවුදැයි ඔවුන් දැන සිටියහ.

එහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් ශුභාරංචිය බෙදා ගත් අතර සියවස් ගණනාවක් පුරා ලොව පුරා එහි ජනප්‍රියතාවය අඛණ්ඩව වැඩි විය.

අපට කුමක් සිදුවුවද අපට ප්‍රීති වීමට හේතුවක් තිබේ. අපගේ අනන්‍යතාවය අපගේ පරීක්ෂාවන් තුළින් සොයා ගත නොහැකි අතර අපගේ නම් ස්වර්ගයේ ලියා ඇති බව සොයාගත හැකිය. අපට අවසාන ජයග්‍රහණය ඇත.

# 7

# 500 ගණන් වල - මවනු ලැබුවේ මැවීම උදෙසාය

*නමුත් ... මම නිර්මාණශීලී නොවෙමි*

*"පව්කාරයන් ශාපලත් අය නම් අඩුම තරමින් ඔවුන් අපගේ මළ සිරුරු මතින් තිරයට පැනීමට ඉඩ දිය යුතුය. ඔවුන් විනාශ වුවහොත් අපගේ දෑත් ඔවුන්ගේ දණහිස් වටා ඔතාගෙන ඔවුන් විනාශ වීමට ඉඩ දිය යුතුය. " - චාල්ස් එච් පර්ජන්*

ශුභාරංචිය යෂ්ඨිය හයවන සියවසේ ඇදහිලිවන්තයන්ට ලබා දුන් අතර මිනිස් වර්ගයා මුළු ලෝකයටම මාරාන්තික ලෙස බලපාන නොපෙනෙන සතුරෙකුට මුහුණ දීමට ආසන්නව සිටියේය. ශුභාරංචියේ දියුණුව සඳහා සියවස ඉක්මන් ආරම්භයක් ලබා ගත්තේය.

ක්‍රි.ව 510 දී ෂෙල්ටික් මිෂනාරි ව්‍යාපාරය අයර්ලන්තයේ ආරම්භ වූයේ ප්‍රවලිත ඇදහිලිවන්තයන් තම මව්බිමේ හුරු පුරුදුකම අතහැර මධ්‍යම යුරෝපය පුරා ළඟා නොවූ ගම්මාන වෙතට ශුභාරංචිය ගෙන යාමත් සමගය. මෙම ව්‍යාපාරය ඉදිරි වසර 400 ක් පුරා පවතිනු ඇත.

නුමුත් ක්‍රි.ව 541 ලෝකය ඔරොත්තු දීමේ පරීක්ෂණයකට මුහුණ දුන්නේය. සසානියානු අධිරාජයේ, නූතන තුර්කියේ සහ සවුදි අරාබියේ දහස් ගණනක් ජනයා හදිසියේම උණ, වමනය සහ ඉදිමුණු වසා ගැති වලින් රෝගාතුර වූහ. මරණය ආසන්න විය. පළමු බොගෝනෙක් වසංගතේ එනම් (කළු මරණය) ආරම්භ වී තිබුණි. ක්‍රි.ව 542 වසන්තය වන විට ආසාදිත මැක්කන්ගේ දෂ්ට කිරීම් නිසා ඇති වූ මෙම බෝවනරෝගය කොන්ස්තන්තිනෝපල් අගනගර, වරාය නගරයට පැමිණියේය.

එතැන් සිට වසංගතය මධ්‍යදරණී මුහුද පුරා වරායෙන් වරායට අවසානයේ ලොව පුරා පැතිර ගියේය.ඊළඟ වසර පනහ තුළ මිලියන 25කට වැඩි පිරිසක් වසංගතයෙන් මියගිය අතර හත්වන සියවසේදී තවත් මිලියන 25ක් මියගියහ. ඒ වනවිට ලෝක ජනගහනයෙන් හතරෙන් එකක් පමණ අතුරුදහන් වී තිබුණි.

වසංගතේ හදිසි පැතිරීමේ ඛේදවාචකය විශේෂයෙන් යුරෝපය සහ මැදපෙරදිග පුරා සිදුවිය. අධිරාජයන් බිඳවැටුණි. ආර්ථිකයන් කඩා වැටුණි. හමුදා බලයන් සහ දේශපාලනය අඩපණ විය. එසේම මිලියන ගණන් රැකියාවක්ද අහිමි විය. සංවිධානාත්මක ක්‍රිස්තියානි ද බලපෑමට ලක්විය. දේවස්ථානවල දොරවල් වැසී ගියේය. එක්සත් නමස්කාරයද නිහඬ විය. යේසුස් වහන්සේගේ ශුභාරංචියද අවසානය බව පෙනී ගියේය.

කෙසේ වෙතත් විශාල පාඩු මධ්‍යයේ වුවද සෑම කෙනෙකුම නිහඬව නොසිටිනු ඇත. උතුරු අප්‍රිකාවේ බල්බර්වරුන්වන එම කෙල්ටික් මිෂනාරිවරුන් හා දැඩි ලෙස පීඩාවට පත් නැගෙනහිර ඇදහිලිවන්තයන් නම් නොකළ ඔවුන්ගේ පරම්පරාවේදී ස්ජිභාරංචියේ යෂ්ඨිය නොවැටෙන පිණිස ඔවුන් මතට එය අරගන්නා ලදී. මෙම කණ්ඩායම් නම් කළ නොහැකි මුහුණට මුහුණලා ආගමික නායකයින්ගේ කාර්යයන් පමණක්ම නොව යේසුස් වහන්සේගේ අනුගාමිකයකු යැයි කියාගත් සෑම කෙනෙකුටම කැඳවීමක් ඇති බව ඔවුන් දුටුවෝය. මරණයේ යථාර්ථය ඉතා සැබෑ වුවද ඔවුන් නිශ්චලව සිටීම ප්‍රතික්ෂේප කළහ. ඉන්පසු ලෝකයට ශුභාරංචිය අවශ්‍ය විය. යේසුස් වහන්සේගේ මෙම සාමාන්‍ය අනුගාමිකයන් ග්‍රීක හෝ ලතින් භාෂාවල්වල දුරාවලියන්ට අයත් නොවූහ. ඔවුන් යේසුස් වහන්සේගේ ශුභාරංචිය ලෝකයට ගෙන ගියහ.

> *ශුභාරංචිය ප්‍රවර්ධනය කිරීම ආගමික නායකයින්ගේ කාර්යයක් පමණක් නොව, යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු යැයි කියාගත් සෑම කෙනෙකුටම කළ යුතු කැඳවීමක් ලෙස සැලකුහ.*

ප්‍රසිද්ධ රැස්වීම් නොමැතිකම නිසා මෙම ඇදහිලිවන්තයන් පැමිණියේ අන්තර් නිර්මාණාත්මක ක්‍රම තිබූ කාලයකය. ඔවුන් ඒ නිර්මාණාත්මක උපායමාර්ගයක් ලෙස භාර ගෙන සංස්කෘතිය ඉගෙන

ගැනීමට නිර්භීත අවස්ථාවක් කර ගත්හ. ශුභාරංචිය බෙදා ගැනීමේ මහත් වීපික ගමන් මිල අධික හා දුෂ්කර වූ නිසා ඔවුන් සංචාරය කළ නගරවල භාෂාව සහ සංස්කෘතිය ඔවුන් ඉගෙන ගත්ත. ඔවුන් තම ක්‍රම අනුවර්තනය කර සහ නව ක්‍රම උපදවාගෙන සෑම නගරයකම සිටියාවූ සෙනඟ වෙතට ළඟාවීමට එය මාර්ගයක් කරගත්තේය. ඔවුන්ගේ නිර්මාණශීලී භාවය තුළින් ශුභාරංචිය පණිවිඩය අද්විතීය ලෙස සාර්ථකව ශුභාරංචිය වේගයෙන් ඉදිරියට ගියේය .

සියවස් ගණනාවක් පුරා ශුභාරංචි ඉදිරියට ගෙනයාමේදී නිර්මාණශීලීත්වය බලවත් ආයුධයක් විය.

## නිර්මාණය කිරීමට නිර්මාණය කරන ලදී

කවුරු හෝ ඔබට කියා තිබෙනවාද ඔබ නිර්මාණශීලී නැත කියා. හොඳයි මම එම චෝදනාව බොරුවක් යැයි ප්‍රකාශ කරමි. ඔබ නිර්මාණශීලී. බයිබලයේ පළමු වාක්‍යයෙන්ම දෙවියන් වහන්සේගේ අපේ පුදුමාකාර ගුණාංගය ගැන පැහැදිලි චිත්‍රයක් අපට ලබාදේ. පටන් ගැන්මේදී දෙවියන් වහන්සේ අහසත් පොළොවත් මැවූ සේක. දෙවියන් වහන්සේ මැවුම්කරුවාණන් වහන්සේය. විශිෂ්ට නිර්මාණශීලීත්වයක් ඇති දෙවිකෙනෙක්ය.

පෙන්සකෝලා හී, බ්‍රවුන්ස්විල් පිබිදීමේදී නමස්කාර නායක ලින්ඩෙල් කූලි මැවීමේ කැඳවීම ගායනා කළ රාත්‍රීන් මට අනන්තවත් මතකය.

*" දෙවි කෙනෙක් නැතැයි මා පවසන්නේ කෙසේද*

*මැවිල්ල වටා ඇති සියල්ල*

*ගායනා කරන කුරුල්ලෙකු, බලවත් ගසක්ද*

*විවෘත මුහුදේ විශාලත්වයද*

*සාගර වෙරළේ සිටගෙන සිටින ගිගුරුම් දෙන රළ*

*ගර්ජනා දැනීමට මට කැමතියි*

*නිමක් නැති නිල් සිතිජයේ රාමුවට යට*

*රන්වන් දාන්නේ කෙත් හරහා ඇවිදීමට*

*මම විශ්වාස කරමි, මම විශ්වාස කරමි, මම විශ්වාස කරමි"*

දෙවියන් වහන්සේගේ විශ්මිත නිර්මාණශීලීතය අපට තේරුම් ගත නොහැකි තරම්ය. පෘථිවියේ ජීවය පවත්වා ගැනීම සඳහා උන්වහන්සේට නීරස පරිසරයක් නිර්මාණය කළ හැකිව තිබුණි. ඒ වෙනුවට උන්වහන්සේ තේජාන්විත කඳු , මුහුදු, ජීවීන්ගෙන් ගිලිහී යන , සාගර නිවර්තන ශාක හා දර්ශනීය සතුන්ගෙන් පිරී ඇති වැසි වනාන්තර සහ උන්වහන්සේගේ ලෝකයට වියනක් වීමට ඉහලින් එල්ලෙන මන්දාකිණි නිර්මාණය කළ සේක.

උත්පත්ති පොතේ පළවෙනි පරිච්ඡේදයේ පද විසි හයකට පසුව දෙවියන් වහන්සේගේ කතාව උන්වහන්සේ එය කෙසේ කළ සේක් දැයි මෙසේ පවසන සේක.

*"තවද දෙවියන්වහන්සේ: අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා සාදම්හ; ඔව්හු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහිද ආකාශයෙහි පක්ෂීන් කෙරෙහිද තිරිසනුන් කෙරෙහිද මුළු පොළොව කෙරෙහිද පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහිද ආණ්ඩුකෙරෙත්වයි කීසේක. දෙවියන්වහන්සේ තමන් ස්වරූපයෙන් මනුෂ්‍යයා මැවූසේක, දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක; පුරුෂයාද ස්ත්‍රියද කොට ඔවුන් මැවූසේක." උත්පත්ති 1:26- 27*

ඉතින් ඔබ නිර්මාණශීලී වීමත් සමඟ එයට ඇති සම්බන්ධය කුමක්ද? මම ඔබට එය මතක් කර දෙමි. අපව දෙවියන් වහන්සේගේ ස්වරූපයෙන් මවා ඇත. නිර්මාණශීලී නිර්මාණකරුවෙකු විසින් නිර්මාණය කරන ලදී. ඔබේ සහ මගේ ජාන DNA කොටසකට නිර්මාණශීලීත්වය ඇතුලත් වේ. සරලව කිවහොත් අපව නිර්මාණය කිරීමට නිර්මාණය කරන ලදී. එම නියෝගය සමඟ ඉවැන්ජලිස්ත සේවයේ මාතෘකාව සමග සම්බන්ධ වී උන්වහන්සේ තම රාජ්‍යයේ දියුණුව සඳහා අද්විතීය නිර්මාණාත්මක සිතුවිලි අපට ලබා දී ඇත. නිර්මාණශීලීත්වය යනු ඉවැන්ජලිස්ත සේවයේ ශ්‍රේෂ්ඨතම මෙවලම්වලින් එකක්ය.

# හඬක් වෙන්න

2016 වර්ශයේ ටන්ජා සහ මා දෙවියන් වහන්සේගේ කැඳවීමට පිළිතුරු දෙමින් යුරෝපයේ මිෂනාරී ඉවැන්ජලිස්ත හැටියට, ස්විට්සර්ලන්තයට ගියෙමු. අපගේ නියෝගය වූයේ සභාවන් අතරට ඒකත්වය ගෙන ඒමත්, ඇල්මැරුණු ඇදහිලිවන්තයන් යේසුස් වහන්සේ වෙතට හැරවීමත්, ශුභාරංචියේ පණිවිඩය තුළින් නැති වූවන්ට බලාපොරොත්තුවත්, ඇතිව යුරෝපය දල්වමු නමින් සේවයකට අපි ගියෙමුව.

සූරිච් හී අපේ නව නිවසෙහි අපි පදිංචි වූ පසු දූතන සේවයේ යෙදීමට ඉතාමත්ම වුවමනාවක් තිබුන නුමුත් කුමක්ද කරන්නේ, කොහෙන්ද ආරම්භ කරන්නේ ඇයි මට ස්ථිරත්වයක් නොවීය. මා හොඳින් දන්නා වූ ඉවැන්ජලිස්ටවරයෙකු ටෙක්සාස්හී ඩලාස් වීඩි වල යේසුස් වහන්සේ ගැන ප්‍රකාශ කරන්නාවූ වීඩියෝවක් සමාජ මාධ්‍යයෙන් මම නැරඹුවෙමි. මා සිතුවේ එය මට වැඩ කරාවි කියා. මක්නිසාද එය ඔහුට ක්‍රියාකාරී වූ නිසා. ඉන්පසු යේසුස් වහන්සේ ලූක් 14:23 සඳහන් කළේ; "එවිට ස්වාමියා දාසයාට කථාකොට: නුඹ මහමාවත්වලටද වැටවල් දිගටද ගොස්, මාගේ ගෙය පිරෙන පිණිස මනුෂ්‍යයන්ට එන්ට බලකරන්නැයි කීවේය."

මා නගර මධ්‍යයට ගියේ, ඉතාමත්ම ආශාවෙන් ගියේ නැති වුවත් යේසුස් වහන්සේ වෙතට පැමිණේ යැයි සිතාගෙනය. ප්‍රධාන දුම්රිය ස්ථානයට මා ගිය අතර මගේ පළමු එල්ලය මා දුටිමි සහ ඒ කෙරෙහි මා ළඟා වීමි. ඔහු දුම්රිය වේදිකාවේ සිටගෙන සිටි අතර දුම්රිය පැමිණෙන තෙක් ඔහු නිශ්චලව බලා සිටියේය. එය ඒමට ප්‍රථම මට මිනිත්තු හතක් තිබුණි. එම නිසා මට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට බොහෝ කාලය විය. මා ඔහුගේ පිටුපසට ගමන් කොට ගමන් කොට සාකච්ඡාවකට මම හැඩ ගැසුනි. මෙම මහත්මයා අවුරුදු හතළිහක් පමණ වයස ඇති ඉතා අලංකාර ඇඳුමක් ඇඳ ව්‍යාපාරිකයෙක්ගේ පෙනුම ඇතුව සිටියේය.

" ඔබ ඉංග්‍රීසි කතා කරනවා කරනවාද " මම ඇසීය.

" ඔව් මං ඉංග්‍රීසි කතා කරමි"

"බොහොම හොඳයි. මා එම ස්ථානයේ සිටගෙන සිටින විට දෙවියන් වහන්සේ මගේ හදවතට ඔබව දැමූවා. මා ඔබට කියන්නට කැමතියි ඒත් වහන්සේ ඔබට ප්‍රේම කරනවා. ඔබ කවදා හෝ ශුභාරංචිය අසා තිබෙනවාද?"

ඔහු ආරම්භ කරමින් මා වෙත හැරී පුදුමාකාර බැල්මකින් බැලුවේය.

" මහත්මයාණනි" මා නැවතත් කීවෙමි. " යේසුස් වහන්සේ කුරුසියේදී ඔබගේ පාපය උදෙසා මළ සේක.උන්වහන්සේ ඔබට බොහෝ ප්‍රේම කරන සේක."

ප්‍රෙහෙළිකාවට පත් වූ එම මනුෂ්‍යයා මගේ ඇස් දෙක දෙස සෘජුවම බැලුවේය. " පුත්‍රය මොකක්ද ඔබට වෙලා තිබෙන්නේ?"

නැත, මා මා ගැන එසේ සිතුවේය.

මේ පුද්ගලයා මා වෙතින් යම් ප්‍රමාණයක් ඈතට ගොස් ඔහුගේ අවධානය වෙනතකට යොමු කළේය.

දැන් කුමක්ද, මගෙන්ම අසමින් මා ගැන ලැජ්ජාවෙන් එම ස්ථානයේ සිටගෙන සිටියේය. ඊළඟ මිනිත්තු හත දුම්රිය එන තෙක් එතන නැවතී සිටියෙමි.

මා කෙලින්ම ගෙදරට ගොස් තන්ජාට කීවේ අපි නැවතත් ඇමරිකාවට යනවා අපගේ ගමන් මලු සූදානම් කරගන්න කියා. විශ්වාස කරන්න, ඔබ වුවද මෙම දෙයම කරන්නට ඇති.

නුමුත් අප ස්විට්සර්ලන්තයේ සිටියෙමු. සති දෙකකට පසු, නැවතත් උත්සාහ කරන්නට මා තීරණය කරමි.

මා වාර්ෂික දුම්රිය පතක් ලබා ගැනීමට පෝලිමේ සිටගෙන සිටියෙමි. මා තීරණය කළේ දුම්රිය ස්ථානයේ වැඩ කරන්නාවූ පුද්ගලයෙක් සමග ශුභාරංචිය බෙදා ගැනීමටය. මා සූදානම්ය. ඒ වැඩ කරමින් සිටි පුද්ගලයා අවුරුදු පනහක් පමණ විය හැකි එසේම පැහැදිලි වූ ස්විට්ස් ජාතිකයෙකි. බාගේ පින්තූරය ගැනීමට ඔහුට වෙලාව පැමිණි කළ මගේ දුම්රිය පාස්පත සඳහා මා සිතා සිටියේ එය තමයි අවස්ථාව කිය. මා ශුභාරංචිය පණිවිඩයට සෘජුවම නොගොස් වීඩියෝ වල මා දුටු ආකාරයට තවත් ආකාරයකින් ඔහුට ළඟාවීමට සිතුවෙමි. මා ප්‍රථමයෙන්ම සුවය උදෙසා කතා කලෙමි. ඉන්පසු ඔහු සුව වුනානම් ඔහු ශුභාරංචියට අනිවාර්යෙන්ම විවෘත වනු ඇත.

" ඔබ ඉංග්‍රීසි කතා කරනවද? " මම ඇසීය

" ඔව්, මා ඉංග්‍රීසි කතා කරමි."

" බොහොම හොඳයි. ඔබව සුව කරන්නට හැකි බලවත් දෙවි කෙනෙකුට මා සේවය කරමි. ඔබේ ශරීරයට අවශ්‍ය කරන සුවයක් තිබේද?" මම ඇසුවෙමි.

" නැත."

" නැත. අපි හැමෝටම සුවය අවශ්‍යයි. ස්ථිර ද?" මා ප්‍රතිඋත්තර දුන්නෙමි.

" නැත"

නැත? ඔබගේ දණහිස්?" මා ඔහුගෙන් ඇසීය. අත්තිකාල වැඩ කරන අවස්ථාවේදී ඔබේ දණහිස් වල ප්‍රශ්න ඇතිවිය හැකි.

ඔහුගේ පාද ඔහු ඉහළට ඔසවා ඔහුගේ දණහිස් දෙපැත්තට ඔහු සෙලවීය. ඉන්පසු ඔහු පිළිතුරු දුන්නේ නැත කියාය.

"සැබවින්ම ඔබ ඔය ඇත්තද කියන්නේ? බලන්න. මම දෙවියන් වහන්සේ යැයි සිතා මගෙන් ඔබ සුව වෙන්න කියා ඉල්ලුවොත් ඔබ සුවය ලබයි. එය කෙසේ වේද?"

මට පිස්සු කෙනෙකු සේ ඔහු මා දෙස බැලීය.

" නැත. නැත. නැත. මම දෙවියන් වහන්සේ නොවෙමි. මම එය ඔබට උපකාරයක් ලෙස පාවිච්චි කළෙමි. මමත් නැහැ"

මේ අවස්ථාව වන විට මා අමුතු පුද්ගලයෙක් ලෙස ඔහු මා දෙස බැලුවේ සහ මම ඔහුට බැන්නේ නැත. දෙවියන් වහන්සේ විසින් ඔහුව අත නොගැසීම ගැන මට අපහසුතාවයක් විය. මක්නිසාද ඔහුට ශුභාආරංචිය ප්‍රකාශ කිරීම උදෙසා. ඉන්පසු මම යුරෝපයට ගියෙමි.

" හොඳයි. ඔබගේ පවුල සහ ඔබගේ මුදල් තත්වය කෙසේද? ඔබට යම් අවශ්‍යතාවයක් තිබේද? මා ඔබට යාච්ඤා කරන්න කැමැත්තෙමි මා නැවත් කීවෙමි."

" නැත "

" හම්ම්ම්ම්, එසේනම් ඔබට හාස්කමක් අවශ්‍යම නැතිද?"

" නැත. සහ මම රැකියාවට යන්න අවශ්‍යයි." කියා ඔහු පැවසා ඔහු ඉක්මනින් එම ස්ථානයෙන් ඇවිද ගියේය.

මම සම්පූර්ණ පරාජිතයෙක් ලෙස එම ස්ථානයේ සිටගෙන සිටියෙමි. නැවතත් සියල්ල එසේ විය. මම යාච්ඤා කලෙමි. මගේ හුස්මට යටින් ස්විට්සර්ලන්තයේ දෙවියන් වහන්සේ ජීවත් වන සේක යනු සම්පූර්ණ කාලය නාස්ති කිරීමකි. ඇයි මම මේ ස්ථානයේ? "

> දෝංකාරයක් නොවන්න; හඬක් වන්න.

ශුද්ධාත්මයාණන් වහන්සේ එවිට කතා කළ සේක. " දෝංකාරයක් නොවන්න. හඬක් පමණක්ම වන්න."

එම අවස්ථාවේදී සියල්ල වෙනස් විය.

යමෙක් සාර්ථකව සිටිනවා අප දකින්නේ නම් ඒ පුද්ගලයා මොන තලයකද යන්නයි අපට තේරුම් ගත නොහැකිය. අප බොහෝ විට සිතන්නේ ඔවුන්ගේ සැලසුම් අපි අනුපිටපත් කළ යුතුය යන්නයි. ඔවුන්ගේ සැලසුම් සාර්ථකත්වය සඳහා අප අනුපිටපත් කළ යුතුය යන්නයි. නමුත් එය එසේ නොවේ. මුල් පිටපතේ ප්‍රතිඵලය සාර්ථකත්වය වන බව අප තේරුම් ගත යුතුය.

මුල් පිටපත එලෙසම පවතින අතර අනුපිටපත් එලෙසම පවතී.

පැරිසියේ, ලූවර් ශාලාව පිටත ඩොලරයකට විකිණීමට ඇති මෝනාලිසාහි අසංඛ්‍යාත පිටපත් තිබේ. කමිස, චුම්භක, මග් සහ පෝස්ටර් මත ඒවා මුද්‍රණය කර තිබේ. නමුත් ලූවර් ශාලාව තුළ ලොව පුරා සංචාරකයින් දහස් ගණනක් ලියනාඩෝ ඩාවින්චි විසින් සිතුවම් කරන ලද මොනාලිසා සිතුවම නැරඹීමට පැය ගණනක් පෝලිමේ රැඳී සිටිති. මුල් පිටපත ඩොලරයක් නොව ඩොලර් මිලියන 800 කට වඩා වටින්නේය.

ඔබව කැඳවනු ලබන්නේ මුල් පිටපතක් වීමටයි. ඔබේම කටහඬක් තිබීමටය. දෙවියන් වහන්සේට අද්විතීය අරමුණක් ඇති අතර ඔබට විශේෂ කැඳවීමක් උන්වහන්සේ දී ඇත.

ඔබව නිර්මාණය කර ඇත්තේ වෙනත් කෙනෙකුගේ ජීවිතය වීමට නොව. සරලව දෝංකාරයක් වන්න සහ වෙනත් කෙනෙකුගේ ජීවිතය අනුකරණය නොකරන්න. නැත. ශුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා දෙවියන් වහන්සේ ඔබව නිර්මාණශීලී ආකාරයේ අදහස් ඇතුව සූදානම් කර ඇත. ඔබට හඬක් ඇත. ඒ හඬ ඔබගේ උපරිම සීමාවට ළඟා වන්නේ ඔබගේ අද්විතිය දීමනා සහ හැකියාවන් තුළින් ප්‍රකාශ වූ විට පමණි. එසේ නොමැති නම් ඔබ වෙනත් කෙනෙකුගේ  නොවටිනා

දෝංකාරයක් වනු ඇත. ඔබට එම සාර්ථක පුද්ගලයා මෙන් පෙනුනත් ප්‍රතිඵල නොලැබෙන්නේ මන් දැයි නිරන්තරයෙන් කල්පනා කරයි.

සූරිච් හී බලපෑමක් ඇති කිරීමට නම් මට වෙනස් දෙයක් කළ යුතු බව මම දැන සිටියෙමි. එය නිර්මාණාත්මක දෙයක් වනු ඇතැයි මම දැන සිටියෙමි. ප්‍රශ්නය වූයේ එය කුමක් වනු ඇද්ද යන්නයි.

# දිවා ආහාරය හෝ සවන් දෙන්න

නැවතත් ඔබ මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ, ඔබව නිර්මාණය කර තිබෙන්නේ නිර්මාණය සඳහාය. නමුත් එම අවස්ථාවේදීම අපගේ නිර්මාණය රාජ්‍යය උදෙසා වන අතර එය දෙවියන් වහන්සේගෙන් උපත ලැබිය යුතුය. විශේෂයෙන්ම මෙය පැමිණෙන්නේ යාච්ඤාවෙන් හෝ යාච්ඤා කාලයෙන් පසුවය. යාච්ඤාව තුළදී උන්වහන්සේ නිර්මාණශීලී භාවයට අපව ඇතුල් කරන අතර එය උන්වහන්සේගේ අරමුණ උදෙසා අප පාවිච්චි කරන්නේ කෙසේදැයි කතා කරනු ලබයි. මෙම මග පෙන්වීම අපි දෙවියන් වහන්සේගෙන් ලබා ගත යුතුය. එසේ නොවේ නම් ගීතාවලිය 127:1 "ස්වාමීන්වහන්සේ ගෙය නොසාදනසේක් නම්, සාදන්නෝ නිෂ්ඵලයේ වෙහෙසෙති. ස්වාමීන්වහන්සේ නුවර ආරක්ෂා නොකරනසේක් නම්, රැකවලා නිෂ්ඵලයේ අවදිව සිටියි."

සිතන්න ලස්සන ගෙයක් තිබෙනවා කියා. ඔබේ යාලුවා වඩු කාර්මිකයෙක්, දවසක් ඔහුගේ මෙවලම් පෙට්ටිය සහ ආයුධ රැගෙන පැමිණෙනවා. කිසිම දැනුම් දීමකින් තොරව ඔහු ඔබේ නිවසේ පිටුපසට පුවරු ගසන්නට පටන් ගනියි. ප්‍රහේලිකාවක් ලෙස ඔබ පිටතට දුවගොස් ඔහු කුමක් කරන්නේදැයි ඔබ ඔහුගෙන් අසයි.

කිසිම දැනුම් දීමකින් තොරව ඔහු ඔබේ නිවසේ පිටුපසට පුවරු ගසන්නට පටන් ගනියි . ප්‍රහේලිකාවක් ලෙස ඔබ පිටතට දුවගොස් ඔහු කුමක් කරන්නේ දැන් ඔබ ඔහුගෙන් අසයි. අවංකවම ඔහු ඔබේ උරහිස තට්ටු කර විශාල සිනහවකින් මෙසේ කියයි. "ඔබ මගේ හොඳම මිතුරා බව මා දන්නවා. අපි කවදාවත් මේ ගැන කතා කළේ නැහැ. නමුත් මම තීරණය කරා මම ඔබේ නිවසේ පිටුපස ක්‍රීඩා කාමරයක් හදන්න." ඔබ ප්‍රතිචාර දක්වන්නේ කෙසේද?

යාච්ඤාව තුළින් දෙවියන් වහන්සේ අපගේ නිර්මාණශීලීත්වය සමඟ සම්බන්ධ වී අපගේ නිර්මාණශීලීත්වය උන්වහන්සේගේ අරමුණු සඳහා භාවිතා කළ හැකි ආකාරය පිළිබඳ මග පෙන්වීමක් ලබා දෙයි.

බොහෝ විට කල්පනාකාරීව ප්‍රතිචාර දක්වනු ඇත . ඇත්ත වශයෙන්ම ඔබ නමුත්

මම ඔහුට මෙය කීමද කිසි විටෙකත් ඉල්ලා නොසිටි බව ඔබ ඉක්මනින් මතක් කර දෙනු ඇත. ඔහුට ඇඳගත් සැලැස්ම කුමක්ද සහ එය මුලින්ම පෙනෙන්නේ කෙසේද යන්න හරියටම දැන ගැනීමට ඔබට අවශ්‍ය වනු ඇත. ඔහු එය කිරීමට දක්ෂ ද සහ එය ඔබට අවශ්‍ය දේ ද යන්න ඔබ තීරණය කළ යුතුය. සියල්ලට පසු එය ඔබේ නිවසයි.

දැන් එකම මිතුරා ඔබේ නිවසට දිවා ආහාරය සඳහා පැමිණෙන බව සිතන්න. ඔබ මේසය වටා වාඩිවී එකිනෙකාගේ ඇසුරු භුක්ති විඳිමින් සිටියි. සංවාදය අවසානයේ ඔහු ඔබට පවසන බොහෝ සාක්ෂි වලින් පැහැදිලි වන පරිදි ඔහු සැබවින්ම විශිෂ්ට වූ අඩු කාර්මිකයකු බවට පත්ව ඇති බව ඔබ පුදුමයට පත්වේ. ඔහු ඔබේ උරහිසට තට්ටු කර විශාල සිනහවකින් මෙසේ කියයි. ඔබ මගේ හොඳම මිතුරා, ඔබේ නිවසට එකතු කිරීම මගේ පරම සිහිනයයි. මට ඒ නොමිලේ කර ඔබට අවශ්‍ය ආකාරයට මේ ගොඩනගා ගැනීමට අවශ්‍යයි .

දැන් ඔබේ ප්‍රතිචාරය කුමක්ද? පුදුමයි ! කියලා කියන්න හොඳ අවස්ථාවක් තියෙනවා. සති කිහිපයකට පසුව ඔබ දෙදෙනා එකතු වී සැලැස්මක් ඇඳ ඔබේ නිවසට අලුතෙන් ඇතුල් කළ යුතු දේ කුමක්දැයි ඔබ සකස් කරනු ඇත. ඔබ න්‍යාය පත්‍රයක් සූදානම් කොට මේ ව්‍යාපෘතියට සම්බන්ධ විය යුත්තේ කවුද සහ පාවිච්චි කිරීමට අවශ්‍යය ද්‍රව්‍ය මොනවාදැයි ඔබ සකස් කරනු ඇත. ඉන්පසු ඔබේ මිතුරාට ඔබ උදව් වන අතර ඉන්පසු ඔබ දෙදෙනා එකට එකතු වී එම නිවසට අවශ්‍ය කරන අලුත් කොටස නිර්මාණය කරනු ඇත.

රාජ්‍යයේද කාරණය මෙයාකාරය විය යුතුය. බලාපොරොත්තු රහිත ආකාරයට බොහෝ මනුෂ්‍යයන් තම තමුන්ගේ ආශාවට අනුව දේව රාජ්‍යය ගොඩනගමින් සහ උන්වහන්සේගේ සැලැස්මෙන් තොරව කටයුතු කරන්නේ ඔවුන්ගේ අදහස යහපත් නිසාය. පළමුව අපි යේසුස් වහන්සේ සමග මේසය වටා ඉඳගෙන අප සහභාගිත්වය තැබිය යුතුය. යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ සමඟ කාලය ගත කළ යුතුය. අපගේ සහභාගිත්වය කාලය තුළදී අප තේරුම් ගත යුත්තේ උන්වහන්සේ අපට කරන්න කියන්නේ කුමක්ද යන්න සහ වැදගත් දේ නම් උන්වහන්සේ අපත් සමග ඒ දේ කරන බවය.

ලූක් 10 පරිච්ඡේදයේ කතාව ඔබට මතකද? මාර්තා යේසුස් වහන්සේට ආරාධනා කළා සහ උන්වහන්සේගේ ගෝලයන්ට ඇගේ නිවසට එන්න කියා කීවා. ඇගේ ජුවලිතකම තුළ ඇගේ සියලුම අවධානය ඇය යොමු කරනු ලැබුවේ එම අමුත්තන්ට අවශ්‍ය කරන්නා වූ දේවල් සැපයීම සඳහාය. ඒ අවශ්‍යතාවයන් මොනවාද කියා කවුද දන්නේ? අපි හිතමු ඇය දිවා ආහාරය සූදානම් කරා කියලා. දහතුන් දෙනෙක් එම නිවසේ සිටි නිසා ඒ ආහාරය ඉතා යහපත් දෙයක් වන්නට තිබුණි. එම අවස්ථාවේදීම ඇගේ සොයුරිය මරියා යේසුස් වහන්සේ කිව්වා වූ සෑම වචනයකට ඇහුම්කන් දෙමින් අනෙක් අයත් සමග ඇය එම ස්ථානයේ රැඳී සිටියාය.

මාර්තා ඉතාමත්ම කෝපයට පත්ව යේසුස් වහන්සේ වෙතට පැමිණ මරියා කරන දේ ඔබවහන්සේ නොදැන සිටිනවාද මේ සූදානම් කිරීමේ කටයුතුවලට ඇය උදව් නොකර සිටීම ඔබ දන්නේ නැද්ද? කියා ඇය කතා කළාය. යේසුස් වහන්සේ මරියාට කතා කොට එකම දෙයයි ඔබට කරන්නට තිබෙන්නේ. එනම් මරියා කරන දේ ඔබ කළ යුතුයි උන්වහන්සේ සමග කාලය ගත කිරීම.

අපගේ නිර්මාණශීලී හදවත් ඇතුව අපගේ යේසුස් වහන්සේට තිබෙන ප්‍රේමය තුළින් සහ අපගේ ආශාව තුළින් දෙවියන් වහන්සේට සේවය කිරීමට යේසුස් වහන්සේ ඉල්ලුම් නොකරා වූ දිවා බොජුන් අප සූදානම් කරමින් සිටිමු. උන්වහන්සේගේ රාජ්‍ය ගොඩනැගීමට අපි කටයුතු කරන්නේ නම් උන්වහන්සේ සමග පළමුව අපේ සහභාගිත්වය තැබිය යුතුය. අපි උන්වහන්සේට කාලය දෙන විට උන්වහන්සේගේ අභිමුඛත්වයේ ඉඳගෙන උන්වහන්සේගේ සැලැස්මට අපි සවන් දෙන විට උන්වහන්සේ අපගේ නිර්මාණශීලී භාවය මේ පොළොවේදී රාජ්‍ය ගොඩනැගීමට පාවිච්චි කරනු ඇත.

# බීජ ව්‍යාපෘතිය

මාස ගණනක් තිස්සේ සාර්ථක නොවූ ශුභාරංචිය බෙදා ගැනීමට උත්සාහ කිරීමෙන් පසු මම අවසානයේ මරියාගේ මාර්ගයට යාමට තීරණය කළෙමි. ලෝකයේ ශ්‍රේෂ්ඨතම මෙහෙවර ශේත්‍රය සූරිච් නොව දෙවියන් වහන්සේගේ හදවත බව මම තීරණය කළෙමි. මම දින ගණනාවක් බයිබලයේ කියවීම්. නමස්කාර කිරීම සහ දෙවියන් වහන්සේට මා කොතරම් ප්‍රේම කරනවාද යන්න පැවසීම පමණක් උන්වහන්සේ තුළ ගත කරන කාලයේදී මගෙන් සිදුවිය. උන්වහන්සේ උදෙසා අපට කිරීමට අද්විතීය දෙයක් තිබේ නම් මම සූදානම් බව උන්වහන්සේට කීවෙමි. මේ අතරතුර මම යේසුස් වහන්සේ ගැන

මිනිස්සුන්ට පැවසීම සහ මා දන්නා දේ සමඟ විශ්වාසවන්තව සිටීම දිගටම කරගෙන ගියෙමි. ඉන්පසු උන්වහන්සේ මට කතා කළා.

එක් උදෑසනක මම අවදි වූයේ දෙවියන් වහන්සේ මාගේ ආත්මයට කතා කරන විටය. ඇසෙන හඬක් නම් නොවීය. නමුත් ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලැබුණු පැහැදිලි අභ්‍යන්තර මග පෙන්වීම මට දැනුණි.

සූරිච් හී ශුභාරංචිය බෙදා ගැනීමට මලක් භාවිතා කරන්න යනුවෙන් ස්වාමීන් වහන්සේ පැවසූ බව මට දැනුණි.

ඇත්තටම මම හිතුවා මීට වඩා හොඳ ක්‍රමයක් තියෙන්න ඕනා. ඒ වගේම මලක්ද, මට මල් ඉවැන්ජලිස්තවරයෙක් ලෙස ප්‍රසිද්ධ වෙන්න ඕන නෑ.

මා ටෙක්සාස් හීදී මගේ සැකයන් තිබියදී මම කීකරුවීම ගැන මා කෘතඥ වෙමි.

මිනිත්තු කිහිපයකින් නිර්මාණශීලීත්වය ග්‍රහණය කරගත් අතර ශුද්ධාත්මයාණන් වහන්සේගේ මග පෙන්වීමත් සමග යුරෝපය දැල්වීම සඳහා ඉවැන්ජලිස්ත උපාය මාර්ගයක් දිග හැරුණි. බීජ ව්‍යාපෘතිය අපි ලස්සන මල් මිලදී ගෙන කාඩ්පතත් සමග පෝසිලෙන් බඳුන්වල තැබුවෙමු. කාඩ්පතේ මූලික පණිවිඩය වූයේ බීජයක් බිමට ගොස්, මියගොස් මෙම සුන්දර මල බවට පත්වූ විට ඔබට සදාකාල ජීවනය ලබාගත හැකිවන පරිදි යේසුස් වහන්සේ පොළොවට පැමිණ මියගොස් නැවත නැගිට්ට සේක. පාඨකයන්ට සම්පූර්ණ ශුභාරංචිය කියවා ප්‍රශ්න සමග අප හා සම්බන්ධ වීමට හෝ ඔවුන් ක්‍රිස්තුස්වහන්සේව අනුගමනය කිරීමට තීරණය කළහොත් අපට දැනුම් දීමට අපි වෙබ් අඩවි ලිපිනයක් කාඩ් පතෙහි තැබුවෙමු.

අපේ කුඩා නගරයේ සූරිච් හී සියලුම නිවාසවල දොරකඩ අපි මල් දෙසිය පනහකට වැඩි ප්‍රමාණයක් තැබුවෙමු. අපි සරලවම දොරකඩ මල් තබා පිටව ගියෙමු. කෙසේ වෙතත් දෙවියන් වහන්සේ දිව්‍යමය හමුවීම් නිර්මාණය කළ අතර ඔවුන් අපෙන් ඇසුවේ ඔබ කුමක්ද කරන්නේ? ඇයි? කියාය.. එය අපට පුද්ගලික ආරාධනයකට විවෘත වූ අතර ඔවුන් සමග ශුභාරංචිය බෙදාගෙන යාච්ඤා කිරීමට හැකි විය.

අප මල් දී අවසන් වූ පසු එම ප්‍රතිඵල ගැන අප කම්පනයට පත් වූ වෙමු. අප මලක් දුන්නා වූ සෑම පුද්ගලයෙක්ම අසලම අපගේ අසල්වාසීන් තිදෙනෙක්ද විය. ඔවුන් අපගේ ශුභාරංචි වෙබ් සයිටය කියවා තිබුණි. අසල්වාසීන් එම අපගේ වෙබ් අඩවියට ප්‍රතිචාර දැක්වා ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කිරීමට හෝ යම් දේකට යාච්ඤා ඔවුන්ට අවශ්‍ය විය. අප දැන සිටියා දෙවියන් වහන්සේ අපට නිර්මාණශීලී අදහසක් දුන් බව සහ සූරිච් හී උන්වහන්සේගේ රාජය ගොඩනැගීමට මෙය එක් මාර්ගයක් බව.

ඒ කාලයේ සිට අපි ස්විට්සර්ලන්තයේ මල් දහස් ගණනක් බෙදා දී ඇති අතර ශුභාරංචිය ප්‍රකාශ කර ඇත්තෙමු.

# යුග ගණනාවක් පුරා

*යුග ගණනාවක් පුරා ශුභාරංචිය ඉදිරියට ගෙන යාමේදී නිර්මාණශීලිත්වය විශාල කාර්යභාරයක් ඉටු කර ඇත.*

ශුභාරංචියේ යඥීය ප්‍රකාශ කිරීමේදී නිර්මාණශීලීත්වය විශාල කාර්ය භාරයක් ඉටු කර ඇත. පළමු සියවසේ දේවධාර්මික සත්‍යතාවයන් සන්නිවේදනය කිරීමේ අපේක්ෂිත ක්‍රමය වූ සිනගෝගයෙන් පිටත තම සුභාරංචිය දේශනා කිරීම යේසුස් වහන්සේගේ මාර්ගය ආදර්ශයට ගත්තේය. යේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ කන්ද උඩ දේශනාව ගලිලය අසල කඳු බෑවුමක පවත්වන ලදී. මතෙව් 5:1 උන්වහන්සේ සමූහයා දුටු විට කන්දක් මත වාඩිවී ඔවුන්ට ඉගැන්වීමට පටන් ගත් බවයි . ලූක් 6: 17 සඳහන් වන්නේ යේසුස් වහන්සේ සමතලා ස්ථානයකට ගොස් ඔවුන්ට ඉගැන්වීමට පටන් ගත් බවයි .

ඊශ්‍රායලය මෙම ස්ථානයේ යෑමට ඔබට කවදා හෝ අවස්ථාවක් ලැබුණ හොත් යේසුස් වහන්සේ තම පණිවිඩය ලබාදීමේදී කෙතරම් නිර්මාණශීලී ද යන්න ඔබට ඉක්මනින් වැටහෙනු ඇත. උන්වහන්සේගේ පණිවිඩය උන්වහන්සේගේ ගෝලයන්ට වඩා විශාල ප්‍රේක්ෂක පිරිසකට ළඟා විය හැකිවන පරිදි උන්වහන්සේ උපායශීලීව කන්ද ස්වභාවික රංග භූමියක හැඩය ඉහළට අල්ලා ගනු ඇත. උන්වහන්සේ බොහෝවිට කරන පරිදි දවස පුරා සෙනග වැඩි වූ අතර කඳු කරය පුරා පැතිර ගියේය.

එහෙත් කඳු බෑවුමේ මිනිසුන් කොතරම් තැනක වාඩිවී සිටියත් යේසුස් වහන්සේ පවසන දේ ඔවුන්ට පැහැදිලිව ඇසෙන්නට විය . යේසුස් වහන්සේ මේ දේවල් කියා අවසන් වූ පසු සමූහයා උන් වහන්සේගේ ඉගැන්වීම් ගැන මවිත වූහ. මන්ද උන්වහන්සේ ඉගැන්වූ බැවිනි.

යේසුස්වහන්සේ මෙම නිර්මාණාත්මක ධ්වනි උපායමාර්ගයක් පමණක් නොව වෙරළ අසල බෝට්ටුවක ගොඩබිමෙහි සිටි සෙනඟට භාවිතා කල මෙම නිර්මාණශීලීත්වය පිළිබඳ සුභාරංචිය සිනගෝගවලින් සහ පෞද්ගලික රැස්වීම් වලින් ඔබ්බට 5000ට අධික ජනතාවකට ව්‍යාප්ත විය.

පුනරුද සමයේ දී ඉහළ මට්ටමේ නූගත්කම සහ බයිබලයානුකූල හේතුවෙන් පැල්ලම් සහිත වීදුරු ජනෙල් ඉදිකරන ලද දේවස්ථාන කොටසක් බවට පත් විය. මෙම කව්ලු බයිබල් කතා වලින් ආභාශය ලැබූ රූප සමඟ නිර්මාණය කර ඇති අතර එමගින් සුභාරංචිය වචනය වෙනුවට පින්තූර වලින් කියවිය හැකි විය.

18වන සත වර්ෂයේ දී ජර්මන් ගීත රචකයෙකු වන ජොහාන් සෙබස්තියන් බැජ් බයිබලය ඔහුගේ සංගීත වචන වලින් නොව සංගීතයෙන් බලවත් ඉවැන්ජලීස්තවරයෙකු ලෙස තමාව තහවුරු කරගනු ඇත. මාර්ටින් ලූතර්ගේ වෙළුම් තුනකින් යුත් පරිවර්තන හරහා මෙම යහපත බෙදාගැනීමේ නිර්මාණාත්මක අදහස ඔහු ඉදිපත් කළේ ය. ඔහුගේ 1727 රචනාව වන ද ෆැෂන් ඔෆ් සෙන්මැට් සුභාරංචිය එය අසා ඇති මිලියන ගණනකගේ හදවත් තුළ රෝපණය කලේය. බැජ්ගේ මරණයෙන් වසර 100කට වැඩි කාලයකට පසු විප්ලවවාදී අදේවවාදියකු වූ ෆ්‍රෙට්රික් නීක් එය ඇසූ විට පිළිගත්තේ ක්‍රිස්තියානි ධර්මය සම්පූර්ණයෙන් ම අමතක කල කෙනෙකුට එය සැබැවින්ම සුභාරංචියක් ලෙස අසන්නට ලැබේ යනුවෙනි.

මයිකෆෝනය සොයා ගැනීමට පෙර එංගලන්තයේ ජනප්‍රිය බැප්ටිස් දේශකයෙකු වූ චාල්ස් පර්ජන් නැති වූවන්ට සුභාරංචිය පතුරුවා හැරීමට නිර්මාණාත්මක ක්‍රමයක් ගැන සිතුවේය. ඔහු සුළං සහිත දිනවල සුළඟට මුහුණ ලා එළිමහනේ දේශනා කල අතර ඔහුගේ හඬ සැතපුම් භාගයක් දක්වා ගමන් කලහැකි අතර කිසිදා දේවස්ථානයකට ඇතුළු නොවුන බොහෝ දෙනෙකු හඬට සවන් දුන්නේය.

නූතන කාලයේ දී නිර්මාණශීලීත්වය ඒ තරමට ඵලදායිතා අවශ්‍ය වේ.

ඇමෙරිකාවේ In-N-Out බර්ගර් ආහාර දාමය ඔවුන්ගේ කෝප්පවල පතුලේ සහ ෆ්‍රයිස් සඳහා ඔවුන්ගේ පෙට්ටිවල ශුද්ධ ලියවිලි පද මුද්‍රණය කරයි. ඔවුන්ගේ අවන්හලේ කෑමට එන්නාවූ ඕනෑම අයෙකුට සුභාරංචිය ඉදිරිපත් කරන විට නිර්නාමික ව්‍යාපාරිකයන්,මං සන්ධි සහ මහාමාර්ග අසල දැන්වීම් පුවරු මත ශුද්ධ ලියවිලි පද තබයි. තවද වැඩිවන යැපීම හේතුවෙන් ජංගම දුරකථන ඔෆ්ලොහෝමොහි තුල්සා හී ලයිෆ් දේවස්ථානය ස්මාර්ට් ෆෝන් සඳහා බයිබල් යෙදුමක් නිර්මාණය කල අතර එය මිලියන භාගයකට වඩා බාගත කර ඇත.

කොවිඩ් 19 වසංගතය අතරතුර 6 වන සියවසේ ඇදහිලිවන්තයන් මුහුණ දුන් ආකාරයටම අසංකයත දේවස්ථාන සහ සුභාරංචි සේවාවන් ද ගෝල ඇදහිලිවන්තයන් ඉදිරියට ගෙන යාම සඳහා නිර්මාණාත්මක අදහස් ඉදිපත් කළහ. ලොවපුරා මාර්ගගත සේවා සහ පුහුණු වැඩසටහන් බිහිවිය. දේවස්ථානය විසින් ධාවක සඳහා සත්කාරකත්වය සපයන ලද්දේ රජය විසින් ඉදිරිපත් කරන ලද රෙගුලාසි වලට අනුව සමාජමය දුරස්ථභාවය තබා ගැනීම පිණිසය.

නිර්මාණශීලීත්වය සැමවිටම ඉවැන්ජලීස්ත සේවයේ ප්‍රධාන කාර්යභාරයක් ඉටුකර ඇත. තවද දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ දියුණුව සඳහා භාවිතා කිරීමට කැමති නිර්මාණාත්මක අදහස් ඔබ තුළ ද ඇත.

භයානක 6වන සියවසේ දී ක්‍රිස්තුස්වහන්සේව නිර්භීතව ප්‍රකාශ කල සාමාන්‍ය කිතුණුවන් ගැන සහා ඉතිහාසයේ කලාතුරකින් කතා කරන අතර සාමාන්‍යයෙන් ඔවුන් නොදන්නා කරුණක් නම් ඔවුන්ගේ නම්, කතාව සහ සාක්ෂි වසර 700කට පසු මොංගෝලියානුවන් විසින් සම්පූර්ණයෙන්ම පාහේ විනාශ කරන ලදී. නමුත් ඔවුන්ගේ නිර්මාණශීලීත්වයේ බලපෑම ඉදිරි සියවස් ගණනාවක් පුරා දැනෙනු ඇත. වසංගතය සෙමින් අවසන් වූ නමුත් සුභාරංචියේ යෂ්ටියේ ප්‍රගතිය තවත් සියවසකට සාර්ථකව සම්ප්‍රේෂණය විය.

# 8

# 600 ගණන් වල - මගේ සාක්ෂියේ බලය

නමුත්,.... මගේ කතාව කම්මැලිය

*" ලෝකය කියවන්නා වූ බයිබල් අපි ය. ලෝකයට අවශ්‍ය ඇදහිල්ල අපි ය.ලෝකයට අවනත දේශනා අපි ය. " - බිලිග් ග්‍රහැම්*

07 වන සියවසේ ලෝකයේ බොහෝ ප්‍රදේශවල නැවුම් ආරම්භයක් සඳහා බලාපොරොත්තුවේ දීප්තියක් ගෙනාවේ ය. පෙර සියවසේ වසංගතය එය ඇතුළු වූ සෑම නගරයක් හරහා ම විනාශයේ මාවතක් ඉරා දැමීය. මහා රෝම නගරය පවා වේදනාවෙන් පෙළුණි. මිතුරන්ගේ මළසිරුරු වලින් ගොඩගැසී ඇති කනත්ත මිනිසුන් ඕනෑතරම් දැක තිබුණි. බොහෝ අය පිස්සු වැටී සිටියහ. මධ්‍යම ඉතාලියේ දැන් කාන්තාරයක් ලෙස පිහිටා ඇති කලක් මහා අධිරාජ්‍යයෙන් මිනිසුන් විශාල වශයෙන් නික්ම ගොස් තිබුණි. 07 වන සියවස වසංගතයෙන් සුවය ලැබීමේ කාලයක් සහා කිලියන් වැනි අසංඛ්‍යාත ඇදහිලිවන්තයන්ගේ සාක්ෂිය හාරහා යුරෝපය පුරා පැතිර ගිය සුභාරංචියේ වැඩිවීමක් සනිටුහන් කළේය.

ක්‍රි.ව. 687 දී අයර්ලන්ත ජාතික කිලියන් (කිලියන් හෝප් කිරීයන්) ජමනියේ වෝස් බ(ර්)ග් අගනුවර නැගෙනහිර ෆැන්ක්වරුන්ට ඉවැන්ජලීස්ත සේවය කිරීමට පිටත් විය. ඔහු උනන්දුවෙන් හා නොනවත්වා තම සාක්ෂිය බෙදා ගනිමින් බයිබලයේ සත්‍යතාවයන් අවට සිටින සියල්ලන්ට ඉදිරිපත් කල විට ඔහු මුල් සාර්ථකත්වය අත් දැක්කේය. විශාල පිරිසක් මිත්‍යා දෘෂ්ටිකත්වයෙන් ඉවත් වී ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කල අතර ඉක්මනින්ම තමන්ගේම සාක්ෂිය බෙදාගැනීමට පටන් ගත්හ. ඔහුගේ පණිවිඩය රටේ වංශවත් අයගේ කන් වලට ලගා විය. ආණ්ඩුකාර කොස්බට් ආදිපාදවරයා පවා තම ජීවිතය ක්‍රිස්තුස්වහන්සේට කැපකල අතර කිලියන් ඔහුව බව්තීස්ම කලේය.

කෙසේ වෙතත් කිලියන්ට ද දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. ආදිපාදවරයාගේ බිරිඳගේ කෝපයට මුහුණ දුන් විට ඔහු තම පණිවිඩය ඉල්ලා අස් කර ගැනීම ප්‍රතික්ෂේප කළේය. ඇය අසතුටින් සිටියා ය.ඇගේ සැමියාගේ ආගමට හැරීමත් සමග පසුව ඇය දිවි පිදුවා ය. කිලියන් තම සාක්ෂිය බෙදා ගැනීමට දැක්වූ දැඩි ආශාව නිසා වෝස් බ(ර්)ග් හී අතිමහත් බහුතරයක් වසර දෙකක් ඇතුළත ක්‍රිස්තියානි ආගමට හැරුණු බව වාර්තා විය. ඇදහිලිවන්තයන්ගේ සාක්ෂිය සැමවිටම සියවස් ගණනාවක් පුරා සුභාරංචිය බෙදා ගැනීමේ උපායමාර්ගික ක්‍රමයක් වී ඇත.

## හොඳයි, හොඳයි, හොඳයි

*" උන්වහන්සේ සමාරිය මැදින් යන්ට ඕනෑ බැවින්, යාකොබ් තමාගේ පුත්‍රවූ යෝසෙප්ට දුන් බිම් කොටස ළඟ තිබෙන සිඛාර් නම් සමාරියේ නුවරකට පැමිණිසේක. එහි යාකොබ්ගේ ළිඳ තිබුණේය. යේසුස්වහන්සේ ගමනින් වෙහෙසව සිටිසේක්, ඒ ආකාරයෙන්ම ළිඳ ළඟ හිඳගත්සේක. ඒ හවෙනි පැය පමණ විය.*

*සමාරියේ ස්ත්‍රියෙක් වතුර අදින්ට ආවාය. මට බොන්ට දෙන්නැයි යේසුස්වහන්සේ ඈට කීසේක." - යොහන් 4:4-7*

කිලියන්ගේ සාක්ෂිය මෙන් සමාරිය ස්ත්‍රීයගේ පෞද්ගලික සාක්ෂිය ගැන යොහාන් මෙසේ සඳහන් කරයි. ඇගේ උපන් ගමේ බොහෝ දෙනෙකු ක්‍රිස්තුස්වහන්සේ වෙත ඇය යොමු කල අතර ඇය සහා ඉතිහාසයේ පළමු ඉවැන්ජලීස්තවරියන්ගෙන් කෙනෙකු බවට පත් කල කතාවක් ඔහු සඳහන් කරයි. සමාරියේ සිඛාර් හි යාකොබ්ගේ ළිඳ ලගදී කාන්තාව සහ යේසුස්වහන්සේ අතර හමුවීම. යොහාන් 4:1-42 දක්වා සඳහන් වේ. ක්‍රිස්තුස්වහන්සේ හමුවීමට පෙර ඇයගේ ජීවිතය අයහපත් අතීතයක් ඇති අයහපත් පරම්පරාවකින් පැමිණි අයහපත් කාන්තාවක් වූවා ය. බොහෝ මිනිසුන් මෙන් ඔබටත් සුභාරංචිය බෙදාගැනීමට අවස්ථාවක් ලැබෙනු ඇත. ඇය සුභාරංචිය ඇසීමට අපේක්ෂා නොකළ නමුත් ඇගේ එදිනෙදා ජීවිතය ගත කලා ය.

ඇගේ කතාව සාක්ෂියක බලය පිළිබඳ කදිම උදාහරණයකි. මේ සමාරියේ කාන්තාව කවුද? ඇගේ කතාව බයිබලයට ඇතුල් වුනේ ඇයි කියලා ඔබ කවදා හෝ කල්පනා කර තියෙනවා ද? ඉතින් ඇය කවුද?

පළමුව ඇය අයහපත් කාන්තාවකී. ඒ දවසේ ඇගේ උනන්දුව බොහෝවිට වතුර බාල්දියක් ගෙන ඒමට නොවේ. ඇය ආදර, හැඟීම්බර,ලිංගික හමුවීමක් සොයමින් සිටියා විය හැකිය. අපි මෙය දන්නේ ඇය තනිවම ළිඳට පැමිණියේ දහවල් කාලයේ දී නිසා ය. යහපත් සමාරියේ කාන්තාවකට මෙය සාමාන්‍ය දෙයක් නොවේ. කාන්තාවන් සමාන්‍යයෙන් කණ්ඩායමක් ලෙස ප්‍රදේශයේ ළිං වෙත ගමන් කරන්නේ ඔවුන් අනිත් කාන්තාවන්ගේ ඇසුරට කැමති නිසා සහ රැගෙන යාමට වතුර ජෝගු ඔවුන්ගේ හිස මත පටවා ගැනීමට උදව් අවශ්‍ය වූ බැවිනි. අමතක කරන්න එපා මේ කාන්තාව වෙනත් පිරිමින් පස්දෙනෙකු සමඟ විවාහවී තරමක් අයහපත් අතීතයක් ඇයට විය. දැනට ඇය ඇගේ සැමියා නොවන පුරුෂයෙකු සමඟ සිටියා ය.

දෙවනුව ඇය ආගමික කාන්තාවක් නොවීය. ඇය සමාරියේ සිට පැමිණි අයෙකි. සමාරිතානුවන් එප්‍රායිම් සහ මනස්සේ ගෝත්‍රයෙන් පැවත එන බව කියා සිටිය ද ඔවුන් බොහෝ යුදෙව්වන් මෙන් මෙසියස්වහන්සේ නොව මෝසෙස් වැනි ගුරුවරයෙකු සොයමින් සිටිය හ. සමාරිතානුවන් සාමාන්‍යයෙන් රෝම ලෝක දැක්මක් සහ යුදෙව් දැක්මක් අතර සිරවී සිටියහ. මෙම සමාරිතානු කාන්තාවෝ මුහුණදුන් ව්‍යාකුලත්වය තේරුම් ගැනීමට ඉතිහාසය අපට උපකාර කරයි.

*සියවස් ගණනාවක් පුරාවට ඇදහිලිවන්තයන්ගේ සාක්ෂිය සැමවිටම ශුභාරංචිය බෙදා ගැනීමේ උපායමාර්ගික ක්‍රමයක් වී ඇත.*

ඔගස්ටස් සීසර් රෝම සිවිල් යුද්ධය අවසන් කිරීමෙන් පසු මහා හෙරොද් සමාරිය නැවත ගොඩ නගා පළමු පරිච්ඡේදයේ සඳහන් ඇකියම් සටනෙන් පසු අධිරාජ්‍යයට සාමය ගෙනාවේ ය. නගරයේ බටහිර මායිමේ හෙරොද් සීසර්ට ගෞරව කිරීම සඳහා අඩි 14 පූජාසනයක් සහා ප්‍රතිමාවක් සහිත ආකර්ෂණීය දේවමාළිගාවක් ඉදි කලේය.

සීසර් මිය ගිය පසු රෝම සෙනෙත් සභාව ඔහුට සියුස් ඔගස්ටස් යන පදවි නාමය ලබාදුන් අතර ඉන් ටික කලකට පසු ලෝකයේ ගැළවුම්කරුවා යන පදවි නාමය ලබා දුන්නේය. ඔගස්ටස්ගේ දේවමාළිගාව යාකොබ්ගේ ළිඳේන් සැතපුම් 10ක් පමණ දුරින් පිහිටා තිබුණි. මෙම කාන්තාව දේවමාළිගාව ගැන දැන සිටින්නට ඇති අතර යුදෙව්වන්ගේ ඇදහිල්ල (පැමිණෙන ගැළවුම්කරුවා) සහ රෝම වරුන්ගේ ප්‍රකාශයන් (සීසර් ගැළවුම්කරුවා) අතර ඉරී තලා යන්නට ඇත. ලෝක ගැළවුම්කරුවෙකු පිළිබඳ අදහස ඇයට හුරුපුරුදු වන්නට ඇත. නමුත් එය පැමිණෙන යුදෙව් මෙසියස්වහන්සේ කෙනෙක්ද නැතහොත් සීසර් වැනි රෝම නායකයෙක්ද යන්න ඇයට නිශ්චිත නැත.

ළිඳ ලග සිටි මේ කාන්තාවට ක්‍රිස්තුස්වහන්සේ හමුවීමක් අවශ්‍ය වූ බව අමුතුවෙන් කිව යුතු නැත. ඒ වගේම හරියට ම සිදුවූයේ එයයි. ඇය පිරිමියෙකු සොයමින් ළිඳට පැමිණියා ය. නමුත් ඇය මෙසියස්වහන්සේ කෙනෙකු සමඟ ගියා ය. ඇය තම වතුර ජෝගුව තබා වහාම ඇගේ නගරයට ගියේ නව කතාවක් සමඟයි. ඇගේ සාක්ෂිය එහි ප්‍රතිඵලයක් ලෙස සමාරිය කිසිදා පෙර මෙන් නොවනු ඇත. ඒ නුවරේ බොහෝ සමාරිතානුවන් යේසුස්වහන්සේ කෙරෙහි විශ්වාස කලේ මා කල සියල්ල උන්වහන්සේ මට පැවසූ සේක යන ස්ත්‍රියකගේ සාක්ෂිය නිසා ය.

> *"මා කළ සියල්ල උන්වහන්සේ මට කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. එවිට සමාරියවරු උන්වහන්සේ ළඟට ඇවිත්, තමුන් සමඟ නවතින ලෙස උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. උන්වහන්සේ දෙදවසක් එහි නැවතුණුසේක.වෙනත් බොහෝ දෙනෙක් උන්වහන්සේගේ වචන නිසා අදහා," - යොහන් 4:39-41*

## සාක්ෂියක අ,ආ,ඇ

අප බොහෝ දෙනෙකු අපගේ සාක්ෂිය සමඟ සුභාරංචිය බෙදාගැනීමට කැමැත්තෙමු. නමුත් අපි කොහෙන් පටන් ගත යුතුදැයි නොදනිමු.මිනිත්තු කිහිපයකින් ඔබේ සාක්ෂිය බෙදාගැනීමට ඔබට ඉගෙනගත හැකි නම් ඔබට බොහෝ දෙනෙකුගේ සදාකාලික ඉරණමට බලපෑමක් කල හැකිය. ළිඳ අසල කාන්තාවකගේ සාක්ෂිය ඇසූ සමාරිතානුවන් හෝ කිලියන්ගේ සාක්ෂිය ඇසූ ව(ර්)ස් බ(ර්)ග් වැසියන් වැනි අය.

ඔබේ සාක්ෂියට ප්‍රධාන කරුණු 03 තිබේ. මම ඒවා සාක්ෂියක අ,ආ,ඇ ලෙස හැදින්වීමට කැමැත්තෙමි. මිනිත්තු දෙක තුනකින් ඕනෑම කෙනෙකුට ඔබේ සාක්ෂිය ඉක්මනින් බෙදා ගැනීමට ඔබට මෙම සරල පියවර භාවිතා කල හැකිය.

(අ) ආරම්භය- මෙය ඔබ ක්‍රිස්තුස්වහන්සේ වෙතට පැමිණීමට පෙර ඔබේ ජීවිතය කෙබඳුද යන්න පිළිබඳ කෙටි විස්තරයකි. මිනිත්තුවක් හෝ දෙකක් පමණි. දෙවියන්වහන්සේ වෙතට පැමිණීමට පෙර ඔබ උන්වහන්සේ ගැන සිතු දේ මෙය විය හැකිය. මත්ද්‍රව්‍ය,ලිංගිකත්වය,අනාරක්ෂිත බව යන ආදීය හරහා ඔබ ජීවිතය අර්ථය සහ අරමුණ සොයමින් සිටී ආකාරය විය හැකි ය. මෙහි විශාල විස්තර වෙත යාම අවශ්‍ය නොවේ. උද්දීපනයන් වෙත යන්න කෙසේ වෙතත් වැදගත් දේ නම් එය අවංකවීමයි. මෙය ඔබේ සාක්ෂිය නොව ඔබ සාක්ෂියකි.

(ආ)මැද- මෙය ඔබේ පරිවර්තනයේ අත්දැකීමයි. ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඔබේ හමුවීමයි. ( ළිඳ ලග කාන්තාව මෙන්) එයද විනාඩියක් හෝ දෙකක් දිගුවිය යුතුය. සුභාරංචිය බෙදාගැනීම මෙහි වැදගත් වන්නේ මූලික වශයෙන් සුභාරංචිය බෙදාගැනීම සිදුවන ස්ථානය මෙය වන බැවිනි.

(ඇ) අවසානය- ඔබේ පරිවර්තනයෙන් පසු ඔබේ ජීවිතය වෙනස් වී ඇති ආකාරය ගැන ඔබ කතා කරන්නේ මේ ආකාරයටයි. ළිඳ ලග සිටි කාන්තාව වහාම ආපසු ගොස් ඇගේ ප්‍රජාවට යේසුස්වහන්සේ ගැන පැවසුවාය. ඉන්පසු ඇය දුරාචාරයේ නොව අමරණීය ලෝකයේ සැබෑ ගැළවුම්කරුවාණන් වහන්සේ තුළ ජීවත් වූ බව අපට පෙනේ. ප්‍රීතියෙන් යාවත්කාලීනව සිටීමට සහා ආගමික වාග්මාලාවෙන් වැලකී සිටීමට මතක තබාගන්න.

යේසුස්වහන්සේගේ අනුගාමිකයකු බවට පත්වීම පිළිබඳ ඔබේ සාක්ෂිය කිවයුතු කතාවකී. ඔබ වයස අවුරුදු 4 දී යේසුස්වහන්සේගේ ගෝලයෙකු වූවා ද නැතහොත් වයස අවුරුදු 40 දී සාතන් නිකායකින් ඔබව ගලවා ගත්තා ද යන්න ය. යේසුස්වහන්සේගේ රුධිරයෙන් ගලවා ගත් ජීවිතයක් පිළිබඳ සෑම සාක්ෂියක් ම අනික් සියල්ලන් මෙන් බලවත් ය. සියල්ලට පසු සාක්ෂියක වැදගත්ම කොටස නම් කතාව ඔබ ගැන නොවන බවයී. ඒ සියල්ල යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ මිදීමේ බලය ගැන ය.සෑම සාක්ෂියකම ප්‍රධාන වස්තුව සහ චරිතය උන්වහන්සේ ය.

> යේසුස් වහන්සේගේ රුධිරයෙන් ගලවා ගත් ජීවිතයක් පිළිබඳ සෑම සාක්ෂියක්ම අනෙක් සියල්ලන් මෙන් බලවත් ය.

# දිව්‍ය හමුවීම් සඳහා සූදානම් වන්න

ඔබට අවසන් වරට දිව්‍යමය හමුවීමක් සිදුවූයේ කවදා ද? මම කතා කරන්නේ කුමක් ගැනද කියා ඔබ දන්නවා ද? මම ෆොරිඩාවේ, පැන්සිකෝලා බ්‍රවුන්ස්විල් පිබිදීමේ දේව සේවා පාසලේ ශිෂ්‍යයෙක් ව සිටිය දී මගේ ගුරුවරයෙකු වූයේ ලැරී තම්සාක් ය. ඔහුගේ පංතිය මගේ ප්‍රියතම එක විය. ඔහු කිසි විටෙකත් කම්මැලි නොවී ය. ලැරී සජීවි කරන ගුරුවරයෙකු වූ අතර අපි ආත්මයෙන් සහ ශරීරයෙන් නිරෝගීව සිටීම ගැන දැඩි උනන්දුවක් දැක්වීය. ජැක් සමඟ පංතිය ආරම්භ කිරීමට අපිට සිදු වූ බොහෝ දින මට මතක් වේ. අපගේ අභ්‍යාස වලින් පසු ලැරී ඔහුගේ සාක්ෂිය බෙදා ගන්නා ආශ්වාදජනක කතාවක් බෙදාගනී. මම සැමවිටම දිරිමත් වී ඇතුලතින් කලබලවීමි. බොහෝ විට ඔහුගේ කතා ඔහු බැංකුවක සිටිය දී, අවන්හලක ආහාර ගනිමින් සිටිය දී හෝ ගෑස් පොම්ප කරන විට එදිනෙදා හමුවීම් ගැන වනු ඇත.

ලැරී ඔහුගේ පිටුපස සාක්කුවට ගැළපෙන කුඩා පත්‍රිකාවල ඔහුගේ සාක්ෂිය මුද්‍රණය කර තිබුණි.ඔහු ආගන්තුකයෙකු මුණගැසුණු විට බොහෝ විට ඔහු තම සාක්ෂිය හරහා සුභාරංචිය බෙදාගෙන ඔවුන්ට මෙම කුඩා පත්‍රිකා වලින් එකක් ලබා දුන්නේය.ලැරී මෙම රැස්වීම් දිව්‍ය හමුවීම් ලෙස හැඳින්වීය. බොලිවුඩ් කීර්තිමත් පුද්ගලයින්, ක්‍රීඩා නිරූපකයින් සහ ඉහළ පෙලේ දේශපාලඥයන් ඇතුළු දස දහස් වාරයක් ඔහු තම සාක්ෂිය පවසා තිබුණි. අපගේම සාක්ෂි මත වැඩකරන ලෙස ලැරී අපට අභියෝග කළේය. අපගේ සාක්ෂිය ඵලදායිලෙස බෙදා ගැනීමට අප සූදානම් වුවහොත් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ සුභාරංචිය බෙදාගැනීමට දිව්‍ය හමුවීම් ගෙන එන්නේ කෙසේ දැයි අපි පුදුමවන බව ඔහු පැවසී ය.

මම අභියෝගය බාර ගත්තෙමි. යේසුස්වහන්සේ මගේ ජීවිතේ වෙනස් කල ආකරය ගැන මිනිත්තු දෙකක කතාවක් මම ලිව්වෙමි. මගේ සාක්ෂියට වසර ගණනාවක් තිස්සේ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීමෙන් මිදීම හෝ ආශ්චර්ය මත් ලෙස සුවය ලැබීම ඇතුළත් නොවූවද එය තවමත් බලවත් විය. යේසුස්වහන්සේ

මාව බේරාගෙන තිබුණි. නැවතත් කතාව අපගැන නොව යේසුස්වහන්සේ ගැනය. මගේ මිනිත්තු දෙකක සාක්ෂිය ගැන මම යාච්ඤා කර දෙවියන්වහන්ස ඔබට ලැරීව භාවිතා කල හැකි නම් ඔබවහන්සේට මාවද භාවිතා කල හැකිය යනුවෙන් කීවෙමි.

එය ඊළඟ දවසේ මම කෙටි කාලීන මෙහෙවර චාරිකාවක් සඳහා අප්‍රිකාව බලා යන අතරතුර නිව්යෝක්හි ජෝන් එෆ් කැනඩි ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සිටියෙමි.

මම මගේ මිතුරා දෙස බලා මෙසේ කීවෙමි. ලැරී අපට දිරිගැන්වූ පරිදි මගේ සාක්ෂිය සහ යේසුස්වහන්සේගේ පණිවිඩය බෙදාගැනීමට මම සූදානම්. මම දිව්‍ය හමුවීමක් විශ්වාස කලෙමි.

මගේ වාක්‍ය අවසන් කිරීමට පෙර අපේ කණ්ඩායමේ කෙනෙක් කෑ ගසමින් බලන්න ඒ කවුද කියලා.

මම ඒ දිහා බලද්දීම කරීම් අබ්දුල් ජබ්භාර් මා අසළට ඇවිදගෙන පැමිණියේ ය. කරීම් පැසිපන්දු ක්‍රීඩකයෙක් සහ ලෝක ඉතිහාසයේ වැඩිම ලකුණු ලබාගත් ක්‍රීඩකයා ඔහු විය. ණ්ඔැ ක්‍රීඩා ලෝලියෙක් ලෙස මම කරීන් කවුද කියලා හරියටම දැනගෙන හිටියා. ඔහු උපත ලැබුවේ ෆර්ඩිනන්ඩ් ඇල්සින්ඩෝර් ජේආර් ජෝනියන් නමිනි. ඔහු 1968 දී ඉස්ලාම් ආගමට හැරුණු පසු ඔහුගේ නම කරීම් අබ්දුල් ජබ්භාර් ලෙස වෙනස් කලා. ඔහු ක්‍රිස්තුස්වහන්සේගේ අනුගාමිකයයෙක් නොවන බවත් සුභාරංචිය අසන්නට අවශ්‍ය බවත් මම දැන සිටියෙමි.

මේ වගේ මොහොතක කරීම්ට සුභාරංචිය බෙදාගැනීමට. දෙවියන්වහන්සේ මට නියමකල දිව්‍යමය හමුවීමක්. මම මගේ අසුනෙන් ගොස් එක පියවරක් තැබුවා.මම ඔහු අසලට පැමිණියා.

සමාවෙන්න කරීම් මහත්මයා මම ඔහුගේ දෑස් දෙස බලමින් උද්‍යෝගයකයෙන් කීවෙමි. අද මට ඔබට හොඳ ආරංචියක් තියෙනවා. අපි ඒ පර්යන්තය දිගේ ඇවිද යන විට ඊළඟ මිනිත්තු දෙක තුළින් සුභාරංචිය බෙදාගැනීමට විශේෂිත වූ මගේ සාක්ෂියේ අ,ආ,ඇ මම බෙදා ගත්තෙමි.

අපි ඔහුගේ ගේට්ටුව ලගට පැමිණෙන විට ඔහු මා දිහා බලා කීවේ ඃ තරුණය ඔයාට ස්තුතියි. මම ඒකට ස්තුති කරනවා ඔහු ටිකට් පත ස්කෑන් කර ඔහුගේ ගේට්ටුවෙන් ගොස් ගුවන් යානයට නැග්ගා.

මගේ හදවත ගැහෙන්න පටන් ගත්තා. මම ඒක කලා.මම මගේ සාක්ෂිය හරහා සුභාරංචිය බෙදාගත්තා. ඒ කාලේ කරීම් සුභාරංචිය ඇසූ පරිවර්තනය කතාවක් මට නොතිබුණත් මම දන්න එක දෙයක් තිබෙනවා. මම බීජයක් වැපුරුවා. කරීම් කොහෙද යන්නේ ඒ කාලේ ඔහුගේ හදවතේ තිබුනේ කුමක්ද නැත්නම් එකම සැබෑ දෙවියන්වහන්සේව දැනගන්න ඔහු කොහෙද හිටියේ කියලා කවුද දන්නේ කොහොමහරි මම ඔහු සමඟ බෙදාගත් වචන ගැන මෙනෙහි කිරීමට ඔහුට ඕනෑ තරම් කාලය තිබුණා. මම ලෝකය ජයගත්තා වගේ හැඟීමෙන් මං මගේ ගේට්ටුවට ආපහු ගියා.මම පාඩමක් ඉගෙන ගත්තා.අපි අපගේ සේවය සඳහා සූදානම් උනානම් අපි උන්වහන්සේගේ සේවය සඳහා සූදානම් වූ විට දෙවියන්වහන්සේ අපව පාවිච්චි කිරීමට සූදානම් .

ඒ දවසේ මම දෙවියන්වහන්සේට ප්‍රකාශයක් කලා. උන්වහන්සේ කීර්තිමත් පුද්ගලයින්, මිතුරන්,සිල්ලර බඩු සාප්පුවේ ආගන්තුකයන් ඕනෑම කෙනෙකුට, ඕනෑම තැනක තවත් දිව්‍යමය හමුවීමක් නියම කලහොත් මම උන්වහන්සේගේ සුභාරංචිය ඔවුන් සමඟ බෙදාගැනීමට සූදානම්ව හා විශ්වාසවන්තව සිටිමි. වසරකට පසු මම සෑම සතියකම ඩලස් කව්බෝයිස් හී දේවගැතිවරයාට සේවය කරන අතර ඉතිරි වසර 10 තුළ වෘත්තීය ක්‍රීඩක ක්‍රීඩිකාවන් සිය ගණනක් වෙත ලගා වනු ඇතැයි මම දැනසිටියේ නැත.

ඉන්ටස්ටේස් බැටස් හී නිර්මාතෘ නෝම් මිල(ර්) සාක්ෂියක බලය විශ්වාස කරනවා පමණක් නොව නැතී වූවන්ට සාක්ෂිය ලබා ගැනීම සඳහා මම දෙවැනි නමින් ලාභ නොලබන සංවිධානයක් පවා ආරම්භ කළේ ය. I AM SECOND වෙබ් අඩවියේ සිය ගණනක් ප්‍රසිද්ධ පුද්ගලයින් ගේ සාක්ෂි වල අ,ආ,ඇ සම්මුඛ පරීක්ෂණ සංෛලයකින් බෙදාගනී. වෙබ් අඩවිය බොහෝ දැන්වීම් පුවරුවල ඇඩ්ලෙස ප්‍රවර්ධන කරන ලදී. ටෙක්ස්සාස්හී දවස් පුරා දසදහස් ගණනක් කුතුහලයෙන් කතා අසා ක්‍රිස්තුස්වහන්සේට තම ජීවිත පූජාකලහ.

ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි සාක්ෂි ,දරන පුද්ගලයින් පිළිබඳ අසංඛ්‍යාත උදාහරණ තිබේ. බොනෝ, ඩොලි පාර්ටන්, සැඩි රොබට්සන් සහ ටිම් ටෙබෝ වැනි කීර්තිමත් පුද්ගලයින් සාක්ෂීන් හරහා සුභාරංචිය බෙදාගැනීමට උත්සාහ කරති. සෑම කීර්තිමත් පුද්ගලයෙකුටම ලොවපුරා සුභාරංචිය බෙදාගත් නොදන්නා කිතුණුවන් දසදහස් ගණනක් සිටින බව මට විශ්වාසයි.

# ONE –TWO PUNCH KNOCKOUT (එක දෙක පහරක්)

ජීවිත කාලය පුරාම ක්‍රීඩාලෝලීයෙකු ලෙස මම සැම විටම පැරණි එක දෙක පන්ච් බොක්සිං ක්‍රීඩාවට ප්‍රියකල ඇත්තෙමි. මෙම එක දෙක පන්ච් යනු පහර දෙකක ප්‍රබල සංයෝජනයකි. සාමාන්‍යයෙන් වම් අතින් ඉලඇට වලට පහරක් එල්ල කරන අතර පසුව දකුණු අතින් ප්‍රතිවාදියාගේ මුහුණට පහරක් එල්ල කරයි. එය යේසුස්වහන්සේගේ ආඥාවට සමාන වන්නේ එක් කම්මුලකට ගැසුවොත් අනෙක් කම්මුල හරවන්න කියා ය.එය එම අණට පෙරළියක් ඇති කරයි. ප්‍රථිඵල සැම විටම පාහේ ප්‍රතිවාදියා නොකවුට් කිරීමකි. තරගය අවසන්. වෙනත් ක්‍රීඩා යෙදුම භාවිත කරන්නේ ඔවුන් එක් කණ්ඩායමක සුපිරි තරු දෙදෙනකු සිටින විට එම කණ්ඩායම නැවැත්විය නොහැකි බවයි.

එළිදරව් 12 යක්ෂයා බිමට වැටෙන එක දෙකක නොකවුට් පහරක් ගැන කතා කරයි. එය සැමවිටම ජයග්‍රහණය කරන ජීවිතයක් හා ස්වර්ගයේ රජු ඉදිරියට යාමට හේතු වේ. එහි අතීත,වර්තමාන සහ අනාගත ඇගවුම් 7 සිට 12 දක්වා පද ඇත. එහි දී ස්වර්ගයේ ඇති වූ අතීත යුද්ධයක් ඇති අතර එහි ප්‍රථිඵලයක් ලෙස යක්ෂයා ඔහුගේ දූතයා සමඟ පොළොවට හෙලනු ලැබීය.

> *"තවද ස්වර්ගයෙහි යුද්ධයක් විය. ඒ වනාහි මිකායෙල් සහ ඔහුගේ දූතයන් මහ සර්පයාට විරුද්ධව යුද්ධයට යාමය. මහ සර්පයාද තමාගේ දූතයෝද සටන්කොට, ජය නොලැබුවෝය, ඔවුන්ට ස්වර්ගයෙහි ස්ථානයක් තවත් නොවීය. මුළු ලෝකයා රවටන්නා වන යක්ෂයාය, සාතන්යයි කියනලද මහා සර්පයා නමැති ඒ පුරාණ සර්පයා පහතට හෙළනු ලැබුවේය; ඔහු පොළොවට හෙළනු ලැබුවේය. ඔහුගේ දූතයෝද ඔහු සමඟ හෙළනු ලැබුවෝය." - එළිදරව් 12:7 -9*

*මේ සියල්ලේ කේන්ද්‍රය යේසුස් වහන්සේ ය.*

සාතන් යක්ෂයා දැන් පොළොවේ සිටින අතර ඇදහිලිවන්තයන්ට චෝදනා කරයි. දිවා රාත්‍රී මෙය දැනට සිදුවෙමින් පවති.

ඇදහිලිවන්තයකු ලෙස යක්ෂයා හෝ ඔහුගේ දූතයන් විසින් නිරන්තරයෙන්ම ඔබව හෙළා දකින කෙනෙකු ලෙස ඔබ මෙයට ඇතුළත් වේ. ( අපි ඔවුන්ව යක්ෂයන් ලෙස හඳුන්වමු. )

> *"එවිටඃ අපගේ දෙවියන්වහන්සේගේ ගැළවීමද බලයද රාජ්‍යයද තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩුබලයද දැන් පැමුණුණේය. මක්නිසාද අපගේ දෙවියන්වහන්සේ ඉදිරිපිට රෑ දාවල් අපේ සහෝදරයන්ට වරදතබන්නාවූ, ඔවුන්ගේ වරදතබන්නා පහත හෙළනු ලැබුවේය." - එළිදරව් 12:10*

අනාගත සිද්ධියක් සම්බන්ධව දෙවියන්වහන්සේ අනාවැකියක ඇතුළාන්තයක් අපට දෙන සේක. සියලු දේ මෙසේ පවතින අතර එක දෙක නොකවුට් පන්ච් පහරක් යක්ෂයාව පරාජය කිරීමට සැම ඇදහිලිවන්තයකුටම භාවිතා කලයුතු වන්නේ අවසානයේ දී සදාකාලික ජීවනය අත්පත් කර ගැනීමටයි.

> *"ඔව්හු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද තමුන්ගේ සාක්ෂියේ වචනය නිසාද ඔහුගෙන් ජයගත්තෝය; ඔව්හු මරණය විඳින තරමට පවා තමුන්ගේ ජීවිතයට ප්‍රේම නොකර සිටියෝය." - එළිදරව් 12:11*

බැටළු පැටවාගේ රුධිරය සහ අපගේ සාක්ෂියේ වචනය යනු පීඩාව වෙනස් කරන ජයග්‍රාහී පියවර දෙක වන අතර එය අවසානයේ සදාකාලික ජයග්‍රහණය ගෙන එනු ඇත. අපගේ සාක්ෂියේ දී අප භාවිතා කරන රුධිරය සහ දෙවියන්වහන්සේගේ වචනය යන දෙකම ප්‍රකාශ කලයුතුය. එය අපගේ ජීවිත අභිමි වුවද කෙසේ වෙතත් අපගේ සාක්ෂිය සුභාරංචිය නොවන බව මතක තබා ගැනීම වැදගත් ය. සුභාරංචිය ප්‍රකාශ කිරීමට අප භාවිතා කරන්නේ එයයි. එය සියල්ලේ කේන්ද්‍රය වන්නේ යේසුස්වහන්සේ ය.

සුභාරංචිය බෙදාගැනීමේ දී ඔබ මෙම බලගතු ඵලදායි මෙවලම් දෙක භාවිතා කරනවා ද? ළිඳ ලග සිටි කාන්තාව ඒවා භාවිතා කල සමාරිය පුරා ඇගේ සාක්ෂිය බෙදාගත්තා ය. කිලියන් ද එසේ කළේ ය. ඔහු තම සාක්ෂිය හරහා සුභාරංචිය බෙදාගත් අතර ඒ නිසා ප්‍රාණ පරිත්‍යාගශීලි විය. 07 වන සියවසේ සහ ඉන් ඔබ්බට සිටි ගණන් කල නොහැකි ඇදහිලිවන්තයන් යේසුස්වහන්සේගේ රුධිරයෙන් පැමිණි සුභාරංචිය බෙදාගැනීමට ඔවුන්ගේ සාක්ෂි භාවිතා කර ඇත. අවසානයේ දී අපගේ සාක්ෂි හරහා සුභාරංචිය ඇසූ බොහෝ දෙනෙකු අපට හමුවනු ඇත.

මේ අතර සියවස අවසන් වූ අතර සුභාරංචි යෂ්ටිය ඊළඟ පරම්පරාවට ලබාදෙන ලදී.

# 9

# 700 ගණන් වල - ක්‍රියා කිරීමට අවස්ථාවයි

## නමුත්.. මා යාච්ඤා කරමි

*"ඊයේ ගෙවී ගොස් ඇත. හෙට තවමත් පැමිණ නැත. අපට ඇත්තේ අද පමණි. අපි පටන් ගනිමු." -තෙරේසා මවුතුමිය*

ක්‍රිස්තු වර්ෂ 700 දී සුභාරංචියේ යශ්ටිය ක්‍රියාකාරී පුරුෂයන් සහ ස්ත්‍රීන් අතර ස්ථිරවම භාර දෙන ලදී.

යුරෝපය වේගයෙන් සුභාරංචිය ප්‍රකාශයට පත් කරමින් පැවතුනද ජර්මනිය වැඩි ස්ථානවල මිථ්‍යා දෘෂ්ටිකවාදය සහා පිළිම නමස්කාරයට තවමත් බලකොටුවක් විය. රෝම ඉතිහාසඥයෙකු වන ටැසිටස් ලිව්වේ මේ කාලයේ ජර්මානුවන් අධික ලෙස මත්පැන් පානය කරන්නන් සහ සුදු කෙළින්නන් වූ බවත් ඔවුන්ගේ ගෝත්‍රික වීරයන් සහ දෙවිවරුන් පිළිබඳ පැවසීමට ප්‍රිය කළ බවත්ය. පූජනීය වනාන්තර මෙම දෙවිවරුන්ට ගෞරව කරන ලදී. මෙම ප්‍රදේශයේ සුභාරංචිය ප්‍රකාශ කිරීමට කැමති ඕනෑම යේසුස් වහන්සේගේ ගෝලයෙකුට වචනයෙන් හා ක්‍රියාවෙන් ක්‍රියා කිරීමද සිදුවනු ඇත.

ක්‍රිස්තු වර්ෂ 723 දී බොනිෆෝස්ගේ නායකත්වයෙන් යුත් ඇදහිලිවන්තයන් පිරිසක් එසේ කළහ. ගිගිරුම් සහිත දෙවියන් වහන්සේගේ නමින් නම් කරන ලද පූජනීය තෝර් වනාන්තරය අසල ජර්මනියේ ගෝත්‍රික ජනතාව සමඟ සුභාරංචිය බෙදා ගැනීමට ඔවුන්ට අවශ්‍ය විය. තෝර්ස් ඕක් නම් දැවැන්ත ගසක් වටා ඉදිකරන ලද සිද්ධස්ථානයකට නමස්කාර කිරීම සඳහා මිත්‍යා දෘෂ්ඨකයන් මෙම වනාන්තරයට රැස්වූහ. බොනිෆස් සහ ඔහුගේ මිනිසුන් විශ්වාසයෙන් යුතුව තෝර්ගේ වනාන්තරයට ගොස් යේසුස් වහන්සේ එකම සැබෑ දෙවියන් වහන්සේ බව ප්‍රකාශ කළහ. මෙම සුභාරංචිය සත්‍ය සහ බලවත් බව ඔප්පු කිරීමට බොනිෆස් සිතාගත නොහැකි දේ කළේය. මිථ්‍යා දෘෂ්ටිකයින් විශාල සංඛ්‍යාවක් බලා සිටියදී හෝ බොනිෆස් තෝර්ගේ ඕක් ගසට පොරවක් ගත්තේය. ඔහු ගසට පළමු පහර සමතලා කරන විට අහසින් අනපේක්ෂිත සුළඟක් හමා ගොස් ඕක් ගස පෙරළා දැමිය. ඕක් ගස බිමට කඩා වැටී එහි අතු ඔටුන්න කැඩී ගොස් සමාන කැබලි හතරකට පුපුරා ගියේය. මිථ්‍යා දෘෂ්ටිකයන් පුදුමයට පත් විය. උන්වහන්සේ වෙනත් ගසක එල්ලුන බව යේසුස් වහන්සේගේ පණිවිඩය මිථ්‍යා දෘෂ්ටිකයින් විසින් ඇසූ කළ ඔවුන් හැරුණහ.බොනිෆස් තෝර්ගෙ ඕක් ගසෙන් ලී ගෙන දේවස්ථානයක් ඉදි කළේය.

ඔවුන්ගේ නිර්භීත ක්‍රියාව බොහෝ මිථ්‍යා දෘෂ්ටිකයින්ට ගැලවීම ගෙන දුන්නේය.

මෙම සියවස පුරාවටම බොනිෆස් සහ තෝර්ගේ ඕක් වැනි කතා ඇසීමට හැකිවනු ඇත. අප ගේ බ්‍රහස්පතින්දා දිනයේදී අපට තවමත් තෝර්ගේ දිනය මතකයේ තිබුණත් බොහෝ මිථ්‍යා දෘෂ්ටික දෙවිවරුන් සම්පූර්ණයෙන්ම මකා දමා ඇති අතර වැඩි වැඩියෙන් ඇදහිලිවන්තයන්ගේ හදවත් මත සුභාරංචිය ලියා ඇත. සුභාරංචි යශ්ටිය මෙම විශ්වාසවන්ත ක්‍රියාකාරී පුරුෂයන් සහ ස්ත්‍රීන් සමඟ ඔවුන්ගේ යහපත් අතේ රැඳී තිබුණි.

## ඔබ යා යුතුයි

බ්‍රවුන්ස්වීල් පිබිදීමේ දේව සේවා පාසල 90 දශකයේ අග භාගයේදි ෆ්ලෝරිඩාවේ පෙන්සකෝලාහි කුඩා ආරම්භක බයිබල් පාසලක් විය. ලොව පුරා සුභාරංචිය ප්‍රකාශ වීමට කිරීමට දැඩි උනන්දුවක් දැක්වූ සිසුන් සහ කාර්‍ය මණ්ඩලයෙන් පාසල පිරී තිබිණි. අපි සෑම සති අන්තයකම පෙන්සකෝලා පුරා පොදු ස්ථානවල සුභාරංචිය බෙදා ගත්තෙමු. අපට සුභාරංචිය සඳහා ක්‍රියාකාරී පාසලක් විය. හොඳයි අපගේ බොහෝ දෙනෙක් එසේ වූහ.

මගේ පාසලේ අවුරුදු තුන තුළ මට අපූර්ව අමතක නොවන කාමර සගයන් බොහෝ දෙනෙක් සිටියහ. ක්‍රිස් නිසැකවම කැපී පෙනේ.මගේ පාසලේ දෙවන වසර අවසන් වන විට ඔහු මගේ කාමර සගයා බවට පත් වූ අතර වහාම මාව විශ්මයට පත් කළේය. දිනෙන් දිනක් ක්‍රිස් ඔහුගේ කාමරයේ පැය

ගණනක් යාච්ඤා කළේය. සමහර විට නිවසේ අනෙක් අය ඔහු යාච්ඤා කරන විට සිනාසෙනු ඇත. මන්ද ක්‍රිස් දෙවියන් වහන්සේ බිහිර යැයි සිතුවා විය යුතු යැයි අපි උපකල්පනය කළෙමු. ක්‍රිස් වචනාර්ථයෙන් දෙවියන් වහන්සේට තමයි ඉල්ලීම් කෑ ගසනු ඇත.

නමුත් අපට වැඩිපුරම ඇහුනේ එක යාච්ඤාවක් පමණයි. පැයෙන් පැයට දවසින් දවස සතියෙන් සතියට ක්‍රිස් පෙන්සකෝලා බේරා ගන්න කියා යේසුස් වහන්සේට කෑ ගැසුවේය. ඔහු උදේ පාන්දර පාසලෙන් ගෙදර එන විට අපි හැමෝම නිදාගැනීමට උත්සාහ කරන විට රාත්‍රියේ ප්‍රමාද වී අපි නගරයේ සුභාරංචිය ප්‍රකාශ කරමින් සිටියදී පවා මෙසේ යාච්ඤා කළේය. අධ්‍යන වාරය අවසන් වීමට ආසන්නව ක්‍රිස් කලබල වී මගෙන් ඇසුවා දෙවියන් වහන්සේ ඔහුගේ යාච්ඤාවලට පිළිතුරු නොදෙන්නේ ඇයි කියා. ඔහුගේ සියලු යාච්ඤාවලදී ඔහු කිසිවකුත් ක්‍රිස්තුස් වහන්සේ වෙතට පෞද්ගලිකව කිසිවෙකු හැරී නැති බවත් ඔහු පැමිණිලි කරේය.

" ක්‍රිස් දෙවියන් වහන්සේ පෙන්සකෝලා පුරා මිනිස්සුන්ව බේරගන්නවා " මම කෑ ගැසුවෙමි.

" ඒසේ නම් දෙවියන් වහන්සේ මාව පාවිච්චි නොකරන්නේ ඇයි? මම ඒක අත්විඳලා නැත්තේ ඇයි? "

" ඔයා යන්නම ඕනේ මම ඔහුට කීවෙමි. දවස පුරා යාච්ඤාව කර දෙවියන් වහන්සේ ක්‍රියා කරයි කියා බලාපොරොත්තු වෙන්න බෑ. ඔබගෙ යාච්ඤාව ක්‍රියාවන් එක සම්බන්ධ කළ යුතුයි. "

ක්‍රිස්ට ඒක තේරුනා. ඔහු යාච්ඤා කළා. ඔහු ගියා. ඒ වගේම පෙන්සකෝලා පුරා බොහෝ දෙනෙකුට සුභාරංචිය ගෙන ඒමට දෙවියන් වහන්සේ ඔහුව පාවිච්චි කළ සේක.

## දෙවියන් වහන්සේ යන්නාවූ අය සමඟ යන සේක

මිලියන සියයකට අධික පිරිසකට සුභාරංචිය දේශනා කළ දෙවියන් වහන්සේ වෙතට ගිය රයින් හාඩ් බොන්කේ බොහෝ විට පැවසුවේ " දෙවියන් වහන්සේ යන අය සමඟ යයි . ඔහු වාඩි වී සිටින්නන් සමග වාඩිවෙන්නේ නැත.නිදා ගන්නන් සමග නිදාගන්නේ නැත. නැතහොත් කතා කරන්නන් සමඟ කතා කරන්නේ නැත. ඔහු යන්නන් සමඟ යයි " යනුවෙනි.

*දෙවියන් වහන්සේට තනිවම ලෝකය බේරා ගත හැකිය, නමුත් පුදුමයට කරුණක් නම්, උන්වහන්සේ අප සමඟ හවුල් වීමට තීරණය කර ඇත.*

ඔව් . අපි තුන්වන පරිච්ඡේදයේ දුටු පරිදි යාච්ඤා කළ යුතුයි. නමුත් එවැන්ජලිස්තසේවයට යාච්ඤාව කිරීමට වඩා වැඩි යමක් තිබේ. අපි කරන්නේ යාච්ඤා කිරීම පමණක් නම් අපි ක්‍රිස්තුස් වහන්සේ මෙන් නොවන්නෙමු. සැම විටම අන් අයගේ ගැලවීම සඳහා කෑගසමින් නමුත් අපගේ යාච්ඤාවට පිළිතුරු කිසි විටෙකත් නොදකිමු. බොහෝ විට ක්‍රිස්තුස්වහන්සේ ගැන එම පුද්ගලයාට පැවසීමට වඩා ගැලවීම සඳහා යාච්ඤා කිරීම පහසු බව මට පෙනේ. ඔබ අත් විඳ තිබේද? කර තිබේද?

දෙවියන් වහන්සේට තනියම ලෝකය බේරා ගත හැකිය. නමුත් පුදුම සහගත ලෙස උන්වහන්සේ අප සමග හවුල් වීමට තීරණය කර ඇත. බොහෝවිටක යමෙකු ක්‍රියාමාර්ග ගෙන එම පුද්ගලයා සමග සුභාරංචිය බෙදා ගන්නා තෙක් දෙවියන් වහන්සේ පුද්ගලයෙකුට ගැලවීම ගෙන ඒමට බලා සිටිනු ඇත. බොහෝ විට වචනයක් පැවසූ පසු දෙවියන් වහන්සේ සෙලවෙන සේක. මෙය කාලයේ ආරම්භයේ සිටම රටාවක් වී ඇත .

> *"පොළොව වනාහි පාළුව හිස්ව තිබුණාය; ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජලමතුයෙහි හැසිරෙමින් සිටිසේක. දෙවියන්වහන්සේ: එළිය වේවයි කීසේක; එවිට එළිය විය." - උත්පත්ති 1:2-3*

සැරි සැරීම ලෙස පරිවර්තනය කර ඇති හෙබ්‍රෙව් යෙදුමෙන් අදහස් කරන්නේ තම පැටවුන්ගේ කූඩුව මත ප්‍රේමණීය සැලකිල්ලෙන් සැරිසරන රාජාලියෙකු ගැනයි. (ද්විතීය කතාව 32:11 බලන්න) ශුද්ධාත්මයාණන් වහන්සේ නොගැලපෙන ලෝකය මත කොපමණ කාලයක් ආදරයෙන් සැරිසැරුවාදයි කවුද දන්නේ? සමහර විට එය දවසක් විය හැකිද? දශකයක් විය හැකිද? සමහර විට එය සහස්‍ර මිලියනයක් විය හැකිද? මම නොදනිමි.නමුත් පැහැදිලි දේ නම් පෘතුවිය නිර්මාණය වූයේ වචනයක් පැවසීමෙන් පසුව පමණක් බවයි. මෙම කතාවෙන් අපට ඉගෙන ගත හැකි අධ්‍යාත්මික අවබෝධයක්

තිබේ. වචනයක් කතා කරන විට දෙවියන් වහන්සේ චලනය වන සේක. උන්වහන්සේ එදා එසේ කළ සේක. උන්වහන්සේ තවමත් චලනය වන සේක. අපි වචනය කතා කළ යුතු අතර පසුව දෙවියන් වහන්සේ ගැලවීමේ ආශ්චර්ය කරන ආකාරය බලා සිටිය යුතුය.

ඵලදායි එවැන්ජලිස්ත සේවය ඇවිදීම හා සමාන බව බොන්කේ සඳහන් කළේය. ඇවිදීමට කකුල් දෙකක් අවශ්‍ය වේ. එක් කකුලක් පියවර තබයි. පසුව අනෙක් කකුල. එබැවින් සුභාරංචියට කකුල් දෙකක් අවශ්‍ය වේ. එක් කකුලක් යාච්ඤාව යි.අනෙක් කකුල දේශනා කිරීමයි. අපි දෙකම භාවිතා කළ යුතුයි. එසේ නොමැති නම් අපි රවුමක පනිනවා කොහේවත් යන්නේ නැතුව.අපි යාච්ඤා කරන විට අපගේ යාච්ඤා කකුල ශක්තිමත් වේ. අපි දේශනා කරන විට අපගේ දේශනා කකුල ශක්තිමත් වේ. අපගේ පාද ශක්තිමත්වන තරමට අපද ඵලදායි වනු ඇත.අපි යාච්ඤා කරමු. අපි දේශනා කරමු. අපි ඇවිදිමු.

*ඔබ විශ්වාසවන්තව යාච්ඤා කොට දේශනා කරන්නේ නම් ඔබගේ ඇවිදීම සෙමින් දිවීමක් බවට පත්වන්නේය සහ ඔබ එය දැනගත් කල ඔබ ශුභාරංචියේ යෂ්ටිය ගෙන බලයෙන් පූර්ණව අභිෂේකයෙන් යුක්තව සහ ඵලවලින් පිරී දුවනු ලබන්නේය.*

ඔබ විශ්වාසවන්තව යාච්ඤා කොට දේශනා කරන්නේ නම් ඔබගේ ඇවිදීම සෙමින් දිවීමක් බවට පත්වන්නේය සහ ඔබ එය දැනගත් කල ඔබ ශුභාරංචියේ යෂ්ටිය ගෙන බලයෙන් පූර්ණව අභිෂේකයෙන් යුක්තව සහ ඵලවලින් පිරී දුවනු ලබන්නේය. මාගේ මිත්‍ර ක්‍රිස් මේ පාඩම ඉගෙන ගත්තේය සහ ඔබටද එසේ කළ හැකිය.

# කුඩා පියවර යෝද පිම්මකි

නීල් ආම්ස්ට්‍රෝන් සඳ මත පළමු පියවර තැබූ විට පැවසූ දේ ඔබට මතකද? ඉතිහාසයේ වඩාත්ම ප්‍රසිද්ධ ඒක-පදාර්ථයක් බවට පත් වන දේ ඔහු ප්‍රකාශ කළේය.එය මා සමග කියන්න."එය මිනිසාට කුඩා පියවරක් මනුෂ්‍යය වර්ගයාට දැවැන්ත පිම්මක්.ඒ වගේම එසේ විය. අභ්‍යවකාශ ඉතිහාසය සදහටම වෙනස් විය.

පළමු පියවර බොහෝ විට ඔබ ගන්නා දුෂ්කරම පියවරයි. එය විසිගනන් වල මැද බාගයේදී මම නත්තලට ජිම් සාමාජිකත්වයක් ලබා ගත්තෙමි. ඒක මටම ලැබුනු තෑග්ගක්. මම අවුරුදු ගණනක් තිස්සේ ජිම් එකක ව්‍යායාම කර නැති නිසා මම ආයෙත් හැඩට එන්න ආසාවෙන් සිටියෙමි. ජනවාරි පළවෙනිදා මම මගේ කාර් එකට නැගලා ජිම් එකට ගියා. ලං වෙනකොට මට ඇත්තටම යන්න ඕනද කියලා මම ප්‍රශ්න කරන්න පටන් ගත්තා. මම කියන්නේ ඒක නිවාඩුවක්. ඕ! මට කිසිම ආකාරයක ව්‍යායාම සැලැස්මක් තිබුනේ නැත. ඒ වගේම සහ ව්‍යායාම කිරීමට අකමැති වීම ගැන නිදහසට කරුණු මගේ මනසට ගලා ආවේය. මම පැය විසි හතරක යෝග්‍යතාවයට යොමු උනේ මේක හොඳ අදහසක්ද කියලා ඇත්තටම විශ්වාසය නැතුවයි.

හැමෝම පරිපූර්ණ හැඩයෙන් සිටියා නම් මට කිසිම බරක් උස්සන්න බැරි නම් මොකද වෙන්නේ?

මම මෝඩයෙක් වගේ පෙනුනොත් හෝ එයාලගේ යන්ත්‍රයක් පාවිච්චි කරන්න දන්නෙ නැත්තන් මොකද කරන්නෙ? මොකද? මොකද? මොකද? මම විනාඩි දහයක් ජිම් එක දිහා බලාගෙන වාහනය නවත්වන තැන මගේ කාර් එකේ වාඩි වී සිටියා. මිනිස්සු ආවා ගියා ඒත් මට යන්තන් හෙල්ලෙන්න පුළුවන් උනා.

අන්තිමේදි මගේ කාර් එක ආපහු පන ගන්වලා එතනින් අයින් වෙලා ගියා. මම කවදාවත් ජිම් එකට ඒ මුල් පියවර තිබ්බෙ නැහැ. ඒක හරිම අමාරුයි.

බොහෝ අය ඉවැන්ජලිස්ට සේවය සමග මේ ආකාරයෙන් සිටින බව මට පෙනේ. ඔවුන්ට ශ්‍රේෂ්ඨ අභිප්‍රායක් ඇත. නමුත් ඔවුන්ගේ නොගැලවූ මිතුරන්ට කිස්තුන් වහන්සේ ගැන පැවසීමට කාලය ආසන්න වන විට ඔවුන් එයින් මිදීමට පටන් ගනී. ඔවුන් මට පිස්සු යැයි සිතුවොත් කුමක් කල යුතුද? මට ඔවුන්ගේ ප්‍රශ්න වලට පිළිතුරු දිය නොහැකිනම් කුමක් කල යුතුද? මම වැරදි දෙයක් කිව්වොත් කුමක් කල යුතුද?එසේ නම් එසේ නම් එසේ නම් කුමක් කල යුතුද?ඔවුන් එය දැනගැනීමට පෙර ඔවුන් කිසි විටෙකත් ශුභාරංචිය බෙදා නොගෙන සංවාදයකින් ඉවත් වෙමින් සිටී. ඔවුන් සාර්ථකව ඔප්පු කර ඇත්තේ

විශ්ලේෂණය හරහා අංශබාගය අපි යමක් අධික ලෙස විශ්ලේෂණය කරන තරමට එම පලමු පියවර තැබීමෙන් අපවම අංශබාග තත්වයට පත් කර ගනිමු.

ඕනෑම දෙයක් සම්බන්ධයෙන් එය එසේ නොවේද?පොතක් ලිවීම, කෙනෙකු සමග හමුවීමක් ඉල්ලා සිටීම දියේ ගිලීමට හෝ උසකට යාමට ඇති බිය ජය ගැනීම,ව්‍යාපාරයක් ආරම්භ කිරීම හෝ නව භාෂාවක් ඉගෙනීම ඒ සියල්ලටම එම පලමු පියවර අවශ්‍ය වේ. ඔබ වටා සිටින අය සමග සුභාරංචිය බෙදා ගැනීමට සහ ඉතිහාසය සඳහටම වෙනස් කිරීමට දෙවියන් වහන්සේ ඔබව භාවිතා කිරීමත් එසේමය.

තාත්තා කෙනෙක් විදිහට මගේ දරුවන් ඇවිදීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ආකාරය මම දැක තිබේ.එය සුන්දර නැත.පලමු පියවරකට බොහෝ විට මුහුණු ආවරණ,පැලුණු තට්ටම් සහ එම පලමු පියවර තැබීමට පෙර වීඩියෝ නැවත ගැනීම් රාශියක් ඇතුළත් වේ. එවිට විශ්වාසය ගොඩ නැගේ. වැඩිකල් නොගොස් වීඩියෝ වේගයෙන් පැනීම් සහ පෙරලීම්වලින් පිරී ඇති අතර මගේ දරුවන්ගෙන් සහ මගේ සිනහව හා ප්‍රීතිය බොහෝය. නමුත් එම සිනහව හා ප්‍රීතිය රඳා පවතින්නේ එම පලමු කුඩා පියවර මතය. කුඩා පියවර සුභාරංචිය සඳහාද විශාල ජයග්‍රහණය කරා යොමු කරයි.

## අද ගැලවීමේ දිනයයි

*කුඩා පියවරයන් ශුභාරංචිය , උදෙසා විශාල ජයග්‍රහණ කරා යොමු කරයි.*

ඔබ වසර ගණනාවක් තිස්සේ යාච්ඤා කරමින් සිටි අයට සුභාරංචිය ඇසීමට අද දිනයයි. දැන් කාලයයි ඔබට එය කල හැකිය. ක්‍රියා කිරීමට කාලයයි. ඔබ යාච්ඤා කරමින් සිටි මිතුරාට දිවා ආහාරයට ආරාධනා කර ඔබේ සංවාදය අතරතුර යම් වේලාවක සුභාරංචිය බෙදා ගන්න . ඔබේ සිල්ලර බඩු ස්කෑන් කරන මුදල් අයකැමි සමග සුභාරංචිය බෙදාගන්න . ඔබේ අසල්වැසියාට එක වරම ඔබේ තණකොළ වලට වතුර දමන්න . එවිට ඔබට උපාය මාර්ගව සුභාරංචිය තුලට ලිස්සායා හැකිය.

හිතෝපදේශ 13 4 පවසන්නේ සිහින දකින්නා ආශා කරන නමුත් කිසිවක් නොලැබේ.නමුත් කඩිසර අයගේ ආශාවන් සම්පූර්ණයෙන්ම තෘප්තිමත් දේ කියායි.

සිහින දැකීමට කාලයක් සහ ක්‍රියා කිරීමට කාලයක් තිබේ. ඔබේ පවුලේ සාමාජිකයා, මිතුරා, අසල්වාසියා හෝ සගයා ක්‍රිස්තුන් වහන්සේ වෙතට පැමිණීම ගැන ඔබ සිහින මැව්වාද? ඔබ යාච්ඤා කරමින් සිටියත් දේශනා කර තිබේද? වචනවලින් ක්‍රියාවට යාමට කාලයයි. ඔබ අවට සිටින අයව විප්ලවාකාරී ලෙස පරිවර්තනය කරන සුභාරංචිය නැරඹීමෙන් ඔබ සිටින්නේ එක් පියවරක් සහ එක් සංවාදයක පමණි.

*ඔබ ශුභාරංචිය නැරඹීමෙන් ඔබ වටා සිටින අයව විප්ලවකාරී ලෙස පරිවර්තනය කිරීමට ඇත්තේ එක් පියවරක්, එක් සංවාදයක් පමණි.*

බොනිෆේස් සහ ඔහුගේ කාර්යමණ්ඩලයට එය කෙසේදැයි මම කල්පනා කරමි. ගෝත්‍රික ජනතාවට සුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා ඔවුන්ගේ සිහිනයත් ආශාවත් විය. ඔවුන්ට තෝර් වනාන්තරයට සුභාරංචිය ගෙනයාම සඳහා උපාය මාර්ග සකස් කල හැකිව තිබුණි. මගේ පැරණි කාමර සගයා වන ක්‍රිස් මෙන් ඔවුන්ට දවස පුරාම වනන්තරයේ සිටින මිනිස්සුන් වෙනුවෙන් යාච්ඤා කල හැකිව තිබුණි. ජර්මනිය බේරෙයි කියා ඔවුන්ට ප්‍රාර්ථනා කරන්න තිබුණා. නමුත් ඔවුන් ඒ ගැන යමක් කළා. ඔවුන් කඩිසරව ඔවුන්ගේ සැලසුම ක්‍රියාත්මක කර ගස දෙසට පියවරක් තැබුවා.

වනාන්තරයට යන සෑම පියවරක් සමගම නිර්භීතකම සහ ශක්තිය වර්ධනය විය. සෑම අයට ඔවුන් සුභාරංචිය බෙදා ගත් විට ඔවුන්ගේ බිය ඇදහිල්ලට මාරු විය. එකිනෙකා තුළින් සුභාරංචියේ පණිවිඩය වනාන්තරයට පැතිර ගියේය. ඔවුන් තෝර් ඕක් වෙත ළඟා වෙන විට එය සුභාරංචිය අසන්නා වූ අයගේ මාර්ගයේ සිටිනවා දැක ඔවුන් එකෙනෙහිම ක්‍රියා කාරි විය. ගස කඩා වැටුණි සහ සුභාරංචියේ පණිවිඩය ජර්මනිය පුරාවට පැතිර ගියේය.

වසර සිය ගණනකට පෙර ශාන්ත ඔගස්ටීන් ප්‍රකාශ කළේ;"සියල්ල දෙවියන් වහන්සේ මත රඳා පවතිනවාක් මෙන් යාච්ඤා කරන්න. නමුත් යමෙකු ගැලවීම ලබන්නේ නම් සියල්ල ඔබ මත රදා පවතිනවාක් මෙන් ක්‍රියා කරන්න." යනුවෙනි.

# 10

# 800 ගණන් වල - ප්‍රේමය

## නමුත් ... මගේ පවුල සහ මිතුරන් මා නොදනිම්

*" ලෝකය දේව ධර්ම හෝ මූලධර්ම තේරුම් නොගනී.නමුත් එය ආදරය සහ අනුකම්පාව තේරුම් ගනී " - ඩී. එල් මූඩි*

ග්‍රීසියේ බයිසෙන්තියානු හමුදාවෙ උසස් නිළධාරියෙකු සහ ඔහුගේ ස්ලාවික් බිරිඳ ක්‍රි.ව 824 සහ ක්‍රි.ව.826 දී පුතුන් බිහි කළහ. මෙතෝඩියක් සහ ඔහුගේ බාල සොහොයුරා වන සිරිල් සාමාන්‍ය සහෝදරයන් වූහ. ඔවුන් එකට සෙල්ලම් කළහ. එකට සිනාසුනාහ. රන්ඩු දබර සහ වාද විවාදද කළහ.ඔවුන්ගේ දෙමාපියන්ට ඔවුන්ට හොඳම දේ අවශ්‍ය වූ අතර අධ්‍යාපනය සහ සාර්ථකත්වය සඳහා කැපවූ නිවසක් නිර්මාණය කළහ.

සහෝදරියන් තරුණයන් බවට කොන්ස්තන්තිනෝපල් හී ඉම්පීරියල් පාසලේ අධ්‍යාපනය ලැබූහ. සිරිල් පාසලේ දර්ශනය පිළිබඳ මහාචාර්යවරයකු බවට පත්වන අතර මෙතෝඩියක් ආණ්ඩුකාරවයෙක් බවට පත්විය. ඔවුන්ගේ හැදී වැඩීම ගැන වැඩි යමක් නොදන්නා නමුත් මඟ දිගේ කොහේ හරි ඔවුන් දෙදෙනාම යේසුස් වහන්සේගේ අනුගාමිකයන් බවට පත් වූහ.

ඔවුන්ගේ පවුලේ අය අධ්‍යාත්මික කැඳවීම් වෙනුවට වෘතීන් කෙරෙහි අවධානය යොමු කළ ද සහෝදරයන් තම හැදී වැඩීම ඔවුන්ගේ පවුලේ අයට සහ මිතුරන්ට සුභාරංචිය බෙදා ගැනීමෙන් වළක්වා ගැනීමට ඉඩ දුන්නේ නැත. නිසැකවම මෙම උගත් සහෝදරයන් දේශපාලනය හෝ දර්ශනය වෙනුවට ක්‍රිස්තුස් වහන්සේ ගැන කතා කිරීමට වැඩි උනන්දුවක් දක්වන්නේ මන්දැයි ඔවුන්ගේ පවුලේ බොහෝ සාමාජිකයන්ට ප්‍රහේලිකාවක් විය.

ඔවුන්ගේ ස්ලාවික් ( නැගෙනහිර යුරෝපයේ ) පරම්පරාව කෙරෙහි ඔවුන්ගේ ආදරය වර්ධනය විය. සහෝදරයන් තම වෘත්තීන් අතහැර තම මව්බිමේ මිෂනාරිවරුන් ලෙස එකට වැඩ කළහ. ස්ලාවික් කලාපයේ සෑම කෙනෙකුටම මෙම සුභාරංචි පණිවිඩය අසා කියවීමට ඔවුන්ට අවශ්‍ය විය. ඒ කාලයේ ස්ලාවික් භාෂාවට ලිඛිත භාෂාවක් නොතිබුණු බැවින් සිරිල් ස්ලාවි හෝඩිය ඉගෙන ගත් අතර පසුව ඔහුගේ සහෝදර මෙතෝඩියස් සමඟ ශුද්ධ ලියවිලි ස්ලාවි භාශාවට පරිවර්තනය කිරීමට පටන් ගත්තේය

එසේම ස්ලාවික් භාශාවේ හා ජනතාවගේ සිරිත් විරිත් වල සුවිශේෂී බව නිසා සිරිල් සහ මෙතෝඩියස් ඔවුන්ව ආදරෙයෙන් රුස් ලෙස හැඳින්වූහ. ඔවුන් තමන්ව සහෝදරයන්ගේ ජීවිත හා පණිවිඩයට කොතරම් ආදරය කලාද යත් රූසින් දැන් රුසිනි රුස්ගේ දරුවන් ලෙස හැඳින්වීමට පටන් ගත් ජනතාව සහ ඔවුන්ගේ ප්‍රදේශයේ භූමිය මෙලෙස හැඳින්වේ. මෙම නව ඇදහිලිවන්තයන් ඔවුන්ගේ ස්ලාවික් භාෂාවෙන් දෙවියන් වහන්සේට ප්‍රේම ගීත ගායනා කිරීමේ අදහසද සහෝදරයන් විසින් ඉදිරිපත් කරන ලදී. මේ කාලය වන තුරු නමස්කාර ගායන කර ලැබුවේ ලතින් හෝ ග්‍රීක භාශාවෙන් පමණි.

මෙම සහෝදරයන් එකිනෙකා කෙරෙහි සහ රුසින්හි ජීවත් වූ අය කෙරෙහි දැක්වූ ප්‍රේමය සුභාරංචිය සියලු දෙනාගේ හදවත් තුළ ඉක්මනින් මුල්බැස ගැනීමට ඉඩ සැලසීය. මෙම සහෝදරයන් දැන් පවුලේ අය ඇතුළුව සැමට අති ප්‍රේමයෙන් ගලා එන සුභාරංචි ප්‍රතිඵලය නිරූපණය කළහ. ක්‍රි.ව. 864 වන විට රුසින් ජනතාව තමයි ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයන් බව ප්‍රීතියෙන් ප්‍රකාශ කළහ. අද වන විට මෙම සහෝදරයන් දෙදෙනත් තවමත් ස්ලාවික් ජාතිකයන්ගේ අපොස්තලවරුන් ලෙස හැඳින්වේ.

නව වන සියවස ඊට පස්සේ මෙම සහෝදරයන් සහ අනෙකුත් අය පෙන්නු අව්‍යාජ ප්‍රේමය සුභාරංචියේ යෂ්ටියේ රථයේ වේගයෙන් ඉදිරියට ගෙන ගියේය.

# THE GO(NG)SPEL

ඔබ කාර්‍යය බහුල නගරයක ඔබේ මිතුරන් සමඟ සිටින විට කෙලවරක සිටින පුද්ගලයෙකු ශුද්ධ ලියවිලි පද කෑ ගසන හඬ ඇසෙන විට ඔබේ මනසට හැගෙන්නේ කුමක්ද ? ඔබට සුභාරංචිය

ඇසෙනවාද ? නැතහොත් ඔහු පවසන දේට කන් නොතබනවාද ? ඔබ ඔහුගේ පණිවිඩය වඩාත් ප්‍රතිචාර දක්වනවාද ? නැතහොත් එය වඩාත් පිළිකුල් සහගතද ?

එක් සීතල හැන්දෑවක ස්විට්සර්ලන්තයේ සූරිච්හි ග්‍රොස්මින්ස්ටර් වල මම සහ මගේ බිරිඳ සිටගෙන සිටියෙමු. අපගේ හදවත් බිඳී ගියෙමුව. මෙම සුන්දර දොලොස් සියයක පල්ලියේ මලුව මැද මැදිවියේ මිනිසෙක් සිටියේ ය. පාපයේ ප්‍රතිවිපාක සහ ක්‍රිස්තුස් වහන්සේ නොමැති නිරයක යතාර්ථය පිළිබඳ ශුද්ධ ලියවිලිමය අනතුරු හැඟවීම් ඔහු තම හඬින් කෑ ගැසුවේය. ඔහු පැවසූ සෑම දෙයක් ම බයිබලානුකූලව නිවරැදි විය. මෙය අපගේ හදවත් වලට මහත් ප්‍රීතියක් ගෙනදුන්නේය. දුක ඇතිවූයේ ඔහු පැවසූ දෙයින් නොව ඔහු එය පැවසූ ආකාරයෙන් සහ ජනතාවගේ ප්‍රතිචාරයෙන් ය. මේ මිනිසාගෙන් කිසිම ප්‍රේමයක් නොමැතිව බවක් පෙනෙන්නට තිබුනි.

ඔහු ඇවිද යන සෑම ආගන්තුකයෙක්ටම කෑ ගැසුවේය. ඔහු ඔවුන්ව වසර ගණනාවක් තිස්සේ හඳුනනවාක්මෙනි. ඔවුන් ඔහුට දරුණුතම වේදනාවක් ඇති ඇති කළහ. සෑම මගියෙක්ම ඇස් හරවා තෝරා ගත හැකි වචන කිහිපයක් කියමින් ඉදිරියට ගියහ. මේ මිනිසා පසුකර යන සිය ගණනක් අපි බලා සිටියෙමු. ඔහු කිව්වා වූ කිසිම දේක සම්පූර්ණ වාක්‍යයක් වත් කිසිම කෙනෙකුට ඇසුනේ නැත.

ඉඳහිට ඔහු මගේ භාරයාවගේ සහ මගේ මුහුණ දෙස බැලූ අතර ඔහු අපටද කෑ ගැසුවේය. මා සාමාන්‍ය සිනාවකින් ඔහුට ඇහුම්කන් දුනිමි. මිනිත්තු 10 කට පමණ පසු ඔහුගේ බයිබලය ඔහුගේ බෑගය තුළට දමාගත් ඔහු එම ස්ථානයෙන් ඉවතට ඇවිද ගියේය. මා ඔහුව නවත්වා ඔහුගේ නිර්භීතමක ගැන ඔහුට කතා කරනු ලැබුවත් මම ඔහුට කියපු දේ ගැනද ඔහු කෑ ගැසුවේය. අවසානයේ මිනිත්තු 2-3 කට පසු ඔහුට එය ඒත්තු ගැන්වීමට උත්සහ දැරූ අතර මම ඔහුගේ ඇස් දෙස බලා මා ඇදහිලිවන්තයෙක් යැයි කීවෙමි. ඔහුද ස්තුතියි කියා ගියේය. අපි නැවත් ඔහුව නොදුටුවේය.

*ආදරය ඉවත් කරන්න, එවිට මුළු බයිබලයම බිමට කඩා වැටෙනු ඇත.*

පාවුල්ගේ වචන මාගේ කන්වලට දෝංකාර දුන්නේ කොරෙන්තිවරුන්ට කියන ලද පාවුල්ගේ වචන එම සන්ධයාවේදී අපගේ හදවත් වලට රැව් පිලි රැව් දුන්නේ ය. මිනිස්සුන්ගේ භාශාවෙන් හෝ දේවදූතයන්ගේ භාශා වලින් මා කතා කරතත් මට ප්‍රේමය නැත්නම් මම හඬ නගන අත්තලකට සමානය.

බයිබලයේ සම්පූර්ණ පණිවිඩය ප්‍රේමය තුළ ගොඩනැගී ඇත.

*දෙවියන්වහන්සේ ලෝකයාට ප්‍රේම කළ සේක. (යොහාන් 3:16 )*

*දෙවියන්වහන්සේ ප්‍රේමය. ( 1 යොහාන් 4:8 )*

*සියල්ල ට වඩා ප්‍රේමය උතුම් ය. ( 1 කොරෙන්ති 13:13 )*

*ප්‍රේමය බොහෝ පව් රාශියක් වසන්නේය. ( 1 පේතෘස් 4:8 , හිතෝපදේශය 10:12 )*

පරණ ගිවිසුමේ පන්සියයකට කට වඩා නියෝග සටහන්ව ඇත.ව‍යවස්ථාවේ ගුරුවරයෙක් යේසුස්වහන්සේව උපක්‍රමශීලීව හසු කරගැනීම සඳහා උන්වහන්සේගෙන් ඇසුවේ මේ සියලූ නියෝග වලින් උතුම්ම නියෝගය කුමක්ද කියාය. යේසුස් වහන්සේගේ ප්‍රතිචාරය විශ්මයජනකය. යේසුස් වහන්සේ කුමක්ද කියන්නේ යැයි ඇසීමට සියල්ලෝම ඒ වටා රැස්වූහ.

*"උන්වහන්සේ ඔහුට කථාකොට: නුඹේ මුළු හෘදයෙන්ද නුඹේ මුළු ආත්මයෙන්ද නුඹේ මුළු බුද්ධියෙන්ද නුඹේ දෙවිවූ ස්වාමීන්වහන්සේට ප්‍රේමකරව. මේක උතුම්වූ පළමුවෙනිවූ ආඥාවය. මෙය හා සමාන දෙවෙනි එකක් තිබේ, එනම්, නුඹට මෙන් නුඹේ අසල්වාසියාට ප්‍රේමකරව යනුය. මේ ආඥා දෙක පිට මුළු ව්‍යවස්ථාවත් අනාගතවාක්‍යයත් පිහිටා තිබේයයි කීසේක." -මතෙව් 22: 37 - 40*

ප්‍රේමය

සියලුම ශුද්ධ ලියවිලි ප්‍රේමයෙහි එල්ලී තිබේ. එල්ලි තිබීම යන වචනයට ග්‍රීක් පදය වන්නේ Kremannymi. යම් පුද්ගලයෙක් පින්තූරයක් එල්ලා තැබීම මෙම වචනය පාවිච්චි කරනු ලබයි. තවත්

ආකාරයකට කිවහොත් එම සම්පූර්ණ පින්තුරයේ රඳවා තිබෙන්නේ ප්‍රේමය නමැති ඇනේ මතය. එම ප්‍රේමය අහකට ගතහොත් සම්පූර්ණ බයිබලය පොළොවට කුඩු වී කඩා වැටේ.

අපගේ ශුභාරංචිය නැමැති දීමනාව ප්‍රේමයෙන් ඔතා නැත්නම් කිසිවෙක් එය ලබාගැනීමට ආශාවන්නේ නැත. ඒ වෙනුවට අපි තවත් මනුෂ්‍යයෙක්ව කේන්ති ගස්වන, කෑ ගස්සන, කිසිවෙක් නොවසන්නා වූ ස්ථානයක සිටින්නා වූ හිස් මනුෂ්‍යයන් විය හැකිය.

# සිංහයෙක් සහ බැටළු පැටවෙක්

ඉහත සඳහන් කළ Kremannymi යන ග්‍රීක වචනය ක්‍රියා 5:30 පේතෘස් විසින් භාවිතා කිරීම අහම්බයක් නොවේ. ඔහු මෙසේ පවසයි. අපේ මුතුන් මිත්තන්ගේ දෙවියන් වහන්සේ යේසුස් වහන්සේව මළවුන්ගෙන් උත්ථාන කළ සේක. ඔබ උන්වහන්සේව කුරුසියක Kremannymi මරා දැමුවා. එම කියමනට අනුව ඇණවලින් යේසුස් වහන්සේව කුරුසියේ එල්ලා නැත. ප්‍රේරමය එසේ විය. උන්වහන්සේ අන් අයට ප්‍රේම කිරීමේ සහ ඔවුන් සමග සත්‍යය බෙදා ගැනීමේ කාර්යක්ෂමතාවය ආදර්ශයට ගත්තේය.

මට තරුණයන් කිහිප දෙනෙකුට මඟ පෙන්වීමේ හැකියාව ලැබී තිබේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඉවැන්ජලිස්ට සේවය සඳහා දැඩි ආශාවක් ඇති අයවලුන්ය.යේසුස් වහන්සේ යුදා ගෝත්‍රයේ සිංහයා ලෙස සඳහන් කර ඇති ආකාරය ඔවුන් ප්‍රිය කරයි. එම තරුණයන් බොහෝ විට මට පවසන්නේ යේසුස් වහන්සේ මෙන් ඔවුන් යන සෑම තැනකම ශුභාරංචිය සමග ගර්ජනා කරන සිංහයෙකු වීමට ඔවුන් කෙතරම් කැමතිද යන්නයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් එසේ කරති. එය විශිෂ්ටයි.

එය කෙසේ වෙතත් යේසුස් වහන්සේ නිහතමානී සහ ප්‍රේමයෙන් පිරුණු බැටළු පැටවෙක්ට සමාන කර ඇත. ශුභාරංචිය පොත් පුරාවටම යේසුස් වහන්සේ සමූහයා දුටුවිට අනුකම්පාවෙන් පෙළඹී ඔවුන් සුව කළ ආකාරය අපි කියවමු. පව්කාරයා සහ රෝගීන් කෙරෙහි උන්වහන්සේ තුළ තිබූ ප්‍රේමය උන්වහන්සේව දේශනා කිරීමට සහ සුව කිරීමට පෙළඹෙව්වේය. ඒ හා සමානව ශුභාරංචිය බෙදා ගැනීමට අප තුළ ඇති ආශාව රෝගීන් සහ පව්කාරයන් කෙරෙහි ඇති අපගේ ප්‍රේමයෙන් ජනිත විය යුතුය.

ඇදහිලිවන්තයෙකු වීමෙන් ලැබෙන ප්‍රධාන ප්‍රතිලාභයක් නම්, අපගේ නැති වූ ලෝකයට යේසුස් වහන්සේම නියෝජනය කිරීමේ ගෞරවය ඔබට ලැබීම බව ඔබ දැන සිටියද? නියෝජනය යන මූල වචනය ඔබ කවදා හෝ දැක තිබේද? නැවත බලන්න. මූල වචනය පවතී.(re) එකතු කළ විට එයින් අදහස් වන්නේ අපි එය නැවත කරන බවයි. නියෝජනය යනු නැවත ඉදිරිපත් කිරීමයි. අපි නැවත ඉදිරිපත් කරන්නේ කුමක්ද? අපි නැවත ලෝකයට පෙන්වන්නේ කුමක්ද? අපි අපගේ ලෝකයට යේසුස් වහන්සේගේ ප්‍රේමය සහ පණිවිඩය සෑම කෙනෙකුටම අපට සමීපතම අයට පවා නැවත නැවත ඉදිරිපත් කරමු.

# පවුල් කටයුතු

මට ඔබ එක්ක අනාරක්ෂිත වෙන්න පුළුවන්ද? මාව හොඳින්ම දන්නා අයට ආදරය කර ශුභාරංචිය බෙදාගන්නා එක අමාරුම දෙය කියා සිතනවා. ඔබ ගැන මොකද කියන්නේ? මට සැඟවී කිසිවක් ඇති නිසාවත් මගේ විශ්වාසයන් ගැන මා ලැජ්ජා වන නිසාවත් නොවේ. ඒ වෙනුවට මාගේ සේවය සහ මාගේ වැරදි ඔවුන් හොඳාකාරව දනී. පවුල තුළට එය පැමිණෙන විට මා තරුණ වියේදී පටන් ඔවුන් මාව හොඳින් හඳුනති. සිරිල් සහ මෙතෝඩියස් මෙන් අපි එකට ජීවත් වුණෙමු. නිවාඩු කාල එකට ගත කෙලෙමු. එකට දඬර කෙරෙමු සහ එකට සමාව දුනිමු.

> අපේ පවුලේ අය සමඟ අපගේ අතීතයේ ඇති වූ සියලු අනාරක්ෂිත බව සහ අත්දැකීම් ඉක්මවා බලා තවමත් ඔවුන්ට කොන්දේසි විරහිතව ආදරය කළ හැකි විට බලවත් දෙයක් සිදු වේ.

අපගේ අතීතය දෙස අප බලන විට යම් බලවත් දෙයක් හට ගනී. සියලුම අනාරක්ෂිත භාවයන් සහ අත්දැකීම් අපගේ අතීතයේ අපගේ පවුල සමග සහ සියල්ලෙහිදී අපි තවමත් ඔවුන්ට කොන්දේසි විරහිතව ආදරය කරමු. අපගේ සහෝදරයන් යැයි අප කතා කරන යම් කෙනෙක් වේද අප මතක තබා ගත යුත්තේ අපගේ සහෝදරයන්, අපගේ මව්වරු පියවරු , ආච්චි සීයා, අපගේ නැන්දලා සහ මාමලා සහ සියල්ලෝම ක්‍රිස්තුස්වහන්සේ තුළ තවමත් අපගේ සහෝදරයන් සහ සහෝදරියන් ලෙසයි. දෙවියන් වහන්සේගේ ඇස්

හමුවේ ඔවුන් සියලු දෙනාටම සමාන ස්ථානයක් දරයි. අප සියල්ලන්ම සමාන ලෙස නිර්මාණය කර ඇත .

සිරිල් සහ මෙතෝඩියස්මෙන් දෙවියන් වහන්සේ දකින ආකාරයට අප අපගේ පවුලේ අය සහ අපට සමීපතමයන් දකින විට සහ ප්‍රේම කරන විට ශුභාරංචිය ඉක්මනින් ඉදිරියට ගෙන යා හැක.

සභා ඉතිහාසය වඩා බලවත්ම ඇදහිලි වන්තයකු වන්නේ පේතෘස් ය. ඔහු මුල් ගෝලයන් දොළොස් දෙනාගෙන් කෙනෙකි. ඔහු යේසුස් වහන්සේගේ බොහෝ හාස්කම් සහ ඉගැන්වීම් දුටුවේය. ඔහු ජලය මත ඇවිද ගියේය. මත්ස්‍යයෙකුගේ මුඛයෙන් දේව මාලිගා බද්ද ඔහුට හමුවිය. ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ ඔහුගේ සාක්ෂිය මත සභාව ගොඩනගන බව ඔහුට කියන ලදී. අපට ඉදිරියට යා හැකිය. නමුත් අපට බොහෝවිට අමතක වන දෙය නම් ඔහු ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙකු වූයේ කෙසේද යන්නයි.

පේතෘස්ගේ සහෝදරයා වන ඇන්ඩෘ දිනක් යේසුස් වහන්සේ කතා කරනවා ඔහුට අහම්බෙන් ඇසුනි. ඇන්ඩෘ කළ පළමු දේ නම් තම සහෝදරයා සොයාගෙන " අපිට මෙසියස් වහන්සේ හමු වුනා" කියා ඇන්ඩෘ එවකට සීමොන් ලෙස හැඳින්වූ තම සහෝදර පේතෘස්ට ප්‍රකාශ කිරීමයි.

ඇන්ඩෘ තව සහෝදරයාව යේසුස් වහන්සේ වෙතට ගෙනාවේය. යේසුස් වහන්සේ ඔහුව දුටු විට යොහාන්ගේ පුත්‍ර වූ සීමොන් ඔබට පේතෘස් යන නමන් තබනු ඇතැයි කී සේක.

පේතෘස්ගේ සහෝදර වූ ඇන්ඩෘ යේසුස් වහන්සේ වෙතට ඔහුව මග පෙන්වීය.

අනෙක් කොටස ඉතිහාසයට අයත්ය.

තෙරේසා මවුතුමිය ළඟට ඇවිත් යම් පුද්ගලයෙක් මෙසේ ඇසිය. " අම්මේ මට දෙවියන් වහන්සේ වෙනුවෙන් උතුම් දෙයක් කරන්න අවශ්‍යයි. නමුත් මම දන්නේ නැහැ. මොකක්ද කියල .මම පාසලක් ආරම්භ කළ යුතුද? විදේශ රටට මිෂනාරිවරයෙකු විය යුතුද? නැතහොත් පුණ්‍යායතනයක් ගොඩනගා ගත යුතුද " කියා ඇසුවා.

*ඔබ උපායමාර්ගිකව ඔබේ පවුලට සහ ඔබේ මිතුරන්ගේ කවයට උපත ලැබුවේ යම් අරමුණක් සඳහා ය.*

එවැනි මනුෂ්‍යයෙක් ගැන කතාවක් තිබෙනවා.

ඔහුට දෙවියන් වහන්සේ කෙරෙහි මහත් අභිලාෂයක් තිබුණි. තෙරේසා මව් තුමිය ඔහු දෙස කරුණාවෙන් බලා මෙසේ ප්‍රතිචාර දැක්වූවාය. " ඔබ කළ යුතු දෙය වන්නේ ඔබගේ පවුලේ කිසි කෙනෙක් ප්‍රේමය නොමැතිව සිටීමට වග බලා ගැනීමයි. "

මා ඔබට මතක් කළ යුත්තේ ඔබගේ පවුලට ඔබ උපායශීලීව උපත ලද තිබෙන බැවින් ඔබගේ යහළුවන්ගේ කවය අරමුණක් උදෙසාය. ඔබගේ කොස්මොස් හී ඔබ ආලෝකයක් විය යුතුය. ඔබේ පවුල සහ යහළුවන්ට ප්‍රේම කරන බව ඔවුන් දැනගත යුතුය. සහ ඔබගේ ජීවිතය ගැන බොහෝ දෙනෙක් නිහඬව අවධානය යොමු කරන බව ඔබ දැනගත යුතුය.

## ඔබ නිරීක්ෂණය කරනු ලැබේ

දහතුන්වන සියවසේ ඉතාලියේ ගම්මානයක් වන ඇසීසි හී ෆැන්සිස් නම් ඇදහිලිවන්තයෙක් විය. ඔහු පිස්තස් වහන්සේව අනුකරණය කිරීම සහ ප්‍රේමයෙන් ශුභාරංචිය බෙදා ගැනීම ඔහුගේ ජීවන මෙහෙවර කරගෙන තිබුණි. ඔහු බොහෝ විට මෙසේ කියනු ඇත . අපගේ ඇවිදීම අපගේ දේශනා කිරීම නොවේනම් දේශනා කිරීමට කොහේවත් ඇවිදීමෙන් පලක් නැත. මෙම උපුටා දැක්වීම වසර ගණනාවක් පුරා බොහෝ විට උපුටා දක්වන දේකට පරිණාමය වී ඇත. හැමවිටම ශුභාරංචිය දේශනා කරන්න , අවශ්‍ය විටෙක වචන භාවිතා කරන්න.

ඔබ රහසිගතව නිරීක්ෂණය කිරීමට කැමතිද? බොහෝ විට එසේ නොවේ කවුද සේ කරන්නේ? නමුත් අනුමාන කරන්නේ කුමක්ද? ඇදහිලි වන්තයන්තයෙකු ලෙස ඔබේ වචන ඔබේ ජීවන රටාවට ගැලපෙනවාද යන්න බැලීමට නැදැහිලිවන්තයන් ඔබ දෙස බලා සිටින බවට විශාල අවස්ථාවක් තිබේ. ඔවුන් එසේ නොකරන්නේ නම් ඔවුන් ඔබේ පණිවිඩයට සවන් නොදෙන බවට හොඳ අවස්ථාවක් තිබේ. ඔබේ වචන ඔබේ ජීවිතයට ගැලපෙන්නේ නම් ශුභාරංචියේ දියුණුව සඳහා ඔබේ ජීවිතය කෙතරම් ඵලදායී විය හැකිදැයි ඔබට පුදුම විය හැකිය.

ටන්ජා සහ මම ස්විට්සර්ලන්තයට ගිය විට අපගේ මහල් නිවාස ගොඩනැගිල්ලේ සිටින සෑම කෙනෙකුටම ශුභාරංචිය බෙදා ගැනීම අපගේ ඉලක්කය කරගත්තෙමු. අප අසල ඇදහිලිවන්තයන් ජීවත් නොවූ අතර අපි ස්වභාවංශය බෙදා ගත්තද කිසිවෙකු උනන්දුවක් දැක්වූයේ නැත. අපව නිරීක්ෂණය කරන බව අප දැන සිටියේ ද නැත. මාස කිහිපයකට පසු පවුල් දෙකක් යම් යම් ආතති සහගත කාලවලට මුහුණ දුන්හ.

ඔබට හිතා ගන්න පුළුවන්ද මොකද වුනේ කියා. ඔව් , ඔබ හරි එයාලත් ටන්ජගෙන් සහ මගෙන් උදව් ඉල්ලාගෙන පැමිණියා. ආයෙත් වතාවක් අපිට සුභාරංචිය බෙදාගන්නත් එයාලා වෙනුවෙන් යාච්ඤා කරන්නත් පුළුවන් උනා. අවුරුදු ගණනාවකට පසු එයාලා තවම අපගෙන් බයිබල් ප්‍රශ්න අසනවා. යාච්ඤා කරන්නත් කියනවා.

*අපි කරන ක්‍රියාවන් සහ අපි ආදරය කරන ආකාරය, අප අවට සිටින අයට බලවත් පණිවිඩයක් දේශනා කරයි.*

අපි කරන ක්‍රියා සහ අපි ආදරය කරන ආකාරය අප අවට සිටින අයට බලවත් පණිවිඩයක් දේශනා කරයි. ඔබ ප්‍රේමණීය ජීවිතයක් ගත කරන විට බොහෝ විට මිනිසුන් ඔබේ ගසේ එල්ලී ඇති ගෙඩි දැක එය නෙළා ගනු ඇත. සමහරවිට ඔබ ඔවුන් වෙත යාමට සිදුවේ. ඔබ තුළ කුමක්දැයි විමසීමට ඔවුන් උපරිම උත්සාහයක් ගනු ඇත. යේසුස් වහන්සේ පවා දේශනා කිරීමට පෙර එතරම් බලගතු ජීවිතයක් ගත කළ සේක. උන්වහන්සේගේ සහෝදර සහෝදරියන් ඉදිරියේ වසර ගණනාවකට පසු ඔවුන් ද උන්වහන්සේ සහ උන්වහන්සේගේ වචන නැවත ඉදිරිපත් කරනු ඇත.

## යකොබ්

යාකොබ් යේසුස් වහන්සේගේ බාල සහෝදරයා විය. යේසුස් වහන්සේ ස්වර්ගයට නැගුණු පසු යාකොබ් නව ගිවිසුමට ඇතුලත් ලිපියක් ලියනු ඇත. යාකොබ් පොත ලිව්වාද නැතහොත් ලියන්නකෝ ඔහුගේ වචන ග්‍රීක භාෂාවට ලියා තැබුවාද යන්න නොදනී. නමුත් කැපී පෙනෙන දේ නම් යාකොබ් ඔහුගේ වැඩිමල් සහෝදරයා ගැන යේසුස් වහන්සේට සමාන ලෙස ශබ්ද කරන ආකාරයයි.

කන්ද උඩ දේශනාව නම් යේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ පණිවිඩය ගන්න. යාකොබ් ගේ පොතේ පද 108 න් එම පද තිහක් යේසුස් වහන්සේගේ දේශනාවට ඉතා හුරු පුරුදුය.

*"සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාවද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය." - යාකොබ් 1:17*

*"මෙසේ නපුරුවූ නුඹලා නුඹලාගේ දරුවන්ට යහපත් දේ දෙන්ට දන්නහු නම්, කොපමණ වැඩියෙන් ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන්වහන්සේ තමන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට යහපත් දේ නොදෙනසේක්ද?" - මතෙව් 7:11*

---

*"නුමුත් නුඹලාම රවටාගනිමින් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වෙන්න." - යාකොබ් 1:22*

*"යමෙක් මාගේ මේ වචන අසා, ඒවා පිළි නොපදීද, ඔහු වැලි මත්තෙහි තමාගේ ගෙය සාදාගත් නුවණ නැති මනුෂ්‍යයෙකුට සමානකරනු ලබන්නේය." - මතෙව් 7:26*

---

*"මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, අසන්න; ඇදහිල්ලෙහි ධනවත්වන පිණිසත්, තමන්වහන්සේට ප්‍රේමකරන්නවුන්ට පොරොන්දුවූ රාජ්‍යයේ උරුමක්කාරයන් වන පිණිසත්, දෙවියන්වහන්සේ ලෝකයේ දිළින්දන් තෝරා නොගත්සේක්ද? නුමුත් නුඹලා දිළින්දාට අගෞරවකළහුය." - යාකොබ් 2:5*

*"සිතින් දිළින්දෝ ආශීර්වාදලද්දෝය; මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය." - මතෙව් 5:3*

---

යේසුස් වහන්සේගේ කීර්තිය කෙරෙහි සදාකාලික හැඟීමක් ඇති කර තිබුණි. යේසුස් වහන්සේ ඊශ්‍රායලය හරහා සමූහයාට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට බොහෝ කලකට පෙර උන්වහන්සේට ප්‍රේම

කරමින් සහ ජීවිතය ගත කරමින් යේසුස් වහන්සේ වැඩමදුවක වැඩ කරමින් උන්වහන්සේගේ සහෝදරයන්ට ප්‍රේමයෙන් කටයුතු කරමින් ඔවුන් ඉදිරියේ පළවෙනියා හැටියට යහපත් ජීවිතයක් ගත කළ සේක. බාල සහෝදරයාට උන්වහන්සේ කළා වූ බලපෑම වූයේ නොදන්නා වූ ඒ කාල වකවානුව තුළ උන්වහන්සේගේ කාර්යය යාකොබ් විසින් පසු කාලයේ දී නැවත කරනු ඇති බව සහතික කරමි. ඔබව නිරීක්ෂණය කරනු ඇත. ඔබ ප්‍රේමය ජීවිතයක් ජීවත් වන්නේද? ඒ නොදන්නා වසර වලදී උන්වහන්සේ තම බාල සොයුරා කෙරෙහි ඇති කළ බලපෑම එතරම් වැදගත් ද යත් යාකොබ් වසර ගණනාවකට පසු ඔහුගේම ලිපියෙන් ඒවා නැවත නැවතත් කරනු ලැබීය. ඔබව නිරීක්ෂණය කරනවා.

ඔබ ආදරයෙන් පිරුණු ජීවිතයක් ගත කරනවාද? අපි හැමෝටම ආදරය ලැබිය යුතුයි.

# අපි හැමෝටම ආදරය ලැබිය යුතුයි

ආදරය විශ්වීය භාෂාවක් වන අතර අපි සියල්ලෝම එය කතා කරමු. නමුත් බොහෝ විට අපගේ ක්‍රියාවන් වචන වලට වඩා ශබ්ද නගා කතා කරයි. ඇදහිලි වන්තයෙකු ලෙස ඔබ වටා සිතන අයට ප්‍රේම කිරීමට බොහෝ ප්‍රායෝගික ක්‍රම තිබේ. අපි ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයේ බව අපට මතක් කර ගත යුතුව ඇත.

*ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ වටා සිටින අයට ප්‍රේම කිරීමට බොහෝ ප්‍රායෝගික ක්‍රම තිබේ.*

ඇස් - ඔබ වටා සිදුවන දේ ගැන අවදියෙන් සිටින්න. ජීවිතය ඔබ ගැන නොවේ. බොහෝ දෙනෙක් වාචික නොවන පණිවිඩ යවමින් ඔවුන්ට දැඩි ලෙස උපකාර අවශ්‍ය බව පවසති. දෙවියන් වහන්සේ ඔබෙන් අන් අයට කිරීමට කැමති දේ දැකීමට ඇස් සහ ඇසීමද කන් ලබාදෙන ලෙස ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ඉල්ලන්න.

කන් - සමහර විට ආදරය පෙන්වීමට ඇති හොඳම ක්‍රමය අන් අයට සවන් දීමයි. දෙවියන් වහන්සේ අපට කන් දෙකක් සහ එක මුඛයක් ලබා දී ඇත. සමහර විට උන්වහන්සේ අපට මතක් කර දීමට උත්සාහ කරන්නේ අප කතා කරන ප්‍රමාණයට වඩා දෙගුණයක් සවන් දෙන ලෙසයි.

මුඛය - දිවේ ජීවයේ බලය ඇත. කාලෝචිත වචන රිදී තැටියක පිළිගන්වන ලද රන් ඇපල් වැනිය. අන් අයව දිරිමත් කිරීමට ක්‍රම සොයන්න. ඔබට ඔවුන් වෙනුවෙන් යාච්ඤා කළ හැකිදැයි අන් අයගෙන් විමසන්න. සියල්ලන්ම සුවපත් නොවිය හැකි නමුත් සියල්ලන්ටම ආදරය දැනෙනු ඇත.

ආයුධ- ක්‍රියා 10:44 ශුද්ධාත්මයාණන් වහන්සේ ඇදහිලිවන්තයන් මතට පැමිණෙන කල්හි භාවිතා කරන ග්‍රීක වචනය එපිපිටෝය. මෙම වචනයෙන් ආදරණීය දෙමව්පියකුගේ වැළඳ ගැනීමේ කුඩා දරුවන්ගේ රූපයක් මතුවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ අපව ආදරයෙන් වැළඳ ගන්නා තරමට අපි බිම වැටෙමු. යමෙකුට වැළඳ ගැනීමක් කිරීම වචනයක්වත් නොකියා ආදරය බෙදා ගැනීමට බලවත් ක්‍රමයකි.

දෑත් - අපගේ දීම ප්‍රේමය පෙන්වීමේ තවත් ක්‍රමයකි. මෙය සේවා ක්‍රියාවක්. මූල්‍යමය තෑග්ගක් හෝ උපකාරක හස්තයක් විය හැකිය.

පාද - පවුලේ සාමාජිකයෙකුට, අසල්වැසියෙකුට හෝ සගයෙකුට ඔබේ මාර්ගයෙන් බැහැරව යාම ප්‍රේමයේ විශිෂ්ට වර්ධනයකි. මිනිසුන් ඉතා අත්මාර්ථකාමී ජීවිත ගත කිරීමට නැඹුරු වෙති. ඔබේ සුව පහසු කලාපයෙන් සහ ජීවන රටාවෙන් පිටතට ගොස් යමෙකුගේ අවුලට පිවිසීමෙන් සුභාරංචිය ඇසීමට ඔවුන්ගේ හදවත විවෘත කළ හැකිය.

ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරය ලෙස අපි ප්‍රේමණීය විය යුතුය. ප්‍රේමය යනු අපගේ මුහුණ දීප්තිමත් කරන අපගේ පියවරට පිම්මක් ඇති කරන සහ අපගේ ක්‍රියාවන්හි වෙනසක් ඇති කරන දෙයකි. අපි කවදා හෝ අපගේ ප්‍රේමය නැතිකර ගනිමු නම් ඇදහිලිවන්තයන්ට අපගේ පෙනුම අසනීප ලෙස පෙනෙන අතර අපගේ ශුභාරංචිය පිළිකුල් සහගත වෙනු ඇත.

# පින්තාරු කිරීම

ඔබ කවදා හෝ බයිබලයේ පණිවිඩය මැසේජ් පරිවර්තනයෙන් කියවා තිබේද? ඉව්ජන් පීටර්සන් මෙම බයිබලය පරිවර්තනය කළේ වඩාත් මධ්‍යස්ථ ජාත්‍යන්තර ඉංග්‍රීසි භාෂාව වෙනුවට ඇමරිකා එක්සත් ජනපදයේ සමකාලීන නොවටිනා භාෂාවක් භාවිතා කිරීමේ අරමුණින්ය. දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ සෙනඟ කෙරෙහි ඇති පොහොසත් ප්‍රේමය ශුද්ධ ලියවිලි පද පුරා ගැඹුරින් බලපෑම් කරන ආකාරයෙන් දැනෙයි. කෙසේ වෙතත් වසර ගණනාවකට පෙර පීටසන් කෙරෙහි හැඟීමක් ඇතිකළ වඩාත්ම අසම්භාගිය පුද්ගලයා ගැන ඔබ පුදුම විය හැකිය.

ඉව්ජන් පීටර්සන් නිව්යෝර්ක් නගරයේ දේවධර්ම ශිෂ්‍යයෙක්ව සිටි කාලයේ සහ තරුණ පිරිසක් සමග වැඩ කිරීම සඳහා ප්‍රෙස්පෙටේරියන් දේවස්ථානයක සේවය කළ කාලය පිළිබඳව කතාව කියයි. දේවස්ථානයේ පිරිසිදු කරන්නා විලී ඔසා නම් ජර්මානු ජාතිකයෙකි.

වාසනාවකුට මෙන් වසර දෙකකට පෙර ජර්මනියේ ජීවත් වූ අතර ඇඩෝල්ෆ් හිට්ලර් විසින් ප්‍රවර්ධනය කරන ලද වෛරයට යටත් වූ ජර්මනියේ බොහෝ ඇදහිලිවන්තයන්ගේ දුක්ඛිත යථාර්ථය ඔසා අත්වින්දේය. ඒ කාලය තුළ ඔසාගේ දේව ගැතිවරයා පවා මිනිසුන්ට සහ ස්වභාරංචියට ඇති ආදරය හුවමාරු කර ගනිමින් දැඩි නාසි වාදියෙකු බවට පත්විය. මෙය දේවස්ථානය සහ ශුභාරංචිය පිළිබඳ ඔසාගේ දෘෂ්ටියට අහිතකර ලෙස බලපා තිබුණි. ඔසා මුරකරු වුවද ඔහු ගෝලීය සභාව පිළිබඳව ඉතා විවෘතව සැක කරන අයෙකි. එහෙත් ඔහු සහ පීටසන් මිතුරන් වී සිටියහ. තමා කෙරෙහි දැක්වූ ආදරය ඔසා නොදැනුවත්වම දැක ගත නොහැකි විය.

ඔසාද කලාකරුවකු වීමට අහම්බෙන් සමත් විය.

ඔහුගේ චිත්‍රය පිංතාරු කළ හැකිදැයි ඇසුවේය. එක් අල්ලා ගැනීමක් තිබුණි . වැඩ අවසන් වන තුරු පීටසන්ට චිත්‍රය බැලීමට අවසර නොලැබෙනු ඇත. ඔවුන් එකඟ වූ අතර චිත්‍රය ආරම්භ විය.

සතියෙන් සතියට ඔවුන් සිතුවම දිගටම කරගෙන යාමට වෙලාවක් නියම කරගන්නා ලදී. දිනක් ඔසාගේ බිරිඳ කාමරයට පැමිණ සිතුවිම දුටු විට කෑ ගැසුවාය. පීටසන් අසනීපයෙන් සිටින බව ඈ දැඩි ලෙස කෑ ගැසුවාය. ඔසා පීටසන්ව අඳුරු මුහුණකින් අප්‍රාණික ඇස් වලින් සහ කිසිදු ප්‍රකාශයකින් තොරව පින්තාරු කර තිබුණි. ඔහුගේ බිරිඳ සමග වේගවත් හුවමාරුවකදී ඔසා ඇයට එයට හේතුව පැහැදිලි කළේය. ඔහු දැන් අසනීප නැහැ. නමුත් අනුකම්පාව නැති වූ විට, ඔහුගෙන් දයාව මිරිකා ගත් විට ඔහු පෙනෙන්නේ එලෙසයි.

පීටර්සන් කිසිදා එම පණිවිඩය අමතක කළේ නැත. තවද ඔහු කිසිදා සිතුවෙමින් ඉවත් වූයේද නැත. ඔහු වටා සිටින අයට විශේෂයෙන් සැක සහිත ඇදහිලිවන්තයන්ට ඔහුගේ ජීවිතය සහ ඒ හරහා දෙවියන් වහන්සේගේ ප්‍රේමයේ කොතරම් වැදගත් දැයි ඔහු වටහා ගත්තේය.

අද මොහොතක් ගෙන කැඩපත දෙස බලන්න. ඔසා පීටර්සන් සමග කලාක් මෙන් ඔබ ගැන සිතන්න. ආදරය නොමැතිව ඔබ ඇදහිය නොහැකි තරම් අප්‍රාණික සහ හිස් පෙනුමක් ලබා දෙනු ඇත. ඇදහිලි වන්තයෙකුගේ සැබෑ ජීවිතය කෙබඳු විය යුතුද යන්න සෞඛ්‍ය සම්පන්න දර්ශනයක් ආදරය ඔබට ලබාදෙයි. ආදරය නැති වූ විට ඔබේ පෙනුම පිළිකුල් සහගත වන අතර ඔබේ පණිවිඩය නොඇසෙනු ඇත.

නම වන සියවසේ සිරිල් සහ මෙතෝඩියස් ඇතුළු සියවස් ගණනාවක් ඇදහිලිවන්තයන් මෙම පැහැදිලි මූලධර්මය තේරුම් ගෙන ඇති අතර ඔවුන් ජනතාවට ආදරය කළ අතර ඔවුන්ගේ හෝඩිය හරහා සන්නිවේදනය කිරීමේ මාර්ගයක් නිර්මාණය කළහ. සියවස් ගෙවී යන්න ඔවුන් නිර්මාණය කළ සහ නම් කරන ලද එකකින් නව හෝඩියක් සෑදී ඇත. සිරිලික් සිරිල් සිහිකිරීම සඳහාය. එය තවමත් රුසියාව, යුක්‍රේනය, බල්ගේරියාවේ සහ සර්බියාවේ හෝඩියයි. මෙම ඇදහිලිවන්තයන්ගේ ප්‍රේමය ඔවුන්ව ඉදිරියට ගෙනගිය අතර සුභාරංචිය ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත විය.

නම වන සියවස පුරාවටම සුභාරංචියේ යෂ්ටිය දිගටම පැවතුණි. ළඟා නොවූ රටවල් සුභාරංචියට සවන් දුන් අතර ඔවුන් ඔවුන්ගේ ජනතාව විසින් නිරූපණය කරන ලද ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අත්විඳින ලදී.

# 11

# 900 ගණන් වල - බීජ

## නමුත්.....මම කිසිවෙකු නො වේ

*" අපව විනිශ්චය කරනු ලබන්නෙ ගැලවීම ලැබූ ආත්ම ගණන අනුව නොව වපුරන ලද බීජ ගණන අනුවය " - රයින්හාඩ් බොන්කේ*

ක්‍රි.ව 943දි ඉතාලියෙ හාමාහි අන්තර් සම්බන්දිත පියෙක් හා මවක් තම පුතාව යේසුස් වහන්සේගේ අනුගාමිකයෙකු ලෙස ඇතිදැඩි කළහ.සෑම දිනකම කෙත්වල වැඩ කිරීමෙන් පසු ඔවුන් එල්තුමය අස්වැන්න නෙලීම සදහා සහ ඔවුන් නිරාවරණය වූ බොහො අනතුරු වලින් ඔවුන් ආරක්ෂා කිරීම උදෙසා යේසුස් වහන්සේට ස්තුති කළහ. රාත්‍රියේදී ඔවුන්ගෙ දරුවා ඇදෙ වැතිර සිටින විට ඔවුන් බයිබලයෙන් කතන්දර රග දැක්වූහ. යේසුස් වහන්සේ නොමැතිව ඔවුන් සදහටම නැති වී ඇති බව තම පුතාට මතක් කර දීම ඔවුන්ගෙ අරමුණ විය.

දෙමාපියන්ට තම පුතා තුල එතරම් වෙනසක් නොපෙනුනි. නව යොවුන් වියේදී ඔහු තම ගමෙ ගැහැණු ළමයෙකු සමග විවාහ වී දරුවන් ලබා අගුල්කරුවෙකු බවට පත්විය. ඔවුන්ගෙ දරුවාගෙන් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි බාහිර ආශාවක් නොතිබුණද ඔහුගෙ දෙමව්පියන් ඔහු සමග සුභාරංචිය බෙදා ගැනීම දිගටම කරගෙන ගියහ. දෙමව්පියන් තම පුතා සමග පමණක් නොව ඔවුන්ගෙ අසල්වැසියන් හා දේශීය වෙළද පොලෙ සිටින අය සමග ද සුභාරංචිය බෙදා ගත්හ. මධ්‍ය කාලීන සභාවේ බොහෝ ඇදහිලිවන්තයන් මෙන් ඔවුන් කිසිවිටෙකත් තම ඇදහිල්ල පුද්ගලික දෙයක් ලෙස සැලකුවෙ නැත.

වසර ගණනාවක් පුරා ඔවුන් ගත කල ජීවිතය සහ ඔවුන්ගෙ දරුවා සහ අසල්වැසියන් තුල ඔවුන් රෝපණය කල පණිවිඩය සදාකාලික වෙනසක් ඇති කරනවාද කියා ඔවුන් රාත්‍රියෙන් රාත්‍රියට කල්පනා කළහ. දෙමව්පියන් මිය ගියහ. දෙමව්පියන් මියගියේ මෙම ප්‍රශ්නය ඔවුන්ගෙ හදවත් වල තබා ගෙනය. ඔවුන්ගෙ පුතා ඇතුලු බොහො දෙනෙකු තුල සුභාරංචිය මුල් බැසගෙන ඇති බව ඔවුන් දැන සිටියෙ නැත. ඇත්ත වශයෙන් ම ඔහු ක්‍රිස්තුස් වහන්සේගේ භක්තිමත් අනුගාමිකයෙකු බවට පත් වූවා පමණක් නොව තම දරුවන් සහ මුනුබුරන් සමග විශ්වාසවන්ත ව සුභාරංචිය බෙදා ගැනීමෙ තම දෙමව්පියන්ගෙ ආදර්ශය ඔහු අනුකරණය කළේය. ඔවුන්ගෙ ගමේ බොහෝ දෙනෙක්ද එසේ කළේය.

මෙම දෙමව්පියන් කවුද අප කවදාවත් දැන ගන්නෙ නැහැ.

මේ දරුවා කවුද? ඒකත් අභිරහසක් යේසුස්වහන්සේගේ අනුගාමිකයන් බවට පත්වූ අසල්වැසියන් කවුදැයි දන්නෙ? දෙවියන්වහන්සේ පමණක්මය.

ඔවුන් ක්‍රිස්තුස්වහන්සේගේ අසංඛ්‍යාත ගෝලයන් සමග එක්විය. ඔවුන් යුගයන් ගණනාවක් පුරා සුභාරංචියෙ යෂ්ඨිය ප්‍රකාශ කළ යේසුස්වහන්සේගේ නමක් නැති මුහුණක් නැති අනුගාමිකයින්ගෙ කොටසකි. ඔවුන් ප්‍රසිද්ධ නොවූ අතර පූර්ණ කාලීන සේවයක් නොතිබුණි. සහ බොහෝ මිනිසුන් විසින් අගය කරනු ලැබුවේද නැත.

නමුත් දහවන සියවසයෙ මෙවැනි නම් නොකළ පුද්ගලයින් යුග ගණනාවක් පුරා සුභාරංචිය වඩාත් ප්‍රවර්ධන ය කළ අය විය. ඉතිහාසයෙ මෙම කාලය අඳුරු යුගයෙ අවසාන සියවසය ලෙස හඳුන්වයි. ඉදිරි සියවස් පුරා තම ආලෝකය බබලවා සදාකාලික අස්වැන්නක් ලබාදෙන බීජ රෝපණය කළ මෙම කිතුණුවන් ගැන ඉතිහාසඥයින්ට අදුරු කිසිවක් නොතිබුණි.

## එක් බලාපොරොත්තුවක් බොල්සානෝ

දෙවියන් වහන්සේට තම රාජ්‍ය ඉදිරියට ගෙනයාමට කැමැත්තෙන් හා විශ්වාසවන්ත මිනිසුන් අවශ්‍යය. මම විශ්වාස කරන්නෙ ඔබ එහෙමයි.

ඒ වගේම ඔබ මෙ පොත කියවන්නෙත් ඒ නිසයි . සුභාරංචිය ඉදිරියට ගෙනයා මේ විශ්වාසවන්තකම ඕනෑම දේකට වඩා බොහෝ ඉදිරියට යන බව මම ඉගෙන ගත්තෙමි. සමහර

සරණාගතයින් ගේ හදවත් තුළ සුභාරංචිය වැපිරීමට දෙවියන් වහන්සේ මගෙ කැමැත්ත භාවිතා කළ ආකාරය පිළිබඳ කතාවත් සමග මම ඔබව දිරිමත් කරමි .

2017 දෙසැම්බර් මාසයේදී ඉතාලියෙ නගරයේද සුභාරංචිය බෙදා ගැනීමට අපි කැමති දැයි දෙවියන් වහන්සේ අසන බව තන්ජා සහ තවත් කෙනෙකුට දැණුනි. අපි එසේ කළෙමු. අපගේ දේවසේවය වන යුරෝපය දල්වන්න හරහා ඉතාලියෙ බුල්සානෝහි වැන්ජලිස්ත ප්‍රචාරක සේවාවක් පැවැත්වීමට අපි තීරණය කළෙමු. නොමිලයෙ උත්සවයට සැමට ආරාධනා කරමින් දහස් ගණනක් පත්‍රිකා සමග අපි නගර මධ්‍යයේ ප්‍රසිද්ධ නත්තල් වෙළෙඳපොළ ආලෝකමත් කළෙමු. නත්තල් වෙළෙඳපොළ අසල තරු හතරේ පාර්ක් හොටෙල් ලෝරින් තුළ ගෝල් රූම් එකක නොමිලෙ ආහාර සහ පාන වර්ග සමඟ එක් බලාපොරොත්තුවක් බොල්සානෝට සත්කාරයත් සපයන ලදී. බොහෝ ඉතාලි ජාතිකයින් ගැලවෙනු ඇතැයි අපගෙ කණ්ඩායම විශ්වාස කළේය. එය සිදුවූයෙ නැත.

උත්සවය ආරම්භ වූ විට උත්සව ශාලාව සිරියාවේ ISI කණ්ඩායමෙන් පලා යන්නාවූ මුස්ලිම් සරණාගතයින්ගෙන් පිරී තිබුණි. අපගෙ පත්‍රිකාවක් සරණාගත කඳවුරට ගිය අතර නොමිලයේ ආහාර පාන පිරිනැමීම සඳහන් වී ඇති හෙයින් එයින් ආකර්ෂණයට පත් වූ ඔවුන් එහි පැමිණයහ. ඒ සන්ද්‍යාවේදි මම මෙ සරණාගතයින් ඉදිරිපිට සිටගෙන සිටියදී නිර්භීතව යේසුස් ක්‍රිස්තුස් වහන්සේව රජු ලෙස ප්‍රකාශ කළෙමි.ක්‍රියා 17:26-27 උපුටා දක්වමින් දෙවියන් වහන්සේ සෑම පුද්ගලයකු ම උපායශීලීව එම කාමරයේ තබා ඇති බව සදහන් කළෙමි. එවිට ඔවුන්ට යේසුස්වහන්සේව දැනගත හැකිය. ( මේ ගැන වැඩි විස්තර ඊළග පරිච්ඡේදයෙ. ) ගැලවීම සඳහා කැඳවීමක් ලැබූ විටඑම කාමරය තුළ සිටියාවූ බොහො සරණාගතයින් ඔවුන්ගෙ අත් ඔසවමින් යේසුස්වහන්සේව ඔවුන්ගේ ගැලවුම්කරුවානන් වහන්සෙ ලෙස ප්‍රකාශ කළහ.

උත්සවය අවසන් වූ පසු අපගෙ දරුවන් අනතුරෙ වැටිය හැකි බවට අපට ආරංචියක් ලැබිණි. මුස්ලිම් සරණාගතයින්ගෙන් එක් අයකු ඔහුගෙ සමාජ වේදිකා වල උත්සවය සජීවීව විකාශනය කරමින් සිටින බව අපි දුටුවෙමු. ඔහුගෙ අභිප්‍රායන් පිළිබඳව කිසිවෙකුට නිශ්චිතතාවයක් නොතිබුණි. අපි ඥානවන්ත වී වහාම පිටව යා යුතු බව දැන සිටියෙමු. වායාරූප කිහිපයකට

*අපෙන් බලාපොරොත්තු වන්නේ එයයි: අපව කැඳවනු ලබන ඕනෑම තැනක ශුභාරංචිය බෙදා ගැනීමට කැමැත්තෙන් හා විශ්වාසවන්ත සේවකයෙකු වීම.*

පසු අපි ඉක්මනින් අපෙ කුඩා දරුවන් දෙදෙනා සහ අපගෙ උපකරණ රැගෙන ගිය අතර අපගෙ කණ්ඩායම පිටත්ව ගියෙමු. අපිට දැනුනෙ ක්‍රිස්තියානි නාවික හමුදා සීල් භටයන් සතුරු ප්‍රදේශයට පියාසර කරමින් සුභාරංචිය දේශනා කරමින් භයානක තත්ත්වයකට පත්වීමට පෙර පිටතට යන බවයි.

ඒ සරණාගතයින්ට මොකද උනෙ කියලා මම බොහෝ විට කල්පනා කර තිබේ. ඔවුන්ගෙන් කී දෙනෙක් තවමත් ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය කරනවද?ඔවුන් ඒ රාත්‍රියේ ඔවුන්ගෙ කඳවුරට ආපසු ගිය විට කතා කළේ කුමක්ද? ඔවුන් දැන් කොහෙද ?

ඒ සරණාගතයින් කවදාවත් මම කවුද කියලා දැන ගන්න එකක් නැහැ. ඒ රාත්‍රියේ ඔවුන්ගෙ සදාකාලික ඉරණම වෙනස් උනාද කියා මම කවදාවත් දැන ගන්න එකක් නැහැ. නමුත් සුභාරංචිය ඔවුන්ගෙ හදවත් වල රෝපණය කර ඇති බව මම දනිමි. අපෙන් බලාපොරොත්තු වන්නෙ එයයි. අපව කැඳවන ඕනෑම තැනක සුභාරංචිය බෙදාගැනීමට කැමැත්තෙන් හා විශ්වාසවන්ත සේවකයින් වන්න අපට අධ්‍යාත්මික ගොවීන් වීමට අපට කැඳවීමක් ලැබී තිබේ.

# අපි ගොවියො

ගොවියෙකු කෙතක් හා බීජයක් ගැන සිතන්න. අස්වැන්නක් ලබාගැනීමට පෙර ගොවියෙකු බීජයක් සිටුවිය යුතුය. බීජ මුල් බැස යම් කාලයක් හිරු එළියෙන් සහ ජලයෙන් පෝෂණය වී පසුව එහි ඵල නෙලාගනී.

ක්‍රිස්තුස් වහන්සේගෙ අනුගාමිකයන් වශයෙන් අපි ගොවීන්ය. කෙත්වතු යනු, පුද්ගලයන්ගෙ හදවත් ය. බීජය යනු, සුභාරංචියි. සුභාරංචිය යමෙක් සමග බෙදා ගන්නා විට බිමෙහි බීජයක් වපුරන ගොවියෙකු හා සමාන ය. ඉන්පසු යම් කාලයක් තුළ තත්පර හෝ අවුරුදු ගණනක් වේවා වෙනත් අය

පැමිණ දෙවියන් වහන්සේගේ ප්‍රේමය සහ ශුද්ධ ලියවිල්ල එම පුද්ගලයා මත වත් කිරීමෙන් බීජ වලට වතුර දමති. අවසන් වශයෙන් අස්වැන්න සූදානම් වූ විට පුද්ගලයා ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණේ.

කොරෙන්ති සභාවේ අයට පාවුල් තුමා මේ සේ සත්‍ය මෙසේ මතක් කර දෙන්නෙ ය.

ශුභාරංචිය යමෙකු සමඟ බෙදා ගන්නා විට, එය බිමෙහි බීජයක් වපුරන ගොවියෙකු හා සමානයි.

*"මම හිටෙවුවෙමි, අපොල්ලොස් වතුර වත්කෙළේය; නුමුත් වර්ධනය දුන්නේ දෙවියන්වහන්සේය. එබැවින් වර්ධනය දෙන දෙවියන්වහන්සේ මිස හිටවන තැනැත්තේද වතුර වත්කරන තැනැත්තේද කිසිත් නැත. හිටවන තැනැත්තෙත් වතුර වත්කරන තැනැත්තෙත් එකය. එක් එක්කෙනා තම තමාගේ වැඩේ හැටියට තම තමාගේ විපාකය ලබන්නේය. මක්නිසාද අපි දෙවියන්වහන්සේගේ හවුල් වැඩකරන්නෝය. නුඹලා දෙවියන් වහන්සේගේ කෙතය, දෙවියන්වහන්සේගේ ගොඩනැගිල්ලය." - 1 කොරින්ති 3:6-9*

ගොවියෙකුට ආශ්චර්යමත් ලෙස අස්වැන්නක් ලබාගත නොහැකි සේම, අපට කිසිවෙකු ආශ්චර්යමත් ලෙස බේර ගත නොහැක. කෙසේ වෙතත් සෑම කිතුණුවෙකුම සුභාරංචියේ බීජය වපුරා වතුර දැමිය යුතු අතර, පැසුණු අස්වැන්නක් නෙලා ගැනීමට සූදානම් විය යුතුය.

ඔබ කවදා හෝ ආත්මික ගොවියෙකු ලෙස ඔබ ගැන සිතුවාද? ආරම්භ කිරීමට කිසිවිටෙකත් ප්‍රමාද නැත. සුභාරංචිය ඔවුන්ගෙ හදවත් වල වැපිරීමට අවශ්‍ය අය සිටිති. තවත් සමහරු එය නැවත නැවතත් කළයුතු අතර තවත් සමහරු යේසුස් වහන්සේගේ නම් රජුට තම පක්ෂපාතීත්වය දීමට සූදානම්ව සිටිති. මම ටිකක් පැහැදිලි කරන්නම්.

යේසුස්වහන්සේව ළිද ළග සිටි ස්ත්‍රීය සමග කතා කළ කතාව අවසන් කලාවිතරයි උන්වහන්සේ තම ගෝලයන් දෙස බලා මෙසේ පැවසූ සේක.

*"තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි-නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලන්න." - යොහන් 4:35*

සෑම පුද්ගලයෙකුම ගැලවීම සඳහා සූදානම් බවට යෙදුම සමග උපුටා දක්වන මෙම පදය අපට බොහෝ විට අසන්නට ලැබේ. මෙය සත්‍යක් නම් මම ප්‍රාර්ථනා කරන්නෙමි. කෙසේ වෙතත් ස්විස්ටර්ලන්තයේ ගොවි ප්‍රජාවක ජීවත් වන මම පැසුණු අස්වැන්නකට බො හෝ දේ ඇතුලත් වන බව ඉගෙන ගතිමි.

අස්වැන්න නෙලීමට පෙර මාස ගණනක් වැපිරීම, වතුර දැමීම සහ කෙත් වලට රැකවරණ ය ලබා දීම සිදු වේ. අධ්‍යාත්මික වශයෙන් ද එය එසේම වේ. ක්‍රිස්තුස් වහන්සේව අනුගමනය නොකරන කෙත් අස්වැන්න නෙලීමට (ගැලවීම) සූදානම් බව  යේසුස්වහන්සේව තම ගෝලයන්ට පැවසූ විට උන්වහන්සේ සමාරියෙ සිටිය සේක. නමුත් උන්වහන්සේ වාක්‍ය කිහිපයකට පසුව ගෝලයන්ට මතක් කර දුන්නෙ අනිත් අය පැමිණීමට පෙර වපුරා වතුර දමා ඇති නිසා පමණක් බවය.

*"මක්නිසාද: එක්කෙනෙක් වපුරන්නේය, වෙන කෙනෙක් කපන්නේය යන කීම මෙයින් සැබෑවේ. නුඹලා විසින් වැඩ නොකළ ගොයම් කපන්ට මම නුඹලා යැවීමි. අන්‍යයෝ වැඩකළෝය, නුඹලා ඔවුන්ගේ වැඩට පැමින්නෝයයි කීසේක." - (යොහන් 4:37-38*

සමාරිය අස්වැන්න නෙළීමට සූදානම් බව යේසුස් වහන්සේ ගෝලයන්ට පැවසූ පසු සුභාරංචිය බෙදා ගැනීමට දොළොස් දෙනාව උන්වහන්සේ වෙනත් ගම් වලට යැවූ සේක. නමුත් සමාරිය මෙන් නොව උන්වහන්සේ මෙවර ඔවුන්ට මෙසේ කී සේක.

*"කවරෙක් නුමුත් නුඹලා පිළිගන්නේවත් නුඹලාගේ වචන අසන්නේවත් නැත්නම්, ඒ ගෙදරින් හෝ නුවරින් හෝ පිටත්ව යන කල නුඹලාගේ පාදවල ධූලි ගසාදමන්න." - මතෙව් 10:14*

අවාසනාවකට සෑම කෙනෙක්ම ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙකයෙක් වීමට සූදානම් නැත. තවද ඔබ පවසන දේ ගැන සෑම කෙනෙක්ම තැකීමක් නොකරනු ඇත. බොහෝ අය යේසුස් වහන්සේ සහ

ගෝලයන් කළාක් මෙන් ඔබව ප්‍රතික්ෂේප කරනු ඇත. බොල්සානෝ හි එම සරණාගතයෙන් බොහෝ දෙනෙක් මට කළාක් මෙන් මා අදහස් කරන දේ ඔබත් දන්නා බව මට විශ්වාසයි.

ශුභාරංචිය යෂ්ටිය සමග දුවන්න. ශුභාරංචියේ බීජ වපුරන්න. යේසුස් වහන්සේගේ ශුභාරංචිය අසා නැති බිලියන තුනකට වඩා වැඩි පිරිසක් සිටිති. අපට වැපිරීමට සහ වතුර දැමීමට බොහෝ දේ ඇත . කෙසේ වෙතත් ධෛර්යමත් වන්න. බොහො 'විට ඔබ වපුරන ලද බීජයේ බලය කිසිවිටකත් නොදනී.

# බීජ

මගේ මිතුරෙකු රයින්හාර්ඩ් බොන්කේගේ පෞද්ගලික සහායකයෙකු වූ අතර ඔහු ඉවැන්ජලිස්ටවරයෙකු විය. ඔහුගේ ජීවිත කාලය තුළ මිලියන 50කට අධික ජනතාවක් ගැලවීම ලැබූ බව දුටුවේය. මගේ මිතුරා මට පැවසුවේ බොන්කේ මෙසේ පවසන බවයි. "අපි ගැලවීම ලැබූ ගණන අනුව නොව වපුරන ලද බීජ ගණන අනුව විනිශ්වය කරනු ලබමු. "

ඔබටත් එසේමයි. මටත් එසේමයි. අධ්‍යාත්මික ගොවීන් වශයෙන් අපගේ අරමුණ වන්නේ අපි යන සෑම තැනකම ශුභාරංචිය වැපිරීමයි. එය වර්ධනය කරවීම අපගේ කාර්යය නොව දෙවියන් වහන්සේගේ කාර්යයි. අපි වපුරමු. වතුර දමමු. කාලය පැමිණි විට අස්වැන්න නෙලීමට සූදානම්ව සිටිමු යේසුස් වහන්සේ පැවසූ සේක.

*තවද උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය වනාහි මනුෂ්‍යයෙකු විසින් පොළොවෙහි බීජ වැපිරීමට සමානය. ඔහු රාත්‍රියේ නිදන්නේය, දහවල් නැගිට සිටින්නේය, ඔහු නොදන්නා ප්‍රකාරයකින් ඒ බීජ පැළවී වැඩෙන්නේය. පොළොවෙන්ම ඵල හටගන්නේය; පළමුව කොළද දෙවනුව කරල්ද ඉන්පසු කරලේ සම්පූර්ණ ධාන්‍යයද හටගන්නේය. ගොයම් පැසුණු කල, කපන කාලය පැමුණුණ බැවින්, ඔහු වහාම දෑකැත්ත යොදන්නේයයි කීසේක." - මාර්ක් 4:26-29*

දිරිගන්වන කරුණ නම් වපුරන සෑම බීජයකටම අපි වපුරන එක පුද්ගලයෙකුට පමණක් විභවයක් ඇති අතර සමහර විට තවමත් පැමිණීමට සිටින අසංඛ්‍යාත මිනිස්සුන්ට එය ඇති කල හැකි වීමයි.

පැරැණි කියමනය අනුව ගසේ ඇපල් ගණන් කළ හැකිය. නමුත් බීජයකයක ඇපල් ගණන් කළ හැක්කෙ කාටද?එක් බීජයකින් විශිෂ්ට අස්වැන්නක් ලැබිය හැකිය. එක්දාස් අටසිය ගණන් වල එක් මිනිසෙකුගෙ ක්‍රියාවන්හි ප්‍රතිඵල සලකා බලන්න.

1855 අප්‍රේල් 21 වන දින එඩ්වඩ් කිම්බල් නම් ඉරුදින පාසල් ගුරුවරයෙකු සපත්තු අලෙවිකරුවෙකු වූ ඔහුගෙ ශිෂ්‍යයෙකුට සුභාරංචිය වැපිරීමට උත්සාහ කළේය. මෙම ශිෂ්‍යා පාඩම් අතරතුර බොහො විට නින්දට වැටෙනු ඇත. ක්‍රිස්තුස් වහන්සේ ගැන ඉගෙන ගැනීම උනන්දුවක් නොදක්වන බව පෙනෙන්නට තිබුණි. දිනක් අධෛර්යයට පත් නොවූ කිම්බල් රැකියාවේදි ශිෂ්‍යා වෙත ලගාවීමට පිටත් විය. තරුණයා සේවය කළ ගබඩාවට ඇතුලු වන විට කිම්බල්ගෙ හදවත ගැහෙන්නට විය. කිම්බල් තම දිනපොත ඒ ගැන මෙසෙ ලියනු ඇත. .මම ඔහුගෙ උරහිස මත අත තැබුවෙමි .මම හේත්තු වී සිටින විට මම සපත්තු පෙට්ටියක් මත මගෙ පාද තැබුවෙමි .ඔහුගෙන් ක්‍රිස්තුස් වහන්සේ වෙතට එන ලෙස ඉල්ලා සිටියෙමි . කිම්බල් රැකියාව වැරදුනා කියා කියලා හිතා ගත්තා. ඔහුගෙ සුභාරංචිය ඉදිරිපත් කිරීම නතර වෙනවා වගෙ කියලා දැණුනා. ඔහු සුභාරංචිය වැපුරුවා උනත් උනන්දුවක් නැතිබව පෙනෙන නිසා ඔහු කලකිරීමට පත් වුණා. අනික් අතට තරුණයා එය වෙනස් ලෙසට වටහා ගත්තා. ඔහු එදින රැකියාවෙන් ඉවත් උනෙ අලුත් මිනිසෙකු ලෙසයි. ඔහු තම ගුරුවරයාගෙ වචන විශ්වාස කර ඇදහිලිවන්තයෙකු බවට පත්විය. ඒ තරුණ සපත්තු අලෙවි කෙරු ඩී.එල් මෝඩි අවසානයේ 1800 අගභාගයේ දී ඇමරිකාවෙ ප්‍රමුඛතම ඉවැංජලිස්තවරයා බවට පත්විය.

*පැරැණි කියමනය අනුව ගසේ ඇපල් ගණන් කළ හැකිය. නමුත් බීජයකයක ඇපල් ගණන් කළ හැක්කෙ කාටද?*

1870 අගභාගයේදී මෝඩි ලේක් ෆොරෙස්ට් විද්‍යාලයේ දී දේශනයක් පැවැත්වූ අතර එම පාසලේ ශිෂ්‍යයෙකු වූ ජේ විල්බට් චැප්මන්ට්

දේශනයට සහභාගි වී දේවමෙහෙයෙන් පසු මෝඩි හමුවිය. පසුව ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයෙකු බවට පත් දූ චැප්මන්ගෙ හදවතෙ මෝඩි සුභාරංචිය වැපුරුවේය.

ජේ විල්බට් චැප්මන්ට් මෝඩි වෙනුවෙන් වැඩ කිරීමට පටන් ගත්තේය. ඔහු චිකාගො ක්ලබ්ස් බේස් බෝල් ක්‍රීඩක බිලී සන්ඩේ ඔහුගෙ සහයකයා ලෙස බදාවාගෙන ඔහුට මග පෙන්විය. බිලී සන්ඩෙ අවසානයේ විශිෂ්ටත ඉවැංජලිස්තවරයෙකු බවට පත් වූ අතර ඔහුගේම විශාල ජනකායක් ආකර්ෂණය කර ගත්තේය. සන්ඩේ ඔහුගෙ කොස්මොස් හි සිටින ජනතාව වෙත ළගා වීමට අධිෂ්ඨාන කරගෙන චාලට් ව්‍යයාපාරික සමාජය දියත් කළේය.

1934 දී චාලට් ව්‍යාපාරිකයන්ගේ සමාජය උතුරු කැරොලිනාවෙ චාලට් හි ඉවැංජලික ව්‍යාපාරික මාලාවක් පැවැත්විය. (සුභාරංචි ප්‍රකාශන මාලාවක්) ඔවුන් මොර්දෙකයි හා නම් මනුෂ්‍යකුට සුභාරංචියේ පණිවිඩය දේශනා කිරීමට ආරාධනා කළහ. එම රැස්වීමකදී එක් තරුණයෙක් යේසුස්වහන්සේටෙ ඔහුගෙ ජීවිතය භාර දුන්නේය. ඒ පුද්ගලා බිලිග් ග්‍රැහැම්ය.

ගරු බිලිග් ග්‍රැහැම් දේව ගැති තුමා රූපවාහිනී යේ දේශනා කළ අතර ජෝන් වේබර් නම් තරුණ පුද්ගලයෙක් විලිම් ග්‍රැහැම් ගෙ පණිවිඩය ට ඇහුම් කන් දී යේසුස් වහන්සේට ඔහුගෙ ජීවිතය භාර කළහ. ජෝන් වෙබර් ඩලාස් කව්බෝයිස් හී පූජකවරයා බවට පත්වී, විද්‍යාලීය තරුණ උපාධියධාරියෙක් හැටියට ඇදහිල්ලෙන් ඔහුට ගුරුහරුකම් දීමට ඔහුගෙ පියාපත් යටතට ඔහුව ගන්නා ලදී. අවු: 22ට පසු එම විද්‍යාලයේ ශිෂ්‍යයෙක් ධර්මදූත සේවය පිළිබඳ ව පොතක් ලියූ අතර එය **ඔබ** විසින් කියවනු ලබනු ඇත.

එම විද්‍යාලීය ශිෂ්‍යා මමය.

1855 අප්‍රේල් 21 සපත්තු සේවකයෙකු හැටියට සබත් පාසල් ගුරුවරයෙකු රෝපණය කරන ලද බීජයක සෘජු ප්‍රතිඵලයක් ලෙස ඔබ මෙම පොත කියවනවා ඇති.එඩ්වට් කින්බල් නම් සබත් පාසල් ගුරුවරයාගෙ හදවතට මෙම බීජය වැපුරුවෙ කවුදැයි අපි නොදනිමුව. ඔහු හෝ ඇය නමක් නොදත් ඉතිහාසයෙ සිටියාවූ කෙනෙක් වන අතර ස්වර්ගයේදී ඔහු හො ඇය නොදන්නාවූ කෙනෙකු නොවනු ඇත. සුභාරංචියේ බීජ විශ්වාසවන්තව වපුරනු ලබන්නේ නම් සතවර්ෂ ගානක් තුල එම අස්වැන්න අපගෙ ජීවිත කාලයට වඩා විශාල වනු ඇත.

# විශ්වාසවන්ත වන්න

බයිබලයේ කිසිදා කිසිවෙක් ශේෂ්ඨ වීමට අදහස් කර නැත. ඔවුන් දෙවියන් වහන්සේගෙ වචනයට විශ්වාසවන්ත වීමට උත්සාහ කළ අතර සමහරුන්ට පොළවේ ශේෂ්ඨත්වය එහි ප්‍රථිපලයක් විය.

දෙවියන් වහන්සේ විසින් අපට ලබා දී ඇති නියෝගය නම් උන්වහන්සේගේ වැපීරීමට සහ වතුර දැමීමේදි අප වටා සිටින අයට සුභාරංචිය දීමෙන් විශ්වාසවන්ත වීමයි.

දෙවියන් වහන්සේ ඔබව මෙ පොළවේ ප්‍රසිද්ධ කිරීමට හෝ නොදැනුවත් කිරීමට තෝරා ගන්නෙ ද යන්න උන්වහන්සේටගේ කාර්‍යයි. අපගෙ ඉලක්කය කිසිවිටෙකත් සුපිරි තරුවක් වීමට උත්සාහ නොකිරීම නොවිය යුතුය. සියල්ලට පසු ඇත්තෙ එකම තාරකාවක් ය. ඒ යේසුස්වහන්සේව ය. අපෙ විශ්වාසවන්තභාවය සදහා උත්සාහ කළ යුතුය.

අප බොහො විට කෙනෙකුව යේසුස්වහන්සේ වෙතට ගෙන එන පුද්ගල යා සමරන්නෙමු. නමුත් ගැලවීමේ මොහොතට බොහෝ කලකට පෙර එම පුද්ගලයා තුල සුභාරංචිය බීජ වපුරා වතුර දැමු නොදන්නා කිතුණුවන් බොහෝ දෙනෙක් සිටින බව අපි අමතක කරමු. අප්‍රිකාවෙ දැවැන්ත අස්වැන්නක් නෙලා ගැනීමට රයින් හාට් බෝන්කෙ කෙනෙකු වසර සියයකට පෙර මිෂනාරි ගවේෂකයෙකු ලෙස අප්‍රිකාවේ මිෂනාරි ක්ෂේත්‍රයේ තම ජීවිතයෙ වැඩි කාලයක් ගත කළ ඩේවිස් ලිවිස්ටන් කෙනෙක් සිටියේය. අප්‍රිකාවේ ඔහුගෙ වසර දහයකට වැඩි කාලය තුල එක් පුද්ගලයෙකු ක්‍රි.ව තුලට ගෙන යාමට ඔහු දායක විය. නමින් පවා එක් අයකු සිටියාද යන්න පිළිබඳව පවා තර්ක කලේය. නමුත් බීජ වපුරා ඇත.

තවද අප ඩේවිඩ්ස් ලිවින්ග්ස්ටන් ගැන දන්නෙ නම් අපි නොදන්නා තවත් ඇදහිලිවන්තයින් කීදෙනක් සිටී දැයි ඔබට සිතාගත හැකිද? බොන්කේ අස්වැන්න නෙලාගත් මහා අස්වැන්නට පෙර අප්‍රිකාවේ වසර සියයක් පුරා ක්‍රි.ව අරමුණ වෙනුවෙන් වෙහෙස මහන්සි වූ ඇදහිලිවන්තයන් වපුරන ලද සෑම බීජයක්ම සහ එක් එක් කෙනා වතුර දැමීම අස්වැන්න නෙලීමෙ කාර්ය භාර්යක් ඉටු කළේය. තවද සියල්ලෝම සදාකාලික විපාකයට හවුල් වෙති.

ඇදහිලිවන්තයෙක් ලෙස ඔබ කිසි අයෙක්ව බේරා ගැනීමට කැදවනු නොලැබේ. ඔබට කිසි අයකුට යේසුස් වහන්සේව විශ්වාස කර ඔහුගේ රාජ්‍යයෙ කොටසක් වීමට සැලැස්විය නොහැක. ඇදහිලිවන්තයෙකු ලෙස කිසිවකු ගලවන්න ඔබව කැදවා නැත. යේසුස්වහන්සේව විශ්වාස කරන්න යැයි කියා උන්වහන්සේගේ රාජ්‍ය යේ කොටසක් කිරීමට ඔබට නොහැක. ඔබව කැදවා ඇත්තෙ විශ්වාසවන්ත ව සුභාරංචියේ බීජය වැපිරීම ට සහ ගැලවීම දෙවියන් වහන්සේ විසින් ඉටුකරනු ලබනු ඇත. සමහරවිට ඔබ සුභාරංචිය වපුර වහාම අස්වැන්න නෙලා ගනී. වෙනත් අවස්ථා වලදී පණිවිඩය වපුරන්නෙ ඔබ විය හැකිය. අනෙක් අය පැමිණ බීජයට වතුර දැමිය හැකිය. තවත් අයකුට අස්වැන්න දැකීමෙ වරප්‍රසාද යද ලැබේ.

බොහො අවස්ථා වලදී සුභාරංචිය වැපිරීම ආකර්ෂණීය නොවේ. සමහර අවස්ථා වලදී පවා එය දුෂ්කර කාර්යක් විය හැකිය. යේසුස්වහන්සේ සුභාරංචිය කෙතට සංසන්දනය කළ විට උන්වහන්සේ පවසන දේ එහි ප්‍රතිවිපාක උන්වහන්සේව තේරුම් ගත් සේක. දුෂ්කර ශ්‍රමය හැරුණු විට බොහෝ විට ගොවිපලවල් ගොවියා ජීවත් වූ ස්ථානය පවා පිහිටා නොතිබුණි. ගොවීන් තම කෙත් වල වැපිරීම ට තම ගොවිපලට යාමට සැතපුම් හයෙ සිට අට දක්වා ඇවිද ගියහ. ඒ සදහා කැපවීම හා වැඩකිරීම අවශ්‍ය විය.

නමුත් ඉදිරියට යන්න ඉදිරියට යන්න කිණුවන් වන ඔබ ජයග්‍රාහී කණ්ඩායමක සිටී.

## අප ශූරයන්ය

සුභාරංචිය බෙදා ගැනීම ශූරතා කණ්ඩායම ක ක්‍රීඩා කරන වා හා සමානය. ඔව්. කණ්ඩායමේ අනික් ක්‍රීඩකයන් ට වඩා ප්‍රසිද්ධ සමහර ක්‍රීඩකයින් සිටිය හැකිය. සමහරු කිසිදා ලකුණු ලබාගෙන හෝ හඳුනාගෙන නොගෙන පිටියේ වැදගත් ස්ථානයක් ඉටු කර දී තවමත් අනෙක් අය පුහුණු කරුවන් සහ පිටත් කණ්ඩායම් පිටත සම්පූර්ණ නොදන්නා දේවගැතිවරුන් වේ. නමුත් තරගය ජයග්‍රහණය කළවිට සෑම කෙනෙකුටම ශූරතා මුද්දක් ලබාදෙනු ලැබේ. ඉතිං යේසුස්වහන්සේව රජ නැවත පැමිණෙන විට එය අප සැමට වනු ඇත. අප සියල්ලෝම එක්ව උන්වහන්සේගේ ජයග්‍රහණය සැමරීමට යන අතර උන්වහන්සේ අපගේ ශ්‍රමය සදහා ප්‍රතිවිපාක දෙනු ඇත.

සමාරියෙ තම ගෝලයන්ට අස්වැන්න නෙලා ගැනීම ගැන යේසුස්වහන්සේ කතා කල විට උන්වහන්සේ ඔවුන් ට වහාම මතක් කර දුන්නෙ බීජයක් සිටුවුවත් බීජයට වතුර දැමුවත් අස්වැන්න නෙලා ගත්තත් සියල්ලන්ටම එක හා සමාන විපාක ලැබෙන බවයි. පණිවිඩය මෙසේ කියයි.

> *"වපුරන්නාත් කපන්නාත් එක්ව සන්තෝෂවන පිණිස, කපන්නා කුලී ලැබ සදාකාල ජීවනයට අස්වැන්න එකතුකරගන්නේය." - යොහන් 4:36*

වපුරන්නා සහ අස්වැන්න නෙලන්නා එක්ව ප්‍රීති වෙති. එක් අය ක්‍රීඩකයාව පුහුණු කරයි. ක්‍රීඩකයෙක් පන්දුව පාස් කරයි. තවත් ක්‍රීඩකයෙක් ගෝලය ලබා ගනී. තිදෙනාම ශූරයො වෙති. එක් අයෙක් බීජ වපුරයි. තවත් අයෙක් බීජයට වතුර දමයි. තවත් අයෙක් අස්වැන්න නෙලා ගනියි. නමුත් සියල්ලෝම එක්ව ප්‍රීති වෙති. අවසානයේ ජයග්‍රාහකයෝ වෙති. අප සැමරිය යුත්තේ එක් පුද්ගලයකු පමණක් නොව කණ්ඩායමයි.

## ඔබේ කොටස තීරණාත්මකයි. .......

නෝර්වේදී මා සංචාරය කල වේගයෙන් වර්ධනය වන සභාවකට මෙම පාඩම අදාළ කර ගැනීමට හොඳ ක්‍රමයක් තිබේ. සභාවේ සාමාජිකයෙන් ඔවුන්ගේ කොස්මොස් හී සිටින සියලුම ඇදහිලිවන්තයන් 3,2,1 සහ 0 පරිමාණයෙන් ලේබල් කර ඇත.තුන යනු කිසිදා සුභාරංචිය අසා නැති අයෙකි. දෙකේ යනු අසා ඇති නමුත් උනන්දුවක් නොදක්වන අයෙකි. එක යනු උනන්දුවක් දක්වන නමුත් තවමත් ක්‍රිස්තුස්

වහන්සේගේ අනුගාමිකයකු නොවන අයෙකි. බින්දුව යනු මෑතකදී පරිවර්තනය වී ගෝලයකු වීමට සූදානම් අයෙකි.

කාර්ය මණ්ඩලය මට කීවේ ඔවුන් ඔවුන්ගේ දේවස්ථානයේ වර්ධනයට හේතුව වන්නේ ශුභාරංචිය රෝපණය කිරීම සහ වතුර දැමීම සැමරීම බවයි. අස්වැන්න නෙලන විට සමරනවා ආකාරයටම එනම් ක්‍රිස්තුස් වහන්සේට තම ජීවිතය දුන් බව "අස්වැන්න නෙලන්නා" එකම එලදායි ඉවැන්ජලිස්ටවරයා ලෙස අලංකාර කිරීම රාජ්‍යය දියුණුවට විනාශකාරී ප්‍රවේශයක් බවය.

ඉවැන්ජලිස්ට සේවයේදී ඔබ ඇතුළු සෑම කෙනෙකුගේම කාර්යභාරය වැදගත් වේ. එය මට ස්විට්සර්ලන්තයේ මගේ පළමු නිවස ඉදිරිපිට ඇති ගොවිපළ මතක් කර දෙයි.

ගොවීන්ගේ ශිල්පීය ක්‍රම සහ ඔවුන් භාවිතා කළ උපකරණ වල යාන්ත්‍ර විද්‍යාව සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීමෙන් ලැබුණු අස්වැන්න ගැන මවිතයට පත් වී අප විසිත්‍ර කාමරයේ ජනේලයෙන් පිටත බලා සිටිමින් දින ගණනාවක් ගත කෙළෙමු. මාස ගණන් සහ අවුරුදු ගණන් ගෙවී යත්ම මම ප්‍රවණතාවක් දුටුවෙමි. සෑම වසරකම මෙම ගොවිපළ වට්ටක්කා වගා කළේය. වාර්ෂික චක්‍රය එකම විය. වසන්තේ එක් දිනක් ගොවීන් දහයක් , පහළොවක් පමණ වගාකළ පසෙහි වට්ටක්කා බීජ රෝපණය කළහ. ඉන්පසු ඊළඟ මාස තුන තුළ ගණන් කළ නොහැකි ගොවීන් ගොවිපළ රැකබලා ගනු ඇත. ඔවුන් පසට වතුර දැමූහ. වැඩෙන වැල් අතරින් වල් පැළෑටි උදුරා දැමූහ. සහ පලතුරු සොරකම් කිරීමට සූදානම් වන සතුන් පෙන්නූහ.

අවසානයේ සරත් සෘතුවේදී මාස ගණනක් බලා සිටි වට්ටක්කා අස්වැන්න නෙළීමට සූදානම් විය. ගොවියෙක් තම ට්‍රැක්ටරය සමග පැමිණි අතර පැය කිහිපයක් අතරතුර සියලුම වට්ටක්කා නෙළා ට්‍රක් රථයට පටවා ප්‍රාදේශීය එළිමහන් වෙළඳපොළකට සහ අවන්හලකට මාර්ගය දිගේ ඇදගෙන යන ලදී. වට්ටක්කා රැගෙන වෙළඳපළ භූමියට ඇතුල්වන විට ටැක්ටරයේ පදවන ගොවියා ආඩම්බරයෙන් බැබළුණි. අස්වැන්න නෙළීම සඳහා සිය ගණනක් ජනයා ප්‍රීති ඝෝෂා කරමින් සහ උද්යෝගයෙන් අත්පොළසන් දුන්හ.

දින කීපයක් පුරා දසදහස් සංඛ්‍යාත ජනතාවක් මෙම වට්ටක් ආසන්න සමරනු ඇත. එය ස්විට්සර්ලන්තයේ විශාලතම අවස්ථාවයි. මෙම අවස්ථාව ප්‍රීතිමත් වූ අතර අප සියල්ලන්ම ගොවිතැනට කැඳවනු ලබන බව මට මතක් විය. දහස් ගණනක් මිනිසුන් ගැලවීම ලබන විශාල කුරුස යුද්ධ දකින විට හෝ වීදි ඉවැන්ජලිස්තවරයකු යේසුස් වහන්සේ වෙතට යන සෑම කෙනෙක්ම මෙහෙයවන යූටියුබ් වීඩියෝවක් දකින විට එය එය අප කිසිවක් නොවන බව අපට හැඟෙන්නට පුළුවන. මෙම ඉවැන්ජලිස්තවරුන්ට ප්‍රශංසා කරනු ලැබෙයි. බොහෝ අනුගාමිකයන් සිටි සහ ඉවැන්ජලිස්ට සේවයේ ප්‍රවීණයන් ලෙස පෙනේ. යථාර්ථය මෙන් බොහෝ දුරයි.

මතක තබා ගන්න ඒ ප්‍රසිද්ධ ඉවැන්ජලිස්තවරයා අස්වැන්න නෙළා ගැනීමට බොහෝ කලකට පෙර තවත් නොදන්නා ඉවැජලිස්තවරුන් හැකි තරම් පිරිසක් තම ආගමට හැරුණු අයගේ හදවතේ ශුභාරංචිය වපුරා වතුර දමා ඇත. ඒ ප්‍රසිද්ධ ඉවැන්ජලිස්තවරයා අහම්බෙන් දෙවියන් වහන්සේ අස්වැන්න නෙළා ගැනීමට තෝරා ගන්නා තැනැත්තා වේ. මොවුන් විශේෂඥයන් නොවේ. ඔවුන් එක් එක් කණ්ඩායමේ ක්‍රීඩකයින්ගෙන් එක් අයෙකු පමණි.

සෑම කෙනෙකුගේම කාර්යභාරය වැදගත්ය.

## ....... සහ හදිසි

හෙට දවස කිසිවෙකුට පොරොන්දු වී නැත. සෑම කෙනෙකුටම වහාම යේසුස් වහන්සේගේ ශුභාරංචිය ඇසීමට අවශ්‍යයි.

අන්න එතනටයි ඔබ ඇතුල් විය යුත්තේ.

අපගේ කාර්යය වන්නේ මිනිසුන්ට ඔවුන්ගේ සදාකාලික ගමනාන්තය සම්බන්ධයෙන් තේරීමක් කිරීමට ඇති බව ඔවුන්ට දැනුම් දීමයි. ප්‍රමාද වීමට පෙර එම තේරීම කළ යුතුය. මන්ද සැබවින්ම සෑම කෙනෙකුටම සදාකාලික ස්වර්ගයක් හෝ සදාකාලික නිරයක් බලා සිටින බැවිනි.

බොහෝ අය තම ශුභාරංචිය නොමැතිකමට "ඉතින් මොකක්ද?"හෝ "කවුද සැලකිලිමත්?" යනුවෙන් ප්‍රතිචාර දක්වන්නේ සැහැල්ලුවෙන්ය. අපගේ එදිනෙදා ජීවිතයේ කාර්යය බහුලත්වයට හසුවීම සහ සදාකාලිකත්වය යනු සෑම කෙනෙකුටම වහාම දැනුම් දිය යුතු බැරෑරුම් කාරණයක් බව අමතක කිරීම පහසුය. අපගේ මිතුරන්ගේ සහ පවුල්වල හදවත් තුළ යේසුස් වහන්සේගේ ශුභාරංචිය වපුරන්නේ ඔබ සහ මම පමණක් විය හැකිය.

ඔබ හදිසිතාව ක්‍රිස්තුස් වහන්සේගේ සහ උන්වහන්සේගේ දේව සේවයේ ප්‍රධාන තේමාවක් ලෙස අපි දකිමු. මාර්කගේ සුවිශේෂය පුරාවටම eutheos යන ග්‍රීක වචනය හතළිස් වතාවකට වඩා භාවිතා කර ඇත. එහි තේරුම වහාම / එකෙණෙහිම යන්නයි. මාර්ක් ගේ පළමු පරිච්ඡේදය තුළ පමණක් මෙම වචනය කොපමණ වාරයක් භාවිතා කර ඇත්දැයි බලන්න.

- උන්වහන්සේ දියෙන් ගොඩනැගුණු eutheos අහස විවරවී, ආත්මයාණන්වහන්සේ පරෙවියෙකු මෙන් තමන් පිටට බැස එනවා දුටුසේක." - ( 10 පදය )
- eutheos ආත්මයාණන්වහන්සේ උන්වහන්සේ වනාන්තරයට පැමිණෙවුසේක." - ( 12 පදය )
- උන්වහන්සේ එතැනින් මදක් දුර ගොස්, සෙබදීගේ පුත්‍රවූ යාකොබ්ද ඔහුගේ සහෝදරවූ යොහන්ද ඔරුවේ හිඳ දැල් අලුත්කරනවා දැක, eutheos ඔවුන්ට අඬගැසූසේක. ඔව්හුද තමුන්ගේ පියවූ සෙබදී වැඩකාරයන් සමඟ ඔරුවේ ඉන්ට හැර උන්වහන්සේ පස්සේ ගියෝය." - ( 19-20 පද )
- ඔව්හු කපර්ණවුමට පැමිණියෝය; eutheos සබත් දවසේ උන්වහන්සේ සිනගෝගයට ඇතුල්වී ඉගැන්වූසේක." - ( 21 පදය )
- ඔව්හු සිනගෝගයෙන් පිටත්ව ආ eutheos යාකොබ් සහ යොහන් සමඟ සීමොන්ගේද අන්දෘගේද ගෙදරට පැමිණියෝය." - ( 29 පදය )
- උන්වහන්සේ ඇවිත් ඇගේ අත අල්ලා ඇ නැගිටෙවුසේක; eutheos උණරෝගය ඈ කෙරෙන් පහව ගියේය, ඈ ඔවුන්ට උපස්ථානකළාය." - ( 31 පදය )

යේසුස් වහන්සේ මෙහෙවරක යෙදී සිටි සේක. eutheos අපට පෙන්නුම් ලබන්නේ යේසුස් වහන්සේගේ මෙහෙවරේ අධිශීඝ්‍රතාවයයි. එම නිසා අප මෙම මෙහෙවරේ අධිශිකයෙන් බීජ වැපිරිය යුතුය.

# ලෝකය ඔබට නොවටිනා දෙයක් කරන්න

අපි ස්වර්ගයට ගිය විට එහි සිටින්නේ කවුද සහ උන්වහන්සේගේ රාජ්‍යයේ ක්ෂේත්‍රතමයාට සලකන්නේ කවුද යන්න ගැන අපි පුදුම විය හැකියි. අද සභාවේ සුපිරි තරු ලෙස අප සලකන අය ස්වර්ගයේදී අප සිතන තරම් ගෞරවයට පාත්‍ර නොවිය හැකිය. දෙවියන් වහන්සේට විශ්වාසවන්තව සිටීමේ ප්‍රතිඵලයක් ලෙස සදාකාලික සාර්ථකත්වයට ලෝකය කරන පරිදි බාහිර සාර්ථකත්වය මනින්නේ නැතිවීම වැදගත්වේ.

දෙවියන් වහන්සේගේ ඇස් හමුවේ සැබවින්ම සාර්ථක පුද්ගලයෙකුත් එබඳු දැයි හෙබ්‍රෙව් පොත අපට ඉඟියක් ලබාදෙයි. ඒ සියල්ල සාරාංශ ගත කර ඇත්තේ දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් යුත් ජීවිතයක් ගත කිරීමෙනි. සුභාරංචියේ බීජ වැපිරීම එම විශ්වාසවන්තකමේ කොටසකි. හෙබ්‍රෙව් පොතේ එකොළොස් වැනි පරිච්ඡේදය " ඇදහිල්ලේ ශාලාව" ලෙස නම් කර ඇත. පරිච්ඡේදය පුරාම ක්ෂේත්‍ර පැරණි මිනිසුන් වන පුරුෂයන් සහ ස්ත්‍රීන් ගැන සඳහන්වේ. නෝවා, ආබ්‍රහම් , ඊසාක්, යාකොබ් , සහ මෝසෙස් කිහිප දෙනෙකුගේ නම්ය. ඉන්පසු ලේඛකයා මෙසේ පවසයි:

> *"මම තව මක්කියම්ද? ගිඩියොන්ද බාරක්ද සම්සොන්ද යෙප්තාද දාවිත්ද සාමුවෙල්ද ප්‍රොපේතවරුන්ද ගැන කියන්ට කල් මදිය. ඔව්හු ඇදහිල්ලෙන් රාජ්‍යයන් යටත්කළෝය, ධර්මිෂ්ඨකම් කළෝය, පොරොන්දු ලබාගත්තෝය, සිංහයන්ගේ මුඛ පියෙවුවෝය, ගින්නේ උෂ්ණය නිවුවෝය, කඩුමුවහතින් ගැළවුණෝය, දුර්වලව සිට ශක්තිමත්කරනු ලැබුවෝය, යුද්ධයෙහි බලසම්පන්නවූවෝය, අන්‍ය සේනාවක් පන්නාදැමුවෝය. ස්ත්‍රීහු නැවත-නැගිටීමකින් තමුන්ගේ මළවුන් ලැබුවෝය. වෙන අය වඩා උතුම් නැවත-නැගිටීමක් ලබන පිණිස, මිදීම පිළි නොගෙන වධකරනු ලැබුවෝය. තවත් අය සරදම්වලින්ද පහරවලින්ද, එසේය, බැඳුම්වලින් සහ*

